
ගුණදාස
අමරසේකර
රතු රෝස මල

# රතු රෝස මල

ගුණදාස අමරසේකර

ගුණසේන

සීමාසහිත ඇම්.ඩී.ගුණසේන (පුද්ගලික) සහ සමාගම
217, ඔල්කොට් මාවත, කොළඹ 11.
දුරකථනය 2323981-4 ෆැක්ස් 2323336 ඊමේල් info@mdgunasena.com
www.mdgunasena.com

© සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ (පුද්ගලික) සමාගම

මුද්‍රණය 2017

ISBN 955 - 21 - 0047 - X

ප්‍රකාශකගේ ලිඛිත අවසරය කලින් තිබී පරිදි නොලබා මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කුමන ආකාරයකින් හෝ කුමන ක්‍රමයකින් ඉලෙක්ට්‍රොනිකව, යාන්ත්‍රිකව, ඡායාපිටපත් මගින් සම්ප්‍රේෂණය සහ භාවිතය පිණිස කිසියම් පද්ධතියක සටහන් කිරීම හා ගබඩා කර තැබීම සපුරා තහනම්ය.

මුද්‍රණය
සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම
20, සාන්ත බස්තියම් කන්ද, කොළඹ 12. P - 3035 - 07/2017

# පටුන


| | | |
|---|---|---|
| 1. | රතු රෝස මල | 01 |
| 2. | ගුරුවරයා | 15 |
| 3. | දවිත් අයියා | 26 |
| 4. | බයිසිකලය | 31 |
| 5. | මාමාගේ ඉඩම | 52 |
| 6. | තරුණ ශිෂ්‍යයා | 67 |
| 7. | සෝමා | 85 |
| 8. | අවුරුදු සිහිනය | 100 |
| 9. | අම්මාගේ ශෝකය | 114 |
| 10. | සැප සෙවීම | 126 |
| 11. | අවබෝධය | 133 |
| 12. | අච්ච | 139 |
| 13. | නිවාඩුව | 152 |
| 14. | වෙසක් කූඩුව | 160 |
| 15. | ලිපිකරුවෝ දෙදෙන | 178 |

# 1

# රතු රෝස මල

මගේ සොහොයුරකු වූ සෝමපාලගේ අසනීපය ගැන දැනගන්නට ලැබුණු වේලෙහි මා තුළ මහත් ශෝකයක් ඇතිවිය. සෝමපාල මට වඩා අවුරුදු හත අටකින් බාල වුවද මා ඔහුට සැලකුවේ හිතවත් මිත්‍රයකු ලෙසිනි. සෝමපාලට මගේ ගෙදර නැවතී බෙහෙත් ගත හැකි බව දන්වා ඔහුට එහි පැමිණෙන ලෙස ආරාධනා කොට ලියුමක් ඇරියෙමි. සෝමපාලගේ නෑදෑයෝ මගේ අදහසට එකඟ වූහ. ඔවුන් හැමටම වඩා කැමති වූයේ සෝමපාලගේ මවය. මා විනීත ගුණධර්ම පුරුදු පුහුණු කළ තරුණයෙකැයි යන්න ඈ මා පිළිබඳව ඇති කර ගත් අදහස බව මම දැන සිටියෙමි. ඒ සියල්ලටම වඩා මා අඳුනන, උමතු රෝග විශේෂඥයෙකුගෙන් බෙහෙත් ගැනීමට හැකිවීම සෝමපාලගේ පැමිණීමට විශේෂ සාධකයක් විය.

මා තනිකඩයෙකු වූ බැවින් සෝමපාල සමඟ හිතවත් තරුණ මෙහෙකරුවෙක්ද ගෙන එන ලදී. සෝමපාලගේ ප්‍රයෝජනය පිණිස මම ගෙදර ඉතාමත් දකුම්කළු කාමරය දුනිමි. මල් වත්තට මුහුණලා ඇති කවුළු පේළියකින් යුත් එය, ඔහුගේ අභාවයට ගිය

කල්පනා ශක්තිය වර්ධනය කිරීමෙහි පොහොසත් වෙතියි යන කිසියම් අදහසක් මා තුළ විය.

සෝමපාල පැමිණ දවස් දෙක තුනක් යනතුරු ම මහත් නිශ්ශබ්දතාවයක් ඉසුළුවේය. කීප දිනකින් එය මග හැරී යතියි මම සිතුවෙමි. ඔහු පැමිණි පසුදම මම සෝමපාල මුලින් සඳහන් කළ දෙස්තර මහතා කරා ගෙන ගියෙමි. දෙස්තර මහතා බොහෝ වේලාවක් ඔහු පරීක්ෂා කිරීමෙන් පසු ඔහුගේ මොලයෙහි අවුරුදු තුන හතරක පමණ සිට අවුල් ගතියක් ඇතිවී තිබෙන බවත් ක්‍රමයෙන් ඔහුගේ ශරීරය කෘශවීම හීතියට කරුණක් බවත් පැවසුවේය. ඉන් පසු දිනපතාම දෙස්තර මහතා ලවා සෝමපාලව පරීක්ෂා කරවන ලදී. දවසකට රාත්තල් තුන හතරක් අඩුවන බව දිනපතා බර පරීක්ෂා කිරීමෙන් වැටහිණ. එහෙත් ප්‍රතිකාර වශයෙන් දෙස්තර විසින් නියම කරන ලද්දේ පෝෂ්‍ය ආහාර දීමත්, මොළයට සුළු ව්‍යායාමයන් කරවීමත් පමණකි.

සෝමපාල බොහෝ විට කාලය ගත කළේ නිකට අත්ල මත රුවාගෙන, රැළිගැසුණු නළලින් යුතුව කල්පනා කිරීමෙනි. ඔහුට එතරම් කල්පනා කිරීමට කුමක් හේතුවී දැයි මම නොදනිමි. දිනපතා කන්තෝරුවට ගොස් රෑවී ගෙදර එන මට ඔහුගේ හැසිරීම ගැන දැනගත හැකිවූයේ තරුණ මෙහෙකරුවාගෙනි. ඔහු අවංක කරුණාවන්ත තරුණයෙක් විය. මම සැමදම ඔහුගෙන් සෝමපාල කළ කී දෑ තොවරදවා ඇසුවෙමි. සෝමපාල පැමිණ සුමාන දෙකකට පමණ පසු මා නැති විටෙක ඔහුට

හෘදයාබාධයක් ඇතිවූ බව දිනක් මෙහෙකරුවා මා සමඟ කීවේය. එදින ඔහු වෙනදට වඩා වෙනස් ස්වභාවයකින් හැසුරුණු බවද ඔහු විසින් මා සමඟ කියන ලදී.

සෝමපාලගේ කාමරයේ සිට යාර විස්සක් පමණ ඈතින් මා ඉතා ආදරයෙන් වවන ලද රතු රෝස පඳුරක් වෙයි. පඳුරු ලා වැඩුණු එය වටා, ගසට කිසිවකුට ළං නොවන සේ සාදන ලද යකඩ වැටක් ඇත. මා රෝස මල් වලට මෙතරම් ප්‍රිය කළේ කුමක් නිසා දැයි මම නොදනිමි. කුඩා කල අපේ ගෙදර මිදුලෙහි වූ රෝස පඳුරක් ගැන මට මතක ඇත. එහි වූ රෝස මල් උදයෙහි පිනිදිය සලා පෙති විදහන විට මම ඒ අවට මහත් ප්‍රීතියකින් බොහෝ වේලාවක් ගෙවීවෙමි.

සෝමපාල එදින කවුළු දෙරින් රෝස පඳුර දෙස බලා සිට, පසුව එහි ගොස් එහි වූ රෝස මල කැඩීමට තැත්කළේය. එහෙත් මෙහෙකරුවාගේ වැළැක්වීම නිසා ඔහුට එසේ කළ නොහැකි විය. අතින් අල්වා බලෙන් තමාගේ කාමරයට ගෙනෙන ලද ඔහු ස්වල්ප වේලාවකින් හෘදයාබාධයකින් පෙළෙන්නට විය.

ඔහු පසුද දොස්තර බැලීමට යා නොහැකි දුර්වල තත්වයක සිටි බැවින් දොස්තර නිවසට කැඳවන ලදී. සෝමපාලට හදිසියේ ඇතිවූ හෘදයාබාධය ගැනත් ඔහුගේ අස්වාභාවික මානසික තත්වය පිළිබඳවත් මම දොස්තර මහතාට කීවෙමි. දොස්තර ලෙඩා පරීක්ෂා කර බලා, හෘදයාබාධය අත්කිසිවක් නිසා නොව

දුර්වලකම නිසා ඇතිවූ බව කීවේය. ඔහු රෝස මලේ පුවත ගැන කිසිත් නොකීවේය. ඔහුගෙන් ප්‍රශ්න කිරීම නුසුදුසු යයි සිතූ බැවින් මම නිශ්ශබ්ද වීමි. සෝමපාලට වෙනදටත් වඩා පෝෂ්‍ය ආහාර දීමටත්, දුව පැන ඇවිදීමෙන් ඔහුට යළි හෘදයාබාධය ඇතිවිය හැකි නිසා කාමරයෙන් පිටතට නොයෑමටත් නියම කරන ලදී.

පසු දින කන්තෝරුවට යෑමට පෙර, මම තරුණ මෙහෙකරුවාට දොස්තර නියම කළ ආකාරයට සෝමපාලව බලාගන්නා ලෙස කීවෙමි. එදින සෝමපාල මා ගෙදර එනතුරු ජනේලය අසලින් නොසෙල්වී සිටි බවත්, දෙවරක්ම තමාට කාමරයෙන් පිටතට යෑමට ඉඩ දෙන ලෙස මෙහෙකරුවාගෙන් ඉල්ලා සිටි බවත් මා ගෙදර පැමිණි විගස ඔහු මා සමග කීවේය. ඔහු එදින දෙවරක් හෘදයාබාධයෙන් පෙළුණේය. මම ඇඳුම් මාරු කිරීමටත් පෙර සෝමපාල සිටි කාමරයට ගියෙමි. මා එහි යන විටද ඔහු ඇඳමත දිගාවී, ඇර තිබුණු කවුළු දෙර වෙත රැඳුණු දෙනෙතින් යුතුව සිටියේය. මා දුටු විගස ඔහු දෙනෙත් බිමට හරවා මහා වේදනාවකින් පෙළෙන්නකු මෙන් තළල රැලි ගස්සන්නට විය. මම ඔහුගේ උරහිස මත සුරත රඳවා 'සෝමපාල' යි ඇමතුවෙමි. ඔහු කිසිත් නොකීවේය. ඔහුගේ දෙනෙත් ක්‍රමයෙන් විශාලවන අයුරු මට පෙනිණ. ඒවායේ කඳුළු පිරී තිබුණා දැයි මට හරි හැටි කිව නොහැක. බොහෝ වේලාවක් නිශ්ශබ්දව සිටි ඔහු මගේ මුහුණ දෙස ඕනෑකමින් බැලුවේය. ඔහුගේ දෙනෙතෙහි පුදුමාකාර බැල්මක් රැඳී තිබිණි.

"මට කාමරයෙන් එළියට යන්න දෙන්න" යි ඔහු කීවේය.

"ඇයි සෝමපාල, සෝමපාලට තේරෙන්නේ නැද්ද වැඩිය වෙහෙස වෙන්න හොඳ නැති බව. ඊයේ අර පසුවේ අමාරුව හැදුනෙත් මම නැති වෙලාවෙ වෙහෙස වෙලා" යි මම පිළිතුරු දුනිමි.

ඔහු ඊට කිසිත් නොකීවේය. ඇඳ මත දිගාවී දෙනෙත් වසා ගෙන බිත්තිය දෙසට මුහුණ ලා නිදන්නාට විය. ඔහුගේ මුහුණෙහි ඊට පෙර නොවූ මලානික ගතියක් එදින පෙණිනි. ඔහුගේ තත්වය භයානක යයි හැඟී ගිය බැවින් දොස්තර ලවා යළිත් පරීක්ෂා කරවීමට සිතුවෙමි.

දොස්තර වෙනද මෙන් ඔහු පරීක්ෂා කොට, හෘදයාබාධයට හේතුව වෙහෙසීම බවත් වෙන අලුතෙන් කිසියම් අසනීපයක් දන ගැනීමට නැති බවත් කීවේය. රෝගියාට ඇඳෙන් බැසීමට ඉඩ නොදෙන ලෙසද නියම කරන ලදී.

පසුද කන්තෝරුවට යෑමට පෙර තරුණ මෙහෙකරුවාට, සෝමපාල බලාගත යුතු ආකාරය පැහැදිලි කොට, සෝමපාලට කොයි ක්‍රමයකින් නමුත් ඇඳෙන් බැසීමට ඉඩ නොදිය යුතු යයි කීවෙමි. එදින මම වෙනදට වඩා කලින් කන්තෝරුවෙන් ආවෙමි.

මම ගෙට ගොඩනැගුණු විගසම සෝමපාලගේ කාමරයට ගියෙමි. සෝමපාලට එවිට නින්ද ගොස් තිබෙණු දුටු මා සිත තුළ ප්‍රීතියක් ඇතිවිය. ඔහුගේ

තත්වය දුවදයක අතට හැරෙන්නට ඇතැයි . මම සිතුවෙමි. ඔහුගේ මුහුණෙහි වෙනද වූ දුක්මුසු සිත් වේදනා කරවන සුළු පෙනුම පහව ගොස් පියකරු භාවයක් එහි විය. ඔහු අවදි කිරීමට නුසුදුසු යයි සිතූ මම කාමරයෙන් එළියට පැමිණ මෙහෙකරුවා සමඟ කථා කරන්නට වීමි.

"අද මොකද පොඩි මහත්තය නිදගන්නෙ" යි මම ඔහුගෙන් ඇසුවෙමි.

"නැහැ, දන් පැය දෙකක් විතර ඉඳල නිදි. දවල් බෙහෙත් බිව්වයින් පස්සෙ නිදගන්න පටන් ගත්තු ගමන තමයි තාම ඔය"

"කොහොමද ඇඳෙන් නැගිට්ටින්න හැදුවද?" යි මම ප්‍රශ්න කෙළෙමි.

"නැහැ, උදේ වරුවේ කල්පනා කර කර හිටිය, වැඩි හැල හොල්මනක් නැතුව. මම දවල් බෙහෙත් ගේන්න ගියා. ඒ අතරතුරේ ඇඳෙන් නැගිට්ටින්න නැහැ. මං එනකොටත් නිදගෙනයි හිටියෙ."

සෝමපාලට නින්ද ගිය බව ඇසීමෙන් මා තුළ සතුටක් ඇති විය. මම ඇඳුම් මාරු කොට ඉස්තෝප්පුවට වුත් පත්‍රය බලන්නට සිතුවෙමි. බොහෝ දවසකින් පත්‍රය බැලීමට තරම්වත් විවේකයක් දනුණේ එවිටය. පත්‍රය රැගෙන පුටුව මත වාඩිවී මිදුල දෙස බැලූ මගේ දෙනෙත් පළමු වරට ඇදී ගියේ රෝස පඳුර වෙතය. එහි වූ රෝස මල් පොකුර දක්නට

නොතිබිණ. මම වහා පඳුර ළඟට ගියෙමි. එහි වූයේ රෝස මල් පොකුර පිටින්ම කැඩීමෙන් ඉතුරුවන ලද ඉති කැබෙල්ල පමණකි. රෝස පොකුරෙහි පිපී තිබුණේ එක මලක් බව මට මතක් විණ. මම තරුණ මෙහෙකරුවා කැඳවා ඔහුගෙන් රෝස මලට කුමක් වී දැයි ඇසුවෙමි. එහෙත් ඔහුට ඒ ගැන කිසිවක් කීමට නුපුළුවන් විය. රෝස පඳුරත් සෝමපාලත් අතර වූ සම්බන්ධය ගැන මට සිහිවිණ. රෝස මල සෝමපාල විසින් කිසිවෙකුට නොපෙනෙන ලෙස කඩන්ට ඇතැයි මම සිතුවෙමි. තින්දෙන් අවදි වූ විට ඔහුගෙන් ඒ ගැන ඇසිය යුතු යයි මම තීරණය කරගත්තෙමි.

සෝමපාල අවදි වූ විට, මම ඔහුගෙන් ඒ සම්බන්ධව ඇසිය යුතු යයි සිතාගෙන කාමරයට ගියෙමි. එහෙත් ඔහුගෙන් ඒ ගැන ප්‍රශ්න කිරීමෙන් ඔහුගේ සිතෙහි යළි කිසියම් කැලඹීමක් ඇතිවෙතියි යන බියෙන් මම කිසිත් නොඇසුවෙමි.

සෝමපාල මා කාමරයට ඇතුල්වූ විගසම මහත් දයාවකින් මෙන් මා දෙස බැලුවේය. ඔහුගේ මුහුණෙහි වූ වෙනද නොමැති පැහැදිලි පෙනුම හා පියකරු බව ගැන මට වඩාත් පැහැදිලි වූයේ එවිටය. "සෝමපාලට දන් සනීප වගෙ" යි මම කීවෙමි. ඔහුගේ කට කොනකින් සිනහ රැල්ලක් මතු විය.

"ඔව්-ස-නීප-යි තින්ද-ගි-යා" ඔහු පිළිතුරු දුන්නේ ගොත ගසමින් වැයමිනි.

මම ඔහුට ළංව ඔහුගේ මුහුණ දෙස ඕනෑකමින් බැලුවෙමි. ඔහු කිසිවක් කීමට දැඩි ආශාවකින් සිටින බව මට පෙනිණ.

දැඩි දුර්වලත්වය නිසා ඔහු කී දෙයින් මට ඇසුණේ ඇතැම් කොටස් පමණකි. එහෙත් ඔහු කීවේ මේ යයි මට සිතුණි.

"අර රෝස මල කැඩුවේ මමයි. මට එය විනාශ කිරීමට වුවමනා වී තිබුණා, මගේ අභාග්‍යය උදාකරේ මෙයයි. එහෙත් මට නම් මෙය විනාශ කරන්නට බැහැ."

මීට මොලව ගත් ඔහුගේ අතෙහි රෝස මල වූ බව මට පෙණුනි. මම එය ඔහුගෙන් ගැනීමට තැත් නොකලෙමි.

ඔහුට කථා කිරීමට නොහැකි වී තිබෙණු දුටු මම බියෙන් ගැහෙන්නට වීමි. දෙස්තරට වහාම පැමිණෙන ලෙස පණිවුඩයක් ඇරියෙමි. දෙස්තර පැමිණෙන තෙක්ම මම කාමරයෙන් එළියට නොගොස් සෝමපාල අසලින්ම සිටියෙමි. මගේ පුදුමයට කරුණ වූයේ ඔහුගේ මුහුණෙහි වූ ශාන්ත පියකරු පෙණුමය. එය භයානක අඩියක සිටින්නෙකු කෙරෙහි නොව ලෙඩෙකින් සුවවන්නෙකු කෙරෙහි ඇතිවන පෙනුමක් ලෙසය මට හැඟී ගියේ.

දෙස්තර සෝමපාල පරීක්ෂාකර බලා, ඔහුගේ තත්වය ඉතා දුර්වල බවත් තත්වය කෙබඳු අතකට පෙරලේ දැයි කිව නොහැකි බවත් ප්‍රකාශ කෙළේය.

හදිසියේ හෘදය දුර්වලත්වය වැඩිවී නම් තත්වය ඉතා භයානක වන්නට පුළුවන් බවද ඔහු විසින් කියන ලදී.

එදින රාත්‍රී සෝමපාලගේ තත්වය දරුණු අතට හැරිණ. දොස්තරවරුන් ගණනක් කැඳවන ලදී. එයින් පලක් නොවීය. පසුදු එළිය වැටීමට දෙපැයකට පමණ පෙර හදිසියේ ඇතිවූ හෘදයාබාධයකින් ඔහු මළේය.

සෝමපාලගේ මරණය මගේ දැඩි ශෝකයට හේතු විය. ඔහුගේ රෝගය සඳහා වියදම් කොට දුප්පත්ව සිටි ඔහුගේ දෙමව්පියනටද මට උපකාර කිරීමට සිදුවිය. එබැවින් මම ඒ ගෙය විකුණා වාම් ජීවිතයක් ගෙවීමට සිතුවෙමි.

සෝමපාලගේ මරණයෙන් අවුරුදු තුන හතරකට පසු මම මිත්‍රයකු සමඟ වාසයට ගියෙමි. අවුරුදු තුනකට පෙර විවාහ වූ මගේ මිත්‍රයා ඒ ගෙයි වාසයට පැමිණ මසක් වත් ඉකුත් නොවීය.

විශාල සමව පිහිටි වත්තකින් යුත් ඒ ඉඩම ඉතා සිත් ගන්නා සුළු එකකි. ගෙයද දකුම්කළු එකක් වුවද පරණ ගෙයක් අලුත්වැඩියා කිරීමෙන් සාදන ලද්දකි. මම එහි ඉස්තෝප්පුවට ඇරුණ කුඩා කාමරය නැවතීම පිණිස ගත්තෙමි. කුඩා වුවද, ගෙයි අන්‍ය කාමර හා සම්බන්ධයක් නොමැති ඒ කාමරය මගේ සිත තදින් ඇද ගත්තේය.

මගේ මිත්‍රයා විනෝදකාමී එකෙකි. ඔහු මා අඳුනා ගෙන ස්වල්ප කලක් වුවද ඒ කාලය තුළ අප අතර

විශාල සම්බන්ධයක් ඇතිවිය. ඔහුගේ බිරිඳ ද ඔහු මෙන්ම අලංකාර ජීවිතයක් ගත කිරීමට ප්‍රිය කළ එකියකැයි මට සිතේ. උස් සිරුරකින් යුත් ඇ පෙනුමෙන්ද බොහෝ සේ සිත් අලවයි.

එහි පැමිණි කීප දිනකින් අපි ගෙයි ඉදිරිපස වූ වත්තෙහි මල් වැවීම ආරම්භ කෙළෙමු. අප තුළ වූ දැඩි ආශාව නිසා ස්වල්ප කලකින්ම ගෙමිදුල නොයෙක් මලින් සැදි දර්ශනීය මල් වත්තක් බවට පෙරළිණ.

අවුරුද්දෙහි මල් බෙහෙවින් පිපෙන කාලය පැමිණියේය. මල් වත්තෙහි හැම ගසක්ම පාහේ මලින් වැසෙන්නට විය. මගේ කාමරය ඉදිරියෙහි මා විසින් ආදරයෙන් වවන ලද විශාල රතු රෝස මල් ගසෙහි ද ටික දිනකින් මල් හට ගන්නට විය. මගේ කාමරය අසල මෙය වැවීමටද හේතු වූයේ මල් වලට තිබූ ආශාවය.

පළමු ඇති වූ පොහොට්ටු එක දෙක පිපී මල් බවට වැඩෙන තුරු මම නො ඉවසිල්ලෙන් සිටියෙමි. ටික කලකින් පිපෙන පොහොට්ටු වලින් යුතු ඇතැම් මල් ඉති මගේ කාමරයේ කවුළුවේ තිරයට හේත්තු වී සිටින සැටි දකින මා තුළ වූ ප්‍රීතිය බොහෝ විය. ටික දිනකින් රතු රෝස මල් නොදැනුවත්වම මගේ කාමරයට ඇදෙතියි ද මට සිතිණ. රෝස මල් දකින හැමවිටම මට සෝමපාල ගැනද සිහිවිය.

මම දිනක් උදයෙහි කිසියම් වැඩක යෙදී සිටියෙමි. මිත්‍රයාගේ බිරිඳ කාමරයට පැමිණ කථා කරන්නට වූවාය.

"මේ රෝස පඳුර උදුරල දමනවා. මේක නිසා මෙතන බිත්තියත් ජනෙල් රෙද්දත් දෙකම කිලුටු වෙනවා" යි ඈ කීවාය.

මම පුදුමයෙන් මෙන් ඈ දෙස බලා සිටියෙමි. ජනෙල් රෙද්ද රෝස පඳුර නිසා කිලුටු වන්නේ කෙසේ දැයි මට නොවැටහිණ.

"මොන බොරුද, මොකක් කිලුටු වුනත් මේක නම් උදුරන්න දෙන්න බැහැයි" මම ඇයට කීවෙමි.

"බෑ, බෑ මොන, මේක උදුරලා දමනවා" යි ඈ කාමරයෙන් ඉවත් වෙමින් කීවාය.

මම ඈ කී දෙය නොපිළිගත්තෙමි. ඈ සරදමක් වශයෙන් මා කෝප කරවීමට කිසිවක් කියන්නට ඇතැයි මට සිතිණ. ඈ එවැනි සරදම් කිරීමෙහි ද බෙහෙවින් දක්ෂය.

එදින හවස කන්තෝරුවෙන් පැමිණි මා තුළ ඇතිවූ කෝපය නිම් හිම් නැති විය. ජනේලය ඉදිරියෙහි වූ රෝස පඳුර මුලින්ම උදුරා දමා තිබෙන බව මට පෙනිණ.

රෝස පඳුර කවුරුන් විසින් උදුරන්නට ඇද්ද යන බව මට වැටහිණ. මම ඇගෙන් කිසිවක් නැසුවෙමි. ඈ හා කථා කරන්නට යෑමෙන් විශාල කලහයක් ඇතිවෙන බව මට සිතිණ.

ඉන් කීප දිනක් පසුවන තුරුද මම ඈ සමග කථා නොකෙළෙමි. ඈ නොයෙක් විට මා සමඟ

කථා කිරීමට සූදානම් බවක් දක්වූ මුත් මම කෝපයෙන් අහක බලා ගත්තෙමි. දින කීපයක් ගතවූ පසුද මගේ සිතෙහි වූ කෝපය අඩු නොවීය.

දිනක් හවස මම කාමරයෙහි මේසය අසලට වී කිසිවක් ලියමින් සිටියෙමි. මිත්‍රයාගේ බිරිඳ සෙමෙන් කාමරයට ඇතුල් වී මේසය අසල වූ පුටුවක වාඩි වූවාය. එය ඇ සමහ කෝප වූවාට පසු ඇ ඒ කාමරයට පැමිණි පළමු වතාවය.

"රෝස පඳුර උදුරා දැම්මේ මමයි" ඇ දිග කථාවක් කීමට සැරසෙන්නියක මෙන් කීවාය. මට කිසිත් නො කීවෙමි. එහෙත් එවිට මගේ කෝපය බෙහෙවින් අඩු වී තිබුණේය.

"මම එය උදුරා දැම්මේ බිත්තිය කිලුටු වන නිසා නොවෙයි. එය මගේ සිතට දුක් දෙන්නක් නිසා."

ඇ කී අන්තිම වචන ඇසීමෙන් මා තුළ මවිතයක් ඇතිවිණ. සෝමපාල ගැන මට එවිට සිහිවිණ.

"ඒ ඇයි ද?" යි මා නො දැනුවත්වම වාගේ මුවෙන් පිටවිණ.

එය මා විසින් නැසිය යුත්තක් බව මට වැටහුණේ එය ඇසීමෙන් පසුව ය. "නෑ ඒක මට උවමනා නෑ" යි මම කීවෙමි.

"නෑ ඒක හංගන්න දෙයක් නෑ" යි ඇ පිළිතුරු දුන්නාය. මගේ නොඇවසිලිමත් ආශාව කෙතරම් දැඩි වුවද මම එය යටපත් කර ගැනීමට තැත් කළෙමි.

"නෑ මට එය ඕනෑ නෑ."

"මම විවාහ වන්නට පෙර මට තරුණයෙක් ප්‍රේම කළා. ඔහු සිටියේ අපි ඒ දවස් වල සිටිය ගෙට යාබද වත්තෙ. ඒ වත්තේ තිබුණා ලස්සන රතු රෝස මල් පඳුරක්. මම ඒ දවස්වල රෝස මල් වලට විශේෂයෙන් ප්‍රිය කළා. දිනක් මම අපේ වත්තේ ඇවිදින කොට රෝස මල් පඳුරෙ රෝස මල් කීපයක් පිපී තිබෙන බව දැක්කා. තරුණයා රෝස පඳුර ළඟ කිසිවක් කරමින් සිටියා. ඔහු අපේ ගෙදරට කීපවිටක් ඇවිත් තිබෙනවා. එහෙත් මා ඊට පෙර ඔහු සමඟ කථා කරලා නැහැ. අපේ ගෙදරත් ඒ ගෙදරත් වෙන්කර තිබුණේ මිටි තාප්පයකින්. මම තාප්පය ළඟට ගිහින් ඔහුගෙන් නැටි දිග රෝස මල් කීපයක් ඉල්ලුවා. අපේ ගෙදර මල් පෝච්චි කීපයක් තිබුණ නමුත් මල් දමීමට නැති නිසා ඒවා පාවිච්චි නොකර තිබුණා. ඔහු මට මල් කීපයක් දුන්නා" යි කී ඇ මඳක් සිනහ වෙමින් මා දෙස ඕනෑකමින් බැලුවාය.

"ඊට පසුව ඔහු මට ප්‍රේම කරන්නට පටන් ගත්තා. මා ඔහුට කිසිවිටක ප්‍රේම කළේ නැහැ. මා ප්‍රේම නොකරන බව පෙනෙත්ම ඔහුගේ ප්‍රේමය දියුණු වුණා. ඔහු ස්නායු දුර්වලත්වයෙන් පෙළෙන කෙනෙක්. කල්යත්ම ඔහුගේ ප්‍රේමය තව තව දියුණු වුණා. ඔහු කිසියම් අභාග්‍යයකට තමන්ගේ වුවමනාවෙන්ම පත්වන බව මට පෙණුනා. ඊට කලකට පසුව මම විවාහ වී ඒ ගේ අත්හැර වෙන පළාතකට ගියා.

"මගේ විවාහයෙන් පසුව ඔහු ඉතා අවාසනාවන්ත කාලයක් ගත කළ බව මට ආරංචි වුණා. ඔහු ගැන සිහිවන විට මා තුළ දැන් ශෝකයක් ඇතිවන මුත් කරන්නට දෙයක් නැහැ. එය ඔහුගේම වරදයි."

"මෙහි ඇති රෝස පඳුර දකීමෙන් මට ඔහු ගැන සිහිවන්නට පටන් ගත්තා. එයින් ඇතිවන වේදනාව නැති කිරීමටයි මම එය උදුරා දැම්මේ."

ඈ කී දෙය ඇසූ මා තුළ මවිතයක් ඇතිවිය. එහෙත් ඈ සෝමපාල පිළිබඳ කීවේ සම්පූර්ණ සත්‍ය දැයි මට සැක සිතිණ. ඇගේ දෙ ඇසෙහි හෝ කට හඬෙහි අවංක භාවයක් නොරැඳී තිබුණේය.

ඈ සමඟ සෝමපාලගේ ජීවිතයේ අන්තිම කොටස පිළිබඳව කීමට මා තුළ දැඩි ආශාවක් ඇති වුවද මම එය නොකීවෙමි. එය අසන්නාගේ සිත් කකියවන සුළු ශෝකී පුවතක් බැවිනි.

# 2

# ගුරුවරයා

'තමුසෙ ළමයින්ගේ ජීවිත නැති කරල. මෙච්චර කල් තමුසෙ කරල තියෙන්නෙ එපමණයි' යන කියමන ඔහුගේ සිතෙහි යළිත් ක්‍රියා කරන්නට විය. දැස පිස ද ඇර තබන ලද ජනේලයෙන් පිටතට දෑස හැරවූ ඔහුට එළිය වැටීමට ඇත්තේ තව ස්වල්ප වේලාවකැයි සිතිණ. ඉස්තෝප්පුවට ඇරුණු ජනේලයෙන් වැහිබර අහසින් විශාල කොටසක් පෙනෙයි. එළිය වැටීමට පෙර මෙසේ අහස දෙස බැලීමෙන් වේලාව කීමෙහි සමත් ඔහු හැමවිටම ඔරලෝසුව දෙස බැලුවේ අහස දෙස බැලීමෙන් පසුවය. ගස් අතරින් සිය නෙතට හසුවුණු වැහිබර අහස ඔහුගේ සිතෙහි වූ කනස්සලු භාවය වැඩි කරන සුළුවිය. අවුල් සහිත කල්පනාවෙන් ගෙවුණු පසුගිය රාත්‍රියෙහි ඔහුට පැයක්වත් නින්ද නොගියේය.

ඇඳෙන් නැගිට ඉස්තෝප්පුවට වුත් පාර දෙස බැලූ ඔහුට කල්පනා වූයේ කරෝලිස් ගැනය. තමා බැලීමට එළිවුණු විගස පැමිණෙන කරෝලිස් අද වෙනදට වඩා ප්‍රමාද යයි ඔහුට සිතිණ. එහෙත් එය අද වෙනදට වඩා කලින් ඔහුට ඇහැ ඇරුණ නිසාද?

නො එසේ නම් තමා තුළ වූ වූවමනාවේ බලවත්කම නිසා දැයි ඔහුට කිව නොහැක.

ඔහු ඉස්තෝප්පුවේ ඒ මේ අත ඇවිදින්නට විය. ඉස්තෝප්පුවෙහි එක් පැත්තක වූ බුරු ඇඳක් යට, වක ගසාගත් කඳින් යුතුව බල්ලෙක් නිද සිටියේය. බුරු ඇඳ රෙද්දෙහි පැල්ලම් ද ඉරී ගිය තැන් කීපයක්ද ඇත. කලු පැහැති කුරුම්භියෙක් ඉස්සරහ බිත්තිය අසල 'රූං රූං' ගාමින් කරකැවෙයි. ඌ ගෙට ඇතුල්වන්ට ඇත්තේ පෙර දින රාත්‍රි විය යුතු යයි ඌ දෙස බැලූ ඔහුට සිතිණ.

පසුගිය ජීවිතය ගැන සලකා බලන තමාට දැන් එදෙස බැලිය හැක්කේ දුකින් මිස සතුටකින් නොවෙතියි ඉස්තෝප්පුවෙහි වූ දුබල හාන්සි පුටුවක දිගා වූ ඔහු තමාටම කියාගත්තේය. දැන් ජීවිතයේ බලාපොරොත්තු වලින් යුතු කාලය අවසාන වී ගොස් ඉවරය. ඔහුගේ ගත මෙන් ම සිත ද පසුගිය අවුරුදු කීපය තුළ වූ විවිධ විපර්යාසයන් උදසීනත්වයෙන් ඉවසා සිටීම නිසා අව් වැසි ආදියෙන් පීඩා ලබන දිරාපත් ගෙයක ස්වරූපය ගෙන තිබේ. එහෙත් ඒ විපර්යාසයන් හා ඇති වූ දුක් කම්කටොලු ආදිය තමාට නොදැනුනේ ඇයි? එය තමා සිය ජීවිතය එකම ක්‍රියා මාර්ගයක බැඳ තිබූ නිසාද? ශරීරය මෙන් ම සිත ද ඒ ක්‍රියාමාර්ගයෙහි බැඳී තිබෙන්නට ඇත. මෙසේ ජීවිතය ගෙවන්නකු තුළ අවට ලෝකය නොපෙනෙන්නාක් මෙන් ම එදෙස උදසීනත්වයෙන් යුතුව බැලීමට ද පුරුදු වේ. තමා මෙන් ම තමා අවටැති ගස් කොලන් ද පසුගිය අවුරුදු කීපය තුළ බිඳකුදු වෙනස් වූ

බවක් ඔහුට කිව නොහැක. උදයෙහි එළිවීමට පැය දෙක තුනකට පමණ පෙර හැමද ඇහැ ඇරෙන ඔහුට ඉන්පසු නින්ද නොයයි. කාමරයේ මේසය උඩ කුඩා චිම්නි ලාම්පුව දල්වේ. චිම්නියෙහි උඩ කොටසෙහි බෙහෙවින් දලි බැඳී තිබේ. කල්පනාවේ වැටෙන ඔහුට මේ ඈ දේ ගැනද සිහිවේ. ඔහු තුළ ඇතිවන සිතුම් පැතුම් විවිධය. එහෙත් ඒවා සියල්ලක් ම ආත්ම වශයෙන් එකම රටාවක් මත ගොඩ නැඟූ ඒවා වේ. එදින තමාට ඇති පාඩම් ගැනද ඔහුට සිහිවන්නේ ඉබේටය. පසුගිය දින නැවැත්වූ තැන ගැන මෙන් ම මෙදින පටන් ගත යුතු තැන ගැන ද ඔහුට හොඳට මතක ය.

"නයිල් ගඟ අප්‍රිකාවේ මැද කොටසින් පටන්ගෙන කෙමෙන් පළල්ව ගොස් රතු මුහුදට ඇද වැටේ. ලෝකයේ ප්‍රථම ශිෂ්ටාචාරය ඇති වූයේ නයිල් ගඟ අසලය. එහි වූ මිනිස්සු ගඟෙන් වතුර ගෙන ගොවිතැන් කළහ. ලෝකයේ ඉතාම දිග ගඟ නයිල් ගඟයි."

මේ සියල්ල ඔහුගේ සිත තුළ රැව් දෙන්නේ නිතැතිනි. අවුරුදු ගණනක් ලත් ආශ්‍රය නිසා ඒවා ඔහුගේ සිත තුළ ලබා ඇත්තේ නාම රූප දෙකෙන් යුතු ජීවයක් ය. මෙසේ විවිධ කල්පනාවේ යෙදුන ඔහුට බොහෝ විට තමාගේ මරණය ගැනද සිහිවිය. එදින ඉස්කෝලය වසා තබනු ඇත. සුදු ඇඳගත් ළමයි කොඩි ආදිය රැගෙන පෙරහරින් යනු ඇත. තමාගේ ගෝලයින් විසින් පත්‍රයට යවන ලද විස්තරයක් එදින මුල් පිටේ පළවීමට බැරි නැත. ඔහුගේ සිත තුළ රැව් දුන්නේ මෙවැනි එකාකාර දෙයය.

උදයෙහි පාසැලට යාම පිණිස පිටත් වූ ඔහුගේ දෙනෙත් ඇදගත්තේ එකම දේවල්ය. ගල් බොරළු මතු වූ පාර දෙපැත්තෙහි සිට කථා කළේ ද සිනහවූයේ ද එකම මුහුණු ය.

"මහත්මයා අද වෙනදට වඩා කලින් වගෙ" යි කිසිවකු ඔහුගෙන් ඇසුවේ ඇසීමට වෙන කිසිවක් නොවූ බැවිනි.

"නෑ වෙනද වේලාවමයි. දැන් උදෙන් ඉර පායනවා." මෙය ඔහු විසින් අවුරුදු ගණනක් තමාගෙන් අසන ලද ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරක් පමණකි. ඇතැම් විටක ඔහු මොවුන් සමඟ කථා කළේ තමාගේ ගෝලයන් ගැනය.

"පියසේනට ගණිතය වැඩිය බැහැ. ගෙදෙද්දී වක්කරය පාඩම් කරවන්න ඕන. ළඟදී ගණිතය අනිවාර්ය විෂයක් වේවි."

මෙසේ කී විට ඇතැම් ගැමියෙකු ඔහු දෙස බැලුවේ කෘතඥතා පූර්වක බැල්මකිනි.

මග දෙපස වූ ඇතැම් පැරණි ගෝලයෙක් ඔහු එනු දැක පසෙකට වී හිසෙහි වූ ලේන්සුව අතට ගෙන බැගෑපත් සිනහවක් පෑවේය.

"මහත්තයා දැන් හුඟක් නාකි වෙලා."

"නෑ දැන් හුඟක් වැඩ වැඩියි. දැන් අලුතෙන් නොයෙක් දේවල් උගන්වන්න තියෙනවා. වැඩ දැන් හුඟක් අමාරුයි. ජෝතිපාලගේ පැමිණීම හොඳ නැහැ"

ඉස්කෝලයෙහිදී ද ඔහු කීවේ ද සිතුවේ ද එක ලෙසමය. කුමක් වුවද ඔහු එකම උදාසීනත්වයෙන් සැලකුවේය. හැම දිනයෙකහිම ඔහු සිය ගැඹුරු කටහඬ විහිදුවා එකම දෙය එකම තාලයෙන් කීවේය.

"සමසීතෝෂ්ණ කාලගුණයකින් යුත් මධ්‍යධරණී මුහුද අවට පලතුරු ගස් හොඳින් වැවේ. ඒ අවට මිනිස්සු පලතුරු වැවීමෙන් ජීවත් වන්නෝය. එහි දේශගුණය පලතුරු වැවීමට ඉතා යෝග්‍ය ය. මධ්‍යධරණී මුහුද අවට ඇති රටවලින් ගෙන්වනු ලබන පලතුරු ඔබ දක ඇතැයි සිතමි."

මෙලෙස දවසින් බාගයක් පමණ ඉස්කෝලයෙහි ගතකිරීමෙන් පසු ආපසු පැමිණෙන ඔහු ඇදිරි වැටෙන තුරුද කාලය ගත කළේ මේ ආකාරයෙනි. ඉස්තෝප්පුවෙහි හැම දිනම වාඩිවෙන හාන්සි පුටුවෙහි වැතුරුණු ඔහු පත්‍රයෙහි එක් අකුරක් අත් නොහැර බැලුවේය. මෙසේ ගතවන ඇතැම් දිනයක සවස්වීමටත් පළමු අහස අඳුරු කඩක පැහැය උදුරා ගනී. දෙතොල් වියළවමින් පැවති හිරු රැස්හි චණ්ඩ භාවය හදිසියේම නැති වෙයි. මොහොතකින් මහ හඩින් වසින්නට පටන් ගනී. වේගයෙන් විසිරෙන වැසි බිඳු 'කිස් 'කිස්' යයි හඬ නගමින් ඉස්තෝප්පුවෙහි ඉස්සරහ පඩියත් හාන්සි පුටුව අසල කවුළුවත් මත ඇද වැටෙයි. වැසි බිඳු ඇද වැටෙනු දනුනු ඔහු සෙමෙන් නැගිට පුටුව අන් තැනකට ඇද යළිත් දිගා වෙයි. 'ඔහොම තමයි. මේ දවස්වල අකාල වැහි තියෙන්නට ඕනෑ.' ඔහු අලසකමින් යුතුව සියල්ල සැලකුවේය.

මෙසේ එක ලෙස සිතීම හෝ ජීවත්වීම මෙතෙක් ඔහුට හිරිහැරයක් ලෙස නොසිතුනේ තමා එයින් ලැබූ ආස්වාදයක් නිසා විය යුතු යයි යළිත් පුටුවෙන් නැගිට ඉස්තෝප්පුවෙහි සක්මන් කරන්නට වූ ඔහුට සිතිණ. ඔහුගේ සිත පෙර කිසි කලෙක නොසිදු වූ ලෙස පැහැරී තිබේ. මතු කිසි දවසක ද එය මෙලෙස පැහැරෙතියි ඔහුට සිතිය නොහැක. වාතයෙහි වෙනද නොමැති සිසිල් බවක් ඇති කරමින් සීතල සුළඟක් හමයි. බිත්තිය අසල ඉහළ පහළ යමින් සිටි කුරුමිණියා තවමත් එලෙසම පියාඹයි. වාතයෙහි සීතලය ඉවසාගත නොහැක්කා සේ ලැග සිටි බල්ලා කීප විටක් කෙඳිරි ගෑවේය.

ඉස්තෝප්පුවෙහි ඒ මේ අත ගමන් කළ ඔහු යළිත් කල්පනා කරන්නට විය. අවුරුදු විසි ගණනක් මෙසේ ජීවිතය ගෙන ගිය ඔහු තුළ තමා අවටැති දේ කෙරෙහි ඇති වූයේ තද ඇල්මකි. ඔහු පාසැලෙහි වූ ළමයකු හට තැලුව ද පසුව ඒ ගැන දුක්විය. ඇතැම් දිනක ඔහු එසේ තැලුම් කා හඬන දරුවකුගේ හිස අත ගා සැනසුවේය. තමාට මෙවැනි එකාකාර ජීවිතයක ඇති නිසරු බව පිළිබඳ හැඟීම මෙතෙක් ඇති නොවූයේ ඒ සිතෙහි වූ තද ඇල්ම නිසා යයි දැන් ඔහුට සිතෙයි. ඔහු තුළ වූ ඒ ඇල්ම සෑම දෙයක් කෙරෙහි මෙන්ම තම නිවස ද අවට ද කෙරෙහි පැතුරුණක් විය. ඔහු කාලය විසින් කඩා බිඳ දමන ලද බිත්ති වලින් යුතු සිය නිවස දෙස ද බැලුවේ ඒ ඇල්මෙන් යුතුවය. මිදුලෙහි බඳින ලද තාප්පය පසුගිය කාලය තුළ වූ දෙදරුම්, විනාශ වීම් නිසා ගරා වැටී තිබේ. දියසෙවලින් වැසී ගිය ගල් පැදුරු එහි තැනින්

තැන වල් පැලෑටි වැඩී ගෙන එයි. මිදුලෙහි වැඩුණු මුල් පැදී ගිය වතුසුද්ද ගස් කීපය පසුගිය අවුරුදු කීපය තුළ අව් වැසි සුළඟින් පීඩා විඳිමින් ජීවත් වෙයි. ඔහු ඒ සියල්ල කෙරෙහි අනුකම්පා කෙළේය. ඔහු ඒ සියල්ල මනැසින් ස්පර්ශ කොළේය. ඇතැම් නින්ද නොයන රාත්‍රියක ඔහු සිහිනෙන් දුටුවේද ඒ සියල්ලය. ඉස්කෝලයෙහි පිණි බැමෙන් තෙත් වූ පැල්ලම් සහිත බිත්ති ද ගේට්ටු ද ඔහු දුටුවේය. ඇතැම් දිනයක, අහස කළු වී මහ හඬින් වසින්නට පටන් ගනියි. අවට වාතයෙහි නිශ්චලතාවයක් පවතී. බංකුවක් මත වාඩි වූ ළමයෙක් ගණන් බැරි නිසා අඬමින් සිටියි. ඔහුගේ ඇඩීම කොයි වේලාවේ නවතී දැයි කිව නොහැක. දිරා ගිය බිත්තිද වහලද දෙදරා ගොස් ඇද වැටෙයි. එවැනි මොහොතක ඔහු ශෝකයෙන් කම්පිත වෙමින් අවදි වෙයි. තමා මෙන්ම ඔවුන්ද උදාසීනත්වයෙන් යුතු ජීවිතයක් ගත කරතියි ඔහු සිතුවේය.

පුටුව අසල වූ කවුලුවෙහි පඩිය මත දෙ අත් දඩු රැඳවූ ඔහු යළිත් පාර දෙස බැලුවේය. පාරෙහි කරෝලිස් හෝ අන් කිසිවකු නොමැත, වාතයෙහි වැසි වැටීමට පෙර ඇතිවන සුළු සීතල බවක් තිබේ. ඊයේ රෑ වැහි වැටීම නිසා කවුළු පඩිය තෙත් බා ඇත. මිදුලෙහි තාප්ප කනුවක් මතවූ බිඳුනු බෝතලයකද ඊයේ වැටුණු වැහි ජලය එක්වී තිබේ. අඩිය පමණක් ඉතිරි වූ එය එතනට ආවේ කෙලෙසද? එය එහි තබන්නට ඇත්තේ බොහෝ කලකට පෙර විය යුතු යයි මෙවර එදෙස බැලූ ඔහුට සිතිණ. මිදුලෙහි වැස්සෙන් සේදී ගිය ලකුණු රැඳී තිබේ.

ඇත කිසිවකු එනු දුටු ඔහු දෙ අත් දඬු මැත් කොට ඕනෑකමින් එදෙස බැලුවේය. එය කරෝලිස් ය. වෙනද මෙන් මුළු උඩුකය වැසෙන සේ පොරවන ලද සාළුවකින් සැරසුණු කරෝලිස් දුටු ඔහු තුළ වූ උනන්දුව දියුණු විය.

"මොකද වෙනදට වැඩිය පරක්කු වෙලා. දත් දත් ඒය කියල මං හිත හිතා හිටියා" යි කරෝලිස් ඉස්තෝප්පුවට ගොඩනැගීමටත් පෙර ඔහු කීවේය.

මෙසේ උදේ හවස තමා සමඟ කා බී ජීවත් වන කරෝලිස් සමඟ ඔහු ආශ්‍රයට වැටුණේ මීට අවුරුදු ගණනකට පෙරය. නෑයකු මෙන් තමාගේ දුක සැප දෙකෙහිම පිහිටවුණු කරෝලිස් තමා මෙන් ම උදසීනත්වයෙන් යුතුව ජීවිතය ගතකිරීමට පුරුදු වූ එකෙකියි ඔහුට බොහෝ විට සිතිණ. තමන් දෙදෙන මෙසේ මිත්‍රයන් මෙන් කල් ගෙවන්නේ ජීවිතයේ එකම පක්ෂයක් වැළඳ ගත්තවුන් නිසා විය හැක.

"වැහි අඳුර නිසා දවල් වුණා දැනුණේ නැහැ. මොකෝ අද ස්කෝලෙ යන්නෙ නැද්ද?"

"නැහැ"

"මොකෝ අද සෙනසුරාද ද?"

"නැහැ" යි ඔහු පිළිතුරු දුන්නේ මදක් ආයාසයෙනි. ඔහුගේ කට හඩ මදක් වෙව්ලුවේය. "මම ලියුමක් අරිනවා"

"මගේ ඉගැන්වීම හොඳ නැතිලු. දැන් අලුත් ක්‍රමවලට උගන්වන්න මට දනෙන්නේ නැතෙයි ඊයේ පරීක්ෂක මහත්තයා කිව්වා"

"ඊයේ විභාග මහත්තයා ආවාද?" යි ඔහුගේ මුහුණ දෙස මෙතෙක් බලා සිටි කරෝලිස් ඇසීය. ඔහු කථා කරන්නේ බලවත් හැඟීමක් මැඩලීමට තැත් කරමින් බව කරෝලිස්ට නොරහසකි. ඔහුගේ තොල් සහ ඇස් බැම හැඟීමෙන් ආකුල වූ කලක මෙන් සෙලවෙයි. යටගිලි ඔහුගේ මුහුණෙහි හා දෙ ඇසෙහි ද චංචල වූ ස්වභාවයක් ඇත.

"ඔව් ඇවිත් කිව්වා මට පරණ විධියට මිසක් අලුත් විධියට කිසි දෙයක් කරන්න බැරිය කියා. භූගෝල ඉතිහාස පාඩම් කටපාඩම් කරවල වැඩක් නැතිලු. මම කරලා තියෙන්නේ අවුරුදු ගණනක් තිස්සේ ළමයින්ගේ ජීවිත නාස්ති කිරීමක්ලු"

හැඟීමෙන් වියවුල් වූ ඔහුගේ මුහුණ දැකීමෙන් මෙවර කරෝලිස් තුළ ඇති වූයේ විමතියකි. තමා ඔහු තුළ මෙවැනි ස්වභාවයක් කිසිවිටක දැක නැත. ඔහු කථා කළේ තම සිතෙහි හටගත් දැඩි ව්‍යාකුලතාවයක් සෙමෙන් සෙමෙන් පිටකරන්නාක් මෙනි.

දෙදෙනම කථාවෙන් තොරව නිශ්චලව සිටියහ. කරෝලිස්ට කිසිවක් කීමට වුවමනා වූ නමුදු නිශ්ශබ්දතාවය ඔහුට එසේ කිරීමට ඉඩ නුදුන්නේය. බිත්තිය අසල පියාඹමින් සිට කුරුම්ිණියා තවම එලෙසම උඩ පහත යයි. බල්ලා කීප විටක් කෙඳිරි ගෑවේය.

''ඒකට මගේ ගෝලයො වෙලා හිටිය අය දුන් හුඟක් ලොක්කො වෙලා ඉන්නවා. ඇයි කරෝලිස් උඹත් දන්නවා නේද?'' යි මෙතෙක් පැවති නිශ්චලතාවය බිඳිමින් ඔහු යළිත් කථා කෙළේය.

''ඔව්'' කරෝලිස් පිළිතුරු දුන්නේ සිහින් හඬිනි.

''අර වැල්ලියද්ද මහත්තය මගෙන් ඉගෙන ගත්තෙ. දුන් ඒ මහත්තයා කච්චේරියෙ ලියන මහත්තැන් කෙනෙක්ලු''

''ඇයි විජේතුංග ලොකු මහත්තයාගෙ පුතත් මගේ ගෝලයෙක්. දුන් ඒ මහත්තයා පොත් ලියනවා. . . ඉතින් මගේ ඉගැන්වීම නරක් වෙන්නෙ කොහොමද?''

''ඔව් මහත්තයගෙ ගෝලයො වෙච්ච අය දුන් හුඟක් ලොක්කො වෙලා ඉන්නවා'' යි කරෝලිස් කීවේ නිශ්චලව සිටීම නුසුදුසු යයි හැඟී ගිය බැවිනි.

නෑ මම ළමයින්ගේ ජීවිත නාස්ති කරලලු. මම ඊයේ හැන්දවේ ලියුමක් ලිව්වා. තවත් ළමයින්ගේ ජීවිත නාස්ති කරන්න බැහැ.''

කථාවෙන් තොරව මොහොතක් ඒ මේ අත ගමන් කළ ඔහු කාමරය දෙසට ගියේය. ඔහුගේ මුහුණ බෙහෙවින් රතු පැහැගැන්වී තිබේ. එහි එවැනි පෙනුමක් තිබිය හැකි යයි කිසිවකුට සිතීමටද නොහැකිය.

කාමරයෙන් එළියට පැමිණි ඔහු ලියුම ගෙනවුත් කරෝලිස් අත තැබිය.

''මේක ගොහින් ලොකු මහත්තයට දෙන්න ඕන. මම මීට පස්සෙ යන්නෙ නැහැ.''

ලියුම රැගත් කරෝලිස් නොපෙනී යන තුරු ද ඔහු ඉස්තෝප්පුවෙහි ඒ මේ අත නො ඉවසිල්ලෙන් ගමන් කෙළේය.

මෙතෙක් කෑ ගසමින් සිටි කුරුමිණියා දැන් බිත්තිය මත නිශ්චලව ලැග සිටියි. අඳුරු පැහැගත් අහස සුළඟින් ආකූල වන්නට විය. වැසි බිඳු කීපයක් 'කීස් කීස්' යන හඬින් තරප්පුවත් ඉස්තෝප්පුවත් මත ඇද වැටිණ. ක්‍රමයෙන් පතිත වන වැසි බිඳුවල හඬ අවට නිශ්ශබ්දතාවය මැඩගෙන පැන නගියි. සීතලය ඉවසා ගත නොහැක්කාසේ ලැග සිටි බල්ලා තව වරක් කෙඳිරි ගෑවේය.

# 3

# දවිත් අයියා

**ද**විත් අයියා අපේ ගෙදර නැවතීමට පැමිණියේ කවද දැයි මට කිව නොහැක. එහෙත් එය බොහෝ කලකට පෙර විය යුතු යයි මම සිතමි. මට මතක දා සිට දවිත් අයියා මඳකුදු වෙනස්වී යයි මට නොසිතේ. ඔහුගේ කෙස්ගසක්වත් වැඩියෙන් පැහුණ දැයි මම නොදනිමි. ඔහු අපේ පවුලේ කෙනෙකු නොවන බවද මා දැනගත්තේ ඉස්කෝලයට යෑමට පටන් ගත් පසුවය. දවිත් අයියා අපේ ගෙදර වූ වැඩවලින් එකක් නියම වශයෙන් කළේ යයි මට කිව නොහැක. ඔහු බොහෝවිට අපේ බක්කි කරත්තය දක්කුවේය.

ගෙදර සිට හැතැප්ම කාලක් පමණ දුරින් වූ පාසැලට නංගීත් මාත් ගියේ බක්කි කරත්තයෙනි. අප දෙදෙන පස්සෙන්ද දවිත් අයියා ඉස්සරහින්ද වාඩිවී, උදේ හවස, කරත්ත යෑමෙන් ගල් මතුවී වල ගැසුණු පාර දිගේ බක්කි කරත්තය 'ඩොක්' 'ඩොක්' ගා ගිය අයුරු මට දැනුදු සිහිකළ හැක.

හිරු රැසින් මලානික වූ කඳු මැදින් වැටුණු පාර දිගේ දහවල් පාසැලෙන් සෙමෙන් එනවිට 'වරි සුද්දෝ' කියා දවිත් අයියා කරත්තය දක්කුවේ පාලු නිදිගන්වන

සුළු ගීතයක සුන්දරත්වය හඟවමිනැයි දැන් මට සිතේ. ඔහුගේ රළුවෙන් තොර හඬ වියලි වාතය හා එක් වීමෙන් ඇතිවන පාළු දුක්මුසු භාවය දැනුදු මට සිහිකල හැකි යයි සිතමි. දවිත් අයියා ඉඳහිට දුම්කොළ ගැනීමට හන්දිය අසල කරත්තය නැවැත්වූ විට අපට සීනි බෝල ගෙනත් දුන්නේය.

දවිත් අයියාට අන් කිසිවකු නොසිටි බව මම එකලද දැන සිටියෙමි. ඔහුට දුවක් සිටි මුත්, ඇ කලකට පෙර මියගිය බව මම අම්මාගෙන් දැන ගතිමි. දවිත් අයියා අපේ ගෙදරට නැවතීමට පැමිණියේ ඊට පසුවය.

මෙසේ පාසැලට ගොස් ආපසු පැමිණි එක්තරා දිනක දවහල් කෑමෙන් පසු මම ඉස්තෝප්පුවට වී පොතකවූ පින්තූර දෙස බලමින් සිටියෙමි. ඉස්තෝප්පුවේ එක් පැත්තක තාත්තාගේ කාමරය වෙයි. එහි තාත්තාත් අම්මාත් කථාකරමින් සිටිය බව මට පෙනිණ. ඔවුන් කථාකළ දෙයට මම ඇහුම්කම් නුදුන්නෙමි. එහෙත් ඔවුන් කී දෙයින් සමහරක් මට ඇසිණ.

"ඕක ගත්ත ඇත්තේ දවිත් අයියාද කියලත් මට විශ්වාස නැහැ" යි අම්මා වරක් උස් හඬින් කියනු මට ඇසිණ. අම්මා තාත්තාට ළං වී තවත් කිසිවක් කීමුත් මට එය නෑසුනේය.

"මොන බොරුද . . . ඒක වෙන්නට බැහැ" යි තාත්තා ඉක්බිතිව කීවේය.

"කියන්න බැහැ . . . මට නම් විශ්වාස නැහැ" යි අම්මා යළිත් කියනු මට ඇසිණ.

මම ඔවුන්ගේ කථාවට කන් යොමා අසා සිටියෙමි. ඔවුන් කථා කරන්නේ ඊයේ නැති වූ අම්මාගේ වළල්ල ගැන බව මට වැටහිණ.

ඊට පෙර දින හවස අම්මාත්, නංගීත් මමත් පන්සලට ගියෙමු. පන්සලට ගොස් ආපසු පැමිණි අම්මා ඇඳ පැළඳ සිටි මාලයත් වළලුත් ගලවා මුහුණ සෝද ගැනීමට ගියාය. ගමනක් ගොස් ආපසු පැමිණි විගස ඇඳ සිටි බඩු ගලවා කුඩා පෙට්ටියේ දමා අල්මාරියේ තැන්පත් කිරීම අම්මාගේ සිරිතය. බඩු තැන්පත් කිරීමට සූදනම් වූ ඇ එක් වළල්ලක් නැතැයි කීවාය. නංගීත් මමත් එවිට මිදුලෙහිවූ මල් වගයක් කඩමින් සිටියෙමු. අම්මා උස් හඬින් කිසිවක් කියනු ඇසී අපි ගෙට දුවගෙන ආවෙමු. ඉන්පසු අපි තිදෙනා ම වළල්ල සෙවුවෙමු. ඊ වනතුරු සෙවූ නමුත් අපට වළල්ල සොයාගත නොහැකි විය. ඊ වූ පසු නංගිත් මාත් වළල්ල සෙවීම නතර කෙළෙමු.

අම්මා කථා කර ඉවරවීමට පෙර දවිත් අයියා වත්ත පහළ සිට එනු මට පෙනිණ. අම්මා, තාත්තා සිටි කාමරය උඩ සිට මිදුල පහළ මිදුලෙන් වෙන් කරන තාප්පයට මුහුණලා, පිහිටා ඇත්තේය. කාමරයෙහි විශාල කවුළුව ඇර තිබුණ නිසා තරප්පු පේළියෙන් ගොඩනගින දවිත් අයියාට ඔහුගේ කථාව ඇසෙන්නට ඇතැයි මට සිතිණ. දවිත් අයියා ඉස්තෝප්පුවට ගොඩවෙනු දුටු අම්මා සාලය දෙසට යනු මට පෙනිණ.

සවස හේවතුර බී යහලුවකුත් සමඟ මම සෙල්ලම් කිරීමට ගියෙමි. අප සෙල්ලම් කළේ ගෙයි ඉදිරිපසවූ පොල් ඔවිටට යාබදවූ තණ පිටියෙහිය. දවිත් අයියා ඒ අසලවූ ඉඩමක කිසිවක් කරමින් සිටින බව මට පෙනිණ. ඔහු පාත්තියක් උදළුගාන බව මම පසුව දැක්කෙමි. සෙල්ලම් කරන අතර මම දවිත් අයියා දෙස ඉඳහිට බැලුවෙමි. වරක් ඔහු උදළු මිටට හේත්තු කොටගත් නිකටින් යුතුව කිසිවක් දෙස බලා සිටිනු මට පෙනිණ. ඔහු එලෙස බොහෝ වේලා සිටිනු මම දැක්කෙමි.

මුහුණ සෝද ගැනීමෙන් පසු මම වෙනද මෙන් මල් කැඩීමට ඇල අද්දරට ගියෙමි. ඇල අද්දර එදෙසට ඇලවූ දෙමට ගසක් වසා ඝනව වැඩී විශාල රුක්අත්තන පඳුරක් වෙයි. එහි හැම දිනම බොහෝ සේ මල් පිපී ඇත. අතුපතර විහිදගත් දෙමට ගස නිසා ඒ අවට පාළු අඳුරු බවක් සවස් කල තිබේ. ඇතැම් දිනයන්හි එය මා තුළ බියක්ද ඇතිකරන සුළුය.

රුක්අත්තන පඳුරට ළංව උස්ව වැඩී මලක් කැඩීමට අත එසවූ මට ඉන් ඔබ්බෙහි වූ කිසිවෙක් පෙනිණ. දවිත් අයියා එහි කුමක් කරත් දැයි වටහාගත නොහැකිවූ මම ඕනෑකමින් එදෙස බැලුවෙමි. එකිනෙකට ළංව වැඩුණු රුක්අත්තන වැල් නිසා දවිත් අයියාට මා නොපෙනෙයි. ඇලකණ්ඩියෙහි වාඩිවී සිටි දවිත් අයියාගේ දෙකකුල් ඇලෙහි වතුර දෙසට දිගුකොට තිබුණේය. ඔහුගේ දෙඇස ඇලෙහි එහා ඉවුර දෙසට යොමුවී තිබිණ. ඔහු කිසියම් දෙයක්

ගැන කල්පනා කරතියි මට එවේලේ සිතිණ. රතු පැහැති හිරුරැස් සෙමෙන් ගලන දියකඳත්, දවිත් අයියා වසා පැතිරෙන්නට විය. මලානික හිරුරැස් නිසා මට ඔහුගේ මුහුණ පෙරට වඩා පැහැදිලිව පෙනේ. ක්‍රමයෙන් ඇල දෙසට අත දිගුකොට ගත් ඔහුගේ දෙනෙත් විශාල වන්නට විය. එපමණක්ද නොව ඒවා හිරුඑළියෙන් දිලිසෙන බවද මට පෙනිණ. මොහොතකින් මෙනෙක් දස පුරා සිටි කඳුළු බිඳු දෙකම්මුල් දිගේ ඇද වැටෙණු මම දුක්කෙමි. දවිත් අයියා මහත් මහත් ශෝකයෙන් හඬන බව මට පෙනිණ.

මම සෙමින් ඇත්වී ගේ දෙසට ගියෙමි. මා තුළ මහත් ශෝකී භාවයක් ඇතිවිය. දතින් මුහුණ වසාගෙන හඬනගා ඇඩීමට මට සිතිණ. සැදෑ අඳුරෙහි සෙමෙන් නොපෙනී යන දවිත් අයියා දෙස මම යලිත් ඔනැකමින් බැලුවෙමි.

මා, ඔහු දුටු අන්තිම වර එයය.

# 4

# බයිසිකලය

"සියද්‍රේරිස් බයිසිකලයක් අරගෙන වගෙයි" යි පාලම අසල වූ කිසිවකු ඔහු පාලම ළඟ වූ කඩ පිළට ගොඩවෙනු දැක කීවේ නළල රැළි ගන්වා සිනහ මුහුණින් යුතුව එදෙස බැලීමෙන් පසුවය. එවැන්නකුගේ දෙනෙතෙහි විස්මය මෙන්ම උපහාසාත්මක සිනහවක්ද විය.

"ඔව් දැන් දවස් හතරකට පහකට ඉස්සෙල්ලා ගත්තා. මං හිතුවට වැඩිය ලාබෙට ලැබුණා" යි එවැනි විටක ඔහු කීවේ-තමා පළමුවර එදෙස බලන්නාක් මෙන් විස්මයෙන් යුතුව බලමින් සිනහවෙන් ඉතිරෙන මුහුණිනි. ඔහුගේ කටහඬෙහි එවැනි වේලාවල ආඩම්බර ගතියක් වී යයි කිසිවකුට සිතෙනු ඇත.

"හැබෑටම උඹට කීයක් විතර ගියාද?" යි එසේ කථාවට වැටෙන එකකු ඔහුගෙන් ඇතැම් විටක අසයි.

එවිට ඔහුගේ ස්වභාවයෙන් කුඩා දෙනෙත් තවත් කුඩාවෙයි. ඒවා දීප්තියෙන් දිලිසෙන්නට පටන් ගනී. ඔහු මඳක් කල්පනාකාරීව සිට ඇද පැද උත්තර

දෙන්නේ ඒ සියල්ල ගැන මතක් වීම ඔහුගේ සිතට ප්‍රීතිය ගෙන දෙන කරුණක් නිසා විය හැක.

"මේකට සෑහෙන ගණනක් ගියා . . . ටිකක් ඔය පේන්ට් එක තරක් වුණාට පැදීම . . . අනික් ඒවා එහෙම බොහොම හොඳයි."

"එහෙනම් රුපියල් හතලිහක් විතර වෙන්න ඇති . . . පිටින් නම් වැඩි ඔපයක් නැහැ."

"ඔව් එච්චර විතර ගියා" යි කී ඔහු නිශ්ශබ්ද වෙයි. කෙසේ වුවද තමා සමඟ පසුව කී කියමන ඔහුගේ සිත නො ගතියි.

"පිට ඔපෙත් මොන වැඩක්ද මම කොහොමත් ඉන්නෙ මේකෙ අලුත් පේන්ට් එකක් ගාලා අලුතෙන් කැලි දමන්න" යි ඉක්බිතිව පිළිතුරු දෙන ඔහු කඩය ඇතුළෙන් ගෙනා සිගරැට් ටින් එකෙහි වූ තෙල් ලාම්පුවට වත් කරයි.

"හා, උඹට මොකෝ රෑ වුණාට බයිසිකල් එකෙන් යන්න බැරිය" යි ඔහු මෙසේ කරනු දුටු කඩය ඇතුළෙහි වූ කිසිවකු කියන්නේ හඬනගා සිනහවෙමිනි. ඔවුන් සියල්ලම තමන් උපහාසයට ලක්කරමින් මෙන් සලකනු ලැබීම ගැන සියදේරිස් කිසිවිටක නොතැකුවේය. ගෙදරින් පිටදී තෝන්ජලයකු වූ ඔහුට බොහෝ දෙන මෙසේ සැලකුවේ ඔහු තුළ සහජයෙන්ම වූ දුර්වලකමක් නිසා විය හැක. එළලු පැහැති මුහුණක් හා දුඹුරු පැහැති හිසකේ ඇති ඔහු වයසින් අවුරුදු තිස් පහක් පමණ නමුදු, එතරම් වයසක් ගිය කෙනෙකු ලෙස

නොපෙනෙයි. ඔහු දෙස බැලූ කිසිවකුට එසේ නොපෙනෙන්නේ, වයසට නොගැලපෙන බැගෑපත් පෙණුමක් ඔහුගේ මුහුණෙහි වූ බැවිනැයි සිතමි. ඔහුගේ මුහුණෙහි මෙන්ම කට හඬෙහිද ඒ බැගෑපත් බව මැනවින් දක්නට ලැබිණ. තමාට වඩා උසස් එකකු හා කථා කරන විට ඔහු ඉඳහිට නවත්වමින්ද සෙමෙන්ද එක්තරා බිය ගතියකින්ද යුතුව කථා කෙළේය.

තමා කියන දෙයෙහි තමාට පවා විශ්වාසයක් නැතැයි යන අදහස ඔහුගේ කථාව ඇසූවකුට නිතැතින්ම සිතේ. මේ බැගෑපත් බව ඔහුට සහජයෙන්ම ආ දෙයක්ද නැත්නම් බොහෝ කලක් අනුන් යටතෙහි වැඩ කිරීම නිසා ලැබූ එකක් දැයි කීම පහසු නොවේ. ඔහු පසුගිය අවුරුදු කීපය තුළ කළේ අනුන්ගේ රබර් වත්තක් බලා ගැනීමය. අක්කර දහයක් පමණ වූ එහි රබර් කිරි කැපීම මෙන්ම වෙන නොයෙක් කටයුතු කිරීමටද ඔහුට සිදුවිය. රබර් ගස් තවම සම්පූර්ණයෙන් වැඩී නැති බැවින් තව කල් යනතුරු කන්දෙහි වල් පැලැටි සුද්ධ කිරීම, ගල් වැටි දැමීම ආදී නොයෙක් වැඩ ඇතැයි ද ඊට තමාගේ මුළු ජීවිතයම ගෙවෙනු ඇතැයිද ඔහු ඇතැම් මොහොතක කල්පනා කෙළේය. උදේ සිට හවස් වනතුරු වැඩ කළද එහි වැඩ සම්පූර්ණයෙන් නිම නොවන්නේ තමාත් තමාගේ බිරිඳත් පමණක් එහි වැඩ කරන නිසා විය යුතු යයි ද ඔහුට සිතිණ. ඔහු සිය පවුල හා ජීවත් වූයේ කන්ද පාමුල වූ මැටියෙන් සාදන ලද කුඩා ගෙයෙහිය. එය පාරෙන් මඳක් ගොඩට වන සේ සෑදුවකි. එහෙත් එහි ගෙමිදුලෙහි මෙහා කොනට පැමිණි විට පාරත් එය

වරෙක ඇල අද්දරින්ද වරෙක වෙල් අද්දරින්ද දිව යන සැටිත් බලාගත හැක. සියදෝරිස් ගෙයි පිටුපස වූ කත්දෙහි වැඩ වේලාසනින් නිමකොට පැමිණි ඇතැම් සැන්දෑවක ගෙමිදුල ඒ කොණෙහි පාර දෙසට ඇල වී තිබුණු පොල් කඳ මත වාඩිවී සිය දරුවන් සුරතල් කෙළේය. එය පුදුම ලෙස නැවුණු පොල් ගසකි. එහි මුල කොටස අඩි කීපයක් යනතුරු පොළව හා සමාන්තරව වැඩී තිබුණේය. ඉන් පසුව එය අහස දෙසට වැඩී තිබුණේය. පොල් කඳ මත වාඩිවී සිටි ඔහු, දරුවන්ගෙන් බාලයා උකුලට ගෙන ඈත් සිට එන පාරද, ඇතැම් විටක ඈත වූ වෙල් හා කඳු ගැන ද කථා කෙළේය.

"ආන්න පුතා අන්න අර බලන්න, අන්න කවුද පාර දිගේ එනවා. අන්න දැක්කයි අර බයිසිකලෙන් එන්නෙ. අර ලොකු රෙදි මිටියකුත් පිටිපස්සේ බැඳගෙන එන්නෙ . . . ආන්න බලන්න.

එවිට උකුලෙහි වූ කුඩා දරුවා ඔහුගේ පපුවට පයක් ගසා ඔහුගේ නැහැයෙන් හෝ උඩු තොලෙන් ඇද්දේය. ඇතැම් විටක කටේ අත දැම්මේය.

"ආන්න බලන්න බයිසිකලේ රෝද කරකැවෙන හැටි ආන්න රූං ගාල වංගුව කැපුව. ඕන්න . . . ඕන්න . . . දැන් ඒවි රූංගාලා කඩේ ගාවට."

දරුවා ඔහු කී සියල්ල තේරුම් ගත්තාක් මෙන් උකුල උඩ නටමින් කෙළ බේරයි.

"අර බලන්න පුතා තාත්තටත් ඒ වගේ බයිසිකලයක් ඇත්නම් පුතත් වාඩි කරවගෙන රූං"

කියල යනවනෝයි'' කී ඔහු දරුවා උස්සා සිය මුහුණට ළං කොට ''ඌ-ඌ-ඌ-ඌ'' කියමින් සිනහෙමින් හිස සලයි.

තමා බයිසිකලයක් ගත යුතු යයි සියදෝරිස් අධිෂ්ඨාන කළේ දනට අවුරුදු ගණනකට පෙරය. බයිසිකලයක් නොමැතිව තම වැඩ කටයුතු කිරීම ඉතාමත් අපහසු යයිද, එය අත්‍යාවශ්‍යක යයිද ඔහු බොහෝ විට තමාටම අවධාරණයෙන් කියා ගත්තේය. බයිසිකලයක් නොමැතිව සිය වැඩ කටයුතු කෙසේ කළ හැකිද? ඔහුට උදේට සැතැප්ම දෙක තුනක් ඇවිදීමට තිබේ. ගෙයි පිටිපස වූ කන්දෙහි රබර් කිරි එකතු කිරීමෙන් පසු ඔහු ඉක්බිතිව හැතැප්ම තුනක් පමණ පයින්ම යා යුතුය. හැම දිනම ගෙදරින් පිටවන විට උදේ අට පසුවී ඉවරය. එවිට පාරට සම්පූර්ණයෙන් අව්ව වැටී තිබේ. උදය නිසා තවම පාර රත්වී නැත. එහෙත් අහසට ඇරුණු පෙදෙසෙහි හිරු රැස් චණ්ඩ ලෙස විහිදී ඇත. මුවාවක් වනසේ ඒ පැත්තෙහි ගසක් කොලක් නොමැතිවීම ගැන බොහෝ විට සියදෝරිස් දෙස් තැගුවේය. ''ගස් ටිකක් වවල තිබුණ නම් එහෙම පිටින්ම වැහෙනව නේ. මිනිසුන්ට කිසිදෙයක් තේරෙන්නේ නැහැ.'' එහෙත් දුෂ්කර, එහි සිට වැඩ ඉවර වූ පසු දවල් දෙළහට පමණ ආපසු ඒමය. එවිට පාර රත් කළ යවටක් සේ රත්ය. හිරු රැස් නිසා අවට දිලිසෙයි. ඉරෙහි චණ්ඩ භාවය නිසා අවට වියළී ඇත. බැනියමකින් හෝ අත්කිසිවකින් ආවරණය නොවූ උඩු කයද, හිසද, දෙපාද එක ලෙස පිච්චෙයි. ඔහු ඇතැම් විටක තවත් දෙපා පිච්චෙනු ඉවසා ගත නොහැකිව දුඹුරු පැහැති

තණකොළ ගොම්ම දිගේ ගමන් කෙළේය. මෙසේ දුකසේ ජීවත්වීමට වඩා ගෙදර නිරාහාරව සිටීම යහෙකැයි ඔහුට එසේ ගමන් කරන බොහෝ වේලාවල සිතිණ. මෙසේ ගමන් කරන විට කිසිවකු බයිසිකලයකින් හෝ අන්කිසිවකින් යනු ඔහුට පෙනේ. ඔහු ඒ දෙස බැලුවේ ඊර්ෂ්‍යාවෙන් බව ඔවුනටද තමාටද ශාප කර ගනිමිනි. ඒ සියල්ල තමා අඩි දහයක් යැමටද පෙර අතුරුදහන් වෙයි. බයිසිකලයේ රෝද වේගයෙන් කරකැවී ගොස් අතුරුදහන්වන සැටි! එහි සිටින්නාට අව්වෙහි චණ්ඩ භාවය බිඳකුදු නොදැනෙනු ඇත. ඒ සියල්ල සුළඟෙහි ඉවත් වූවාක් මෙන් නොපෙනී යයි. ඔහුගේ ඊර්ෂ්‍යාව එයින් දියුණු විය. තමාට බයිසිකලයක් ගත හැක්කේ කවදාද? ඊට තව බොහෝ කල් යනු ඇත. ඊට අඩු ගණනේ රුපියල් හතලිස් පහක් පමණවත් අවශ්‍යවනු ඇත. එහෙත් එතෙක් ඉතිරි කිරීමට කෙතරම් කල්යාද? ඉතිරි කරනු වෙනුවට ඔහුට බොහෝ මාස වල වැඩියෙන් රුපියල් දෙක තුනක් පමණ ණයට ගැනීමට සිදුවේ. එයද ගත යුත්තේ දවස් තුන හතරක් නිකම් වැඩ කොට කනපින්දම් කීමෙන් පසුවය. එහෙත් එසේ මුදල් එකතු කොට බයිසිකලයක් ගත් විට තමා එයින් යන සැටි ගැන ඔහු කල්පනා කෙළේය. එවිට කකුල් රිදීමක්වත්, අව්වෙහි පිච්චීමක්වත්, කාලය නාස්තිවීමක්වත් සිදු නොවේ. එවිට තමන්ද අන් අය මෙන් කිසිවක් ගැන නොතකා එය පැදයනු ඇත. දැන් අව්වෙන් වේලෙන මුළු පෙදෙසම පසු කිරීමට එවිට යන්නේ මිනිත්තු කීපයක් පමණකි. බයිසිකලය වංගුවල නැමෙමින්ද, සුළඟ මෙන් වේගයෙන්ද නොපෙනී යනු ඇත. එහි

රෝද දෙස බලා සිටින්නකුට ඒවා පොළොවට උඩින් යන්නාක් මෙන් පෙනෙණු ඇත. ඒ ගැන සිහි කරන ඔහුගේ සිත ප්‍රීතියෙන් නටයි. ඔහුට දුක්මුසු වර්තමානයද එවිට අමතක වේ. තමා බයිසිකලයක් පැදගෙන 'රූං' කියා යන සැටිද ඈත සිට බලන්නකුට පුළුමයක් මෙන් එය වංගු ආදියෙහි නැමෙමින් නිමේෂයකින් නැතිවී යන සැටිද ඔහු තමාගේ සිතෙහි මවා ගත්තේය. වේගයෙන් යන ඇතැම් මොහොතක දූවිල්ල වලාකඩක් මෙන් එය වසා පැතිරෙනු ඇත. ඒ සියල්ල කෙතරම් රමණීයද?

රුක්මලගොඩ සිට බොහෝ වෙහෙස වී පැමිණි ඇතැම් දිනයක ඔහු සිහිනෙන් දුටුවේද මෙවැනි දේය. බොහෝ හිරිහැර විඳිමින් සිටින තමාට හදිසියේ බයිසිකලයක් හමුවී තිබෙනු ඔහු දුටුවේය. එය වඩා අලුත් බයිසිකලයක් නොවුවද එහි ගානලද පාට නිසා එහි දිස්නයක් තිබුණේය. එහි ලේබලයේ වූ සිංහයාගේ රූපය රත්රන් පාටින් බැබලුණේය. එහි රතු පාට සීට් එකක් විය. රතු පාට සීට් එක ඔහුගේ සිත ගත්තේය. බයිසිකල් සීට් සියල්ලම රතු පාට විය යුතු යයිද ඔහු කල්පනා කෙළේය. ඉක්බිතිව තමා එහි නැඟී යන සැටිද ඔහු දුටුවේය. බයිසිකලය පාරෙහි පමණක් නොව කඳු අතරද වෙල් වලද, වරක් ඒ දණ්ඩක් දිගේද වේගයෙන් ගියේය. මෙසේ යන අතර එය හදිසියේ නැවතුනාක් මෙන් ඔහුට දැනිණ. කවුදෝ පිටුපසින් වේගයෙන් තල්ලු කෙළේය. බයිසිකලයද ඔහුද 'දඩස්' ගා ඇලට ඇද වැටෙයි. එවැනි මොහොතක ඔහු බියෙන් හා ශෝකයෙන් කම්පිත වෙමින් නැගිට්ටේය. එහෙත් ඒ ගැන ඔහු පසු දිනද සන්තෝෂ විය.

උදේ නැගිට තේ වතුර බොන අතර ඔහු ඒ ගැන සිය බිරිඳ සමඟද කීවේය.

"දන්නවද, මම ඊයෙ හීනෙන් දැක්ක බයිසිකලයකින් යනව. ඒක හොඳ අගේ ඇති අලුත් බයිසිකලයක්. ඒකට . . . පස්සෙ මමත් ඒකත් එක්කම ඇලට වැටුණා."

ඔහුගේ බිරිඳ ඔහුගේ සිතෙහි ස්වරූපය නොහඳුනයි.

"ඔය සෙම් කෝප වෙලා වෙන්න ඇති. වතුර පෙනෙන්නේ සෙම් කෝප වුණාම. ටික දවසකටවත් හේනේ වැඩ නවත්වන්න හොඳයි. මුළු දවසෙම ගිනිකට්ටේට පායලා හැන්දෑවට වහිනවා. ඕකෙන් තමයි සෙම් කෝප වෙන්නෙ. මාත් දැක්ක පෙරේද හැන්දෑවෙ වතුර ගලලා තියෙනවා."

ඔහුගේ බිරිඳ ඔහු හා කුලුපග බවෙන් යුතුව කථා කරන්නේ කලාතුරකිනි. සාමාන්‍යයෙන් ඔහු සිය බිරිඳට සැලකුවේ තද පරුෂ ගතියෙනි. "ඈ ගෙදර වැඩ කිරීමටද දරුවන් හැදීමටද නොදත් මෝඩ ගැහැනියකැ" යි ඔහු බොහෝ විට කීවේය. තමා ගෙදර එනතුරු කෑම නුයා හෝ දරුවන්ට කෑම නොදී තිබුණ ඇතැම් දවසක ඔහු ඈට තැලුවේය. තමාට ඈ බයෙන් හා ගෞරවයෙන් යුතුව සලකතියි යන හැඟුම ඔහුගේ ප්‍රීතියට කරුණක් විය. "ඈට හුඟක් මෝඩ ගති ඇත්තේ ඈ ඉස්කෝලයේ තුන් වෙනි ප්‍රමාණය දක්වා ඉගෙන ගත් බැවිනි. ඉස්කෝලේ ඉගෙන ගැනීම ගෑනුන්ට හොඳ නැහැ" යි ඔහු බොහෝ

විට සිතුවේය. එසේ වුවද ඈ ඔහු සිතන තරම් මෝඩ තැනැත්තියක් නොවූවාය.

"ඒක නොවෙයි මට බයිසිකලයක් ලැබෙන්න වෙන්න ඇති. මං දූනට මාසෙකට විතර ඉස්සෙල්ලත් හීනෙන් දක්කා. ලේල්වල බයිසිකලයක් විකුණන්න තියෙනවලූ" යි ඔහු කීවේ තමාගේ බිරිඳට තමා කියන කිසිවක් නොතේරෙතියි යන හැඟුමෙන් යුතුවය.

"බයිසිකලයක් ගන්න ඕන වුණාට කොහේද සල්ලි තියෙන්නේ. මම ඊයේ රුපියල් දෙකක් ණයට ඉල්ල ගෙනයි සමුපකාරෙන් බඩු ගෙනාවෙ. ගිය මාසයේ මද්දුම මහත්තයගෙන් ගත්තු ණයත් දෙන්න තියෙනව."

"උඹට මක්කටද සල්ලි වගක්. මට තව රුපියල් දහයක් තියෙනව නම් බයිසිකලේ ගන්න හැටි මං දන්නවා" යි ඔහු පිළිතුරු වශයෙන් අහංකාර ලීලාවෙන් කීවේය. ඉක්බිතිව ඔහු කිසිවක් මතක් වූවාක් මෙන් ගේ තුළට ගියේය. එය කුඩා ගෙයක් වුවද එහි කාමරයක් තිබේ. එය මැද සාලය දෙකට වෙන් කිරීමෙන් සාදන ලද්දකි. ඊට තිබුණේ එක් ජනේලයකි. කෝටු හරහට හා දිගට බැඳීමෙන් ආවරණය කොට තිබීම නිසා ඉන් ඇතුළු වූයේ ස්වල්ප ආලෝකයකි. ජනේලය අසල බිත්තියෙහි කුප්පියක් ගසා තිබුණේය. ඊට උඩින් අවුරුදු ගණනක දූලි බැඳී තිබිණ. බයිසිකලය ගත්විට එය මෙහි තැබිය යුතු යයි ඔහු මුල සිටම කල්පනා කෙළේය. ඊට ඉබ්බෙක් දැමිය හැකි දෙරක් වූ බැවින් එය ඊට ඉතා සුදුසුය. සාලයෙහි අනික් කොටසෙහි ඇඳක් තබා තිබුණේය. ඇඳෙහි තැන්දට රෙද්දක් දමා නොතිබුණේය. එහි රාත්‍රියට

ඔහුගේ පටියද, ලේන්සුවද, දරුවන්ගේ රෙදි කැබලිද දමනු ලැබේ. ඇඳ අසල වූ මේසයට උඩින් බිත්තියෙහි කවි කොලයක්ද, නූල් බෝලයක මුද්දරයක්ද, පාට ඡන්ද කොලයක්ද අලවා තිබුණේය. එහි "යූ. ඒ. කුලතිලක වෙද රාළහාමිට ඡන්දය දෙමු" යි රතු අකුරින් ලියා තිබුණේය. මේසය අසලට පැමිණි ඔහු ඉනෙහි සඟවා තිබූ යතුර ගෙන එය ඇරියේය. වට පිට බැලූ ඔහු එහි තබන ලද සිගරැට් ටින් එක සෙමෙන් එළියට ගෙන ගනින්නට විය. එහි ඇත්තේ අවුරුදු දෙක තුනක පමණ සිට ඔහු ඉතා අමාරුවෙන් එකතු කරන ලද මුදල්ය. හැම දිනම පඩි හම්බවූ දිනයෙහි ඔහු එහි ශත පනහේ කාසියක් හෝ රුපියලක් දම්මේය. එය එහි වූ බව බිරිඳ හෝ අන් කිසිවකු නොදනියි. බිරිඳ එය දනිත් නම් කිසිවිටක එය ඉතිරි කරගත නොහැකි යයිද ඔහු සිතුවේය. සෙමෙන් වට පිට බලමින් ගණන් කළ ඔහු ඒවා යළිත් එහි දමා ලාච්චුව යතුරු ලා වැසුවේය. "රුපියල් තිස්පහයි. තව රුපියල් දහයක් ඇත්නම්" යි කාමරයෙන් එළියට පැමිණි ඔහු තමාටම කියා ගත්තේය.

මෙසේ මාස කීපයක් ගතවන්නට ඇත.

පසුගිය ඔක්තෝම්බර් මාසයේ රබර් මිල බෙහෙවින් නැග්ගේය. ඒ මාසයේ අන්තිමෙහි සියදෝරිස්ට රුපියල් දහයක් වැඩියෙන් ලැබුණේය. එදින ඔහු ගෙදර ආවේ ඊට පෙර කිසිවිටක නොවූ ප්‍රීතියකින්ද යුතුවය. ගෙදර එන අතර ඔහු කඩයටද ගොඩ නැග්ගේය. තමාගේ අභිමතාර්ථය ඉෂ්ටවන අයුරු දකින ඔහුගේ සිත ප්‍රීතියෙන් උදම් වෙයි. ඔහුට ඒ ගැන කඩයෙහිදී කථා කිරීමට උවමනා විය. එහෙත්

කිසිවකු ඒ ගැන යමක් සිතතියි බියෙන් ඔහු එය කෙළින්ම නොකීවේය.

"හෙට ලේල්වලට යන බස් එකක් තියෙන්නේ කීයටද?" යි ඔහු කඩයෙහි වූවකුගෙන් ඇසුවේය.

"කොයි වෙලාවටත් තියෙනවා . . . මොකෝ යන්නද?"

"ඔව් මට උවමනාවක් තියෙනවා . . ."

ඉක්බිතිව ඔහු එහි වූ කිසිවකු සමඟ පොදුවේ බයිසිකල් ගැන කථා කරන්නට විය.

"මහත්තය හැබෑටම රැලේද හොඳම බයිසිකල් ජාතිය?"

"ඔව්" එහි වූ තැනැත්තා නුවමනාවෙන් මෙන් පිළිතුරු දුන්නේය.

"ඔව් මාත් හිතනවා ඔය හම්බර් හර්කියුලිස් බයිසිකල් වලට වැඩිය පරණ උනත් රැලේ බයිසිකලය හොඳයි. මහත්මයා ළඟ තියෙන්නේ රැලේ බයිසිකලයක්ද?"

"නැහැ ඒක හම්බර් එකක්. රැලේ එක ඊට වැඩිය හොඳයි."

එයින් ඔහුගේ සිත ප්‍රීතියෙන් ඉපිලෙන්නට විය. රැලේ බයිසිකල් ගමේ වැඩි දෙනෙකුටද නොමැත. එයින් අලුත් එකක් ඇත්තේ තමාගේ ස්වාමියාට පමණකි. එය ගත් අලුත බොහෝ දෙන ඒ ගැන

කථා කළ සැටි ඔහුට මතකය. තමාට රැලේ බයිසිකලයක් ගත්විට ඇතැම් විටක ඒ ගැන කථා කිරීමටද බැරි නැත.

එදින ගෙදර ගිය ඔහු බිරිඳ සමහද කථා කළේ උඩහු ලීලාවෙනි. ඔහු ගෙදර වූ කාමරයේ පැත්තක් අස් කෙළේය. කොතක වූ පැදුරු සහ බංකුවක්ද පැත්තකින් තැබූ ඔහු එහි බයිසිකලයක් තැබීමට සෑහෙන ඉඩ තරම් තුන් හතර ගුණයක් එළි කළේය. එදින රාත්‍රි නිදගැනීමට ගිය ඔහු බිරිඳට තමාට උදයෙන් අවදි කරන ලෙසද කීවේය.

"හෙට උදෙන්ම කුද්දන්න ඕන. මට ලේල්වලට යන්න තියෙනවා."

"මොකටද?" යි මඳක් නිශ්ශබ්දව සිටි බිරිඳ ඇසුවාය.

"ලොකු උවමනාවකට . . . මට වරද්දන්නෙ නැතුව කුද්දන්න ඕන. හෙට උදේට වහින එකක් නැහැ නේද?"

"කියන්න බැහැ. මේ දවස්වල උදේට ටික ටික වහිනවා. අද හවස මීදුම තිබුණ නිසා මීට පස්සෙ ඉඳල මගේ හිතේ පායන්න පටන් ගනීවි" යි බිරිඳ පිළිතුරු දුන්නාය. ඔහු වෙනදට වඩා සෞම්‍ය ලෙස කථා කරනු ඇසීම ඇගේ පුදුමයට හේතු විය.

"මෙයාට වැඩියෙන් රුපියල් දහයක් හම්බ වුණාය කියන්නේ ඇත්තද? අද මද්දුම මහත්මයා එහෙම කිව්වා"

"මොන බොරුද; ඒක බොරුවක්."

"එහෙම නම් මම කියන්න හිටියේ හෙට ලේල්වල ඉඳල එනකොට මටත් හැට්ටෙක රෙදි ගේන්නය කියන්න. මේ දරුවන්ටත් අඳින්න මොකවත් නැහැ. මම ඊයේ රුක්මල්ගොඩින් පරණ පොඩි ගවුමක් ඉල්ලගෙන ආව."

පසුදින උදයෙහි ලේල්වල ගිය ඔහු ආපසු පැමිණියේ බයිසිකලයෙහි. එවිට ඔහුගේ සිතෙහිවූ ප්‍රීතිය කෙතරම්ද යත් ඔහු කීපවිටක් ඇදගෙන වැටීමටද ගියේය. වෙනද පයින් පසු කළ පෙදෙස් පසු කළ ඔහු එදෙස බැලුවේ මහත් අහංකාර ලීලාවෙනි.

පෙරට යන සැටිද, ඇතැම් වංගුවකදී එය තමා සමඟම නිමේෂයකින් ඇලවී යන සැටිද දකින ඔහුගේ සිත ප්‍රීතියෙන් වියරු වැටෙන්නාක් මෙන් වෙයි. ඇතැම් තැනකදී ඔහු හිස කෙළින් කොට බයිසිකලය වේගයෙන් පැද්දේය. ඔහු කඩමණ්ඩිය පසුකර යනු දුටු කීපදෙනෙක් සිනහවෙමින් ඇතැම් දේ කීහ. "අද සියදෝරිස්ට නින්ද යාවී" යි ඉන් ඇතැමෙකු කියනු ඔහුට ඇසිණ.

එදින ඔහු ගෙදර එනවිට සවස්වීමට ආසන්න වී තිබුණේය. ඔහු බයිසිකලයෙන් එනු දුටු ඔහුගේ බිරිඳ පුදුම වූවාය.

"මෙයා උදෙන්ම ගියේ බයිසිකලයක් ගේන්නද" යි ඈ දැස ඇදහිය නොහැක්කාක් මෙන් ඇසුවාය.

"ඔව් මෙන්න උඹටත් හැට්ට රෙද්දක් ගෙනාවා" යි ඔහු මෙතෙක් ඉනෙහි ගසාගෙන තිබුණු රෙදි කැබෙල්ල ගෙන ඇට දුන්නාය. වහා බිඳයන කිසිවක් ගන්නාක් මෙන් එය ගත් ඇගේ මුහුණ ප්‍රීතියෙන් ඉතිරෙන්නට විය. "මං අද ලේනහාතු වගයක් හැදුවා" යි ඉක්බිතිව ඇ කීවේ ඔහුගේ සිත තවත් සතුටු කරන අටියෙනි. ඔහු ලේනහාතු කෑමට ප්‍රිය බව ඇ දනී. තේවතුර බීමටත් පෙර සියදෝරිස් බයිසිකලය මිදුලට ගෙන පිසදමන්නට විය. ඇඳිරි වැටෙන තුරු ඔහු එය සෙමෙන්ද සීරුවෙන්ද පිස දැම්මේය. ඔහුගේ දරුවෝ ඔහු අසලට වී එදෙස බලා සිටියහ. බයිසිකල් රෝදයෙහි ස්පෝක් ඇල්ලීමට ඉන් එකකු තැත් කළ විට ඔහු වහා වළකාලුවේය.

"උඹලා මේව අල්ලන්නේ නැතුව බලාගෙන ඉඳපල්ලා." පැය දෙකක් පමණ පිසද ඉවර කළ පසු ඔහු එය රැගෙන ගොස් කාමරයෙහි තැබුවේය.

එදින රෑ නින්දට ගිය පසුද ඔහු කථා කළේ ඒ ගැනය. අඳුරෙහි වැතිරී සිටි ඔහුගේ බිරිඳ ඔහුගේ කථාව අසා සිටියාය.

"රුලේ බයිසිකල් වැඩිය නැහැ. මේ ගමේ වුණත් තියෙන්නේ බොහොම ටිකයි" යි ඔහු ඇට සියල්ල විස්තර කිරීමට මෙන් කීවේය. ඔහුගේ කටහඬෙහි මොලොක් ගතියක් තිබුණේය. එය ඇ තුළවූ ප්‍රීතිය දියුණු කරන සුළු විය.

"අර දෙවරගෙදර තියෙන්නේ මොන බයිසිකලයක් ද?" යි ඇ ඔහුගෙන් ඇසුවාය.

"ඒක රෑලේ බයිසිකලයක් නෙවෙයි. වෙන මොකක්ද එකක්"

"ඒකෙ ඉස්සරහ කණ්ණාඩිය තියෙන්නෙ මොකටද? අපේ බයිසිකලයේ එහෙම නැහැ නේද?

ඈ බයිසිකල් ගැන කථා කරනු ඇසීම ඔහුගේ ප්‍රීතියට හේතු විය.

ඈ ඒතරම් මෝඩ නැතැයිද ඔහුට සිතුනේය. ඔහු ඒ සියල්ලද බයිසිකල් ගැන විස්තරයක්ද ඈට කීවාය.

"මේක මම හේනට යනකොට කාමරේ දල දෙර වහල යතුරු දලයි යන්නේ. ඒකට පුංචි ඇයින්ට කිට්ටුවෙන්න දෙන්න එපා."

"ඒ මොකෝ?"

"වෙන මොකටවත් නෙවෙයි, උන් ඒව මේව නැතිකරල හූරලා දව්. ඒ වගේම කවුරුත් ඉල්ලුවොත් කියන්න ඕන ඒක නරක් වෙලා කාමරේට දලය කියල. එහෙම නැතුව බේරෙන්න බැහැ." ඈ ඔහු කී සියල්ල අනුමත කළාය.

ඉන්පසු සියදෝරිස් ජීවිතයේ ප්‍රධාන කාර්යය ලෙස සැලකුවේ තමාගේ බයිසිකලය රැක බලා ගැනීමය. ඔහු එය දිනපතා දෙතුන් වරක් පිස දැම්මේය. ගමනක් ගොස් ආපසු පැමිණි විගස ඔහු පළමුවෙන්ම කළේ එය පිසද කාමරයේ තැබීමය. ඔහු තම දරුවනට ඊට අතගැසීමට හෝ ඉඩ නුදුන්නේය.

වරක් ඔහුට රුක්මලගොඩදී බයිසිකල් පිළිබඳ කොල වගයක් සම්බවිය. ඒවා එහි වූ රැලේ බයිසිකලය ගතිද්දී දෙන ලද පත්‍රිකාය. ඔහු ඒ සියල්ල ගෙදර ගෙනාවේය. ඔහුගේ ගෙදර ඉස්සරහ බිත්තියේ සීවලි පින්තූරයක්ද, ජෝර්ජ් රජ්ජුරුවන්ගේ හා බිසොවගේ ක්ලැන්ඩරයකින් කපාගත් පිංතූරයක්ද අලවා තිබේ. ඔහු තමා ගෙනා කොලද ඒ අසලම ඇලවූයේය. ඉන් එකක වූ කොට කලිසමක් හා කමිසයක් වැනි කිසිවක් හැඳගත් තරුණියක් බයිසිකලයක් අල්ලා ගෙන සිටිනු දක්වන රූපය ඔහුගේ සිත ඇදගත්තේය.

කාමරයට යෑමට තම දරුවනට ඉඩ නුදුනද බයිසිකලය ඔවුන්ගෙන් ප්‍රවේසම් කරගත හැකිවූයේ ඉතා අමාරුවෙනි. දිනක් ඔහු දහවල හේනේ සිට ගෙදර පැමිණියේය. එදින ඔහුට බයිසිකලය වූ කාමරය යතුරු දා යෑමට නොහැකි විය. ඔහු ගෙදර එනවිට ඔවුන් සියලු දෙනම බයිසිකල් රෝදය කරකවමින්ද, අඟුරු කැබෙල්ලකින් එහි නොයෙක් දේ අඳිමින්ද සිටියහ. එය දුටු ඔහුගේ කෝපය නිම්හිම් නැති විය. ඔහු වහා ගොස් ඔවුන් ඇදගෙන වුත් කාමරයෙන් දෙව්ට දැම්මේය. ඉක්බිති ඔහු බිරිඳට කථා කෙළේය.

"මම නැති වුණාම උඹට බැරිද මේ කාමරේ දෙර වහල තියන්න. මං නැත්නම් මේකෙ කිසි දෙයක් කෙරෙන්නෙ නැහැ" බිරිඳ කථා නොකර සිටියාය. ඔහුගේ කෝපය දියුණු විය. ඔහු ඈ අසලට පැමිණ ඇගේ බෙල්ලෙන් අල්ලා තල්ලු කෙළේය.

"තොට මේකෙ අගේ තේරෙන්නෙ නැහැ. මං අවුරුදු ගණනක් හම්බුකරල ගත්තු දේ පරිස්සම්

කරන්න තොට ඕනකමක් නැහැ.'' ඔහුගේ කටහඬ කෝපයෙන් දෙදරුම් කෑවේය.

ඉක්බිතිව ඔහු බයිසිකලය සම්පූර්ණයෙන් පිසද කාමරයෙහි දමා දොර අගුළු ලෑවේය.

ඔහු බයිසිකලය පාවිච්චි කළේද හැම දිනම නොවේ. ඇතැම් දිනයක මුළු රාත්‍රියම වැස, පාර බොහෙවින් මඩවෙයි. පාරෙහි තැනින් තැන විශාල මඩ වළවල් සෑදේ. කරත්ත යෑම නිසා සෑදුණු ඇලිවල මඩවතුර එක්වී තිබේ. පාර දෙපසෙහි තණකොළ අසලද දුඹුරු පැහැති මඩ තිසා එරෙයි. එවැනි දිනයෙක ඔහු බයිසිකලය කාමරයෙන් එළියට නොගත්තේය. එදින ඔහු රුක්මලගොඩ ගියේද පයිනි. එසේ යන ඔහු දුටු එකකු ප්‍රශ්න කරන්නේ තමා කාරණය සම්පූර්ණයෙන් නොදන්නා නිසා නොවේ.

''මොකෝ පියදෝරිස් අද පයින්ම!''

''නැහැ, මම බයිසිකලය ගෙදර තියල ආවා.''

''එහෙනම් පැච් එකක් වෙන්න ඇති'' යි කී එසේ ඇසූ තැනැත්තා හඬ නගා සිනහවෙන්නේ තමා සියල්ල දන්නා බව හඟවනු පිණිසය.

කල්යත්ම පියදෝරිස්ට බයිසිකලය පිළිබඳ තම සිතෙහි වූ ඇල්ම දියුණු විය. දන් වෙනද මුළු දවසම යන වැඩට ඔහුට යන්නේ පැය කීපයකි. බයිසිකලයෙහි නැගී වෙනද පයින් පසු කළ පෙදෙස් කුරුල්ලකු මෙන් වේගයෙන් පසු කර යන විට ඔහුගේ සිත ප්‍රීතියෙන් ඉපිලෙයි. ඔහු ඇතැම් මොහොතක තමාට

අයිතිවූ භාග්‍යය ගැන සිහිකර ප්‍රීති විය. ඔහු ඒ ගැන නොයෙක් දේද සිතුවේය. මිනිසුන්ට මේ ජාතියේ වැඩ කරන්නේ ගිය ජාතියේ ඔවුන්ගෙන් ණය ගත් උදවියයි. බයිසිකලයද ගිය ජාතියේ තමාගෙන් විශාල ණයක් ගත්තෙකු විය හැක. ඔහු මේ ගැන වරක් සිය බිරිඳ හා කිව්විට ඈ ඔහු හා වාද කළාය. "බයිසිකලයට ගිය ජාතියේ පණක් තියෙන්නේ කොහොමද?" යි ඈ ඇසුවාය.

"උඹ දන්නේ නැහැ. ගස් ගල් වලටත් පණ තියෙනවා. බුදුහාමුදුරුවෝ හාමුදුරුවන්ට තණකොළ ගහක්වත් කඩන්න එපයි කියල තියෙන්නෙ ඒකයි. අපේ කුඹුරු වතුපිටි වලට පණක් නැත්නම් ඒව අපිට හරිහම්බු කරල දෙන්නේ කොහොමද? ඒවාටත් අපිට වගේ නැති වුණාට පණක් තියෙනවා."

එය තමාගේ භාග්‍යය උදකළේ යයිද ක්‍රමයෙන් සියදෝරිස්ට සිතෙන්නට විය. දැන් ඔහුගේ වතුවල පලදාව වැඩිය. ඔහුගේ කොරටුවෙහි මේ වාරයේ කෙසෙල් කැන් කීපයක් පිට පිට වැටුණේය. ඔහු එළිකළ කොටසෙහි ගොයමද මේ වාරයේ බෙහෙවින් සාරවී තිබේ. දැන් එහි කරල් රන් පැහැ ගැන්වී පොළව දෙසට බරව ඇත.

මෙසේ මාස කීපයක් ගතවී ගියේය.

දැන් රබර් ගස්වල කොළ හැලෙන කාලයයි. කොළ හැලුණු රබර් ගස් පාලු මළානික ගතියකින් යුතුව අහස දෙසට ඇරී තිබේ. රබර් ගස්වලට පෝර දමමින් මුළු දවසම ගෙවන ඔහුට නැග්නවූ අතුරිකිලි

පාලු ගතියකින් යුතුව තිල් පැහැති හිස් අහස පසුබිම්කොට නැගී සිටින සැටි පෙනේ. දවල් කාලයෙහි තදින් පායයි. හවස්වන විට වැහිලිහිණියෝ හඬ දෙති. උදේ සිට සවස් වනතුරු පෝර දමමද, ඉවරකළ හැක්කේ කුඩා කොටසකි. සවස පෝර දමීමෙන් පසු, පසුදින දමීම සඳහා පෝර ගෙනෙනු පිණිස රුක්මලගොඩ යායුතුය.

දිනක් සවස ඔහු පෝර මිටිය බයිසිකලයෙහි බැඳ තබා එය පාර අයිනෙහි නතර කොට කිසියම් උවමනාවක් සඳහා කඩයට ගොඩ නැග්ගේය. බයිසිකලය වූයේ පාර අද්දරය. කඩය තුළ මුදල් වගයක් ගෙවමින් සිටි ඔහුට කිසිවක් 'දඩස්' ගා මහ හඬින් ඇදවැටෙනු ඇසිණ. ඔහු වහා පාර දෙසට දිව්වේය. එය තමාගේ බයිසිකලය විය යුතු යයි ඔහුට අනුමානයෙන් සිතිණ. ඔහුගේ ඇඟ වේගයෙන් ගැහෙන්නට වූවාසේ ඔහුට දනුනේය. පාරෙහි බයිසිකලය පෙනෙන්නට නොවීය. ලොරියක් ඇත වේගයෙන් පාලම පසුකොට යනු පමණක් ඔහුට පෙනිණ. වහා පාලම අසලට පැමිණි බැලූ ඔහුට සිය දෑස ඇදහිය නොහැක්කාක් මෙන් විය. ඔහුගේ දෙඇස වහා විවෘත විය. දෙකම්මුල්හි මස්පිඬු ලේ පැහැ ගැන්විණ. හදවතෙහි ගැස්ම ඉවසිය නොහැකි තරම් වේගවත් විය. ඔහුට ඉබේටම කෑ ගැසිණ. බයිසිකලය වූයේ පාලම යට ඇළෙහිය. සිදුවූයේ කුමක් දයි නොතේරුණාක් මෙන් ඔහු සැලෙන හදවතින් යුතුව එදෙස බලා සිටියේය. ඔහුට සිහි එළවා ගතහැකි වූයේද මෙසේ ස්වල්ප වේලාවක් ගල්ගැසී සිටීමෙන් පසුවය.

එහි අවට වූවෝ ඔහු හා සමඟ එක්ව, ඇලට බැස බයිසිකලය ගොඩගත්හ. එහෙත් එහි ඉතිරි වූයේ කැබලි පමණකි. බයිසිකලයෙහි ඉස්සරහ රෝදය සම්පූර්ණයෙන් නැමී බිඳී ගොස් තිබිණ. පස්ස රෝදය ඇලෙහි කණු අතර පටලැවීම නිසා ගතහැකි වූයේ බොහෝ වේලාවක් ඇදීමෙන් පසුවය. එහි කිසිවක් ඉතිරිවී නොතිබිණ.

කල්පනා විරහිතව මෙන් එදෙස බලා සිටි ඔහු එතන නොරැඳී ගෙදර දෙසට ගියේය. මගදීද අවුල් කල්පනාවේ වැටී සිටි ඔහුට කිසිවක් ගැන සිතිය නොහැකි විය. ඔහුගේ සිතෙහි වූයේ හිස් බවකි. හැඟීමෙන් වියවුල් වූ එය වියරු වැටීමට ආසන්න එකකුගේ මෙන් අරමුණෙන් තොරව වේගයෙන් ක්‍රියා කෙළේය. කථා කිරීම හෝ කල්පනා කිරීම ඔහුට රුචි නොවිය.

ඔහු ගෙදර එනවිට රෑ බෝවීමට බෙහෙවින් ආසන්නවී තිබුණේය. ගෙමිදුලට පැමිණි ඔහු පොල් කඳ මත වාඩිවී අහස දෙසට විහිදූ දෑසින් යුතුව බලා සිටියේය. ඔහුගේ මුහුණෙහි වූ රත් පැහැය ඒ වනවිට වැඩිවී තිබිණ. ඔහු කල්පනා විරහිතව එදෙස බොහෝ වේලා බලා සිටියේය. සැඳෑ අඳුර සෙමෙන් ගෙමිදුල අවටද වසා පැතිරී ගෙන එයි. තද රත් පැහැයට හා දම් පැහැයට හුරුවූ වලාකුල් කීපයක් ඈත පාළු වෙල්යායක් උඩින් පාවෙමින් තිබුණේය.

එදින රාත්‍රී ඔහුට නින්ද නොගියේය. ඔහුගේ බිරිඳ බියෙන් ඔහු හා කථා නොකළාය. වරක් ඈ

ඔහු අස්වැසීමට තැත් කළ විට ඔහු ඇට කෝපයෙන් බැන වැදුණේය. පැය කීපයක් කල්පනා විරහිත වූවාක් මෙන් සිටි ඔහුට ක්‍රමයෙන් සියල්ල ගැන සිහිවන්නට විය. ඒ හා සමහම ඔහු තුළ තද ශෝකයක් ඇති විය. මෙතෙක් ගොළුව සිටි ඔහුගේ සිතට පළමු වරට ශෝකයක් ඇතිවූයේ එවිටය. තමා අවුරුදු කීපයක් දුකසේ වෙහෙස වී ලබාගත් එකම දෙය නැති විය. එයින් තමාගේ ජීවිතයේ වැදගත් කොටසක්ද නැතිවී යැයි ඔහුට සිතිණ. ඔහු දෑස නොපියා අඳුර දෙස බලා සිටියේය. ඔහුගේ සිතෙහි වූ ශෝකය මඩිමින් දැඩි කෝපයක් නැගගෙන එයි. එය ඔහුගේ ඇඟ රත්කරවන සුළුය. 'තමා කෝප විය යුත්තේ කා සමහද? එය කිසිවකු විසින් කරන ලද්දක් නොවේ.' 'එසේ වුවද මේ සියල්ල පිටු පසෙහි, තමාට නොවැටහෙන කිසියම් බියකරු බලයක් විය යුතුයි' ඔහු කෝපයෙන් දෙනෙත් පියාගත්තේය.

පසුදින ඔහු ගෙදරින් බැහැර නොගියේය. එහෙත් ගෙදර සිටීමද ඔහු වෙහෙස කරවන සුළු විය. ඔහුගේ බිරිඳ බිය නිසා ඔහු හා කථා නොකළාය. මුළු දවසම ගෙදර සිටි ඔහු එදින ඇඳිරි වැටෙත්ම ගෙදරින් පිට විය.

එදින ඔහු ආපසු ආවේ මැදියම් රැයද පසුවූ පසුය. මෙතෙක් කිසිදිනක මත්පැන් දෙතොලෙක නොතිබූ ඔහු ඉන්පසු සිහි නැතිවන තුරු බීමට පටන් ගත් බව ගමෙහි ආරංචි විය.

# 5

# මාමාගේ ඉඩම

එදින මා මාතම්පිටට ගියේ අවුරුදු දහනවයකට හෝ විස්සකට පසුවය. ඊට දවස් දෙක තුනකට පමණ පෙර මට මාමා ගාල්ලේ බස් නැවතුම් පොළේදී සමුවිය. කෙසේ හෝ ඉඩ ඇති විටක ඔහු බැලීමට එන්නැයි ඔහු විසින් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටි හෙයිනි මා එද ඔහු බැලීමට යායුතු යයි කල්පනා කළේ.

මෙතරම් දිගු කලක් ඉකුත්වන තුරු මා ඔහු බැලීමට නොගියේ මගේ වරදක් නිසා යයි මම නොසිතමි. කිසිවිටක අපහට වරදක් නොකළ මාමා වැනි කෙනෙකු කෙරෙහිද එහි වරද පැවරිය නොහැක. එය අප අතර ඇති කිසියම් අමනාපයක් නිසා නොව පුරුද්දක් නිසා ඇති වූවක් පමණකැයි මට සිතේ. කුඩා කාලයේ වුවද මා මාමාගේ ගෙදරට ගිය වාර දෙක තුනකට වඩා ගැන මට මතක නැත. එසේ වුවද, මාමා බැලීමට ගිය ඒ වාර දෙක තුන, ඉතා දුර්වල ස්මරණ ශක්තියක් ඇති මා සිත තුළද බෙහෙවින් පැහැදිලි ලෙස පවතී. ඊට හේතුව කුමක් දැයි මට හරිහැටි කිව නොහැක. එය එසේ වන්නේ ඒ ගමන් වලදී සිදුවූ ඇතැම් සිද්ධීන් මගේ ළදරු සිතට

බෙහෙවින් කා වැදී ගිය නිසාද? නොඑසේ නම් ඒවා මට ගමින් දුර ඈත පලාතකට යනු පිණිස ඉඩ ලැබුණු අවස්ථාවන් නිසා දැයි මට නිශ්වය කොට කිව නොහැක.

එකල අප සිටි ගමෙහි සිට මානම්පිටට අම්මාත් තාත්තාත් නංගිත් මාත් තිරික්කලයකින්, පාළු දුඹුරු පැහැති පාරක් දිගේ ගිය සැටි මට දැනුදු මනැසෙහි නහා ගත හැක. අප අපේ ගෙදරින් පිටවූ පසු පාලමක් පසුකොට ගොස් ඉක්බිතිව පිවිසෙන්නේ ගල් මතුවූ ඒ රතු පැහැති පාරටය. රතු දූවිල්ලෙන් වැසුනු තණකොළින් යුතු දෙපසින් සැදි අන්තයක් නොමැත්තා සේ දිවෙන ඒ පාර, හිරු රැසින් තැවෙන වාතයෙන් යුතු ඇතැම් දිනයක මා තුළ පාළු කනස්සලු ස්වභාවයක් ඇති කරවන සුළු විය. තරහවූවන් මෙන් කථාවෙන් තොරව සිටින අප ඒ මේ අත පද්දමින් අලස බවෙන් පෙරලෙන කරත්ත රෝදය වරෙක පාරෙහි වූ වලක ඇද වැටෙයි. වියළි බවෙන් ඒකාකාර සිහිනයක් බවට පෙරළන ලද අප සිත් ඉක්බිතිව පිබිදෙයි. හිරු රැසින් පීඩාවෙමින් මෙසේ දහවල, ගමන් කිරීමෙන් පසු, අප මාමාගේ ගෙදරට ළංවන්නේ දවල් දෙකට හෝ තුනට පමණය. ඉන්පසු තාත්තාත් අම්මාත් මාමා හා අන් අය සමඟ කථා කරන අතර නංගිත් මමත් කුරුඳු පඳුරින් වැසීගිය ඒ වත්තෙහි ඒ මේ අත ඇවිදිමින් කාලය ගත කරමු.

මෙසේ මාමා බැලීමට ගිය හැම විටම ඔහු අපට බෙහෙවින් සැලකූ බව මට මතකය. එහෙත්

අම්මා හෝ තාත්තා මාමාට එතරම් සැලකුහයි මට එකලද නොසිතිණ. මාමා සමඟ කෙසේ වුවද නැන්ද සමඟ අපේ අම්මා ප්‍රීතිමත් කුලුපග ලීලාවකින් කථා කළ බව මට කිව නොහැක. එමෙන්ම නැන්දද ඔවුන් සමඟ කථා කිරීමට වඩා අප සමඟ ගත කිරීමට ප්‍රියවූ බව මම දැන සිටියෙමි. ඇ එසේ කලේ ඔවුන් ඇට සැලකිල්ලක් හෝ දැඩි ඇල්මක් නොදක් වූ බැවින් විය හැක. විශේෂයෙන් මට මෙසේ සිතෙනුයේ මෙසේ ඔවුන් බැලීමට ගිය එක් වතාවකදී සිදුවූ එක් සිද්ධියක් නිසාය. ඒ සිද්ධිය සම්පූර්ණයෙන් මට සිහිකළ නොහැකි වුවද, ඉන් කරුණු කීපයක් මට සිහිකළ හැක.

එදින අප එහි පැමිණියේ එහි වූ සාංඝික දනයක් සඳහාය. දනයෙන් පසු ඔවුන් කථා කලේ, කුඩා අපගේ සිත් ඇද ගන්නා දෙයක් ගැන නොව ඔවුන් ගේ ඉඩකඩම් ගැනය. බොහෝ වේලාවක් කථා කිරීමෙන් පසු අම්මා කෝපයෙන් මෙන් උස්හඬින් කථා කරන්නට වූවාය. ඇ කීවේ කුමක්ද, ඒවා කුමක් ගැනද යනාදිය මට මතක නැති වුවද ඉන් පසු නැන්ද ඉකිබිඳිමින් හැඬූ බව මට මතකය. එදින ගෙදර පැමිණීමෙන් පසු අම්මා තාත්තා සමඟ නැන්දගේ දෙස් කියමින් ඇට බැන්නාය. 'ඒකි හදන්නේ අපේ නම්බුව නැති කෙරුවා වාගේ දේපළත් කඩාගන්න.' නැන්ද වැනි අසරණ එකියක හා අම්මා උරණවී සිටින්නේ කුමක් නිසා දැයි මම නොදත්තෙමි.

ඉන්පසු අපි මාමා බලන්නට නොගියෙමු.

මාමා අපේ අම්මාට වඩා බෙහෙවින් දිළිඳු අඩියක වූ බව මම එකලද දැන සිටියෙමි. ඔහු දිළිඳු වූයේ අන් කිසිවකුගේ වරදක් නිසා නොව සිය උවමනාවෙන්මය. තමාට වඩා පහත් කුලයකින් විවාහ වූයෙන් ඔහුට තම දෙමව්පියන්ගෙන් කිසි වස්තුවක් නොලැබිණ. ඔහු වසන ගෙය වුවද නැන්දගේ පියාගෙන් ලැබුණකි. අම්මා පළමු වරට එහි ගියේද ඔහුගේ විවාහයෙන් අවුරුදු ගණනකට පසු බව මම අම්මාගෙන් දැනගතිමි. මාමා ඇගෙන් නොයෙක් විට උපකාර ඉල්වූ නමුත් ඈ කිසි විටක එසේ නොකළාය. එසේ ඈ උපකාර නොකෙළේ ඔහු විසින් සිය කුලයට කරන ලද කැලලට පළිගැනීමක් වශයෙනැයි මම සිතමි.

මා ගමින් ඈත්ව වැඩිදුර ඉගෙනීම පිණිස කොළඹට ගිය පසුද මාමා ගැන කිසිවක් ඇසුවේ කලාතුරකිනි. නිවාඩුවට ගෙදර පැමිණි ඇතැම් විටක අම්මා ඔහු ගැන සඳහන් කළ මුත් වැඩි යමක් නොකීවාය. මාමා ඉතා දැඩි ආශාවෙන් ධන උපයීමෙහි නියැලී සිටින බවත් ඔහුගේ වැඩිමහල් පුතා උඩරට කඩයක නියුක්ත වී සිටින බවත් දැන ගන්නට ලැබිණ. ඔහු සිය දරුවන්ට තුගැන්වූයේ ධන වියදම් වන බැවිනි.

මා ඉගෙනීම අවසන් කොට කොළඹ රක්ෂාවකට පත් වූ පසු උඩරට රක්ෂාව කළ මාමාගේ වැඩිමල් පුතා හදිසියේ මළ බව මට ආරංචි විය. කලක සිටම අයහපත් ගතියෙන් පසු වූ ඔහු සිය රක්ෂාව අතහැරද

ගමට පැමිණියේය. ඔහු මගේ ඉන් සීප දිනකට පසුවය. ඔහුගේ අවමඟුල සඳහා අම්මාත් තාත්තාත් ගිය මුත් මට එහි යා නොහැකි විය.

මෙවර ඔහු බැලීමට යාම සඳහා පිටත් වූ වේලෙහි සිට අතීතය පිළිබඳ මෙවැනි සිතුවිලි මා තුළ ඇතිවන්නට විය. ඉන් ඇතැම් දේ මා තුළ ලජ්ජාවක්ද ඇති කරවන සුලු විය. දෙමව්පියන් හා නෑයන්ද අතර වූ අමනාපකම් අප විසින් මෙතෙක් කල් අත් නොහැරීමෙන් අප කර ඇත්තේ වරදකැයි යන හැඟුමය මගේ ලජ්ජාවට හේතු වූයේ.

මා ගෙට ඇතුල්වෙත්ම මාමා සිනහවෙමින් මා වෙතට පැමිණියේය. ස්වභාවයෙන් පියකරු ඒ මුහුණෙහි මා දැකීමෙන් ඇතිවූ මහත් ප්‍රීතියක සලකුණු දුටු මමද සන්තෝෂ වීමි.

"පොඩි මහත්තයා ඒය කියා මම හිතුවේ නැහැ" යි ඔහු මා සමඟ ගෙතුළට යමින් කීවේය.

මාමා මට කුඩා කල සිටම ආමන්ත්‍රණය කළේ නැකමින් නොව පොඩි මහත්තයා යනුවෙනි. ඔහු එසේ කළේ තමා අපට වඩා තත්වයෙන් පහත් එකෙකැයි යන හැඟුම නිසා ද එසේ නැත්නම් නැකමින් ආමන්ත්‍රණය කිරීම මා තුරුස්සතියි යන හැඟුම නිසා දැයි මට කිව නොහැක.

"ළඟදී එන්ට පුළුවන් අනික් දවසක් නැති නිසා අදම එන්න සිතුවා" යි මම කීවෙමි.

"පුතේ මේ මාමට හුඟක් වෙහෙස ඇති. මූණ හෝදගන්න වතුර ටිකක් ගෙනැත් තියාපන්" යි ගෙම්දුලෙහි වූ සොලොස් වියෙහි පමණ සිටි ළමයකු අමතා ඔහු කීවේය.

"කෝට් එක ගලවා දලා මූහුණ ටිකක් හෝදගන්න."

වතුර බේසමක් රැගෙනවුත් ගෙම්දුලෙහි වූ කණුවක් මත තැබූ ඔහු දෙස මම ඕනෑකමින් බැලුවෙමි. ගොරෝසු ඉරිවැටුණු රෙද්දකින් යටිකය පමණක් වැසූ ඔහු පංචායුධයක් ඇමුණු නූලකින් සැරසූ සිහින් ගෙලක් ඇත්තෙකි. ඒ ගෙල තියුණු නැහැයකින් යුත් ඔහුගේ මුහුණට කදිම සුරුබුහුටි පෙනුමක් දෙන්නකි.

"පොඩි මහත්තයා අපේ මුනුපුරා අඳුනනවාද? මේ තමයි මගේ ලොකු පුතාගේ වැඩිමලා" යි මාමා මා දෙසට හැරෙමින් තම මුණුපුරා අඳුන්වා දුන්නේය.

ඇඳ සිටි කබාය ඉවත් කොට මුහුණ සෝද ගැනීමට මිදුලට පැමිණ මා වට පිට බැලුවේ, එදින මාමා සමුවූ වේලෙහි ඔහු නොබෝද ගත් බව කී ඉඩම ඒ ළඟ පහත වී දැයි දැනගනු පිණිසය. එහෙත් මගේ නෙතට හසුවූයේ පෙනෙන තෙක් මානයේ සනව වැඩි අතු පතර විහිද ගත් කුරුඳු පඳුරු වලින් සෙවන වූ සම බිමය. ගෙම්දුලෙන් පටන් ගෙන නොනැවතී දිව ගොස් අහසට ඇරෙන ඉදිරිපස බිමෙහි, පසුගිය අවුරුදු කීපය තුළ කිසිදු වෙනසක් නොවී යයි මට සිතිණ.

"මේ පැත්තේ කිසි වෙනසක් වෙලා නැති විදියයි" මම මාමා සමඟ කීවෙමි.

"ඔව් ලොකු වෙනසක් නැහැ. කුරුඳුවල මිල නොනගින කල් මෙහේ වෙනසක් ඇති වෙන්න බැහැ, ඒ වුණත් ඉස්සරට වැඩිය හුණුගාපු ගෙවල් තියෙනවා."

මාමා මා සමඟ කථා කලේ ඉතා සන්තෝෂයෙනි. අවුරුදු ගණනක් දුක් කම්කටොළු සහිත ජීවිතයක් ගත කළ ඔහුගේ මුහුණ මා සිතුවාට වඩා තරුණ ප්‍රීතිමත් සවභාවයෙන් යුක්තවීම මගේ පුදුමයට හේතු විය.

"මාමාගේ කරදර දැන් ඉවරද?" මම ඔහුගෙන් ඇසුවෙමි.

"කරදර නම් ඉවර නෑ. ඒ වුණත් මගේ හිතට දැන්නම් සතුටුයි"

ඉක්බිතිව ඔහු සිය ජීවිතයේ පසුගිය කාලය තුළ වූ නොයෙක් සිදුවීම් ගැන පවසන්නට විය.

ඉස්තෝප්පුවේ තබන ලද වැල්වලින් වියූ ඇඳක වාඩි වූ මම ඔහුගේ කථාවට අලස භාවයෙන් යුතුව කන්යොමා සිටියෙමි. කාමර දෙකකින් හා ඉස්තෝප්පුවකින් යුත් ඒ ගෙය කුඩා වුවද සම බිමකට මුහුණලා සිටින සේ සාදන ලද මනහර එකකි. ඇඳෙහි වාඩිවී ඔහුගේ කථාවට කන්යොමා සිටින මගේ දෙනෙත් හිරු රැසින් දිලිසෙන පඩුවත් පැහැගත්

ගස්කොලින් යුතු ඒකාකාර භූමිය නිසා පීඩා විඳියි. දැඩි උෂ්ණය නිසා දෙතොල්හි මෙන්ම අත් පා හිඳ වියලි ගතියක් දැනේ. මම කීපවිටක් අලස බවෙන් ඈනුම් ඇරියෙමි.

"අපේ ලොකු පුතා නැතිවෙන කොට පොඩි මහත්තයා හිටියේ කොළඹද?

"ඔව්" යි මම කීවෙමි.

"ලොකු පුතා මැරුනේ හදිසියේ" කවදාවත් තුන් හිතකින් හිතූ දෙයක්ය. මෙහාට ගෙනෙන කොටම හොඳ නොවන ලකුණු තිබුණා. මෙහාට ගෙනැල්ල තුන්වෙනි දවසෙහි මැරුනේ. මෙහේ ඉඩ කඩමක් එලිකර ගන්න තිබුණා නම් මම මිනිහව උඩහ යවන්නේ නැහැ.

"ඊළඟ පුතා උපසේන කරගත්තු දේ පොඩි මහත්තයට ආරංචිද?" යි කියමින් මඳ වේලාවක් නිශ්ශබ්දව ශෝකී ස්වභාවයකින් සිටි ඔහු යළිත් කථා කරන්නට විය. ඔහුගේ ශෝකයට හේතුවන්නට ඇත්තේ සිය වැඩිමල් පුතා ගැන සිහිවීම යයි සිතමි. ඔහුගේ යටගිය දෙනෙතට මොහොතකට නැඟුණු කඳුළු බිඳු නැතිවී යන සැටි මට පෙනිණ.

"ඕවා ඔහොම තමයි. එක් එක්කෙනාගේ කරුමය තමයි" යි මම ඔහු අස්වසනු පිණිස කීවෙමි.

"නැ උන්ට ගමේ කන්න ඉන්න තිබුණ නම් ඔහොම වෙන්නෙ නැහැ"

"උපසේන දැන් ඉන්නේ බදුල්ලේ. මෙහෙන් ගෑනියෙක් අරගෙන පැනල ගිහින් දැනට අවුරුද්දක් විතර වෙන්න ආවා. නව ලියුමක්වත් ලැබුණේ නැහැ"

පිඟානක තබන ලද තේ කෝප්පයක් රැගෙන ආ මැදි වියෙහි වූ ස්ත්‍රියක් මට එය පිළිගැන්වූවාය. තේ කෝප්පය ගනිමින්ම මම ඇගේ මුහුණ දෙස බැලුවෙමි. කදිම දෑසකින් හා පිරුණු කම්මුල් වලින් යුත් ඇගේ මුහුණ දුක් කරදර නිසා ලබා ඇත්තේ දඩි හෝ රළු බවක් නොව බැගෑපත් බවකි. දුක් කම්කටොළු නිසා ඇතිවන සලකුනු රැදී ඇත්තේ ඇගේ මුහුණෙහි නොව ඇහපතෙහිය. ඈ මාමාගේ වැඩිමහල් පුතාගේ බිරිඳ විය යුතු යයි මම අනුමාන වශයෙන් සිතුවෙමි.

"දුවේ, මේ තමයි අපේ අක්කගෙ ලොකු පුතා" යි මාමා ඈට මා අඳුන්වා දුන්නේය. "මේකි තමයි මගේ සියලු දුක සැප සොයා බලාගන්නේ"

මා දෙස බැලූ ඈ සිය දත් දෙපල පෙන්නා සිනහ වෙමින් ඈත් වූවාය.

මාමාගේ ජීවිතයේ පසුගිය කාලය තුළ වූ දුක්මුසු සිදුවීම් සියල්ල සිහිකළ මා තුළ හටගත්තේ අනුකම්පාවෙකි. ඔහුගේ වැඩිමහල් පුතාගේ මරණයෙන් පසු ලේලියද තමා සමඟ විසුමට පැමිණියාය. දැන් මාමාට සැප සාත්තු කරන්නේත් ගෙදර වැඩපල කරන්නේත් ඇය. ඉන්පසු ඔහුගේ ඊළඟ පුතා වන උපසේනද ගැහැනියක හා හාදවී ගෙදරින් පැන

ගියේය. ඔහු දත් බදුල්ල අසල ගමක දුකසේ ජීවත් වෙයි. නැන්දද කලක සිට වාත අමාරුවක් සැදී ඇඳට වී සිටියි.

"නැන්දට වියදම් කරන්න මට දැන් සල්ලි නැහැ"

"ඇයි මාමා මුලදී හුඟක් සල්ලි හම්බකරා නේද?" යි මම ඇසුවෙමි.

"ඔව් හම්බුකරා, ණයත් ගත්තා"

"එහෙනම් ඒවා ඔක්කොම වියදම් වුණා ද?"

"තිකරුණේ වියදම් වුණේ නැහැ. ණය ගත්තේ ළඟ තිවුණු සල්ලි මදි හන්ද"

"එහෙනම් මාමා ඉඩම ගත්තේ ඒ එකතු කරපු සල්ලි වලින්ද? යි මම ඔහුගෙන් ඇසුවෙමි. "ඉඩම ගන්න ණයත් වුණා?"

මා ඇසූ ප්‍රශ්නයට ඔහු උත්තර දුන්නේ ටික වේලාවක් නිශ්ශබ්දව සිටීමෙන් පසුවය. ඒ නිශ්ශබ්දතාවයට කුමක් හේතුවී දැයි මම නොදනිමි.

"ඇයි එහෙම ඇසුවේ?"

ඉක්බිතිව මාමා යළිත් කල්පනා කරන්නට විය. ඔහුගේ සිතට නොරිසි කිසිවක් මා අතින් කියවුනි දැයි මම බියවීමි. 'ඉඩම් ගැනීමට ණය වී යයි' යන මා කී දේ ඔහුගේ අමනාපයට හේතු වීද? එහෙත් එය සත්‍යය පමණකි.

"මට ඉඩකඩම් නැති වුණේ පොඩිමහත්තයලා හින්ද නොවෙයි. පොඩිමහත්තයලගෙ අම්මා නම් හිතාගෙන ඉන්නේ මත් එහෙම කල්පනා කරනවාය කියා" යි පැවසූ ඔහුගේ මුහුණෙහි වූයේ අහංකාර ලීලාවකි.

"අනේ මම දන්නෙ නැහැ" යි මම කීවෙමි.

ඔහු එසේ කීවේ ඔහුට ඉඩකඩම් නැති වූයේ අප නිසා යයි යන හැඟීම මා තුළ ඇති කරනු පිණිසද? එසේ නැත්නම් සිය සිතෙහි ඇති ඒ හැඟීම වසා ගනු පිණිසද?

"කොහොම වුණත් මට උවමනා වී තිබුණේ මගේය කියා ඉඩමක්, අඩු ගණනේ මේ පුංචි ඇයො කරදරයක් නැතුව වලලන්න."

"ඒ වුණත් මාමා ටිකක් පහුවෙලා ඉඩම් ගන්න කල්පනා කරානම් හොඳයි. ළමයින්ට තුගත්වා ඉඩම් ගන්න යෑමේ වරද පේන්නේ පස්සේ" යි මම කීවෙමි. මාමාගේ කියමන් මගේ සතුටට හේතු නොවීය.

එහෙත් මෙසේ මොහු විසින් මුළු ජීවිත කාලයක් තුළ වැඩූ කිසියම් ආශාවක් මුදුන්පත් වූ විට එහි දෙස් සෙවීමෙන් මා කළේ වරදකැයි මම ලතවූයෙමි.

"කොහොම වුණත් මාමා තමන්ගේය කියා ඉන්න හිටින්න තැනක් ගත්තු එක හොඳයි. ඒවායේ අගේ පේන්නෙ පස්සෙ" යි මම කීවෙමි.

"පොඩිමහත්තයා ඉඩම දැක්කෙ නැහැ නේද? බොහොම අගේ ඇති පොළොව. මම හිතුවටත් වැඩිය හොඳයි. අපි තව ටිකකින් ගිහින් බලමු. වැඩි දුරක් නැහැ" යි ඔහු තවමත් නොසෙල්වෙන සිය දත් දෙපෙළ පෙන්නා සිනහ මුහුණින් කීය. "වැඩි දුරක් නැහැ. විනාඩි පහකින් යන්න හැකි."

"එහෙනම් දැන්ම යමු. අපිට කන්න එන්න පුළුවන්" යි ඔහුගේ උනන්දුවේ තරම දුටු මම කීවෙමි. ඔහුගේ උනන්දුව මම මුල සිටම ඉවෙන් මෙන් දැන ගතිමි. එමෙන්ම නොනවත්වා කරන ඔහුගේ කථාවට එක තැන හිඳ කන්දීමද මට හිරිහැරයක් විය. අවටැති උණුසුම නිසා දැස හැර වටපිට බැලීමටද නුපුළුවන.

වියළි බව ඉවසා ගත නොහැක්කා සේ ගේ අවට වූ රුහියෝ කැගසන්නට වූහ. මෙසේ එක තැන එක ලෙස සිටීම නිසාදෝ සිතෙහි කාන්සි ගතියක්ද ඇතිවී ගෙන එයි.

ඒ වත්තෙන් නික්මුණු අපි වතු කීපයක් පසු කොට කුඹුරක් දිගේ වැටුණු අඩි පාරක ගමන් කරන්නට වීමු. මඳක් නැන් ගිය ඔහු කඳු ගැටයක බෑවුමෙහි වූ ඉඩමක් දෙසට අත දිගුකොට කථා කරන්නට විය.

"තවත් එහාට ගියාමයි ඉඩමේ තියෙම ලස්සන පෙනෙන්නෙ. මට හැමදම උවමනා වුණේ මේ වගේ ඉඩමක් ගන්න. පොඩිමහත්තයලගෙ වත්තත් මේ වගේ නේද?"

ඉඩමට පැමිණි ඔහු මා සමඟ ඒ මේ අත නොයෙක් දේ විස්තර කරමින් ඇවිදින්නට විය. මට ඒ සියල්ල අමතක වුවද ඒ සෑම දෙයකින්ම හෙළි වූයේ ඔහුගේ සිතෙහි වූ ගර්වය සහිත ප්‍රීතිය යයි සිතමි. එහෙත් ඔහු දුටු සුන්දරත්වය හෝ සරු බව මම එහි නුදුටිමි. එය උස්ව වැඩුණු ගස් කීපයකින් යුත් තැනින් තැන වල් බිහි වූ පාළු ඉඩමකි. එක් පැත්තක අගල දෙසට නැමී සිටින සේ වවන ලද කෙහෙල් පඳුරු කීපයක් නිසා නොවේ නම් එය කිසිවකු විසින් බොහෝ කලකින් එළි පහලි නොකරන ලද එකකැයි කිසිවකුට සිතෙනු ඇත. බෑවුමෙහි එක් පැත්තක ඇදීමට සූදනම් කරන ලද ගෙපලක් තිබේ. එතන ගෙයක් සෑදීමට නම් තව අවුරුදු ගණනක් ගෙපල ඇදීම කළ යුතුය. කඳු බෑවුමෙහි ඉහළ කොටස ගල් බොරළු පෑදීම නිසා රතු පැහැ ගැන්වී තිබේ. හිරුරැස්හි දඩි බව නිසා සියල්ල රන් පැහැයක් ගෙන දිලිසෙයි.

"මේ පැත්තේ හෝදලා යාම නවත්වන්න ගල් වැටි කීපයක් දමන්න ඕන. දැනටත් මම ටිකක් බැඳලා තියෙනවා" යි ඔහු මා සමඟ කීවේය. "මම උදේ ඉඳලා හැන්දෑවෙනකම් කරන්නේ මේකේ වැඩ."

ඔහු කී සියල්ල මම අසා සිටියෙමි.

"අතනයි ගෙය හදන්න අදහස් කරන්නේ ගෙපල් අදින්න තමයි ටික්ක අමාරු. ඔය ටික අදින්නත් මාස තුනක් විතර ගියා, ඊට පස්සේ ඕක ඔක්කොම

ඇදලා අර පැත්තෙන් පාර කපනවා. එතකොට පොඩිමහත්තයලගෙ ගෙදර වගේ හිටීනේද?

'ඔව්' මම ඔහු ඇසූ සැම ප්‍රශ්නයකටම පිළිතුරු දුනිමි. මා එසේ කළේ ඔහු කී සියල්ල තර්කය නමැති සින් පිත් නැති ඇසින් බලා ඉවත ලෑම නුසුදුසු යයි හැඟීගිය බැවිනි. ඔහුට මේ සියල්ල කිරීමට තව කොපමණ කල් යාද? කෙසේ කළ හැකිද? යනාදි ප්‍රශ්න මා තුළ ඇතිවුවද මම ඒ සියල්ල යටපත් කර ගතිමි.

පැයක් පමණ ගත කිරීමෙන් පසු අපි දවල් කෑම පිණිස පැමිණියෙමු. දඩි අව්වේ ගමන් කිරීම නිසා මගේ මුහුණින් මෙන්ම ඇඟපතින්ද දහඩිය ගලයි. බොහෝ කලකින් පසු සෙරෙප්පු සපත්තු නැති දෙපයින් ගමන් කිරීම නිසා මගේ දෙපතුල්ද වේදනා දෙයි. කෑම කනතුරු මාමා ඔහු කිරීමට අදහස් කරන නොයෙක් දේ ගැන කථා කරන්නට විය.

"පොඩි මහත්තයලගෙ ගෙදර වගේ ඉස්සරහ තාප්පයක් බඳින්න හොඳ නැහැ. තාප්පයක් නැතුව ගෙදෙට්ටම පාර කැපුවොතින් පොඩිමහත්තයලගෙ ගෙදෙට්ටත් වැඩිය හොඳ වෙනව."

"ඔව්"

ඔහුගේ කථාව මෙන්ම කටහඬෙහි වූ අහංකාර භාවයද මගේ සිත් නොගත්තේය.

කෑම කා ඉවරවීමෙන් පසු කාමරයට ගිය ඔහු ඉදුණු කෙසෙල් ඇවරියක් ගෙනවුත් මේසය උඩ තැබුවේය.

"කන්න මේවා අගුණයක් නැහැ. කොහොමත් ඉස් ඉස්සෙල්ල පලගත්තු කෙහෙල් කැනෙත් පොඩිමහත්තයටත් දෙන්න ලැබුණ එක ලොකු වාසනාවක්" යි කී ඔහු කෙහෙල් ගෙඩියක් කඩා මට එය දිගු කෙළේය. මම එය ප්‍රතික්ෂේප නොකෙළෙමි. එය බුදිමින්ම මම මේසය අසල ඇඳෙහි වාඩි වී සිටි මාමා ගේ මුහුණ දෙස බැලුවෙමි. ප්‍රීතියෙන් ඔද වැඩී ගිය ඒ මුහුණෙහි මහත් සතුටක ඡායාවක් පිළිබිඹුවී ඇති සැටි මට පෙනිණ. එය වූ කලී මිනිසකුගේ ජීවිතයේ වරක් හෝ දෙවරක් පමණක් ඇතිවන සතුටක් විය හැක. කඳුලින් තෙත්වූ ඔහුගේ දෙඇස කාන්තියෙන් දිලිසෙයි. එහි ඇත්තේ ගර්වයත් ප්‍රීතියත් එකට ගැටීමෙන් ඇතිවන බැල්මකි.

පැයක් පමණ අලස ලෙස නිද ගැනීමෙන් පසු මම ආපසු ඒමට පිටත්වීමි. ගෙයින් පිටත් වුණ මා තුළ ඇති වූයේ පරාජිතයකුගේ ශෝකයකි. එය කුමක් නිසා ඇති වූවක් දැයි මට කිව නොහැක. එය ජීවිතය පිළිබඳ දැඩි කලකිරීමක්ද? පැය කීපයක් ලතවෙමින් සිට නිද ගැනීමෙන් පසු ඇතිවන සුළු ශෝකී පාර් ගතියක් එවිට මා හද තුළ වී යයි මම සිතමි.

# 6

# තරුණ ශිෂ්‍යයා

'මගේ සිත කිසිවෙක් නොදකී. එය කිසිවකුට නොපෙනෙයි. මගේ ජීවිතය මෙතරම් අභාග්‍යයකට පත් වූයේ එබැවිනි.'

"මෙවැනි ඇතැම් මොහොතක මගේ සිත වියරු වැටීමට ආසන්න එකකුගේ සිතක් බඳුවෙයි. අතීතය පිළිබඳ ශෝකී සිතුවිල්ලෙන් එය පිරී යයි. ඉන් ගැලවීමට නම් ම විසින් ඒ සියල්ල ඔබට කිව යුතුය."

"මිත්‍රය, අපට අපේ දෙපා මත නැගී නොසිටිය හැක්කේ කුමක් නිසාද? ඒ දුර්වලකමින් පෙළුණ අපි ආගම, දර්ශණය, ප්‍රේමය, කලාව ගැහැනිය මද්‍යය සොයා යමු. එයින් ඇතැම් දේ අපේ දුර්වලත්වය වසයි. එහෙත් ඒ සියල්ලම මිනිසුන් මෙන්ම කුහකය. මෙසේ අනුන්ගේ පිහිට නොසොයා ජීවත්විය නොහැකිවීම කෙතරම් අභාග්‍යයක්ද?"

මමද මේ සියල්ලෙහිම පිහිට සොයා ගියෙමි. ගැහැනියකට ඊර්ෂ්‍යාවෙන් හා බොළඳකමින් යුතුව පෙම් කෙළෙමි. එහෙත් ඇ මගේ සිත නොහඳුනයි. මා ඇගෙන් බලාපොරොත්තුවන්නේ කුමක් දැයි ඇ

නොදනී. එබැවිනි මගේ ජීවිතය අපේක්ෂාවන් විරහිත මෙවැනි තත්වයකට පැමිණියේ.

එසේ වුවද මා මෙසේ මගේ සිතට එන එන දෑ එලෙසම ලියා ඔබ වෙහෙස නොකළ යුතුය. මේ සියල්ලෙහිම අන්‍යොන්‍ය සම්බන්ධයක් තිබිය යුතුය. මා එසේ ලිවීමට වෑයම් කලද එය සඵල වෙතියි මම නොසිතමි. එබැවින් මෙය ව්‍යාකූලත්වයෙන් ගහනවනු නිසැකය. ඔබ ඒ ගැන මා හා උරණ නොවිය යුතුය.

එය අසන්නා විසින් පිළිකුල් කරනු ලබන හැඟීම් වලට වහලකු වූවකු ගේ ජීවිත කථාවකි. එය කියවන්නා මා නීචයකු-ලාමකයකු කොට සලකනු ඇත. පෙර නම් මම ද එවැනි දේ ගැන සැලකුවෙමි. එබැවින් විය යුතුය මා ඇගේ දෙදණ වැළඳ ගෙන මට ප්‍රේම කරන ලෙස ඇට කීවේ. එහෙත් ඇයට එය නොවැටහේ. එය ඇගේ නොව මිනිසත් බවෙහි වරදය. සා පිපාසාවෙන් පීඩිත වූ දුබලයකු කිසිවකු ගේ දෙපා මුල වැටී තමාට දිය බිඳක් දෙන්නැයි කඳුළු රැඳි දෙනෙතින් යාච්ඤා කරයි. එහෙත් ඔහු එය අබැටක් පමණකුදු ගණන් නොගනී. දැන් නම් මා මේ සියල්ල බිඳකුදු නොසලකමි. ඒ සියල්ල ඉවසිය යුත්තේ තවත් ජීවිතය පිළිබඳ බලාපොරොත්තු ඇති අය පමණකි. බලාපොරොත්තු ශූන්‍ය වූ තැනැත්තා ඒ කිසිවක් නොඉවසිය යුතුය. එසේ වුවද අතීතය සිහිකරන මගේ සිත මොහොතකට නමුදු ශෝකයෙන් පිරී යයි. 'අතීතය මල් වත්තක් වගේ නේද' යි වරක් මා ඇගෙන් ඇසූ පැවිද මට මතකය.

එකල මා ඉගෙන ගත්තේ වෛද්‍ය විද්‍යාලයයෙහි පළමු අවුරුද්දෙහිය. එය දැනට අවුරුදු පහකට පෙරය. එවිට මගේ ජීවිතය බෙහෙවින් පියකරු විය. මා එකල ජීවිතය ගෙවන අතරදීය මට ඇය හමුවූයේ. ඇ පළමු අපේ ගෙදරට පැමිණි දින මට මතකය. ඇ අසල පාසැලක ගුරුවරියක වශයෙන් පත්ව ඇති බැවිනි අපේ ගෙදර නැවතීමට පැමිණියේ. ඒ සියල්ල මට දැනුදු මැනවින් සිහි කළ හැක. එදින ඇ හැඳ සිටියේ දම් පැහැයට හුරු සේද සාරියකි. ඇ දුටු පළමු දිනයෙහිම මම ඇගේ මුහුණෙහි සුන්දරත්වය හෝ මනහර බව තුදුටිමි. එහෙත් කල් යත්ම මගේ සිත තුළ ඇ කෙරෙහි නිශ්චල ප්‍රේමයක් ඇති විය. ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කරත් ම මම ඇගේ සුන්දරත්වයෙන් වශීකෘත වූයෙමි. මලාතික දෙඇසින් හා පිරුණු කම්මුලින් යුතු ඇගේ මුහුණ සැබවින්ම පියකරුය. ඇතැම් උදයක ඇ සිය කෙස් කලඹ කරල් දෙකක් වතයේ ගොතමින් ජනේලය අසල බලා සිටින විට ඇගේ සුන්දරත්වයෙන් වශීකෘත වූ මම ඇගේ ප්‍රේමයෙන් පිරී ගිය මුහුණ දෙස නෙතගින් බලා සිටියෙමි. උදය හිරු රැස් කොළ පැහැති ජනෙල් රෙද්ද මතත් ඇගේ දෙපා අසලත් සිනහවෙන් ඉතිරෙමින් නටයි. ඒ දිනවල මෙන් හිරු රැස් පවා දැන් එසේ ප්‍රීතියෙන් තොඉපිලෙන්නේ ඇයි? ඇගේ සිහින් මටසිලුටු රත් පැහැති ඇඟිලි කෙස් රොදවල් එකිනෙක ගෙන සෙමෙන් පටලවයි. ඉක්බිතිව ඇ සිය දෙකම්මුල් හා නළලද ඇඟිලි තුඩින් පිසදමා කණ්ණාඩිය දෙස බලයි. මෙතෙක් ඇ දෙස බලා සිටි මම ලජ්ජාවෙන් යුතුව වෙනතක් බලමි.

මා ඇට ප්‍රේම කරත් නම් මා ලජ්ජාවෙන් හා බියෙන් මිරිකිය යුත්තේ කුමටද? එය මා වැනි වයසින් හා බුද්ධියෙන් මුහුකුරා ගිය එකකුට සුදුසු නොවේ. මගේ ජීවිතය අවාසනාවන්තවීමට ප්‍රධාන හේතුව වූයේ මේ බිය සහ උදාසීනත්වයය. කිසිවක් කෙරෙහි නිශ්චයකට පත්විය නොහැකි මම බොහෝ විට ඉතා සුළු දෙයින් කැලඹීමට හා බියට පත්වීමි. මේ සියල්ල මා කුඩා කල සිට ලැබූ දේ යයි මම සිතමි. කුඩා කල ද ඉතා සුළු දෙයින් මම දැඩි කනස්සල්ලට හා බියට පත්වීමි. අප ගෙය ඉදිරි පස වූ කඳු දහවල හිරු රැසින් මත් වූවාක් මෙන් තැවෙනු දකින මා කුඩා කල පැය කීපයක් කනස්සලු ගතියෙන් යුතුව සිටි සැටි මට මතකය. අවට පරිසරය තවත් ඉවසිය නොහැකි මට හඬ නගා ඇඬීමට හෝ කෑ ගැසීමට සිතුනු වාර බොහෝය. ඇතැම් නිශ්චල මොහොතක මා මගේ දෙනෙතට නැඟි කඳුළු බිඳු පිසද ගත්තේ අවට කව්රුවත් ඇද්දැයි බලමින් ලජ්ජාවෙනි.

මෙ වැනි ගති ඇත්තකුට සැපවත් ජීවිතයක් ගෙවිය නොහැකි බව මම දනිමි. ජීවිතයේ ප්‍රීතිය විඳිය හැක්කේ හැඩි දැඩි සත සමක් ඇත්තනට පමණකැයි වරක් රුසියන් කථාකාරයකු වූ චැකොප් කී බව මට මතකය. ඔහු එය කියන්නට ඇත්තේ තමාගේ ජීවිතය දෙස බලා විය යුතුය. විශාල ජීවිත පරිඥානයකින් යුත් ඔහුද අවුරුදු දහයක් විවාපත් ගැහැනියකට පෙම් කෙළේය. අවුරුදු දහයකට පසු හදිසියේ හමුවූ ස්ත්‍රියක හා විවාහ වූ ඔහු ඉන් තුන් අවුරුද්දකට පසු මළේය. ජීවිතය දුක් දෙම්නස් හිරිහැර ආදියෙන් ගහණ යයි ඔහු කීවේය. ජීවිතයේ නිසරු

බවත්, අපගේ පරිශ්‍රමයන්ගේ නිෂ්ඵලත්වයත් ඔහුගේ කථාවලින් පිලිඹිබු වන්නේ මෙබැවින් විය යුතුයි.

නුවුවමනා බියත්, උදාසීනත්වයත් නිසා නොවේ නම් මට ඇයට සාමාන්‍ය අයකුට මෙන් ප්‍රේම කරන්නට තිබුණු බව නොඅනුමානය. එහෙත් මගේ සිතෙහි නීච දුර්වලකම . . . ඒ සියල්ල සිහිවන විටත් මා සිත ශෝකයෙන් හා කෝපයෙන් වියරු වැටෙයි. මා ඇයට පෙම් කරන බවද කීවේ ඇට බොහෝ කලක් ගොළු වතින් යුතුව පෙම් කළ පසුවය. ඇට පෙම් කරන බව කීමට නොව ලිවීමටද මම බියවීමි. මගේ සිතෙහි වූ නොසන්සුන්කම තවත් ඉවසිය නොහැකි වූ මා වරක් ඇට මගේ සියල්ල කීමට සිතු සැටි මට මතකය. එය එක්තරා උදයකි. වාතයෙහි පුදුම සැහැල්ලු බවක් තිබුණේය. ගෙදර සියලු දෙනම බැහැර ගොස් සිටියහ. ඇ ඇගේ කාමරයේ ඇඳෙහි වාඩිවී සිටියාය. සාලයෙහි සිටි මම ඇට මගේ සිතෙහි වූ සියල්ල කිව යුතු යයි තීරණය කර ගතිමි. ඇට ඒ සියල්ල කීමට කදිම අවස්ථාවක් ලැබී තිබේ. මම පුටුවෙන් නැගිට්ටෙමි. එහෙත් මගේ දෙපා වෙවුලන බව මට දැනිණ. දොරටුවට පැමිණි මා තුළ පෙර වූ ආත්ම ශක්තිය බිඳකුදු නොතිබිණ. මම ඇ අසලට පැමිණ ඇ සිටි ඇඳ මතම වාඩිවීමි. සාරියක් නවමින් සිටි ඇ මා දෙස හිස ඔසවා බැලුවාය. මම යළිත් ධෛර්‍ය උපදවා ඇ දෙස බැලුවෙමි. එහෙත් මගේ මුවගට ඒ වචන නොඑයි.

"විමලා ගෙදර ගියහම මට මෙහාට ලියුම් ලියන්න එපා" යි මා අමාරුවෙන් කීවේ, මගේ සිතෙහි වූ මූලික කරුණ යටපත් කරමිනි.

"ඇයි?"

"එපා, ඒක වරදවා තේරුම් ගනීවි" යි මට කියවුණේ ඉබේටය. එය මගේ සිතෙහි වූ දෙයට හාත් පසින් විරුද්ධ කියමනකි. ඈ සිනහවෙමින් ඉතිරෙන දෙ ඇසින් යුතුව මා දෙස බැලුවේ මගේ සිතෙහි තෙරපෙමින් තිබුණු දෙය දැන ගෙන විය යුතුය.

ඇට මා පෙම් කරන බව මා පළමුවෙන් දැන්වූයේද ඈ අපේ ගෙදරින් අස්වූ පසුය. එතෙක් මා ගොලුවකු මෙන් සිටියේ ඉහතින් කී මගේ දුර්වලකම් නිසා විය යුතුය. ඈ අස්වන විට මා සිටියේ වෛද්‍ය විද්‍යාලයෙහි දෙවන අවුරුද්දෙහිය. එකල මට ගෙදර ඒමට හැකි වූයේ කලාතුරකිනි. එවිට ඈ කෙරෙහි මා තුළ වූ ප්‍රේමය ගහක් වැනි විය. එය සෙමෙන් වලනයෙන් තොරව ගලා බැස්සේය. ඈ මට නිතර ලියුම් එව්වාය. එහෙත් මා ඇයට පිළිතුරු ඇරියේ ඉඳ හිටය. එය ඈ කෙරෙහි වූ ප්‍රේමය අඩුවීමක් නිසා සිදුවූවක් නොවේ. එහෙත් ඊට හේතුව කුමක් දැයි මට ම කිව නොහැක. එවිට මට විද්‍යාලයෙහි වැඩ බහුලව තිබුණ නිසාද නොඑසේ නම් සහජ උදාසීනත්වයේ ප්‍රතිඵලයක් නිසාද මගේ අතින් එවැන්නක් සිදුවූයේ. මෙසේ තිබෙන අතරදීය ඈ අපේ ගෙදරින් අස්වන බව දන්වා මට ලියුමක් එව්වේ. එදින සවස ගෙදර පැමිණි මම එය කඩා කියවූයේ ගැහෙන හදවතින් යුතුවය. එය මා තුළ දැඩි ශෝකයක් ඇති කරවන සුළු විය. මට එදින රාත්‍රී නින්ද නොගියේය. පසු දිනද මට සිතෙහි ඒකාග්‍රතාවය ඇතිකරගත නොහැකි විය. දින කීපයක් යන තුරුද මගේ හැඟීම් මට බලවත් ලෙස වද

දෙන්නට විය. ඒ ගැන එතරම් නොසැලකිය යුතු යයිද මම මට ම කියා ගතිමි. මා මෙසේ ශෝකවීමට කුඩා දරුවෙකු නොවේ. කෙතරම් තර්කානුකූලව කල්පනා කළ ද මගේ සිත ඉන් පැහැරිණ.

දෙවන අවුරුද්දෙහි අපට බෙහෙවින් වැඩ තිබිණ. මම ඒ සියල්ල උනන්දුවෙන් කරන්නට වීමි. එහෙත් මගේ සිතෙහි පෙර නොවූ අලස ස්වභාවයක් ඇත්තා සේ මට දැනිණ. මුලින් එය මා තුළ නොදැනුවත්වම වැඩුණා ද පසුව මට එය ක්‍රමයෙන් පැහැදිලි වන්නට විය. මගේ සිත උදාසීනත්වයෙහි ගිලෙන්නට විය. ස්වභාවයෙන් මා කිසිවක් කෙරෙහි දැඩිලෙස සිත එකඟ කිරීමට හෝ බොහෝ වේලාවක් වෙහෙස කිරීමට හෝ හැකි පුද්ගලයකු නොවේ. බොහෝ වෙහෙස මහන්සි වී විශාල කාලයක් ගත කොට කරන ලද දේවල් ද මට ඇතැම් විටක මොහොතකින් එපා වේ. දවස් ගණනක් වෙහෙස වී කළ කාර්‍යයක් ද මට මොහොතකින් සම්පූර්ණයෙන් විනාශ කළ හැක. ඇතැම් දේ ගැන මගේ සිතෙහි මෙකල කලකිරීමක් ඇතිවූයේ ඉබේය. බොහෝ දෙන ප්‍රීතියෙන් ඉවසන දෑ මගේ සිත වෙහෙස කරවන සුළුවිය. සතියකට වරක් සිනමා බැලීම මා පෙර සිට පුරුදු කරගෙන ආවක් විය. මම එය අත්හැරියෙමි. ඇතැම් චිත්‍රපටියක් බලන්නට ගිය මම එය අවසන්වීමට බොහෝ වේලාවකට පෙර චිත්‍රපට ශාලාවෙන් පිට වී ආවෙමි. මා පිටවෙනු දුටු ඇතැමෙකු මා දෙස පුදුමයෙන් බලනු මට දරිය නොහැකි විය. බොහෝ දේ කෙරෙහි මගේ ඇති උනන්දුව නැතිවන්නාසේ මට දැනිණ. මගේ සිත ලිස්සා යන ගල් දැත්තක දෙපා තබා නැඟී

සිටීමට සඳන කිසිවකු වැනි විය. එහි සිටින්නා තමන් නොදැනුවත්වම ඇද වැටෙයි. මගේ සිතද උදාසීනත්වය නමැති අගාධය කරා ඇද වැටෙන්නට විය. මගේ අතින් ඉගෙනීමේ කටයුතු අතපසු වන්නට විය. වරෙක මම මගේ සිතෙහි වූ ධෛර්‍ය්‍ය වඩවා දැඩි අධිෂ්ඨානයෙන් සියල්ල දෙස බලන්නට තැත් කෙළෙමි. මේ සියල්ල කුමක්ද? මේවා මා සිතින් මවා ගත් දේ පමණකි. මේ මායා ලෝකයෙන් එළියට පැමිණ යළිත් මගේ වැඩ කටයුතු නිසි ලෙස කළ යුතුය. එහෙත් මට එසේ කල්පනා කළ හැකිවූයේ සවල්ප වේලාවකට පමණකි. එය වහා නැති විය. පෙර වූ උදාසීනත්වය ඉන්පසු පෙරටද වඩා දියුණු වෙයි. දෙවන අවුරුද්ද අන්තිමෙහි මම විභාගයෙන් අසමර්ථ වීමි. මම ඒ ගැන දුක් නොවීමි. මම ඒ සියල්ල අත හැර ද ගමට පැමිණියෙමි. මට තවත් වෙහෙස විය නො හැකි බවත්, එය මගේ සිත නොගන්නා බවත් මම දෙමව්පියනට කීවෙමි. මගේ මිත්‍රයෝ මේ තීරණය ගැන දුක්වූහ. මා යළිත් ධෛර්‍ය්‍ය වඩවා ඉගෙනීමේ කටයුතු ආරම්භ කළ යුතු යයි ඔවුහු කීහ. එහෙත් මම එය නොසැලකුවෙමි. මගේ සිතෙහි වූ අලස උදාසීනත්වය ක්‍රමයෙන් දියුණුවන්නට විය. මම බොහෝ දේ කෙරෙහි කලකිරුණු එකකු මෙන් ජීවත් වන්නට වීමි. මගේ සිත මේ ආදී හැඟීම් නිසා ඇතැම් විටක වියරු වැටුණු එකකුගේ සිත බඳුවිය. එවැනි හැඟීම් වලින් බේරිය නොහැකි වූ ඇතැම් මොහොතක මම ගෙදරින් පිටව ගොස් හිස හැරුණු අත ඇවිදින්නට වීමි. මෙලෙස් දවස් දෙක තුනක් ගෙවූ පසුය මා යළිත් ආපසු පැමිණියේ. එහෙත් එයද මගේ සිත ස්වල්ප කලකින්ම වෙහෙස කරවන සුළුවිය.

දිනක් රාත්‍රියෙහි මට නින්ද නොගියේය. එදින මගේ මිත්‍රයකු විසින් දෙන ලද සම්භාෂණයකට සහභාගි වී මා පැමිණියේ රෑ බෝවීය. මා එහි එතෙක් වේලා ගත කළේ මිත්‍රයාගේ බලවත් ඕනෑකම නිසාය. එහි වූ සෑම දෙයක්ම මගේ සිත වෙහෙස කරවන සුළුවිය. ඇතැම් ගැහැනියක අවට වූ දෙතුන් දෙනකු හා නගන සිනාවක හඬ ද ඉඳ හිට නැඟුනු සංගීත නාදය ද මගේ සිත පීඩාවුයේය. ඇතැම් ප්‍රීති ලෝලයෙකු හඬ නගා සිනහවෙමින් කා බී නටනු දුටු මම පිළිකුලෙන් යුතුව අහක බලා ගතිමි. එහි වූ සියල්ල ම මගේ සිතෙහි වූ කනස්සලු ස්වභාවය දියුණු කරන සුළුවිය. ඊට හේතුව කුමක් ද? එය මා තුළ ඔවුන් කෙරෙහි වූ ඊර්ෂ්‍යාවක් නිසා ඇති වූවක්ද? නැත්නම් අන්කිසිවක්ද? හැඟීම් වලින් අවුල් කරනු ලැබූ මම මැදියම් රෑ වනතුරු අවුල් කල්පනාවේ වැටී සිටියෙමි. එහෙත් ඒ සියල්ල මට බේරාගත නොහැකි විය. මා ඇඳෙන් නැගිට කාමරයේ ඒ මේ අත ඇවිද්දේ කෝපයෙන් දිලිසෙමිනි.

මිත්‍රය, ජීවිතයේ මෙවැනි මොහොතවල් සෑම එකකුටම ඇත් දැයි මම නොදනිමි. එවැනි ඇතැම් මොහොතක් මුළු ජීවිතයකම වගකීම බාරව සිටියි. මිනිස් සිත පුදුම දෙයකි. මිනිසුන් දරුණු අපරාධ කිරීමට වුවද පෙළඹෙන්නේ මෙවැනි මොහොතවලදී යයි මට හැඟේ.

මම කාමරයේ පහන දල්වා, මේසය අසල වාඩි වී ලියුමක් ලියන්නට වීමි. මා එය ලියුවේ ඇට ය. මට ඇගෙන් අන්තිම ලියුම ලැබුණේ ඊට අටමාසයකට

පෙරය. මා එහි ලිව්වේ කුමක් දැයි මම හරිහැටි නොදනිමි. ලියුම ලියා අවසාන වූ මම කවරයක් ගෙන එය එහි බහා ඇලවූවෙමි. මා එසේ කළේ එය පසුව කියවීමට ගතහොත් මගේ අතින් එය ඉරා දමෙතියි යන සැකයෙනි.

ඊට ඇගෙන් පිළිතුරක් ලැබුණේ සතියකට පමණ පසුය. එය කෙටි එකක් විය. ඇ දුන් සතුටින් බවත් ම විසින් යළිත් කරගෙන ආ කටයුතු ආරම්භ කළ යුතු බවත් එහි කියා තිබුණේය. මගේ සිතෙහි එකල තරමක නිශ්චලත්වයක් තිබුණේය. මම ඒ දිනවල බෙහෙවින් පොත් පත් කියවූවෙමි. නවකථා විශාල ගණනාවක් මෙන්ම පෙර අපර දෙදිග දර්ශනවාදය පිළිබඳවද ම විසින් එකල කියවන ලද පොත් විශාල ගණනකි. ඒවායේ වූ ඇතැම් දේ මම පිස්සකු මෙන් කටපාඩම් වනතුරු දෙතුන් වරක් කීවෙමි. 'මුහුදු ලිහිණියා' නමැති චැකෝෆ්ගේ නාට්‍යයෙහි වූ ඇතැම් කොටසක් මට දැනුදු සිහියට නගා ගත හැක. "මිනිසුන්, සිංහයන්, උකුස්සන්, ඇටි කුකුළන්, මුවන්, හංසයන්, මකුළුවන් ජලයෙහි වාසය කරන නිශ්චල මත්ස්‍යයන් සහ ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර ජීවීන් මේ ඇ ජීවයෙන් යුතු සැම දෙයම, ඔවුන්ගේ දුක්මුසු චක්‍රය වටා ගමන් කොට ඉන්පසු නැති වී යති. . . අවුරුදු දහසක් මුළුල්ලෙහි භූතලය ඒ මත සජීවමත් සත්වයෙක් නොදරීය. දුබලවූ චන්ද්‍රයා තමාගේ ප්‍රදීපය නිකරුණේ දල්වයි. ගොයම් කපා අවසාන වූ ලියදිවල පක්ෂීහු පෙර මෙන් හඬ නගා අවදි නොවෙති. දෙහි ගස්වල මැයි මාසයේ කුරුමිණියන්ගේ හඬ නොඇසේ. අවට ශීතය. ඔතැතිය. තිදිගත් සුළය. හිස්ය, අවකාශය,

බියකරුය. ජීවමත් සත්වයන්ගේ ශරීරයන් දූවිලි බවට පරිවර්තනය වී තිබේ. සදකාලික ලෝකධාතුව ඒ ශරීරයන් ගිරිශිඛර, ජලය, වලාකුළු ආදියට පෙරළා තිබේ.'' ඇතැම් නිශ්චල සන්ධ්‍යාවන්හි මම වත්තෙහි ඇවිදිමින් හෝ කිසිවකු නොමැති ඉස්තෝප්පුවට වී හෝ මෙවැනි කොටස් සෙමෙන් තොල් මතුරමින් කී සැටි මට මතකය. මා එයින් කිසියම් ආස්වාදයක් ලබන්නට ඇත. කෙසේ වුවද ඇගේ පිළිතුර මගේ ප්‍රීතියට හෝ ශෝකයට හේතු නොවීය. එහෙත් මම එයින් නොපැහැදුනෙමි. ඉන් සුමානයකට පමණ පසු මම නැවතත් ඇයට ලීවෙමි. මම ජීවිතයේ අපේක්ෂාවන් විරහිත තත්වයකට පැමිණ ඇති බවත්, අපේ ප්‍රේමය ප්‍රකෘතිමත් නොකොට ජීවත්වීම අපහසු බවත් මම ඇට එකහෙළා කීවෙමි. ඇගෙන් ඊට ලැබුණ පිළිතුර දරිය නොහැකි විය. ඇ විවාහ ගිවිසගෙන ඇති බවත් තව ස්වල්ප කලකින් විවාහවන බවත් එහි කියා තිබුණේය. එය ඇසූ මම වියරු වැටුණු එකකු මෙන් ක්‍රියා කරන්නට වූවෙමි. මගේ සිතෙහි පෙර කිසිකලෙක නොවූ ව්‍යාකූලත්වයක් ඉන් ඇති විය. මම දින කීපයක් යහතුරු අරමුණකට ගත නොහැකි වූ සිතින් යුතුව සිටියෙමි. ගෙදර සිටීම මට රුචි නොවීය. මම මධ්‍යම රාත්‍රිය වනතුරු පවා නිකරුණේ ඇවිද්දෙමි. ඇතැම් අන්ධකාර වීථියක ගමන් කළ මා හදිසියේ නැවතී සිහි එළවා ගත නොහැකි වූවකු සේ බලා සිටියෙමි. ගෙදරින් බැහැර යාමට මට සිතිණ. මම ඔවුනටද නොකියා උඩරට මගේ මිත්‍රයකු සමඟ වාසයට ගියෙමි.

එහි දී මම මෙතෙක් නොගෙවූ ජීවිතයක් ආරම්භ කෙළෙමි. මා ඒ ජීවිතයට වැටුණේ කෙසේ දැයි මම නොදනිමි. එහෙත් එය මගේ සිතට එක්තරා සැනසීමක් විය. මම මෙතෙක් නොකළ ලෙස ඉන්ද්‍රියයන් පිනවීමට පටන් ගතිමි. ඉන්ද්‍රියයන් පිනවීම පරමාර්ථ කොට ගත් මගේ ඒ ජීවිතය එක් අතකින් ප්‍රීතිමත් විය. එවිට මට අතීතය සිහිවූයේ කලාතුරකිනි. ගැහැනියකගේ උණුසුම් මසෙහි ගැටෙන ඔබට අතීතය ගැන නොව ඔබ ගැනද අමතක වෙයි. මුළු ජීවිතයම එකම හිස් බිංදුවක් බවට පෙරළෙයි. එය කෙතරම් සැපයක්ද? මම ඇතැම් දිනයක ගෙදර පැමිණියේ මධ්‍යම රාත්‍රියද ගෙවුණු පසුය. මම පසු ද නැගිට්ටේ ප්‍රීතියෙනි. අවට වාතයද කා බී සැනහී නටන වියරු වූවන් වැනිය. මගේ සිත මෙන් එයද සැහැල්ලුය.

එහි රක්ෂාවක් ලැබුණද මම එය නොකෙළෙමි. ඊට අවශ්‍ය සිතෙහි නිශ්චලත්වය කෙසේ වුවද මා තුළ නොතිබිණ. මම එපමණක් නොව නොයෙක් තැන ඇවිද්දෙමි. එවැනි අතීතයකුත් අනාගතයකුත් නැති ජීවිතයක් ගත කිරීම එක් අතකින් බෙහෙවින් පියකරුය. එහෙත් මගේ සිතෙහි එවිට වූයේ සාමාන්‍ය ස්වභාවය නොවෙතියි මට ඇතැම් මොහොතක සිතිණ. එය තාවකාලික නිශ්චලත්වයක් විය හැක. දැඩි වේදනාවක් වුවද බොහෝ කල් ඉවසීමෙන් පසු සැපයක් බවට පෙරළේ. මගේ සිතෙහි ඇත්තේද එවැනි තත්වයක් විය යුතුය. කෙසේ වුවද මම ඒ ගැන නොසලකා ප්‍රීතියෙන් ගෙවූයෙමි. මම රාත්‍රී දෙකක් පිට පිට ගෙදර නොසිටියෙමි. අද එක් තැනක වී නම් හෙට මා ඇත්තේ ඉන් හැතැප්ම සියයකට ඈත තැනකය.

දිනක් මම බදුල්ලේ සිට මහනුවර යමින් සිටියෙමි. එය නුවරට දවල් දෙකට පමණ ළඟාවන දුම්රියකි. දුම්රිය එක්තරා දුම්රිය පොළක නවත්වන ලදී. ඈත් ඇගේ මවත් මා සිටි කාමරයට ගොඩ වූහ. මම දැස ඇදහිය නොහැක්කා සේ බලා සිටියෙමි. ඔවුනට නොපෙනෙන ලෙස වෙන පැත්තකට යා යුතු යයි මම සිතුවෙමි. එහෙත් ඊට පෙර ඈ මා දුටුවාය. ඇගේ මුහුණ මහත් ප්‍රීතියකින් පිරීගියා සේ මට පෙනිණ. දුම්රියෙහි සෙනඟ පිරී සිටියහ. ඇගේ මව මඳක් ඔබ්බෙහි වූ අසුනක වාඩි වූවාය. මා අසල වාඩිවී සිටි තැනැත්තා නැගිට්ටෙන් ඈ එහි ඇවිත් වාඩි වූවාය.

එවිට ඈ හැසුරුණ සැටි මට පුදුමය. ඈ එසේ හැසුරුණේ දැන් ඈ නියම ජීවිතය අඳුනන එකියක වූ නිසා විය යුතුය. ඈ බොහෝ කලකින් සමු වූ මිත්‍රයකු සමඟ මෙන් මා හා ප්‍රීතියෙන් හා අවංක භාවයෙන් යුතුව කථා කළාය. ඇගේ මුහුණෙහි මෙන් ම කටහඬෙහිද පෙර නොමැති මේරූ ගතියක් ඇත. දැන් ඇගේ කම්මුල් පෙර මෙන් පිරුණු ගතියක් නොපෙන්වයි. එබැවිනි ඈ පෙරටද වඩා සුන්දර.

"දැන් සිරි මොකද කරන්නේ?"

"ඔහෙ නිකම් ඉන්නවා. කිසිදෙයක් කරන්න මට තාම හිත නැහැ" යි මම කීවෙමි.

"ඔහොම ඉන්න එපා ගෙදර ගිහින් මොකවත් රක්ෂාවකට යන්න. ඔහොම සිටියහම තව කාලකණ්ණි වෙනවා" යි ඈ කීවේ දුක්මුසු ස්වරයකිනි.

"ජීවිතයේ තවත් කාලකණ්ණි වෙන්න දෙයක් නැහැ. මට නම් හිතෙනවා ගෙදර ඉන්නවාට වැඩිය හොඳය කියා මෙහේ ඉන්න එක. මට මෙහේ හොඳයි."

මා කී දෙය ඇසූ ඈ කල්පනා කරන්නට වූවාය. ඇගේ මුහුණ ශෝකයෙන් ආකුලවනු මම දුටුවෙමි.

"සිරි ඔහොම කථා කරන්නට එපා. මම සිරිගේ ජීවිතය ගැන හුඟක් දුක් වුණා. ඔය සුළු දේවල් ගැන හිතන්නේ නැතුව ගෙදර ගිහින් වැඩ කරන්න පටන්ගන්න."

ඇගේ කටහඬෙහි මෙන් ම මුහුණෙහිද වූයේ අවංක භාවයය.

"සිරිට මාව බැඳ ගන්න බැරි වුණාය කියා දුක් වීමෙන් වැඩක් නැහැ. මට වැඩිය දහස් වාරයක් හොඳ එක්කෙනෙක් බඳින්න පුළුවන්. ඕව අත්ඇරලා ආයිමත් වැඩ කරන්න පටන්ගන්න" යි ඈ කීවේ සිනහ වෙමින් සිතෙහි වූ ශෝකය පෙන්වමිනි.

ඇගේ නිර්මල හදවත හමුවෙහි මගේ සිතෙහි වූ අරූප මරුවන් පලාගියෙන් එය දසයකු මෙන් බැගෑපත් විය. මෙතෙක් යටපත්ව තිබුණු ඇතැම් තියුණු හැඟීම් මෙතෙක් ඒ වසා පැවති හිම පටලය අතරින් මතුවන්නාසේ මට දැනිණ.

"මට අතීතය මතක් කරන්න එපා. මම මෙපමණ කල් වැයම් කළේ ඒක අමතක කරන්න" යි මා කීවේ වැයමිනි. අපේ කථාව අසල සිටියවුනට ඇසෙන්නට

ඇතැයි මට සිතුණි. එහෙත් දුම්රියෙහි ඝෝෂාව නිසා කිසිවෙකු කන්යොමා සිටියද අපේ කථාව ඇසෙන්නට ඇත්තේ යම්තම්ිනි.

"සිරිට විතරක් නොවෙයි. මට වුණත් අතීතය දැනට වැඩිය සැපවත්ය කියා හිතෙනවා. ඒකට ජීවිතේ අපට ඕන විදියට හැඩ ගැහෙන්නේ නැහැ. අපේ හැම අදහසක්ම හරි යන්නේ නැහැ. අතීතය ගැන කල්පනා කරලා දුක්වෙන්න තරම් සිරි මෝඩ වෙන්න එපා."

ඇගේ කටහඬ දයාවෙන් හා ශෝකයෙන් බරවී තිබිණ. ඇගේ තර්කය හමුවෙහි මම ලජ්ජාවීමි. එය ජීවිතය පිළිබඳ කෙතරම් රමණීය දර්ශනයක්ද? එහෙත් පොත් පත් කියවා, බුද්ධියෙන් දියුණු වූ මට එය නොපෙනේ. මම මට ම ශාපකර ගතිමි.

"ඔව් ඉස්සර නම් ජීවිතය මල් වත්තක් වගෙයි" යි මා මෙවර කීවේ ඇගේ අදහස අනුමත නොකිරීමට තරම් දරුණු නොවිය යුතු යයි සිතුණ බැවිනි.

"එහෙත් ජීවිතය මගෙන් දරුණු ලෙස පළිගත්තා. මට ජීවිතය එපා වූයේ කුමක් නිසාද කියා මම ම දන්නේ නැහැ."

මම ඉන්පසු ඈ සමඟ අප අතර කිසිවක් නුවූවාක් මෙන් අවංක ලෙස කථා කෙළෙමි. දයාවෙන් පිරුණු ඇගේ හදවත හමුවෙහි මගේ ආත්මාර්ථකාමී භාවය මොහොතකට වුවද නැති විය.

"සිරි ලබන පුමාතෙම අපේ ගෙදරට එන්න. ඉරිද දවසක ආවොත් විජේත් හමුවෙන්න පුළුවන්" යි දුම්රියෙන් බැසීමට සූදනම් වූ ඇ මට කීවාය. විජේ යයි ඇ කීවේ ඇගේ සැමියාටය.

එදින ඇ සමුවීමෙන් පසු මගේ සිතෙහි එතෙක් පැවති නිශ්චලත්වය යළිත් බිඳිණ. මෙතෙක් තාවකාලික වශයෙන් යටපත්ව පැවැති පෙර වූ හැඟීම් යළිත් මගේ සිතෙහි සටන් කරන්නට විය. මා ගෙවමින් සිටි ජීවිතය මට එපාවිය. එය ඉතා නින්දිත ජීවිතයකැයි ද මට සිතිණ. ඉන්ද්‍රියන් පිනවීම පරමාර්ථකොට මා ආශ්‍රය කළ ගැහැනුන්ගේ ආශ්‍රය මා පිඩාපත් කරවන සුළුවිය. මා තුළ ඔවුන් කෙරෙහි දැඩි පිළිකුලක් ඇති විය. ඔවුන් පමණක් නොව ඔවුන් සමඟ ගත කළ අතීතයද මගේ දැඩි පිළිකුලකට පාත්‍ර වීය. එහෙත් මගේ හිත මුලින්ුදුරා අහසට විසිකරන ලද වස්තුවක් මෙන් ආලම්බනයෙන් විරහිත වූවා සේ මට දැනිණ.

මිත්‍රය, මිනිස් සිත එවැනි ආලම්බනයෙන් තොරව ජීවත් විය හැක්කක් නොවේ. ජීවිත්වීමේ ශෝකය එය ය.

මගේ සිතෙහි තත්වය මට දැරිය නොහැකි විය. ඇ නොමැතිව ජීවත්විය නොහැකි යයි යන හැඟුම ඊට පිවිසුනේ ඉන්පසුවය. දින කීපයක් යනතුරු මම එය මගේ සිතට වැද්ද දීමට පවා ඉඩ නුදුනෙමි. එය සමඟ කීප දිනක් සටන් කෙළෙමි. එහෙත් එය දිනෙන් දිනම මා තුළ කාවදින්නට විය. මම මට ම ශාප

කර ගතිමි. මා ඉතා නින්දිත තර්කානුකූලව කල්පනා කළ නොහැකි ලාමකයෙකැයි මම මටම කියා ගතිමි. ඇ දැන් විවාපත් ගැහැනියකි. පෙම් කළ යුතු යයි ඇට කීමට තරම් ලාමකයකු නොවිය යුතුය. නින්දිත දුර්වල කමක හැටි. . .

සුමානයකට පමණ පසු මම ඇ සමුවීම පිණිස ගියෙමි. එදින ඉරිදා දිනයක් නොවූයෙන් ඇ හැර අන් කිසිවෙක් ගෙදර නොසිටියේය.

මා එද හැසුරුණේ පිස්සකු ලෙස විය යුතුය. මම ඇ හා සාලයෙහි වාඩිවී කථා කරන්නට වීමි. මා අතින් මොනවා කියවුණි දැයි මම ම නො දනිමි. අන්තිමේදී මම ඇයට එය කීවේ මහත් ආයාසයෙනි. ඒ ඇසූ ඇ ගල්ගැසුනාක් මෙන් මා දෙස බලා සිටියාය.

"සිරි ඔය බොරු අතඅරින්න. මම හිතුවේ නැහැ නාම ඔය මනස්ගාතවලට වහල්වෙලාය කියා."

මම බිම බලාගෙන කථාවෙන් තොරව සිටියෙමි. මගේ ආත්මශක්තිය නැතිවී යන්නාසේ මට දැනිණ.

"මා සමඟ ඕවා කථා කරන්න එපා."

මට තවත් ඉවසා සිටිය නොහැකි විය. මා වාඩිවී සිටියේ අසල වූ සැටියෙහිය. එවිට මගේ සිතට යක්ෂයකු ආවේශවන්නට ඇත. නැත්නම් එතරම් නිහීන ක්‍රියාවක් කිසිවිටක මා අතින් සිදු නොවේ. මම ඇගේ අතින් අල්ලා දෙදණ මත හිස රඳවා මට ප්‍රේම කරන ලෙසත්, පෙර මෙන් මා කෙරෙහි අනුකම්පා කරන ලෙසත් කීවෙමි.

ඇ විදුලි සැරයක් වැදුණු එකියක මෙන් නැගිට්ටාය. ඇගේ මුහුණ කෝපයෙන් ලේ පැහැ ගැන්වී තිබිණ. ඇගේ දෙතොල් වෙවුලන්නට විය.

"බහින්න දෙට්ට. මම මෙච්චර කල් ආශ්‍රය කළේ හිතවත් මිත්‍රයකු වශයෙන්. මුලදී වගේ මට ඔය මනස්ගාත ඉවසන්න බැහැ. මට දන් මා ප්‍රේම කරන සැමියෙක් ඉන්නවා. කරුණාකරල දෙට්ට බහින්න.

ඇගේ කටහඬ කෝපයෙන් විනිවිද ගියේය.

"දෙට්ට බහින්න. ඔය තරම් නින්දිතයෙක්ය කියල මම හිතුවෙ නැහැ."

මගේ සිත කෝපයෙන් වියරු වැටෙන්නට විය. එවේලෙහි මට උවමනා වූණි නම් ඇ මැරිය හැකිව තිබුණි. තව මොහොතක් එතන වූවහොත් දරුණු අපරාධයක් වෙතියි මම බියවීමි.

ඒ සියල්ල අතීතය ය. ඒ සියල්ල ගැන මම දන් බිඳක්වත් නොතකමි. මදය වීදුරුවෙහි දෙතොල් රඳවන්ම සියල්ල අමතක වෙයි. වෙසඟනකගේ උණුසුම් සෙළවෙහි තුරුළුවන්ම මුළු ජීවිත කාලයක්ම එකම කලු හිස් තිතක් බවට පරිවර්තනය වේ. ඔවුන්ගේ උණුසුම් සිඹීම, වැළඳීම මා සිත නලවයි. මම තව ස්වල්ප වේලාවකින් එයින් එකියකගේ උණුසුම් සිරුරෙහි ගිලෙමි. සියලු ජීවිතය මොහොතක් බවට පෙරලන ඇගේ පරම පවිත්‍ර අධ්‍යාත්මය. එය ආත්මාර්ථකාමී අපට නොපෙනේ. දෙවියන් වහන්සේගේ අනුපමෙය වූ ශරීරය මත නලල තබන්නකු මෙන් නිරුවතින් යුතු ඇගේ දෙපා මම භක්තියෙන් සිඹින්නෙමි.

# 7

## සෝමා

**මා** පියදස ඇඳින ගෙන සිටියේ බොහෝ කලකට පෙර සිටය. අප කුඩා කල එකම පාසැලෙහි සිටිමුත් ඔහු මට වඩා උසස් පංතියක වූ බව මට මතකය. පියදස නැවතී සිටියේද එකල අප විසූ ගෙදරට ළඟපාත වූ ඔවුන්ගේ නැන්දලාගේ ගෙදරකය. අපේ ගෙමිදුලෙහි වූ විශාල සියඹලා ගසක් ගැන මට මතකය. සවස් කල මගේ වයසෙහි වූ වෙනත් කුඩා දරුවන් සමඟ ඒ ගස මුල සෙල්ලම් කරන කල පියදසද, එහි වූහයි මට සිතේ.

පියදස විවාහ වූ බව මම දැනට අවුරුදු හතරකට පමණ පෙර ඇසුවෙමි. දිනක් කොළඹ රෙදි සාප්පුවකදී මට පියදසත් ඔහුගේ බිරිඳත් හමුවුණේය. ඔහුගේ මුහුණෙහි මා කුඩා කල දැක තිබුණු ඔතැනි මළානික ස්වභාවය එවිටද නොසෙල්වී තිබුණේය. එය පෙරට වඩා දියුණුවී තිබුණේ යයිද මට සිතුණේය. ඔහු පියකු වීමට, සුදුසු එකෙක් නොවේ යයි ඔහුගේ මුහුණ බැලූ එකකුට සිතෙතියි මට සිතේ. ඔහුගේ බිරිඳ සිහින්ව වැඩුණු දේහයකින් යුත් එකියක වූවාය. ඈ රූපත් එකියකැයි යන්න ඈ දුටු විගස මට

සිතිණ. පියදස මා අඳුන්වා දුන් වේලෙහි ඈ බිමට හැරවූ දෙනෙතින් යුතුව අත දිගු කල ආකාරයෙන් ඈ ඉතා ලැජ්ජාකාරියකැයිද මට හැඟිණ.

ඉන්පසු මට යළිත් පියදස මුණගැසුණේ මෙවර ඔවුන්ගේ නිවස අසලට පදිංචියට පැමිණීමෙන් පසුය. මා නැවතී සිටියේ පියදසගේ වත්තට යාබද වත්තෙහිය. අපේ වතු දෙක එකිනෙකින් වෙන් කලේ මිටිව පැතිරී පවත්නාසේ වැඩුණු වද වැටකිනි. එහි පැමිණ සිප දිනකින්ම මම පියදසගේ නිවසෙහි සවස් කාලය ගෙවීමට පුරුදුවීමි. පියදස යහපත් ගති පැවතුම්වලින් යුත්තෙක් වුවද, ඔහු වැඩි කෙළි සෙල්ලම් හෝ කවටකම් ආදිය ප්‍රිය කල එකෙක් නොවීය. ඔහු වැන්නවුන්ගේ සිත්ගන්තේ ජීවිතයේ කුමන මුහුණුවරක් ද යි යන්න. මට තවම සැක සහිතය. පියදස කන්තෝරුවෙන් වුත් ආවස් කල ගතකලේ ඇඳිරි වැටෙනතුරු පත්‍රය කියවමිනි. කෙතරම් දකුම්කළු සැන්දෑවක් වුවද කිසි දිනක ගෙමිදුලින් එළියට ගිය බවක් ගැන නම් මට මතක නැත. නොයෙක් ශෝභාමත් සන්ධ්‍යාවන්හි මම ඔහුට එළිමහනෙහි ඇවිදින්නට යෑමට ආරාධනා කෙලෙමි. එහෙත් කිසි දිනක ඔහු මගේ ආරාධනාව පිළි නොගත්තේය. අශෝභනය, ශෝභාමත්ය, පියකරුය, අවලක්ෂණය යනාදී වචනයන්හි නියම තේරුම ඔහුට කිසිකලෙක අවබෝධ නොවන්නට ඇතැයි මට සිතෙයි. ඔහු වැන්නවුන් දන්නේ ඔවැනි වචනයන්හි ප්‍රත්‍යක්ෂයෙන් දත් අර්ථය නොව වාච්‍යාර්ථයෙන් පමණ යයි මට සිතේ.

ඔවුන් ආශ්‍රය කරන්නට වූ කීප දිනකින්ම මට එක් කරුණක් පැහැදිලිසේ පෙනී ගියේය. එනම් සෝමා (ඇගේ නම මම එහි පැමිණි කීප දිනකින් පියදසගෙන් එය දන ගතිමි.) තුළ ඇතිවී තිබෙන වෙනසය. මා මුලින් හමු වූ දිනයෙහි ඈ මහත් ලැජ්ජාවෙන් හැසුරුණ අයුරුත් දැන් ඒ කිසිත් නොමැතිව හැසිරෙන සැටිත් දකින මා සිත තුළ පුදුමයක් මෙන්ම සැකයක්ද හටගනී.

පියදස මෙන් නොව ඈ ඇගේ මිතුරන් හා එළිමහණෙහි ඇවිදින්නට යාමෙන් සවස් කල ගතකළාය. ඈ ආපසු ගෙදර පැමිණෙන්නේ රෑ බෝවූවායින් පසුව බව මම කීප දිනකින් දැනගතිමි. බොහෝ දිනයන්හි සැන්දෑවෙහි පොතක් කියවමින් කාමරයෙහි ජනේලය අසල සිටින මට සෝමා ඇගේ මිතුරන් හා කථා සල්ලාපයෙහි යෙදී සිය නිවෙස දෙසට යනු පෙනේ. මා පෙනෙන්නට වුවහොත් ඈ බොහෝවිට සිනහ මුහුණින් යුතුව මට ආචාර කළ බව මට මතකය.

පියදස ආශ්‍රය කරන්නට වී තෙමසකට පමණ පසු දිනක් ඔහු මා සමඟ තමා පාසැලෙන් අස්වූ පසු ජීවිතය ගෙවූ සැටි විස්තර කෙළේය. පාසැලෙන් අස්වූ විගසම ඔහුට කොළඹ රක්ෂාවක් ලැබුණ බවත්, තමා විවාහ ජීවිතයට වැඩි කැමැත්තක් නොදක්වූ නමුත්, තමාගේ දෙමව්පියන්ගේ ඇවිටිලි නිසා සෝමා හා විවාහ වූ බවත් ඔහු මා සමඟ කීවේය සෝමා උඩරට වංශවත්, ධනවත් පවුලක ඉතා හොඳ නැති

පැවතුම් වලින් යුතුව වැඩුණු එකියක් බවද, ඔහු විසින් මා සමඟ කියන ලදී. ඔවුන්ගේ විවාහයෙන් අවුරුද්දකට පමණ පසු ඔවුනට පුතෙක් ලැබුණ බවද, ඊට තුන් අවුරුද්දකට පමණ පසු ඔහු හදිසියේ මළ බවද, පියදස මා සමඟ කීවේය.

'පියදස කුමක් නිසා ආණ්ඩුවේ රක්ෂාවකට බැඳුනාද' යි ඔහුගේ මේ කථාවෙන් පසුව මට සිතුණේය. ඔහුට ඇති ධනයත්, ඉඩකඩනුත් මට ඇත්නම් මම කිසි කලෙක කිසිවකු යටතේ රක්ෂාවක් නොකරන්නෙමි. ඔහු ආණ්ඩුවේ රක්ෂාවක නියුක්තවන්ට ඇත්තේ ඔහුගේ සිත අදින ජීවිතයේ වෙන යම් මුහුණුවරක් නොවුණ බැවිනැයි මට දැන් සිතේ.

පියදස සමඟ ආශ්‍රයට පැමිණ අටමසක් පමණ ගත විය. ගස්වල බොහෝ සේ මල් පිපෙන කාලයද පැමිණියේය. සැන්දෑවන් පෙරට වඩා ශෝභාමත් විය. පියදසගේ හා අපේ වත්තේ වූ අසෝකා ගස් මලින් වැසෙන්ට පටන් ගත්තේය. මගේ කාමරයෙහි ජනේලය අසල වූ අසෝකා ගසෙහි සුදු පැහැති මල් පොකුරු වලින් එකක් දෙකක් මා නොදැනුවත්වම කවුළු දෙරින් කාමරය තුළට ඇදී තිබෙණු මම දුටුවෙමි. සවස් කල පියදසගේ නිවසට වුත් ඔහු සමඟ කථාවෙහි යෙදීමට වඩා සෝමා සමඟ ඇවිදින්නට යෑමට මට සිත් විය. ඈ ද මා සමඟ සවස් කල ගතකිරීමට කැමති වූහ යි මට සිතේ

ඇ හා මෙසේ ඇවිදින්නට ගිය කීපදිනකින්ම ඇ ඉතා මනබඳින සුළු යයි මට සිතිණ. ඇ ඉතා සුරූපී යයිද මට සිතුණේය. එහෙත් ඇගේ සෑම අංගයක්ම දෙස වෙන වෙනම බැලූවහොත් ඔබට ඇගේ සුන්දරත්වය නොවැටහෙතියි මම සිතමි. ඇගේ දෙනෙත් උවමනාවට වඩා විශාලය. එහෙත් ඒවායේ මා මහත්සේ ඇලූම්කරන පෙනුමක් විය. ඇගේ දෙනෙත් දෙස බලන කිසිවකුට ඇ මොහොතකින් කඳුළු සලතියි සිතෙනු නොඅනුමානය. සුරූපී ගැහැනියකගේ මුහුණෙහි ඉතාමත් මනබඳින සුළු පෙනුම ඇත්තේ ඇගේ දෙනෙත් කඳුලින් පිරුණ විට යයි මම සිතමි. ඇගේ නැහැයද එතරම් සිහින්ව උස්ව වැඩුනක් නොවේ. ඇගේ දෙතොලද උපුල් පෙත්තක පැහැය ගත්තෙක් නොවේ. එහෙත් අගින් සිහින්වන සේ මනාව වැඩුණු ඇඟිලි වලින් යුත් ඇගේ සිහින් දෙඅත් කවියකුගේ සිහින ලොවක නිවසන සිහින් දෙඅත් යුගලයක් බඳුයයි මට නොයෙක් වර සිතිණ. ඇගේ සිරුර සිහින්ය, කුඩා දරුවකුගේ වැනි කථාවද ඉතා පියකරුය. ඇ හා කථාවෙහි යෙදුන මට බොහෝ විට කාලය ගෙවී යනු අමතක විය. ඇ කථා කෙළේ මා දන්නා අඳුනන අන් ගැහැනුන් මෙන් හිස් දේ ගැන නොව දර්ශනවාදයකුට වුවද තර්ක කිරීමට සෑහෙන ජීවිතයේ නොයෙක් සත්‍යයන් ගැනය. ඇ හා කථාවෙහි යෙදෙන බොහෝ අවස්ථාවන්හි ඇ උගතියකැයි යන හැඟීම මා සිත තුළ ඇති විය.

දිනක් මෙසේ කථා කරන අතර "ඔබ කිසිකලක යුවතියකට ආලය කර තිබේද" යි ඇ මගෙන් ඇසූ

බව මට මතකය. ඇගේ ප්‍රශ්නයෙන් මා සිත තුළ කැලඹීමක් ඇති විය. ඇ වැනි යොවුන් වියෙහි වූ එකියකට එය ඇසිය නොයුතු ප්‍රශ්නයෙකැයි මට සිතුණේය. 'නැහැ' යි මා පිළිතුරු දුන්නේ මඳක් ලැජ්ජාවෙනි. මා ඇට කීවේ සත්‍යය. මා කිසිකලෙක යුවතියකට ආලය කළ බවක් ගැන මට මතක නැත. මා සොළොස් වියෙහි දී පමණ මගේ පංතියෙහි වූ දැරියකට ඇලුම්කළ බව මතකය. එහෙත් එය වැඩුණු ගැහැනුන් හා පිරිමින් අතර පවත්නා ආලයට බොහෝ සේ ඈත්වූ එකක් බව මට දැන් වැටහේ.

මල් හටගන්නා කාලය බැවින් පියදාසගේ ගෙවත්තෙහි වූ රෝස ගස්හි මල් පිපෙන්නට විය. සෝමා රෝස මල් කඩමින් උදය කාලය ගෙවනු කන්තෝරුවට යනතෙක් ජනේලය අසල ගතකරන මට පෙනේ. සැම උදයෙක්හිම ඇ රෝස මල් කැඩීමෙන් පසු රෝස පොකුරු තුන හතරක් මටද එව්වාය. ඇ මල් කඩා අවසන් වනවිට මා මගේ කාමරයේ ජනේලය අසල වී නම් ඇ සියතින් එය ගෙනත් දුන්නාය.

දිනක් සවස හතට පමණ මම මගේ කාමරයේ පොතක් කියවමින් සිටියෙමි. වෙනදාට වඩා ප්‍රමාද වී කන්තෝරුවෙන් පැමිණි බැවින් මට එදින එළියට යෑමට සිත් නොවීය. පොත කියවන්නට වූ විත වේලාවකින් කිසිවකු මගේ කාමරයේ දෙරට තට්ටු කරනු මට ඇසිණ. මම දෙර හැර බැලුවෙමි. එහි වූයේ සෝමා ය.

"නිමල්, අද ඇවිදින්න යන්නෙ නැද්ද?" "කවුරුවත් නැති නිසා මට හිතුනා නිමල්ට කථා කරන්න" යි ඈ දෙර හැරී විගස කීවාය.

"මට හිතුනෙ නොයන්න. අඩගහනවා නම් එන්නම්" යි මම කාමරයේ දෙර වසමින් කීවෙමි.

ටික දුරක් අපි කිසිවක් කථා නොකොට ගමන් කෙලෙමු. අපේ වත්තට වතු හතරක් පහක් පමණ ඈතින් කුඩා උද්‍යානයක හැඩහුරු කමක් ඇති පිට්ටනියක් වෙයි. උයනක් වශයෙන් එහි ඇත්තේ සෙවන දෙන ගස් කීපයක් පමණි. එදින සඳ ඇති රැයක් විය. මලානික සඳරැස් ගස් මුදුන් මත වැටී තිබුණේය. මම එදෙස බලමින් ගමන් කෙලෙමි. සිහින් සීතල සුළං රැල්ලක් ගස් අතරින් ඇදී එන්නට විය. සෝමා ඇගේ අතෙහි ඇඟිලි තුඩින් මගේ අත අල්වා ගත්තාය. ඈ වෙතින් මගේ අත ගත යුතු යයි මම සිතුවෙමි. එහෙත් එය කිරීමට මට ශක්තියක් නොවීය. ඇගේ සිහින් ඇඟිලි තුඩෙහි ස්පර්ශයෙන් ලැබෙන කිසියම් පියකරු හැඟුමක් මගේ යටි සිතෙහි වූ බව මට දැනුණේය. ඈ කිසිත් නොකියා ගමන් කළාය. මලානික සඳරැස් ඇගේ මුහුණ මතත්, ඇගේ සුදු පැහැති සාරිය මතත් වැටී ඇති සැටි මට පෙනිණ. ඇගේ මුහුණ සඳ රැයෙහි මඳක් ආලෝකමත්වී තිබුණේය. ඇගේ සිහින් කෙස් රොදවල් සුළඟෙහි තටනවිට ඒ මත සඳරැස් වැටීමෙන් ඒවා දිලිසෙන අයුරු මම දුටුවෙමි. මඳක් තැන් ගිය ඈ "නිමල්; අපි ආපසු යමු" යි කීවාය. මම කිසිත් නොකියා හිස

සැලුවෙමි. ඈ ආපසු හැරුණාය. සඳරැස් වලට පිටුපා ගමන් කරන අපගේ අඳුරු ඡායාවල් අප ඉදිරියෙහි වැටී ඇති සැටි මට පෙනිණ. මගේ හිස එවිට එකම හිස් දෙයක් ලෙස මට වැටහුණේය. ඇගේ සාරි පොටවල් එකිනෙකට වැදීමෙන් නිකුත්වන "සර, සර" හඬ පමණක් මට ඇසුණේය. ඈ හුස්ම හෙලන හඬ මට දැනිණ. වාතයෙහි සීත බවද මා හට ඉඳහිට දැනුණේය. සෝමා තව තවත් මා වෙතට ළං වූවාය. ඇගේ සිහින් දේහය මගේ සිරුරෙහි ගැටෙතියි මම බියවීමි.

ඇගේ නිවසට ළංවත්ම අසෝකා මල්වල සුවඳ මගේ නැහැයට දැනිණ.

"නිමල් ගෙට එන්න" යි ඈ සිය නිවස දෙසට පා නගමින් කීවාය. මට ඇගේ කීම නුසුදුසු යයි සිතුණේය. මා එසේ සිතීමට හේතුව කුමක් දැයි මම නොදනිමි. ඈ වෙතින් පලා යාමට මට එවිට සිතිණි. එහෙත් එය කිරීමට තරම් ශක්තියක් මට නොවීය. ඈ ආලින්දයට පැමිණියාය. මම ද ඈ පසු පස්සෙහි ආවෙමි. ගේ ඉදිරියෙහි වූ සේපාලිකා ගසෙහි අතු පතර අතරින් ඇදී එන සඳරැස් ආලින්දයත් අපත් වසා සිටින සැටි මට පෙනුණේය. ආලින්දයෙහි කිසිවෙක් නොවීය. පියදසගේ කාමරයෙහි දොර වසා තිබුණේය. ඈ කිසිත් කථාවක් නොමැතිව ගල් රුවක් සේ නොසෙල්වී සිටියාය. සඳ එළිය නිසා මට ඇගේ මුහුණ පෙනිණ. ඇගේ මුහුණෙහි වූයේ මා බිය ගන්වන සුළු පෙනුමකි. මා කිසිත් කථා නොකොට පසෙක වූ පුටුවක වාඩිවීමි. මට තවත් ඇගේ දෙනෙත් දෙස

බලා සිටිය නොහැකි විය. ඈ සෙමෙන් මා සිටි අසුන ළඟට ආවාය. ඈ මා වාඩිවී සිටි පුටුවෙහි අත මත වාඩිවනු මට සිහිනයකින් මෙන් පෙනුණේය. හදෙහි හටගත් කිසියම් වේගවත් හැඟීම් සමුදයක් නිසා දෙ ඇස මෙන්ම අත්පාද දුබලවී ගියාසේ ම දැනිණ. ඇගේ හුස්මෙහි සීතලය මට දැනිණ. මම ඈ දෙස මහත් ධෛර්‍යයෙන් බැලුවෙමි. ඇගේ මුහුණ රතු පැහැවී තිබිණ. ඇගේ දෙ ඇසෙහි පුදුම බැල්මක් විය. ඇගේ දෙතොල මහත් තොසත්සුත් අයුරකින් මෙන් කිටි කිටියේ සෙලවෙමින් තිබුණේය. මගේ හදවත කිසියම් බරකින් මඩනා ලද කලක මෙන් දරිය නොහැකි ලෙස දැණිනි. මම අසුනෙන් නැගිට ඈ වෙතින් පලා යාමට සිතුවෙමි. එහෙත් එසේ කිරීමට පෙර ඇගේ දෙඅත් මා ගෙල වටා ගියේය. ඈ ඇගේ මුහුණ මා මුහුණ වෙත ළං කළාය. ඇගේ සිහින් කෙස් රොදක් කිති කවමින් මගේ නළල මත වැටී තිබෙනු මට දැනිණ.

මගේ දෙ ඇසට කඳුළු බිඳු නැගිණ. හදවත වේගයෙන් උස් පහත් වන්නට විය. දෙ ඇස කඳුලින් පිරුණේය. මම දෙ අත්වලින් මුහුණ වසාගෙන හඬන්නට වීමි.

මා මෙසේ හැඬුරුණේ කුමක් නිසා දැයි මම නොදනිමි. මා හැර අන්කිසිවකු එලෙස හැඬිරෙතියි මම නොසිතමි. මා එසේ හැඬුවේ දැඩි ප්‍රීතිය හා මුසුවූ ශෝකයක් නිසාද? නැත්නම් ස්ත්‍රියක මා සමඟ එසේ හැසුරුණ පළමු අවස්ථාව නිසා දැයි මම නොදනිමි.

ඈ සෙමෙන් මා වෙතින් ඈත්වූවාය, ඈ වචනයකුදු කථා නොකොට සාලයේ සිට ආලින්දයට ඇතුළුවන දොරටුව අසල කල්පනාවේ නිමග්නවී සිටින සැටි මට පෙනිණ. ඇගේ හිස දොරටුවට හේත්තුවී තිබුණේය. ඇගේ නිකට අත්ලමත රැඳවී තිබිණ. ඈ එසේ මඳ වේලාවක් සිට දොර වසා ඇගේ කාමරයට යනු මට පෙනුණේය.

මම ආලින්දයෙන් එළියට බැස මොහොතක් නොරැඳී නිවස වෙත ගියෙමි.

එදින නින්දට ගිය මා සිත තුළ වූයේ මහා ව්‍යාකූලත්වයකි. ඈ හැසුරුණ අයුරු මට පුදුම එළවන සුළුවිය. ඊටත් වඩා පුදුම එළවන සුළුවූයේ මා හැසුරුණ අයුරුය. එය සිහිවත්ම මගේ මුහුණ ලැජ්ජාවෙන් රතු වන්නාසේ මට අඳුරෙහිද පෙනිණ. එහෙත් මගේ සිතෙහි කිසියම් නොණක යම්කිසි සතුටක් වූ බව මට වැළහිය නොහැක. ඇගේ සිහින් දෙ අත් හා දෙතොලෙහි ස්පර්ශයෙහි සුන්දරත්වය මා ඊට පෙර කිසි විටෙක නොලැබූ බවක් මට වැටහිණ. ඇගේ සිහින් මුහුණ මා ඉදිරියෙහි ඇත්තාසේ මට පෙනුණේය. ඇගේ දෙ ඇසෙහි මවිසින් මිනිය නොහැකි ඒ පුදුම බැල්ම නොසෙල්වී තිබුණේය. ඇගේ දෙ ඇස දකිත්ම මා සිත තුළ මහත් සැකයෙක් පහළ විය. "ඈ ඇගේ අනික් මිතුරන්නුත් සමඟද හැසිරෙන්නේ මෙලෙසද?" යන ප්‍රශ්නය මගේ සිතට එවිට හැඟිණ. මම ඊට පිළිතුරක් සෙවීමට අපොහොසත් වීමි.

ඈ පසුව ගල් රුවක්සේ සාලයේ දෙරටුව අසල මළානික ස්වභාවයකින් සිටි සැටි මට පෙනුණේය. ඇගේ මුහුණෙහි එවිට කුමන පෙනුමක් වී දැයි මට විසඳ ගැනීමට නුපුළුවන් විය.

පසුද මා අවදි වූයේ අප නිවසෙහි වූ මහලු වැඩකාරිය මගේ කාමරයෙහි ජනේලය අසල හිඳ තැගසනු ඇසීමෙනි. ඈ ඊට පෙර කිසි විටක එසේ මා අවදි කළ බව මට මතක නැත.

"මහත්තයා, මහත්තයා අල්ලපු ගෙදර තෝනා ඊයේ මැරිල!"

ඈ කී දේ ඇසුණු මට කිසිත් කරගත නොහැකි විය. මම වහා ඇඳෙන් නැගිට්ටෙමි.

"කවුද?" මම නොඉවසිල්ලෙන් ඇසුවෙමි.

"අල්ලපු ගෙදර තෝනා."

"කොයි වේලාවෙද මැරිල තියෙන්නේ?"

"ඒක කියන්න දන්නේ නැහැ. අද උදේ මහත්තය නැගිටල බලනකොට මැරිල හිටියලු" යි ඈ විදහාගත් දෙනෙතින් යුතුව කීවාය.

"මම ඇගෙන් වැඩිපුර ප්‍රශ්න නොකෙළෙමි. මට එසේ කිරීමට ශක්තියක් නොවීය. මා සිත තුළ ශෝකයක් හා ඊට නොදෙවෙනි භීතියක්ද විය. අප හැසුරුණු අයුරු පියදස විසින් දක්නට ඇතැයිද,

එයින් ඇති වූ කලහයක ප්‍රතිඵලයක් වශයෙන් ඈ සියදිවි නසාගත්ත ඇතැයිද මට සිතිණ.

එම නිසාම මම පියදස හමුවීමට යෑමට බියවීමි. එහෙත් ඊට ස්වල්ප වේලාවකට පසු පියදස මා හමුවීමට පැමිණියේය.

ඔහු දකිත්ම මා සිත තුළ මහත් භීතියක් ඇති විය. මගේ මුහුණ රතුවී දෙ ඇස් මළානිකවනු ඔහුට පෙනීයන්නට ඇතැයි මට සිතුණේය. මම ධෛර්‍ය උපදවා ගෙන ඔහු හා කථා කරන්නට වීමි.

තමා උදයේ නැගිට සෝමාගේ කාමරයට ගියවිට ඈ මැරී සිටිනු දුටු බව ඔහු කීවේය. ඔහු ඈගේ මරණයට කුමක් හේතුවී දැයි නොදත්තේය.

ඈ වෙනදට වඩා එදින පරක්කුවී නින්දට ගිය බවත්, කිසියම් ලියුමක් ලියා එය එවලේම තැපැල් කරනු පිණිස මෙහෙකාර කොලුවා අත පිටත්කර යැවූ බවත්, තමා මෙහෙකාර කොලුවාගෙන් දත් බව පියදස මා සමඟ වැඩි දුරටත් කීවේය.

සෝමාගේ මරණයෙන් පසුදින මට ලියුමක් ලැබිණ. එය එවා තිබුණේ ඈ විසිනි.

එහි වූ දේ මෙසේය.

"මා මෙසේ ලියන්නේ හුදෙක් ඔබ කෙරෙහි ඇති අනුකම්පාව නිසා යයි පළමුවෙන්ම කිව යුතුය. මා සිය දිවි නසාගත් බව දනගත් විගස ඊට වැරදිකරු

ඔබ යයි ඔබ විසින් සිතන බව මම දනිමි. එහෙත් ඔබ විසින් එසේ නොපිළිගත යුතුය. මා දිවි නසා ගත්තේ මට තවත් ලෝකයේ ජීවත්වීමෙන් වැඩක් නැතැයි සිතුණු බැවිනි. මගේ ජීවිතය ගැන දන්නෙහි නම් ඔබද මගේ තීරණය නොඅනුමානවම අනුමත කරනු ඇතැයි සිතමි.

මා ධනවත් පවුලකට අයිති හොඳ ගුණධර්ම පුරුදු කළ එකියක වූ බව ඔබ දනිතියි මම සිතමි. මා පියදාස සමඟ විවාහ වී දැනට අවුරුදු පහකට වැඩි නොවේ. ඔහු කොතරම් විනීත පුද්ගලයෙක් දැයි ඔබට දන්වීම මා සතු යුතුකමකැයි සිතමි. පියදාසට වඩා ඉවසිලිමත්, කරුණාවත් ස්වාමිපුරුෂයෙකු ලබා ගැනීම දුෂ්කර යයි සිතමි. එහෙත් ඔහු කිසිවිටක මා හා ආලය කෙළේ යයි මම විශ්වාස නොකරමි. ස්ත්‍රියක සිය ස්වාමිපුරුෂයාගෙන් බලාපොරොත්තු වන ප්‍රේමය කොබඳු එකක්දැයි ඔහු වැන්නවුන් දනිතියි මම සැක කරමි. ඔහු හැසිරෙන අයුරින් එය ඔබටද වැටහෙන්නට ඇත. එසේ වුවද මම ඔහු හා ඉතා සමගියෙන් සතුටින් කල් ගෙවූයෙමි. එහෙත් මා මෙහිදී එකක් සඳහන් කළ යුතුය. අතීතය ගැන නොසඟවා නිර්දයව බලනවිට මා සතුටින් කල් ගෙවූ බව මට කිව නොහැක. ඒ අසතුටු බව ගැන මම කිසි දිනක නොදත්තෙමි. එහෙත් එය මගේ යටි සිතෙහි වූ බව මට දැන් කිව හැක. මා විවාහයෙන් බලාපොරොත්තු වූ සමාප්තිය එහි නොවීය. අප විවාහ වී අවුරුද්දකට පමණ පසු අපට පුතෙක් ලැබුණේය. මා ඔහුට බෙහෙවින් ආදරය කෙළෙමි. මගේ යටි සිතෙහි වූ

අසම්පූර්ණත්වය පිළිබඳ වූ හැඟීම් ඉන් යටපත් වූවාසේ මට දැනිණ. එපමණක්ද නොව මගේ ජීවිතයේ මූලිකස්ථානය ඔහු යයි මට සිතුණේය. මෙතෙක් අර්ථයක් නොමැති ජීවිතයක් සේ වැටහුණු මගේ ජීවිතය ඔහු නිසා කිසියම් අර්ථයක් ලද්දසේ මට වැටහිණ. එහෙත් ඔහුට වයස අවුරුදු තුනේදී ඔහු මළේය. එය මට ඉවසිය නොහැකි දුකක් විය. පියදසටත් එය එසේවී දැයි මම නොදනිමි. හැඬූ කඳුළින් යුතුව මාස ගණනක් ගෙවූයෙමි. ඔහුගේ නැතිවීමත් සමඟම මගේ ජීවිතයේ එකම අර්ථයද නැති වූවාසේ මට දැනුණේය. යමක් ඒ මේ අත නොදී අල්ලා බැඳ තබන ලද ආධාරයක් නැති වූ කලක මෙන් මා සිතද නොතිසියේ ඒ මේ අත දිවෙන්නට විය. ඔහුගේ උත්පත්තියට පෙරවූ අසම්පූර්ණත්වය පිළිබඳ හැඟීමද දියුණු විය. එපමණක්ද නොව දැඩි සෝකයෙන් ලත් පහර නිසාදෝ විලි බිය, ආදී හැඟීම් වලට මා සිත නො නැවෙන්නාසේද මට දැනිණ. "විවාහය" "ජීවිතය" ස්වාමි භක්තිය මේ ආදී දෙයෙහි පූජනීයත්වය පිළිබඳ හැඟීම මා තුළින් තුරන් විය.

මම දුරාචාරයේ හැසිරෙන්නට වීමි. දැන් මේ ලියන මට, මා ගෙවූ ජීවිතය ගැන ලැජ්ජාවෙන් හා එනිසාම ඇතිවන කෝපයෙන් තුරන්ව එය සිහි කළ නොහැක. මගේ මිත්‍රයන් හා නොතිසි සේ හැසිරෙමින් ඉන්ද්‍රියයන් තුෂ්ටුපුෂ්ටසේ පිනවීමට මම පුරුදු වීමි. ඔබද හමුවූයේ මෙසේ මා ජීවිතය ගෙවන අතරදීය.

පියදස මගේ මේ ජීවිතයෙහි වූ එකම වෙනස් වීමක්වත් ගැන දැන සිටියේ යයි මම නොසිතමි. මා

විනීත බිරියක ලෙසද අවිනීත ස්ත්‍රියක ලෙසද හැසිරෙන විට ඔහු ඒ දෙක්හි කිසි වෙනසක් නොදක්කේය. ඔහුට මේ වෙනස්කම් පෙනුණි නම් මට මෙසේ ජීවිතය නසා ගැනීමට හේතු නොවෙතියි සිතමි. ඔබ සමඟ මා මිත්‍ර වූයේද මා මුලින් සඳහන් කළ අදහස මුදුන්පත් කර ගැනීම පිණිසය. එහෙත් මේ ඔබ හැසුරුණු අයුරින් මගේ සිතෙහි මහත් වෙනස් වීමක් ඇති විය. ඔබ හැසුරුණු අයුරින් මා කෙතරම් පාපිස්ත්‍රියක දයි වැටහෙන්නේ දන්ය. මෙතෙක් මගේ ඇස් අන්ධවී තිබුණාසේ මට දනෙයි.

මේ සියල්ල පියදසට විස්තර කොට යළි අලුත් ජීවිතයක් ආරම්භ කළ යුතු යයි මට වරෙක සිතේ. එහෙත් මේ කිසිදෙයක තේරුමක් නොදන්නා ඔහු වැන්නකුගෙන් මා නිර්දෝෂී ස්ත්‍රියකැයි කියවා ගැනීම පමණක් මට නොසෑහේ. මා නිර්දෝෂී ස්ත්‍රියකැයි හද පත්ලෙන්ම ඔහු දන් කියන්නට සුදනම් නම් මා අවිනීත එකියක ලෙස හැසුරුණු විටද නිසියාකාර මට සැලකිය යුතුව තිබුණා යයි මම සිතමි. ඔහුට දන් දයාවක් ඉපදීමට ඉඩ ඇත්තේ නම් එවිට කෝපයක්ද උපදින්නට නොඅනුමානවම ඉඩ තිබෙන්නට ඇත. ඔහු හද එකල නොසෙල්වී තිබුණි නම් දනුදු සෙලවෙතියි මට නොසිතේ. එබැවින් මට සැනසීමට ඇත්තේ මරණය පමණි. මගේ සිතට දිස්වෙන එකම සැනසීමේ මාර්ගය එයයි.

ඔබ නිර්දෝෂී බව දන් ඔබට වැටහෙතියි මම සිතමි. ඔබට වැටහෙන්නෙහි නම් මා ද නිර්දෝෂී යයි කියන්න.

8

# අවුරුදු සිහිනය

නව හැවිරිදි පියසේන ඉස්තෝප්පුවෙහි උළුවස්සට හේත්තුවී බලා සිටියේය. වේලාව හවස හතර හමාරට පමණ ඇත. පියසේන හිස උස්කරමින් යළිත් වීථිය දෙස බලන්නට විය. පාරෙහි බොහෝ දෙනෙක් කථා කරමින් ඒ මේ අත ගමන් කරමින් සිටියහ. ඔහු ඔවුන්ගේ හිස් වලට උඩින් ඈත වංගුව දෙස බැලුවේය. ඔහු සීප වරක් ඇහිලිතුඩු අගින් නැගී සිටද ඒදෙස බැලීය. බොහෝ වේලා මෙසේ බලා සිටීම නිසා දැන් ඔහුගේ බෙල්ල රිදෙයි. ඇස්ද මඳක් කසියයි. එහෙත් තවම කිසිවකු පෙනෙන්නට නොමැත. ඔහු යළිත් කණුවට හේත්තුවී බලා සිටින්නට විය.

අද අම්මා එන බව ඔහුට හොඳටම විශ්වාසය. නව අවුරුද්දට ඇත්තේ එක දවසකි. දැනට දින තුනකට පෙර ඔහු අම්මාට එන ලෙස කියා ලියුමක් ඇරියේය. එය ලියන ලද්දේ කුස්සියේ අම්මා විසිනි. එදින රාත්‍රියෙහි සියලු දෙනම නිදගත්විට ඔහු ඇට කියා කුප්පි ලාම්පුවක එළියෙන් එය ලියෙව්වේය. "අනේ අම්මේ කොහොම හරි එන්න. මං එනකම් උන්විල්ලාට බඳින්න එපා" යි ලියුමෙහි අන්තිමට ලියන ලෙස්

ඔහු ඇට කීවේය. එබැවින් අම්මා තමා ගෙදර එක්ක යැමට එනු නියතය. ඒ ඇරත් ඔහු එද ගෙදරින් පිටවී එන විටද, තමා අවුරුද්දට එක්ක යැමට එන බවට අම්මා පොරොන්දු වූවාය. ගෙදරින් එනු පණිස පිට වූ විට තමා හැඬූ සැටි ද ඔහුට මතකය. ඔහු අම්මාගේ ඇහෙහි එල්ලී යා නොහැකි බව කියමින් හැඬුවේය. එවිට අම්මා ඔහුගේ ඔළුව අතගා "යන්න පුතා. මන් උඹ අවුරුද්දට එක්ක එන්න එනවා" යි කීවාය. අම්මා ඔහු කාරෙකට ගොඩ නැගුනු විට ඔහුගේ හිස අල්ලා සිඹීබාය. "අනේ බලා ගන්න හොඳ හැටි" යි ඈ කීවේ අඬමින් බව ඔහුට මතකය.

"අම්මා මන් එක්ක යන්න එනවාය කියල පොරොන්දු වුණා. දැන් ළඟම එනවා ඇතැ" යි යළිත් පාර දෙස බලන්නට වූ පියසේනට සිතිණ. ඇත කිසිවෙකු වංගුවෙන් හැරෙණු දුටු පියසේන යළිත් ඇඟිලි තුඩින් උස් විය. එහෙත් කිසිවෙක් හඬනගා තමාට කථා කෙළේය.

"පියසේන, පියසේන, කෝ මෙහාට ඇවිල්ල මේ කතුර නෝන මහත්මයට ගිහන් දීපන්."

වහා දිව ගොස් එය ගෙනවුත් ස්වාමිදූවට දුන් ඔහු යළිත් ඉස්තෝප්පුවට දුව ආවේය. වංගුවෙන් හැරුණු තැනැත්තා එවිට පෙනෙන්නට නොසිටියේය. ඒ අම්මා විය යුතු යයි ඔහුට සිතිණ. අම්මාට අමතකවී ගෙය පිට මං කොටට යන්නට ඇත. ඔහු වහා ගේට්ටුව වෙත දුව ගොස් පාරෙහි අනික් පැත්ත දෙස බැලුවේය. එහෙත් එහි ගියේ අම්මා නොව වෙනත් ගැහැනියකි.

ඔහු යළිත් උළුවස්ස අසලට පැමිණ වීථිය දෙස බලාසිටින්නට විය. ඉස්තෝප්පුවෙහි වැටී තිබුණු හිරු එළියද දැන් ක්‍රමයෙන් මැකීගෙන යයි. ඔහු දැන් මෙසේ බලා සිටින්නට වී පැය දෙකකටත් ආසන්නව ඇත. අම්මා මෙතරම් ප්‍රමාද වෙතියි ඔහු නොසිතුවේය. ඔහු ඈ එතියි බලාපොරොත්තු වූයේ උදයෙහිය. තව හැන්දෑවීමට ඇත්තේද ටික වේලාවකි. ඔහු යළිත් ඇහිලි තුඩින් නැඟී පාර දෙස බලා සිටින්නට විය.

යළිත් දෙතුන් වරක් වංගුව දෙස බලා සිටි ඔහු දෙර කණුවට හේත්තුවී කල්පනා කරන්නට විය. අම්මා මෙතරම් ප්‍රමාද වන්නේ කුමක් නිසා දැයි ඔහුට කිව නොහැක. අම්මා ගෙදරින් උදේ වරුවේ නොඅනුමානවම පිටත්වන්නට ඇත. මොහොතකින් ඔහුගේ සිතෙහි ගෙදර වූ ගොළු මල්ලී නංගී සමඟ එළිපත්ත උඩ වාඩිවී සෙල්ලම් කරනු ඇත. ගොළු මල්ලී බඩගිනිවී අඬන සැටිද ඔහුට සිහි විය. මල්ලිගේ ගොළුකම කලේ අපලය ගෙවුණ පසු හොඳ වේතියි අම්මා නොයෙක් වර කී සැටිද ඔහුට මතක් විය. ගෙදරින් පිටත් වූ අම්මා මෙතරම් වේලා නාවේ ඇයි? ඔහු ශෝකයෙන් යළිත් පාර දෙස බැලුවේය.

"අම්මා මෙච්චර වේලා නාවේ ඇයි?" ඒ ගැන සිතත්ම ඔහුගේ දෙනෙත මොහොතකට අඳුරුවී කඳුළින් තෙත් වෙයි. ඔහු තුළ වූ ශෝකය ඉවසුම් නොදෙන තරම්ය. "අම්මාට හුහක් ලොරි බස් යන පාරවල ඇවිදින්න දන්නේතේ නැත." එහෙත් එය ඔහුට සිහිකිරීමට පවා නොහැක. ඔහු බියෙන් ගැහෙන හදවතින් යුතුව පාර දෙස බැලීය.

දනට සුමානයකට පමණ පෙර ඔහු කඩේ යන විට පාරේ ගිය ගැහැනියක ලොරියක හැපී වැටෙනු ඔහු දක්කේය. ඈ වැටුණු වහාම මිනිස්සු ඒ වටා රැස්වුහ. ඈගේ හැට්ටය ලෙයින් තෙත්වී ගියේය. ඈ මැරෙන්නට ඇතැයි ඔහුට සිතුණේය.

ඔහු ශෝකයෙන් බර වූ දෙනෙතින් යුතුව යළිත් වීථිය දෙස බැලුවේය. එහි අම්මා පෙනෙන්නට නොමැති බව දකිත්ම ඔහුගේ ශෝකය මුළු සිතම වෙලමින් නගියි. අම්මා එන්න ඇත්තේ මගේ ලියුම දකලා. මම ලියුම ලිව්වේ නැත්නම් අද එන්නේ නැහැ. ශෝකය නිසා ඇඩීමට එන්නාක් මෙන්ද ඔහුට දැනිණ. ඔහු නිශ්චලව බියෙන් හා ශෝකයෙන් වෙළීගිය හදවතින් යුතුව බලා සිටින්නට විය. ඔහුගේ මුහුණ ඉදිරියෙහි බොහෝ වේලාවක සිට කෝඳුරුවන් කීපදෙනෙක් 'රූං රූං' යයි කෙඳිරි ගාති. විශාල පින්තූර දෙකක් දෙපැත්තෙහි බඳින ලද බර කරත්තයක් ඉක්මනින් ගේ ඉදිරිපස පසුකර ගියේය. එහි ඇතුළෙහි ගසන ලද දවුලක් හෝ ඩෝරයක් වැනි කිසිවකින් නැගුනු නාදය වාතයෙහි දුක් මුසු බව වැඩිකරමින් පැතුරුණේය. එය ඔහු තුළ වූ ශෝකය හා මලානික භාවය වැඩි කරයි. කරත්තයෙන් නගින නාදය දුක්මුසු බව උත්සන්න කරමින් සෙමෙන් නැතිවී යයි. ඔහු කල්පනා විරහිතව එදෙස කන්යොමා සිටියේය.

"අම්මාට මොකක් වුණාද?"

ඔහුට එය තවත් ඉවසිය නොහැක. ඔහු වහා කුස්සිය වෙතට දුවන්ට විය. ඔහු එහි වූ ගැහැනිය සමඟ කථා කරන්නට විය.

"කාටවත් මොකවත් වුණොත් දැනගන්නේ කොහොමද?" යි ඔහු ඇගෙන් ඇසුවේය. කිසියම් වැඩක නියුතු වූ ඇ එය නෑසුනාක් මෙන් සිටියාය.

"කාටවත් මොකවත් වුණොත් දැනගන්නේ කොහොමද?"

"මොකක්ද මට තේරෙන්නේ නැහැ."

"නැහැ දැන් පාරේදි මට මොකවත් වුණොත් කුස්සියේ අම්මා දැනගන්නෙ කොහොමද?"

"පොලිසියෙන් දන්වනවා ඒ ඉන්න තැනට."

ඇගේ උත්තරය ඔහුගේ ප්‍රීතියට හේතුවිය.

"අපේ අම්මට මොකවත් වුණොතිනුත් දන්නනවද?"

"ඔව් කවුරුනුත් දන්වනවා. කාටත් එහෙමයි" ඔහුගේ ප්‍රශ්නවලට උත්තර දීමෙන් වෙහෙසට පත් ඇ කීවාය.

ඉන් ඔහුගේ සිත බලවත් ප්‍රීතියක් ඇති විය. මෙතෙක් පැවති සියලු දුක්මුසු හැඟීම් ඉන් අතුරුදහන් විය. "අම්මාට එහෙම මොකවත් වෙලා නම් මෙලහට දැනගන්න ඕනෑ. පරක්කු වුණත් දැන් ළඟ ළඟම එනවා ඇති" යි යළිත් ඉස්තෝප්පුවට දුව ආ ඔහුට සිතිණ.

පියසේන . . . මෙහේ වරෙන් . . . දත් ඇති උළුවස්සේ එල්ලිලා . . . හතිකට වරෙන්" යි ස්වාමිදූව හඬ නගා කියනු ඔහුට ඇසිණ.

ඔහු වහා කාමරයට ගියේය.

"ඉඳා ඉක්මනට කඩේට ගිහිල්ලා, නූල් රෝද දෙකක් අරගෙන වරෙන්."

"උඹ සල්ලි එහෙම නැති කරගන්න නෙවෙයි."

"මොකක්ද ගේන්න කිව්වේ?" ඈ යළිත් ඇසුවාය. "නූල් රෝද දෙකක්. සුදු ඒව"

ඔහු මුදලුත් රැගෙන පිටත් විය. ඔහු ඒ ගැන සතුටු විය. අම්මා දත් ඔහුට මගදීම සමුවිය හැක.

ඔහු පාර දෙපස නිතර බැලුවේය. අම්මා තව ටික දුරක් යත්ම තමාට සමුවෙතියි ඔහුට සිතේ. වීථිය දිගේ ගොස් කඩ වීථියට වැටුණු ඔහු වට පිට බැලුවේ නොයෙක් නෙත් ඩැහැ ගන්නා දෙයින් පිරීගිය කඩ දෙසය. ඒවායේ නොයෙක් වර්ණයෙන් යුත් ඉතා සිත් අදින සුළු දේ තිබේ.

ඇතැම් කඩයක ඉදිරිපස හුලං පුරවන ලද බැලුන් වලින් වසා තිබුණේය. එහි දිග නිල් පැහැති බැලුන් ද, තව නොයෙක් පැහැති බැලුන් ද එල්ලා තිබුණේය. මිනිහෙක් එයින් එකක් පුරවමින් "සත දහයයි. මෙයින් ඕනෑ එකක් ගන්න. සත දහයයි." ඉඳ හිට මහ හඬින් කෑ ගැසුවේය. ඔහු වටේ ළමෝ කීප දෙනෙක්

බලා සිටියහ. පියසේනද එහි වහා දිව ගියේය. ඒ කෙරෙහි ඇදී ගිය සිත් ඇති ඔහුට තමා පැමිණි පණිවුඩය ගැනද අම්මා ගැනද මොහොතකට අමතක විය. එහෙත් ඔහුට එයින් එකක් ගත හැක්කේ කෙලෙසද? ඒ දෙස ටික වේලාවක් බලාසිටි ඔහු යළිත් ගමන් කරන්නට විය. යාර දහයක් පමණ ගිය ඔහු හදිසියේම නැවතුණේය. බිමසිට අඩි කීපයක් උසට පේළියට තබන ලද රතිඤ්ඤ පෙට්ටි ගොඩ දුටු ඔහුගේ දෑස විස්මයෙන් වෙලී ගියේය. රතිඤ්ඤ පෙට්ටි කීපයක් බිම අතුරාද තිබුණේය. ඔහු ඒවා දෙස ඕනෑකමින් බලා සිටින්නට විය. රතිඤ්ඤ පෙට්ටියෙහි පිට වූ මහත ගැහැනියකගේ රූපය ඔහුගේ සිත ඇදගත්තේය. එවැනි රතිඤ්ඤ පෙට්ටි තුනක් ගිය අවුරුද්දේ තමාට ලැබුණු සැටිද ඔහුට සිහිවිය.

ඔහුට නැඹුරු වී බිම තබා තිබෙන රතිඤ්ඤ පෙට්ටියක් අල්ලා බැලීමට සිතිණ. එහෙත් ඔහු ඒදෙස අත යවත්ම කඩය ඇතුළෙහි වූ තපුරු පෙනුමකින් යුත් මිනිහෙක් කෑගැසුවේය.

"උඹ ළඟ සල්ලි තිබෙනවද?"

නැහැ . . . නැ . . . හැ . . ." යි ඔහු පස්සට වෙමින් සෙමෙන් කීවේය.

"එහෙනම් ඒක ගන්න හැදුවේ. පලයන් යන්න . . ." යි ඔහු ඉක්බිතිව රළු හඬින් මොර ගෑවේය.

ඔහු කී වචන ඇසුණු පියසේන තුළ ලැජ්ජාවක්ද කනගාටුවක්ද ඇති විය. ඔහු එතන නොසිට

ඉවත්වී ගියේය. "තාත්තා සිටියා නම් මේ සැරෙත් අපිට රතිඤ්ඤ පෙට්ටි ගෙනැල්ලා දෙනවා" යි ඔහු තමාටම කියා ගත්තේය. තාත්තා මැරුණු සැටි ගැනද ඔහුට සිහිවිය. තාත්තා මැරුණේ ඉස්පිරිතාලයේය.

තමා මෙසේ රතිඤ්ඤ පෙට්ටි දෙස බලා සිටින විට අම්මා පිටමංවී යන්නට ඇතැයි ඔහුට සිතිණ. ආපසු දිව ගිය ඔහු පාර මැදට වුත් ආපසු බැලීය. එහෙත් අම්මා එහි පෙනෙන්නට නොවීය. අම්මා අද නොඑතියිද ඔහුට වරෙක සිතිණ. අම්මා නොපැමිණියහොත් තමා ගෙදර යන්නේ කෙසේද?

ඔහුට හදිසියේ තමා පැමිණි කාරණය ගැනද සිහිවිය. තමාට වහා එනලෙස ස්වාමිදූව කීවාය. තමා පැමිණි දුර පමණ තව යෑමට තිබේ. ඔහු ඉක්මණින් ගමන් කරන්නට විය.

සිතුවිලි වලින් පිරිගිය ඔහුට අම්මා ගැනද, තමා දකින දේවල් ගැනද තවත් නොයෙක් දේ ගැනද සිහිවෙයි. දැන් ගමෙහි හැම තැනම උන්චිල්ලා බැඳ ඇත. මෙවර ගෙදරත් උන්චිල්ලාවක් බඳින්නට ඇත්ද? එසේ බැන්ද නම් එය බඳින්නට ඇත්තේ අගල අද්දර කොස් ගසෙහි අත්තක විය යුතුය. ගිය අවුරුද්දේ බැන්දේද එතනමය. තාත්තා නැති නිසා උන්චිල්ලාවක් බැඳීමට කෙනෙකු නොමැති යයිද ඔහුට සිතිණ. කෙසේ වුවද, දැන් සිරිසේනත් විජයපාලත්, අන් අය සමඟ එකතු වී ගෙයි පිළිකන්නෙහි දෙඩම් ගස යට වල කජු ගසණු ඇත. ගිය අවුරුද්දෙහි තමා තරම් කිසිවෙක් නොදිනුවේය. ගිය අවුරුද්දෙහි දිනූ කජු

සියල්ල ඔහු මල්ලක දමා දුමෙහි තැබුවේ මෙහි එන්නට සුමානයකට පෙරය. "අම්මේ කජු මල්ල මං එනකම් කාටවත් අල්ලන්න දෙන්න එපා" යි ඔහු එන්ට පිටත් වූ විට අම්මාට කීවේය. තවම එය එතනම ඇත. දැන් ඔහුට යළිත් ගෙදර යා නොහැක්කේ ඇයි? තමා මෙසේ අල්ලා බැඳ තබන්නේ කුමක්ද? එහෙත් දැන් තමාට උවමනා ලෙස සිටිය නොහැකි බව ඔහු දනී. ඔහුගේ සිත ශෝකයෙන් මැලවෙන්නට විය. "දැන් කුමක් කරන්ටද? මෙහෙන් පැන යන්නට බැරිද? මේ ඇ සිතුවිලි නිෂ්ඵල බව ඔහු දනී. එහෙත් අම්මාට පණිවුඩයක් අරින්නට බැරිද? මෙතරම් සෙනඟ අතර කොබෝගම ගැන දන්නා අය බොහෝ විය යුතුය. ඔවුන්ගෙන් එකකුට කීවොත් අම්මාට එන්නට කියා නොඅනුමානවම පණිවුඩයක් ඇරිමට හැකිවනු ඇත. ඔහුගේ සිත ප්‍රීතියෙන් පිනා යන්නට විය. අන්තිමේදී තමා විසින් කළ යුතු දේ සිහිවිණි යයි ඔහු සතුටින් සිනහ වූයේය.

කොබෝගම ගැන දන්නා කෙනෙක් ඇත්දැයි දැන් සොයා බැලිය යුතුය. ඔහු පාරෙහි එහා මෙහා යන අයගේ මුහුණු දෙසද නැවතී කිසිවක් කරමින් සිටි අයගේ මුහුණු දෙසද ඕනෑකමින් බැලුවේය. තමාගේ සිතෙහි ඇති වූ අලුත් ප්‍රීතිය නිසා ඔහුට සියල්ල අමතක විය.

තමාට යාර දෙකක් පමණ ඈතින් කෝට් එකක් හැඳ කුඩයක් අතින්ගත් තාකි මිනිහෙක් සෙමෙන් ගමන් කෙළේය. පියසේන වහා දුවගොස් ඔහු හා කථා කරන්නට විය.

"මේ සීයේ . . . කොබෝගම දන්නවද?"

නාකි මිනිහා තැඹුරුව ඔහු දෙස පුදුමයෙන් මෙන් බැලුවේය.

"මොකක්ද . . . කීවේ . . ."

පියසේන පෙරටත් වඩා හයියෙන් කථා කෙළේය.

"කොබෝගම දන්නවද?"

"නැහැ . . . මට ඇහුනෙ නැහැ . . ." යි කී මිනිහා නොනැවතීම ගමන් කෙළේය.

පියසේන යලිත් වට පිට බලමින් ගමන් කරන්නට විය. කොබෝගම ගැන දන්නා තව බොහෝදෙනකු ඇත. පාරෙහි වූ කණුවකට හේත්තු වී පත්තරයක් බලමින් සිටි කෙනෙකු දුටු පියසේන ඔහු නොඅනුමානවම කොබෝගම දනිතියි සිතුණේය. ඔහු වහා මිනිසා වෙතට දිව්වේය.

"මේ . . . කොබෝගම දන්නවාද?"

මිනිසා නැසුනාක් මෙන් පත්තරය කියෙව්වේය.

"කොබෝගම දන්නවාද?"

"පලයන් යන්න . . . පොඩ්ඩක් පත්තරේවත් බලන්න නැහැ" යි මිනිසා හිස නොඋස්සාම කෑගැසුවේය. ඔහුගේ කෑගැසීමෙන් තැති ගත් පියසේන කථා නොකරම යන්ට ගියේය.

පියසේන යළිත් වට පිට බලමින් වීථියෙහි වේදිකාව දිගේ ගමන් කරන්නට විය. ඊ බෝවීමට ළංව ඇති බැවින් දැන් වීථියෙහි මිනිසුන් බෙහෙවින් වැඩිය. බඩු වෙළඳම් කරන්නෝ පෙරටද වඩා කෑගසමින් බඩු මිල ගණනුත් ඒවා ලාබ බවත් කීහ. අර බැලූන් වෙළෙන්දගේ කටහඬ දැන් මෙතනටද ඇසේ. ඔහු නොනැවතීම කෑගසයි. "ශත දහයයි. ඕනැම එකක් . . . නංගිලට මල්ලිලට ගෙනහින් දෙන්න . . ." ඉක්බිතිව තාකි මිනිසෙක් කුඩා කරත්තයක් අදිමින්ද තව කරත්ත කීපයක් අතින් එල්ලාගෙනද වේදිකාව දිගේ ගියේය. වේදිකාවේ පැත්තක තරබාරු ගැනියක් බුලත්විට් වගයක් විකුනන්ණාය. ඔහු ඇ වෙතට සෙමෙන් ළං වූයේය.

"මොකද විඩක් ඕනද? යි ඇ ඔහු ළංවත්ම ඇසුවාය. ඔහු ඇට සෙමෙන් කථා කෙළේය.

"ආච්චි කොබෝගම දන්නවද?"

"මොකක්ද?"

"කොබෝගම?"

"පලයන් යන්න කොබෝගම ගැන අහන්න ආව."

පියසේනගේ සිත ශෝකයෙන් පිරෙන්නට විය. දැන් ඔහු කොබෝගම ගැන කීපදෙනෙකුගෙන් අසා තිබේ. එහෙත් ඉන් කිසිවකුට ඒ ගැන කිව නොහැකි විය. මෙතරම් මිනිසුන් ඉන්නා තැන මින් එකෙකුවත් කොබෝගම ගැන නොදනිත්ද? ඔහු සුන්වූ බලාපොරොත්තු වලින් යුතුව වට පිට බැලුවේය.

"ඒයි ළමයා, උඹට මක්කද ඕනැ? යි වේදිකාවේම විට මඳක් ඇතිත් වූ මිනිසෙක් ඔහුගෙන් ඇසීය. මිනිසා ඔහු ඉදිරියෙහි බොත්තම්ද, යතුරු කටුද, දම්වැල්ද දමූ පෙට්ටියක් තබාගෙන සිටියේය. පියසේන වහා ඔහු වෙත දිව ගියේය.

"කොබෝ්ගම දන්නවද?"

මිනිසා ඔහුගේ දෑසද මුහුණද දෙස බැලුවේය. ඉක්බිතිව ඔහු තමාටම සිනාසුණේය.

"ඔව්, දන්නවා."

ඒ වචනය ඇසෙත්ම පියසේනගේ සිතෙහි මෙතෙක් ඇති නොවූ ප්‍රීතියක් ඇති විය. ඒ විශ්වාස කළ නොහැක්කාක් මෙන් ඔහු යළිත් ඔහුගෙන් ඇසුවේය.

"කොබෝ්ගම දන්නවාද?"

"ඔව් දන්නවා, ඉතින් මොකක්ද ඕන?"

"එහෙනම් අපේ අම්මට කියන්න, හෙට කොහොමහරි මාව එක්ක යන්න එන්න කියල. මට මෙහේ ඉන්න බැරිය මං එක්කයන්න එන්නෙයි කියන්න."

"උඹේ අම්ම රෙදි හැට්ට අඳින එක්කෙනෙක් නේද?" යි ඇසූ මිනිසා යළිත් හඬනගා සිනහ විය.

"ඔව්. කියන්න කොහොමහරි මාව එක්ක යන්න එන්නයි කියල හෙට උදේම."

"මට නිකම් කියන්න බැහැ ඔය අතේ තියෙන සල්ලි වලින් ශත දහයක් දීල බොත්තමක් ගන්න ඕන."

පියසේන මඳක් කලබල වී වට පිට බැලුවේය. "සල්ලි නැති නොකරගෙන එන්න ඕන" යි පිටත්වන විට ස්වාමිදුව කී සැටි ඔහුට සිහිවිණ. එහෙත් තමා සත දහයක් දී බොත්තමක් නොගතහොත් මොහු අම්මාට පණිවුඩය නොකියනු ඇත. ගෙදර ගොස් ගුටි කෑ යුතු යයි ඔහු සිතුවේය. ඔහු ශත දහය දී බොත්තම ගත්තේය.

කඩය දෙසට යන්නට පිටත් වූ ඔහු ආපසු හැරී යළිත් මිනිසාට කථා කෙළේය.

"කොහොම හරි කියන්න. හෙට උදේම එන්නය කියල."

"නැ ඒව ඔක්කොම හරි" යි මිනිහා කියනු ඔහුට ඇසිණ.

ඔහු ගෙදර එනවිට ඇඳිරි වැටීමට ආසන්නව තිබිණ. ප්‍රමාදය ගැන ඔහු බිය විය. එහෙත් ස්වාමිදුව තවමත් මහමින් සිටියාය. ඔහු නූල්රෝද ගෙනවුත් ඇට නොව කුස්සි අම්මාට දී ඉතිරි සල්ලිද දුන්නේය. නූල් රෝදවල ගණන ඇය දනිතියිද, තමා මිනිසාට සත දහයක් දුන්බව දන ගනිතියිද ඔහු බිය විය. ඒ ගැන ඇසුවොත් තමාට ගුටිකන්නට වනු නොඅනුමානය. ඔහු පැයක් පමණ කුස්සියට වී සිටියේය. එහෙත් කිසිවෙක් ඒ ගැන ප්‍රශ්න නොකළේය.

රෑට කෑම කා නිදගන්නට එත් ඔහු නොයෙක් දේ ගැන සිතන්නට විය. ඔහුගේ සිත ප්‍රීතියෙන් කුල්මත්ව නැටුවේය. 'හෙට උදේම අම්මා පැමිණ තමා එක්ක යනු ඇත.

ඔහු සිහිනෙන් දුටුවේද තමා ගෙදර ගොස් සිටින බවය. ඔහු ගෙට ගොඩවූ විගස ගොළු මල්ලීත්, නංගීත් දුවගෙන ආහ. නංගී ඔහුගේ ඇඟ කෙනිත්තුවේය.

"කෝ . . . කජු මල්ල . . . කෝ . . . උඹලා නැති කරලා . . . ඔහු කෝපයෙන් අසන හඬද ඇසුණේය. "නැති කරලා . . . උඹලා . . . මං එනකම් . . ." ඉක්බිතිව ඔහු ඉකි බිඳින හඬද ඇසිණ.

## 9

# අම්මාගේ ශෝකය

"**තා**ත්තා හිටිය නම් ඔක කවදවත් සිද්ධ වෙන්නේ නැහැ" නිශ්චලව කල්පනාවේ යෙදී සිටි අම්මා කියනු මට ඇසිණ. මැද සාලයෙන් ඔබ්බෙහි දික් සාලයෙහි වූ මේසය අසල වාඩිවී සිටි මම ඇගේ කථාව නෑසුනාක් මෙන් කියවමින් සිටි පොත කෙරෙහි සිත යොමු කෙළෙමි. දික් මේසය මැද තබන ලද විශාල ග්ලෝවකින් යුත් ලාම්පුවෙහි එළිය කාමරයේ අම්මා සිටි කෙළවර එළි නොකරයි. මා ඉදිරියෙහි වූ මේසයේ අනික් පැත්තෙහි වාඩිවී කිසිවක් මහමින් සිටි අක්කා හිස ඔසවා අම්මා දෙස බැලුවාය.

"මේ කට්ටිය ලාබයත් ලේසියත් බලාගෙන කෙරුවට මොකද දැනටම මිනිස්සු එක එක දේවල් කියන්න පටන් අරගෙන තිබෙනවා"

"ඒ ගොල්ලන්ට වැරදිච්ච තරම කොච්චරද කිව්වොත් මේ සැරේ කුඹුරුත් අඳේට දෙන්න ලෑස්තිවෙලා ඉන්නවයි කියා අද කීපදෙනෙක් කියනවා සියදෝරිස්ට ඇහුනලු" යි අම්මා අක්කා කී දෙය ස්ථිර කරමින් කීවාය.

"මේ අලුත් මෝස්තර දකින්න ඉස්සෙල්ල අර මනුස්සය වගේ මටත් මැරෙන්න වුණා නම් එහෙත්" යළිත් නිශ්ශබ්දව සිටි අම්මා කීවේ මඳක් කෝපයෙන් හා සංවේගයෙනි. ඇගේ කටහඬින් මම එය දුන ගතිමි. ඇගේ කෝපයට වඩාත් හේතුවන්නට ඇත්තේ මගේ නිශ්ශබ්දතාවය විය හැක. මම ඔවුන්ගේ කථාවට ඇහුම්කන් නොදී කියවමින් සිටි පොත බලන්නට වීමි.

මෙවර අපේ කුඹුරු බද්දදිය යුතු යයි අයියා විසින් යෝජනා කරන ලද්දේ මීට මසකට පමණ පෙරය. කුඹුරුවල වැඩපල කිරීමත්, ඒවා බලා සොයා ගැනීමත් තමාට කළ නොහැකි බැවින්, කිරීමට ඇති එකම දෙය නම් ඒවා බද්දදීම යයි ඔහු පසුගිය වාරයේ ගොයම් කැපීමෙන් පසු නොයෙක් විට කීවේය. පසුගිය වාරයේ අස්වැන්න ඊට පෙර හැම වාරයකටම වඩා බෙහෙවින් අඩු විය. නොයෙක් ආකාර පෝර දමා, අලුත් ක්‍රම අනුව පැළ කළද මෙසේ අස්වැන්න බෙහෙවින් අඩුවී යෑම අයියාගේ කලකිරීමටත් ශෝකයටත් හේතු විය. විශේෂයෙන් තාත්තා මිය යෑමෙන් පසු ගොවිතැන් එළිකළ පළමුවාරය එය වූ බැවිනි ඔහුගේ කලකිරීම වඩාත් දියුණු වූයේ. තාත්තා සිටියදී ඔහු සිය ඉඩකඩම් හෝ කුඹුරු කිසිවිටක බද්දට හෝ අඳේට නුදුන්නේය. ඔහු එසේ කළේ එවැනි අවස්ථාවක් නොඑළඹුන නිසාම යයි මට කිව නොහැක. තාත්තා අසනීපයෙන් සිටි අන්තිම කාලයේ වරක් සිය කුඹුරු බද්දට දෙන්නට යයි අයියා යෝජනා කළ බව මට මතකය. එහෙත් තාත්තා එය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කෙළේය. "මට ඇදෙන්

නැගිටින්න පුළුවන් කල් මට ඒක කරන්න බැහැ. ඊට වැඩිය හොඳයි ඒවා විකුණලා දන එක." තාත්තා මෙසේ කීවේ බලවත් හැඟීමෙන් යුතුවය. තාත්තා මිය යෑමට කීප දිනකට පෙරදා ඔහු හැම දිනම එළිවන විට කළේ සිය කුඹුරුවල ඇවිදීමය. ඔහු එසේ කළේ කිසි කාර්යයක් පිණිස නොව මුළු ජීවිතකාලයක් තුළ තම සිතෙහි පුරුදුකළ සිරිතකට වහලකු වීමේ ප්‍රතිඵලයක් වශයෙනැයි සිතමි. යම්තම් එළිය වැටෙන විට ගෙදරින් පිටවූ ඔහු පිණිදියෙන් තෙත් වූ තණකොළින් යුතු නියරදිගේ ඇවිදමින් දෙපසෙහි වූ කුඹුරු දෙස බැලුවේ, බොහෝකල් තමාට උපකාරී වූ මිත්‍රයකුගේ මුහුණ දෙස බලන්නකු මෙනැයි මම සිතමි. ඔහුගේ දෙ ඇසෙහි වූයේ කෘතඥතා පූර්වක බැල්මකි. අහලක දිය එක්වී තිබෙනු දුටු ඔහු මොහොතක් නැවතී දෑතින් දෙපස සකස් කොට විලුඹින් දියමග පෑදුවේය. ගොයම් ගස් වැඩී, පිපී, කරලින් බරව යන අවදියෙහි ඔහු හැම උදයෙක්හිම ගොයම් කරලකින් ඇට කීපයක් සීරුවෙන්ගෙන මාපට ඇඟිලි දෙකෙහි නියපොතු වලට තද කොට බැලුවේය. "දන් ඇටවල තාඹර වැටිලා තව ටික දිනකින් කපන්න ඇහැකි" යි ඔහු ඇතැම් දිනක ගෙදරවුත් අම්මා සමඟ කීවේ අහංකාර ලීලාවෙනි.

තාත්තාගේ මරණයෙන් පසු මේ සියල්ල බාරවූයේ අයියාටය. මට වඩා වයසින් අවුරුදු හතක් පමණ වැඩි ඔහුට තාත්තාගේ මරණයෙන් පසු පවුලේ ප්‍රධානියා වශයෙන් ක්‍රියා කිරීමට සිදුවිය. තාත්තා නැති වූ පළමු වාරයෙහිම අස්වැන්න බෙහෙවින් අඩුවී

ගිය බැවින් අපේ කුඹුරු සියල්ල බදුදිය යුතු යයි ඔහු තීරණය කෙළේය. මමද ඔහුගේ තීරණය අනුමත කෙළෙමි. එහෙත් අක්කා හා අම්මා එය අනුමත නොකළහ. මට වඩා අවුරුදු තුනක් පමණ වැඩිමල් අක්කා ගමේ පාසැලේ ගුරුවරියකි. අම්මා, කුඹුරු බදු දීම ගැන අසතුටු නොවිය යුතු යයි අයියා නොයෙක් අයුරින් කී නමුත් ඈ ඒ කිසිවක් නොපිළිගත්තාය. අම්මාට අප කී දෙය නොවැටහුණේ කුමක් නිසා දැයි මම නොදත්තෙමි. ඇගේ විරුද්ධත්වය ඇතැම් විටක අයියාගේ කෝපයද අවුස්සන සුළු විය. එවැනි විටක ඔහු ඈ සමඟ වාද කිරීමට නොගොස් ම නිශ්ශබ්ද වූයේය.

අම්මාගේ මුහුණ මා සිටි තැනට පැහැදිලිව නොපෙනුනද මම එහි වූ පෙනුම මනැසින් දුටුවෙමි. මඳ වේලාවක් නිශ්ශබ්දව සිටි ඈ යළිත් කථා කරන්නට වූවාය.

"පහළ මහගේනේ ලියද්ද බදු අරගෙන තියෙන්නේ, පැලවත්තේ කරනේලිස්ලා නේද?"

"ඔව්" යි මම මෙතෙක් කියවමින් සිටි පොත පහත් කොට ඈ දෙස බලමින් කීවෙමි.

"තාත්තා ඉන්න කාලේ ඒ මිනිහාට මේ වත්තේ පස් පෑගෙන්න ඇරියේ නැහැ. ඉඩම් නඩුව වෙලාවේ තාත්තට විරුද්ධව සාක්කි කිව්වේ ඔය මිනිහා. කරනේලිස් අද කිය කියා ඇවිද්දලු අපිට තාත්තගෙ ලෙඩේට වියදම් වෙච්ච නිසා ගොවිතැන් කරවන්න මිල මුදල් හිඟවෙලා ඒ මිනිහට බදු දුන්නාය කියා."

"මිනිස්සු කියන දේවල් ගණනට අරගෙන වැඩකරන්න බැහැ. කුඹුරු බදු දුන්නහම කිසි කරදරයක් නැහැ. කැම හදන්නවත්, කුලී දෙන්නවත් ඕන නැහැ. ඒ මිනිස්සු ගොවිතැන් එළිකරලා අපේ කොටස දේවි. ඒක හුඟක් ලාබයි" යි මම පිළිතුරු වශයෙන් කීවෙමි.

"මම දන්න ලාභයක් නැහැ. එකක් නම් මට පේනවා. උඹලාගෙ වැඩ හින්ද අපිට ලැජ්ජාවෙ දෙවට බහින්න බැරිවෙනව" යි අම්මා උස් හඬින් කීවේ කෝපයෙනි. පුටුවෙන් නැගිටි ඈ සාලයෙහි ඒ මේ අත සක්මන් කරන්නට වූවාය.

"අම්මාගේ ලෝභකම නිසා කිසිදෙයක් පෙනෙන්නේ නැහැ." අපේ කුඹුරු බද්දට දුන්නාට අපිට වෙන අවනම්බුව මොකක්ද?" යි ඈ කී දෙයින් කෝපයට පත් මම අක්කා සමඟ කීවෙමි."

මෙතෙක් නිශ්චලව අප කී දෙයට කන්යොමා සිටි ඈ මැහුම නමා පසෙකින් තැබුවාය.

"මල්ලී, අම්මා කුඹුරු බදු දෙනවාට අකමැති ලෝබකම නිසා නොවෙයි. අනුන් ඒවා එළිකරන බව දකින එක අම්මාගේ හිත රිදවන නිසා වෙන්න ඇති."

"මොකටද හිත රිදෙන්නේ, අම්මලාගෙ බොරු මාන්නය නිසා තමයි කිසි දෙයක් කරන්න බැරි" යි මම කීවෙමි.

"එහෙම කියන්න එපා. අම්මලාගේ මුළු ජීවිතයේ හුපුරුදු දෙයක් වෙනකොට එයාලට ඒක රුස්සන්නෙ නැහැ. හුඟක් කල් පාවිච්චි කරහම කොයි දේකට වුවත් ලොකු ආසාවක් ඇතිවෙනව"

ස්වභාවයෙන් නොයෙක් දේහි අසාමාන්‍ය පැත්ත බැලීමෙහි රුසියකු වූ අක්කා ගැඹුරු දේ ප්‍රියකළ එකියකැයි සිතමි. අයියා සහ මා මෙන් නොව හැඟීමෙන් යුතුව ජීවිතය දෙස බැලීමට ඈ පුරුදු වූයේ කුමක් නිසා දැයි මම නොදනිමි. අවුරුදු ගණනක් කුඩා දරුවනට උගැන්වීමෙන් ලත් ඉවසීමත්, අත්දැකීමෙන් ලත් පුළුල් දැනුමත් නිසාද ඈ එසේ බැලීමට පුරුදුවූයේ. ඇගේ නිශ්චල ගැඹුරු දෙනෙත හා දිගටි මුහුණද ඇගේ සිතෙහි මුහුණුවර කියන්නකියි මම සිතමි.

"මල්ලී මම නැබොඩ ඉස්කෝලේ ඉන්න කාලේ මට තද නිල්පාට හැට්ටයක් තිබුණා. මට මුලදී ඒක පෙන්නන්නත් බැරුව තිබුණා. පස්සෙ ඒක ඉරෙන්න යනකොට මට ඒකට හරි ආසාවක් හිතුනා හොඳටම ඉරුනයින් පස්සෙත් මම ඒක මහ මහ ඇන්ද."

"එහෙනම් අම්මටත් වෙලා තියෙන්නේ ඒ වගේ එකක් ද?" යි මම අක්කාගෙන් ඇසුවේ සිනහවෙමිනි.

"මොකක් වුණත් අම්මාට දුක ඇති අපේ කුඹුරු අනුන් එළිකරනවා දකින්න" අක්කා යළිත් කීවාය.

එදින රාත්‍රි කෑම කෑමෙන් පසුද අම්මා කථා කලේ ඒ ගැනමය.

කෑමෙන් පසු අයියා පැමිණ ඉස්තෝප්පුවෙහි වූ හාන්සිපුටුවෙහි වාඩිවූයේය. මම මැද සාලයෙහි එක් පසෙක වූ සෝපාවෙහි සිටියෙමි. සාලයෙහි මැද පිත්තල දම්වැල් වලින් එල්ලන ලද විශාල පහනෙහි එළිය ඉස්තෝප්පුව තෙක් පැතිර නොසිටියි. අම්මා ඉස්තෝප්පුවෙන් සාලයට පිවිසෙන දෙරටුව අසල නැගිට සිටියාය. අවට සිහින් පොද වැස්සක් වැටෙමින් තිබුණේය.

"උඹ අද්දර ලියද්ද කැල්ලත් බදු දුන්නද?" යි අම්මා අයියාගෙන් ඇසුවාය.

අද්දර ලියද්ද යනුවෙන් අප විසින් අඳුන්වනු ලබන්නේ අපේ ගෙයි ඉදිරියෙහි වූ කුඹුරය. ඒ මැදින් දිවෙන ගම්සභා පාරෙන් යුතු එය විශාල ලෙස අවට වසා පැතිර ගොස් අවසන් වන්නේ කඳු පාමුලකිනි.

"ඔව්," ඒක නොදී ඒක විතරක් තියාගෙන මක්කටද?"

"ගෙදර ඉස්සරහ තියෙන එකවත් අපට එළිකරන්න තිබුණහම නරකද? නිතර දෙවේලේ පෙනෙන එකත් අනුනට දෙන්නේ මොකටද?" යි අම්මා යලිත් කීවාය.

"ඕවා ටික ටික වුණත් එළිකරන්න ගියහම කුලී යනවා අත්තිමට බැලුවහම අස්වැන්නට වැඩියි, වියදම් වෙන කුලිය. ඒ සල්ලි ළඟ තියාගෙන හම්බවෙන වී මදිනම් ඒවායින් සල්ලිවලට පිටින් වී ගත්තහම ඊට වැඩිය ලාබයි."

"අනුන්ගෙන් වී සල්ලිවලට ගන්නවට වැඩිය හොඳයි බඩගින්නෙ නොකා මැරෙන එක" යි අම්මාගේ කටින් පිටවූයේ කිසිවක් වේගයෙන් පිපිරී විසිරී යන්නාක් මෙනි. ඔහු කී දෙය ඇසීමෙන් ඇගේ හදෙහි ඇති වූ හැඟීම් කෙතරම් බලවත් දැයි මම ඇගේ කටින් පිටවූ වචනයෙන් හැඳින ගතිමි. අයියා කිසිත් නොකියා නිශ්ශබ්ද වූයේය.

අවට වූ වැස්ස ක්‍රමයෙන් දියුණුවෙගෙන එයි. මා සිටින ඇඳ අසල වූ ජනේලයෙහි පියනක් මත වැසි පොද කීපයක් වේගයෙන් හඬනගමින් ඇද වැටෙයි.

"මේ කුනු පිදුරු වටාරෙ වෙන අවුරුදුවල නම් මීට වැඩිය පරක්කු වෙලයි වහින්නෙ" ගෙයි පිටුපස බරාඳයෙහි වූ දවිත් අයියා අක්කා සමඟ කියනු මට ඇසිණ.

"අලුතෙන් වක්කඩවල් බඳින්න පටන්ගන්නෙ කවද ද?" යි මද වේලාවක් නිශ්ශබ්දව සිටි අම්මා යළිත් ශාන්ත හඬින් ඇසුවාය.

"හෙට හවස ඉස්සරහ කෑල්ලේ වක්කඩවල් බඳීවි. ඊට පස්සෙ තමයි අනිත් හරියේ වක්කඩවල් බඳින බව කිව්වේ."

"තාත්ත හිටියා නම් කිසිදෙයක් ඔහොම වෙන්නේ නැහැ. තාත්තාට හොඳට ඇවිදගන්න බැරි කාලෙත් එකම දවසක්වත් ගොයම් කපන තැනකට නොගොහින් අත්හැරියේ නැහැ. පස්සේ තනියම යන්න බැරි වුණාම දවිත් එක්ක හැරමිටියෙ වාරුවෙන් ගියේ.

කුඹුරු අඳේට දෙනවාට තාත්තා කවදාවත් කැමති වුණේ නැහැ" යි අම්මා අන්තිම වශයෙන් කීවේ දුක්මුසු හඬිනි.

පසුදින උදයෙහි මම ඉස්තෝප්පුවෙහි වූ පුටුවක වාඩිවී අලස කල්පනාවක යෙදී සිටියෙමි. වාතයෙහි සැහැල්ලු බවද, හිරුරැස් දිය දහරක්මෙන් ඉදිරිපස දෙළුම් ගසෙහි කොළ අතරින් බේරී, රටාවක් ලෙස වැතිර ඇති සැටිද දකින මා සිත අලස බවෙහි ගිලෙයි. මිදුලෙහි පේළියට වවන ලද ඕකිඩ්ස් ගස් කීපයක් කුඩා දරුවන් මෙන් ප්‍රීතියෙන් සිනහවෙති. උඩ මිදුල පහළ මිදුලෙන් වෙන්කරන තාප්පයෙහි තරප්පු පේළිය අසල සිට අම්මා කිසිවකු හා කථා කරනු ඇසී මම එයට කන්යොමා සිටියෙමි. පහළ මිදුලෙහි සිටි තැනැත්තා මා සිටි තැනට නොපෙනුනද මම ඔහු ඇඳින ගතිමි.

"මම හිටියේ උඹ එතකන්" යි අම්මා ඔහු හා කියනු මට ඇසිණ. "උඹට කියල වැඩක් කරවගන්න තියෙනවා."

"මොකක්ද" යි දවිත් අයියා උද්‍යසිත ගතියෙන් ඇසුවේය.

"අර අටුව කඩල දන්න ඕන. දන් ඕවයින් ඇති වැඩක් නැහැ. නිකම් ගේ හිරවෙන එක විතරයි. මීට පස්සෙ ඕවයි තියන්න වී හිටින එකක් නැහැ."

"අනේ මම දන්න එකක් නැහැ. වෙනද වී මල හැටක් හැත්තෑවක් තියන එකේ මීට පස්සේ . . .

කොහොමද . . . කියලවත් මට නම් හිතන්න බැහැ'' යි දවිත් අයියා කීවේය.

''මගේ හිතට නම් මහ මොකක්ද වගෙයි. මමත් පුංචිමහත්තයට කිව්වා.''

අම්මා දවිත් අයියා සමග ගේ තුළට යනු දුටු මම, ඇ කුස්සියෙහි වූ අටුව කඩා දමතියි සිතුවෙමි. එහෙත් ඇ එසේ නොකළාය.

''වෙනද මේකෙ කොච්චර වී තිබෙනවාද? ගිය මුරේ මට අහුවුණා ඔය ලොකු පුතා පුංචි කාලෙ තියපු බිත්තර වී මල්ලක්. කුස්සියට ඉඩ ආවත් මට නම් මේක කඩල දන්න බැහැ'' යි අටුව ළඟට දවිත් අයියා සමග පැමිණි ඇ කීවාය.

එදින සවස්වන තුරුද අම්මා නොයෙක්විට කථා කෙළේ ඒ ගැනමය. දවල් කෑම කෑමෙන් පසු පැයක් පමණ නිදගැනීම අම්මාගේ සිරිතය. ඇ සිරිතක් වශයෙන් නිදගන්නේ සාලයේ ස්කිරීමෙන් වෙන් කරන ලද කොටසෙහි ජනේලය අසල තබන ලද විශාල කච්චියෙහිය. ඇ එහි නොමැති වූ බව දුටු මම අක්කාගේ කාමරයට ගියෙමි.

''අම්මා නිදගත්තේ නැතිව කොහේ ගිහිල්ලද?'' යි හිස පීරමින් සිටි ඇගෙන් මම ඇසුවෙමි.

''මම නානකොට නම් ඉස්සරහ ලියද්දෙ පලා වගයක් කඩ කඩා හිටියා. මම ඇහුවම කිව්ව කොළ කැඳවලට ගොටුකොළ වගයක් කඩන්න ආවය කියල'' යි අක්කා කීවාය.

මම ඈ අසල වූ ජනේලයේ රෙද්දට උඩින් අවට බැලුවෙමි. ගස් කීපයකින් ආවරණය වුවද ඉස්සරහ කුඹුරෙන් හරි අඩක් පමණ ජනේලය අසලට මැතවින් පෙනෙයි. අනෙන් කිසිවක් රැගත් අම්මා කල්පනාකාරී ලෙස නියරක් දිගේ පාර දෙසට එනු මම දුක්කෙමි.

"අම්මා හිතනවා ඇති කුඹුරු බද්දට දුන්නහම ඒවා අපිට තවත් නැතිවේය කියා" යි මම අක්කා සමඟ කීවෙමි.

"මල්ලි ඒක නොවෙයි. කොච්චර වුණත් අම්මාට හිතට අමාරු ඇති. අපිට වගේ නොවෙයි" ඈ කීවාය.

එදින ඇඳිරි වැටීමට පළමු අහසෙහි අඳුරු පැහැයක් ඇතිවෙන්ට විය.

නිශ්චල අහසෙහි මෙන්ම වාතයෙහිද බර කනස්සලු භාවයක් රැඳී තිබේ. 'පස්කාස්', 'පස්කාස් උදැල්ලක් පොළොවෙහි වැදීමෙන් නගින හඬ පමණක් අවට නිශ්චලත්වය බිඳියි. උදළු හඬ නොනැවතී ඇසෙයි. එය අද්දර ලියද්දෙහි වතුර බැඳීමට පැමිණියවුන් වේල්ලක් බඳින හඬ විය යුතු යයි ඉස්තෝප්පුවෙහි පුටුවක වාඩිවී සිටි මම සිතුවෙමි. ඉස්තෝප්පුවෙහි ඉදිරිපස මුවා කොට ඇත්තේ ගරාදි වැටකිනි. ඉන් කණුවකට හේත්තුවී සිටි අම්මා කල්පනාවෙහි යෙදී සිටියාය. ඉස්තෝප්පුවෙහි එක් මුල්ලක වූ මගේ පුටුව තබා සිටි තැනට ඇගේ මුහුණ සම්පූර්ණයෙන් නොපෙනෙයි.

"පස්කාස්", "පස්කාස්," උදල්ල පොළොවෙහි වැදීමෙන් නගින හඬ අවට නිශ්චලත්වය බිඳිමින් නොනැවතී නගියි. අපේ ගෙයි ඉදිරිපස වැටී ඇති දුඹුරු පැහැති ගම්සභා පාරෙහි කිසිවකු නොපෙනේ. ගෝනි දෙකක් පැටවූ තිරික්කලයක් එහා පාරෙහි වේගයෙන් දුවගොස් අතුරුදහන් විය. ඉක්බිතිව නිශ්චලත්වය යළිත් දැඩි විය. වාඩිවී සිටි පුටුවෙන් නැගිට ඉස්තෝප්පුවෙහි ඒ මේ අත සක්මන් කළ යුතු යයි සිතුන නමුත් නිශ්ශබ්දතාවය මා වටාද පැතිරිණ. ඉතා දුක්මුසු ආරංචියක් බලාපොරොත්තු වූවන් මෙන් සියල්ල ඒ නිශ්චලත්වයෙහිම ගැලී සිටියි.

'පස්කාස්, 'පස්කාස්,' උදළු හඬ ඉතා දුක්මුසු නාදයක් මෙන් වාතයෙහි පැතිරෙයි. ඉන් ගැලවිය නොහැකි වූ මම නොනැගිට එහිම සිටියෙමි. මේ සියල්ල මෙසේ සිදු නොවිය යුතු යයි මටද දැන් සිතේ.

'පස්කාස්, 'පස්කාස්,' දුක්බර හඬ අවට ගලා යයි. අම්මා තවම හේත්තු කොටගත් හිසින් යුතුව නිශ්චලව සිටින්නීය.

"පස්කාස්, පස්කාස්"

# 10

# සැප සෙවීම

තරුණියකට පෙම් කළ එක්තරා තරුණයෙකු ඇ මැරූ සැටි දක්වන අපූර්ව පුවතක් මම කලකට පෙර කියවූයෙමි. තරුණයා ඇ මරා තිබෙන්නේ ඇ තමාට ප්‍රේම කිරීමට නොහැකි යයි පැවසූ බැවිනි. ඇ මැරීමෙන් පසු "මම ඇගෙන් එය ගත්තෙමු" යි ඔහු මොහොතක් යනතුරු ප්‍රීතියෙන් කෑ ගසමින් නැටූ සැටිද එම ප්‍රවෘත්තිය අන්තිමෙහි කියා තිබුණේය.

කලකට පෙර කිය වූ මේ ප්‍රවෘත්තිය මෑතක සිට මට සිහිවනුයේ මගේ මිත්‍රයකු පිළිබඳ එක්තරා සිද්ධියක් ඇසීමෙන් පසුවය. මගේ මිත්‍රයා මේ පුවතෙහි එන තරුණයාගේ චෛතසික ස්වභාවය ඇත්තෙකැයි මට නිගමනය කළ නොහැක. එහෙත් ඔහු ද මිනිස් සිත පිළිබඳ ඒ සත්‍යයෙන්ම මෙහෙයවනු ලැබූවෙකැයි සිතීම නිවැරදි යයි සිතමි.

"තමුසේ කියන්නේ ඇත්තද?" යි ඔහු කී දෙය විශ්වාස කිරීමට නොහැකි වූ මම විස්මයෙන් මෙන් සිරිමාන්නගේ මුහුණ දෙස බැලීමි. කන්තෝරුවෙන් වෙනදට වඩා කලින් පැමිණ බඩුවගයක් ගැනීම පිණිස යමින් සිටි මට එදින පිටකොටුවෙහිදී සිරිමාන්න

සමුවිය. බොහෝ කලකින් ගමට යෑමට නොහැකි වූ බැවින් මම ඔහු සමඟ හෝටලයකට ගොස් ඔහුගෙන් ගමරට තොරතුරු ගැන අසන්නට වීමි.

"හැබෑටම මිනිහා මොකක් හිතාගෙනද ඔහොම කරන්න ඇත්තේ?" යි මම නැවතත් ඔහුගෙන් ප්‍රශ්න කෙළෙමි.

"ඒක මොකක් වුණත් සේරසිංහට මගේ හිතේ හිරේ නොගිහින් බේරෙන්ට පුළුවන් එකක් නැහැයි" සිරිමාන්න පිළිතුරු දුන්නේය.

"ඔහොම වෙන බව දැන දැන ඔහොම එකක් කරන්න මිනිහ මහ මෝඩයෙක් නොවැ" යි ඔහු කී දෙයින් පුදුමයට පත් මම කීවෙමි.

"එහෙම කියන්නත් බැහැ" යි කියනු කල්පනාකාරී පෙනුමක් දෙනෙතට නඟා ගනිමින් සිරිමාන්න කීවේය. "සේරසිංහ එහෙම මෝඩකම් කරන මිනිහෙක් නොවෙයි."

සේරසිංහ ගැන ඔහු කී දෙය ඇසීමෙන් පුදුමයට පත්වූයේ මා ද සේරසිංහ හොඳට අඳුනාගෙන සිටියකු බැවිනි.

කොළඹ රක්ෂාවකට පැමිණීමට පෙර ගම නැවතී සිටි කාලයේ දී මම සේරසිංහ ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කෙළෙමි. ඔහු එකල සුදු මහතකුගේ අක්කර තිහක පමණ වත්තක් බලාගෙන සිටියේය. ඔහු රක්ෂාවක් වශයෙන් කළේ එපමණය. ඔහු අවංක කෙනෙකු වූ

බැවින්, ඔහුගේ පවුලට පදිංචිය පිණිස, වතු අයිති කරුවා විසින් එහි කුඩා ගෙයක්ද සාදවා දෙන ලදී. තමා සතු ඉඩකඩම් ටිකක් තිබුණ නමුත් ඔහු ළඟ මිල මුදල් වඩා නොවීය.

මෙ පමණ කලක් රක්ෂාව කොටද තමාට ඉන්නට සෑහෙන ගෙයක් සාද ගැනීමට නොහැකිවී යයි ඔහු එකලද නොයෙක් විට කී බව මට මතකය. දෙමව්පියන්ගෙන් කිසිවක් ලබාගැනීමට නොමැතිවද ඔහු මෙවැනි තත්ත්වයකට පැමිණීම හොඳටම ඇතැයි මම ඒ අවස්ථාවල දී ඔහු අස්වසනු පිණිස කීවෙමි. එහෙත් තමාට පදිංචියට නිසි ගෙයක් නොවී යයි යන හැඟුම ඔහු තුළ එකලද දැඩිව පැවති එකක් බව මට අවබෝධ විය. එය කිසිවකු තුළ ඇතිවන සාමාන්‍ය හැඟීමකැයි මා මුලින් සිතුවද එක්තරා සිද්ධියකින් පසු එය එසේ නොවන බව මට වැටහිණ. ඒ හැඟුම ඔහුගේ සිත කෙබඳු දැඩි ග්‍රහණයක ගෙන ඇද්දැයි යන්න මට එදින ප්‍රථම වරට මැනවින් පෙනිණ. එය කිසිවකු ඇදහීමට වුවද මැලිවන සුළු අපූර්ව සිද්ධියකි.

අපි එදින යාබද ගමක මඟුල් කෑමක් පිණිස ගොස් ආපසු එමින් සිටියෙමු. කිසිවක් ගැන කථා කරමින් පැමිණි ඔහු නිශ්ශබ්දව ගමන් කරන්නට විය. ඔහු නිශ්ශබ්ද වීමට හේතුව කුමක් දැයි දැනගනු පිණිස මම ඔහු දෙස බැලුවෙමි. ඔහුගේ දෙනෙත් පාරෙන් යාර සියයක් පමණ ඈත්වූ ගෙයක් දෙස යොමුවී තිබෙන බව මට පෙනිණ. ගෙය අලුත සාදන ලද කුඩා මනහර එකකි. එදෙස බලාගත් වනම පැමිණි ඔහු ගෙයි වත්තෙහි කඩුල්ල අසලට පැමිණ

තතරවී එදෙස බලාගෙන සිටින්නට විය. දෙනෙත් පුළුල් කොට බලා සිටින ඔහු දෙස මම ඕනෑකමින් බැලුවෙමි. තදකොට පියාගත් දෙතොලින් හා අයාගත් දෙ ඇසින් යුතුව බලා සිටින ඔහු දුටු මට සිහිවූයේ, සාප්පුවක වීදුරු අල්මාරියක් ඇතුළෙහි ඇති සෙල්ලම් බඩුවක් දෙස බලා සිටින බිළිඳෙකුගේ මුහුණය. ඔහු එදෙස බලාසිටින්නේ තද ඇල්මකින් බව මට පෙනිණ. ඔහුගේ මුහුණෙහි සෑම අංගයකින්ම දැඩි ආශාවකින් පෙළෙන ඒ හා බඳු ස්ථිර අධිෂ්ඨානයකින් යුක්තවූවකුගේ සිතෙහි මුහුණුවර හෙළිවී යයි මට සිතිණ. ඔහු කල්පනාවෙහි ගැලී සිටින බව දුටු මම ඔහුට කථා කෙළෙමි.

"කවුරුවත් දැක්කොත් අපි පිස්සොයි කියල හිතන්න පුළුවන්. අන්න කවුද සාලයේ ඉඳල එළියට එනව" යි මම කීවෙමි. මා කීවේ බොරුය. සාලයෙහි හෝ වත්තෙහි කිසිවෙක් පෙනෙන්නට නොවීය.

මගේ වචනවලින් ඔහු පිබිදුනෙන් අපි යළිත් ගමන් කරන්නට වීමු. "වෙන තැනක හැදුව නම් අගේ ඇති ගේ" යි ටික දුරක් ගිය ඔහු කී බව මට මතකය.

"මිනිහට එකවරටම ගෙයක් හදන්නට තරම් සල්ලි ළඟ තිබුණේ කොහොමද?" යි මඳක් කල්පනා කරමින් සිටි මම යළිත් සිරිමාන්නගෙන් ඇසුවෙමි.

"ඇයි වත්ත අයිති මහත්තය මාස ගණනකින් සල්ලි අරගෙන නැහැ. වැඩි විශ්වාස කම හින්ද පස්සෙ අරගන්න කියල තියන්න ඇති."

"දුන් කොහොමවත් බේරෙන්න විදියක් නැද්ද" යි ඔහුගෙන් සියල්ල දැන ගැනීමට උත්සුක වූ මම ඇසුවෙමි.

"බේරෙන්න කොහොමද? මිනිහම කියල තියෙනව නොවෙ සල්ලි ගත්තු බව. මගේ හිතේ දුන් තවූ දල" යි ඔහු කීවේය.

"රුපියල් හාර පන්දහක් විතර අරගන්න ඇති" යි සිරිමාන්න පටුවෙන් නැගිට්නු දුටු මම ඔහුගෙන් තව තොරතුරු දැනගනු පිණිස ඇසුවෙමි.

"ඔව් එච්චර විතර වෙන්න ඇති. දුන් බස් එකටත් කිට්ටුයි. මේක වැරදුනොත් යන්න වෙන්නේ හතහමාරෙ බස් එකෙ" යි කී ඔහු හෝටලයෙන් එළියට ඒමට සූදානම් විය.

සේරසිංහ පිළිබඳ පුවත ඇසූ මා තුළ මවිතයක් ඇතිවිය. ඔහු වැන්නකු මෙතරම් මුදලක් තබා සුළු මුදලක්වත් වංචා කරතියි සිතීම මට අපහසු විය. කෙසේ වුවද ඔහු වැටී ඇති අන්තරාදයක අඩිය ගැන මම ශෝකවීමි. තමා අතින් නොදැනුවත්වම වියදම් වන්නට ඇති නමුත් ඔහු විසින් කිසිවිටක වංචා කරන්නට ඇතැයි යන්න මට කිසි ලෙසකින්වත් විශ්වාස කළ නොහැකි විය.

ඊට සුමාන කීපයකට පසු මම කිසියම් උවමනාවක් සඳහා මරදානට ගියෙමි. මරදානේ දුම්රිය පලේදී මට සේරසිංහ සමුවිය. ඔහු සමුවීමට පුර

පුලා සිටි මම ඔහුගෙන් තමාගේ අභාග්‍යය ගැන ප්‍රශ්න කෙළෙමි.

"තමුසේ හැබැටම සල්ලි වියදම් කළේ දත දතද නැත්නම් නොදනුවත්වමද?" යි ඔහු සමඟ කථා කරමින් සිටි මම ඔහුගෙන් ඇසුවෙමි.

"නොදනුවත්වම නොවෙයි" ඔහු පිළිතුරු දුන්නේය.

"මොකද දත් හඩුව කොයි අතටද වාසි" යි මම නැවතත් ඔහුගෙන් ප්‍රශ්න කෙළෙමි.

"මොකක්ද මට අවුරුද්දකට විතර හිරේ යන්නට වෙච්" ඔහු මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ඉතා ශාන්ත ස්වරයෙන් කීවේය.

කථාව අවසන් කොට යෑමට පිටත් වූ මට ඔහු සිහින් හඬින් මෙන් මෙසේ ද කීය.

"තමුසෙ ගේ දක්කද? ඒක බොහොම පෙනීමයි."

එසේ කිවූ ඔහුගේ දසෙහි මොහොතකට මහත් සතුටක ජයාවක් රහදුන් බව මට පෙනිණ.

ඔහු කිසි කැළඹීමක් නොමැතිව පිළිතුරු දුන් සැටිත්, ඔහුගේ මුහුණෙහි වූ ශාන්ත පෙනුමත් මා තුළ වූ මවිතය දඩිකරන සුළුවිය.

එදින ගෙදර පැමිණි මම ඒ ගැන බොහෝ වේලා කල්පනා කෙළෙමි.

තරුණියගේ මැරූ ප්‍රේමාතුරයා ගැන මුලින් කී පුවත මට සිහිවන්නට විය. ඔහු එසේ කරන්නට ඇත්තේ, පළිගැනීමක් වශයෙන් නොව, තමා අතින් වන භයානක අන්තය ගැන නොතකා සිතෙහි වූ අභිලාෂය මුදුන් පත් කරගැනීමක් වශයෙනැයි මට සිතේ. මොවුන් දෙදෙනම, සැප ලැබීමේ විවිධ මාර්ග අතුරින් එක්තරා මගක් ගත්තනැයි සිතීම නිවැරදි යයි හඟිමි.

# 11

# අවබෝධය

"හැබෑටම තමුසෙට ජීවිතය ඔතරම් ප්‍රීතියක්ද" යි සමාජ ශාලාවේ කිසිවකු විජේසිංහගෙන් අසන්නේ පිටට තට්ටු කරමින් සිනහවෙමිනි. සමාජ ශාලාවෙහි විජේසිංහ ගැන දන්නා බොහෝ අය ඔහුට ඊර්ෂ්‍යා කළහ. ඔහු ජීවිතයේ දුක් කම්කටොලු වලින් ඈත්වූ ඒවා නොහඳුනන්නෙකැයි යන හැඟුම ඔවුන් තුළ වූ ඊර්ෂ්‍යාවට හේතු විය. විජේසිංහ වටකොටගෙන උස්හඬින් සිනාසෙමින් කිසියම් සෙල්ලමක යෙදෙන ඔහුගේ මිත්‍රයන්ගේ හඬ සමාජ ශාලාව අවට සෑම සන්ධ්‍යාවකම ඇසිය හැක. අන් අයට වඩා උස්හඬින් සිනාසී එකවිට දෙතුන් දෙනෙකු හා කථා කරන කිසිවකුගේ හඬ නෑසුණහොත්, එය විජේසිංහ නොමැති බවට සලකුණකැයි, සමාජ ශාලාව ආශ්‍රය කරන බොහෝ දෙනා දත්හ. එහෙත් එය සිදුවූයේ ඉතා කලාතුරකිනි.

විජේසිංහ තවම තරුණවිය නොඉක්මවූවෙකි. ඔහු කොළඹ ආණ්ඩුවේ කන්තෝරුවක උසස් රක්ෂාවක් කෙළේය. එහෙත් එයින් ධනයක් උපයීමට ඔහු බලාපොරොත්තු වූ බව කිව නොහැක. අවුරුදු දෙක තුනකට පෙර රුවැති ගැහැනියක හා විවාහ වූ

ඔහුට ඇගෙන් විශාල ධනයක් ලැබුණේය. කොළඹ අසල විශාල ගෙයක නිවසන ඔහු විවාහ වීමට පෙර සිටද සැපවත් ජීවිතයක් ගත කිරීමට පුරුදු වූවෙකි. කුඩා කල බොහෝ සෙයින් දුක්වින්ද නමුත්, ඉගෙනීමෙහි ශූරයෙකු වූ තරුණවියට පත්වෙත්ම විශාල ධනයක් රැස්කර ගැනීමෙහි සමත් විය. විශාල ධනයක් රැස්කර ගැනීමෙන් පසු ඔහු බොහෝ සේ සැපවත් ජීවිතයක් ගත කිරීමට පුරුදු විය. මුලදී විඳි දුක් ගැහැට නිසා ඔහු බොහෝ සෙයින් ප්‍රීතිවීමට පුරුදු වීම ස්වභාවික යයි විජේසිංහගේ ඇතැම් මිත්‍රයෝ සිත.

දිනපතාම පාහේ කන්තෝරුවෙන් පැමිණි විගස සමාජ ශාලාව කරා එම විජේසිංහ පුරුද්දක් කොට ගත්තේය. එසේ පැමිණි ඔහු මිත්‍රයන් හා ප්‍රීතිවී ආපසු ගියේ රෑ බෝවීමට ඉතා ආසන්නවය.

ඇතුළු කාමරයෙන් එළියට පැමිණි විජේසිංහ සමාජ ශාලාවෙහි දෙරටුව අසල නැගිට පාර දෙස බලා සිටියේය. ඔහුගේ සිතෙහි පර නොවූ කිසිවක් ඇත්තාසේ ඔහුට දැනිණ. එය කුමක් නිසා ඇතිවූවක් දැයි පවා ඔහුට නොතේරෙයි. විජේසිංහ කෝපයෙන් මෙන් නෙත් අයා බැලුවේය. තමා පළමුවරට විශාල මුදලක් පැරදුන අවස්ථාව එයයි. එහෙත් තමා වැනි ධනවතෙකුට එය එතරම් කරුණක් නොවේ. තමා වැන්නකුට එය සිතට ගැනීමට තරම් කරුණක් නොවේ යයි විජේසිංහ තමාටම කියාගත්තේය. විජේසිංහ යළිත් දෙරටුවට ගසාගත් දකුණතින් යුතුව කල්පනා කරන්නට විය. තමා පරාද වූ විට ඔහුගේ මිත්‍රයෙකු කී දෙය තමාගේ සිතෙහි වූ හැනීමට හේතු විය හැකි

යයි විජේසිංහට සිතිණි. එහෙත් ඔහු කීවේ කිසි ගතයුතු දෙයක් නොවේ. ඔහු එය කීවේද සිනහවෙමින් සරදමක් වශයෙනි. එසේ නොමැතිව තමාගේ සිතරිදවීමට හෝ නිගා කිරීමට නොවේ. වෙනද නම් තමාද ඔහු හා එක්වී සිනාසෙනු නොඅනුමානය.

විජේසිංහ ඉස්තෝප්පුවේ ඒ මේ අත ඇවිදිමින් කල්පනා කරන්නට විය. ඒ ගැන සිතත්ම ඔහුගේ සිතෙහි වූ ව්‍යාකුලත්වය දැඩිවෙයි. එය ඔහු තුළ බිහියක්ද ඇති කරන සුළුය. ඔහු සෙමෙන් ශාලාවෙන් එළියට පැමිණියේය. තවත් ශාලාවෙහි සිටීම ඔහුගේ සිතෙහි වූ ව්‍යාකුලත්වය දැඩිකරන සුළු යයි විජේසිංහට සිතුණේය. ඔහු ගෙදර දෙසට ගමන් කරන්නට විය.

රෑවීමට බොහෝ වේලා තිබුණ නිසා වීථියෙහි බොහෝ දෙන ඒ මේ අත ගමන් කරමින් සිටියහ. විජේසිංහ ඔවුන්ගේ මුහුණු දෙස ඕනෑකමින් බැලුවේය. එයින් තමාගේ සිතෙහි වූ හැඟීම අමතක කළ හැකි යයි ඔහුට සිතිණි. පාරෙහි එහා පැත්තෙහි කිසිවකු තමාට මුහුණ ලා එනුදුටු විජේසිංහ ඕනෑකමින් එදෙස බැලුවේය. තුවායක් වැනි කිසිවකින් ආවරණය කරගත් හිසින් යුතුව පාරෙහි එන තැනැත්තා විජේසිංහ අඳුනා ගත්තේය. ඔහු තමා සමඟ කලකට පෙර එක ගෙයම නිවසූ මිත්‍රයෙකි. තමා නැවතී සිටියේ මිත්‍රයාගේ නැන්දලාගේ ගෙදරකය. එකල මිත්‍රයා තමාට බොහෝ සේ උපකාරී වූ බව විජේසිංහට සිහිවිය.

ඔහුගේ මුහුණ හඳුනාගත් විජේසිංහ මොහොතක් නැවතී ඔහු දෙස අවතාරයක් දුටු කලක මෙන් බැලුවේය. මිත්‍රයාගේ මුහුණ බොහෝ සේ වැහැරී

ගොස් තිබෙන බව විජේසිංහට පෙනිණ. ඔහුගේ මුහුණෙහි පිටතට නෙරාගිය හකුඇට නිසා මළානික දෙඇස බොහෝ යටගිලී බවක් දක්වයි. ඔහුගේ දෙඇසෙහි වූ පෙනුම දුටු විජේසිංහට ඔහු දරුණු වේදනාවක් මැඩ ගැනීමට තැත් කරන බව සිතිණ. කලකට පෙර තමාගේ මිත්‍රයා දරුණු මානසික රෝගයකින් පෙළෙමින් සිටින බව තමාගේ අනිත් මිත්‍රයන් කියනු විජේසිංහ දැන සිටියේය. රෝගය ඉතා දරුණු එකක්වූ බැවින් ඔහු සිය රක්ෂාවද අතහැර ගමට ගියේය. ඉන්පසු නොයෙක් විට ඔහු පිළිබඳව පුවත් ඇසුමුත් විජේසිංහ ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වූයේය.

මෙවර ඔහු දැකීමෙන් විජේසිංහ තුළ භීතියක් ඇතිවිය. ක්‍රමයෙන් අඩුවී ගිය එය ශෝකයක් බවට පෙරළිණ. ඔහු මිත්‍රයා සමඟ ඉතා බැගෑපත් ලීලාවෙන් සිනා වූයේය. එහෙත් මිත්‍රයා තමා නොදැක්කාක් මෙන් ගමන් කරනු විජේසිංහට පෙනිණ. ඔහු තමා සමඟ සිනහනුනේ කුමක් නිසා දැයි විජේසිංහට නොතේරිණ. තමා දැකීමෙන් ඔහු තුළ ලැජ්ජාවක් ඇතිවන්නට ඇත. ඔහු වැටී ඇති දිළිඳු දුඃඛිත තත්වය ඔහු තුළ ඇතිවූ ලැජ්ජාවට හේතුව විය හැක.

විජේසිංහ මිත්‍රයා දෙස ආපසු හැරී බැලුවේය. ඔහු සමඟ නැවතී කථා කළ යුතු යයි විජේසිංහට සිතිණ. ඔහු සමඟ කථාකොට ඔහුගේ සිත සතුටු කළ යුතුය. වේදනාවෙන් පෙළෙන ඔහු සමඟ කථා කිරීමෙන් ඔහු සැනසිය හැක. නැවත වරක් එදෙස් බැලූ විජේසිංහට මිත්‍රයා බොහෝ දුර ගොස් ඇති බව පෙනිණ.

විජේසිංහ යළිත් ගමන් කරන්ට විය. විශාල වරදක් කළ එකකු තුළ ඇති වන ශෝකයත් භීතියත් මුසුවූ කිසියම් හැඟීමක් ඔහු තුළ ක්‍රියා කරන්නට විය. එය මොහොතින් මොහොත දියුණු වන බව ඔහුට දැනිණි. ඔහු පෙරට වඩා වේගයෙන් ගමන් කරන්නට විය.

විජේසිංහ ගෙදර එනවිට හිරු බැස යාමට ආසන්නව තිබුණේය.

සිතෙහි වූ ව්‍යාකූලත්වය නිසා, නළල මතට වැටුණු හිසකෙසින් හා කෝපයක් ඇති වූ කලක මෙන් රතු පැහැගත්, දෙඇසින් යුත් ඔහුගේ මුහුණ බිය එළවන සුළුය. ස්වභාවයෙන් පියකරු ඒ මුහුණේ මෙවැනි බියකරු පෙනුමක් ඇතිවිය හැකි යයි කිසිවකුට සිතිය නොහැක.

ගෙයි ඉස්තෝප්පුවේ වාඩි වූ විජේසිංහ දෙනෙත් පුළුල් කොට අහස දෙස බැලුවේය. නොසන්සුන් අයුරින් වෙවුලන සිය දෙතොල ඔහු තරයේ පියා ගත්තේය.

ගෙයි ඉදිරිපස වූ අලුත් පස් දැමීමෙන් දුඹුරු පැහැගත් පාරෙහි කිසිවකු පෙනෙන්නට නොමැත. එහෙත් ඉන් බොහෝ ඈත කිසිවකු ප්‍රීතියෙන් නගන සිනහවක් ඔහුට ඇසිණි. ඈත වැහැර ගිය බල්ලෙක් පාරෙහි එහා සිට මෙහා පැත්ත දක්වා වේගයෙන් දිව්වේය. ඉක්බිතිව දැඩි නිශ්චලත්වයක් ඇතිවිණි. සන්ධ්‍යාන්ධකාරය නිසා පාරත් ඒ අවටත් පාළු මලානික ගතියක් පවතී. ඈත අහසෙහිද එය එලෙසම ඇත. නිශ්චලත්වය සිතෙහි වූ භීතිය වැඩි කරන සුළු විය. විජේසිංහ එදෙස නොබලා බිම බලාගත්තේය.

සිතෙහි ධෛර්‍යය උපදවාගත් විජේසිංහ යළිත් කල්පනා කරන්නට විය. බියෙන් සැලෙන ඔහුගේ සිතට කල්පනා කිරීමද දුෂ්කරය. කෝපයෙන් දෙනෙත් විදහා ගත් විජේසිංහ වාඩිවී සිටි පුටුවෙන් නැගිට්ටේය. ඔහුගේ මුවගට සිනහවක් නැගිණ. තමා තුළ ඇත්තේ නොපෙනෙන භීතියක් පමණකැයි ඔහුට සිතිණ. ඒ භීතිය සත්‍ය වශයෙන් ඇත්තක් නොව සිතෙන් මවාගත් එකක් පමණකි.

එහෙත් මොහොතකින් එය නැතිවිය. පෙර පැවති භීතිය යළිත් ක්‍රියා කරන්නට විය. එය තමාගේ සිත පෙරට වඩා දැඩිව වෙලාගන්නා සේ ඔහුට දැනිණ.

ඔහු කාමරය දෙසට ගියේය. පහන් නොදැල්වීම නිසා ගෙතුළද අන්ධකාරය පැතිරී ඇත. කාමරයට ඇතුළු වූ විජේසිංහට තමාගේ ශරීරය බියෙන් වෙවුලන්නා සේ දැනිණ. ඔහු එහි වූ ඇඳෙහි වැතිර දෙනෙත් තදකොට පියාගත්තේය.

සිය බිරිඳ සාලයෙහි සිට පියානාව වාදනය කරන හඬ විජේසිංහට ඇසිණ. එය බියට පත් ඔහුගේ සිත මඬින සුළුය. ඔහුගේ සිත යවුලකින් විදින්නා සේ ඔහුට දැනිණ. ඔහුගේ සිත කෝපයෙන් රත් විය. ඔහු ඇඳෙහි අනික් පැත්තට හැරී කාමරයෙහි ඈර තබන ලද දෙර පලුව වේගයෙන් වැසුවේය.

දෙර පලුව හඬනගා පියවෙනු ඇසුණු විජේසිංහ යළිත් දෙනෙත් පියා කොට්ටය ගෙන මුහුණට තද කොට ගත්තේය. කොට්ටය වැරයේ බදගත් ඔහු වේදනාවෙන් කෙඳිරි ගෑවේය.

# 12
## අව්ව

එක් නිවාඩු කාලයක මම ගෙදර පැමිණ සිටියෙමි. වයස අවුරුදු දහහතරෙහි පමණ වූ එකල ඉගෙන ගත්තේ ගෙදරින් හැතැප්ම අටක් පමණ ඈතින් පිහිටි ඉංගිරිසි පාසැලෙහි ය. පාසලෙහි නිවාඩු දුන් දිනම මා ගෙදර එක්ක ඒම තාත්තාගේ සිරිතය.

එය අපේ කුඹුරුවල ගොයම් කපන කාලය විය. ගොයම් කපන අවදියෙහි කුඹුරුවල සැරිසරමින් වැඩ කරන මිනිසුන් හා එක්වී සිටීමට මම කුඩා කල සිටම බෙහෙවින් ප්‍රිය කෙළෙමි. එහෙත් අම්මා මට එසේ කිරීමට ඉඩ නුදුන්නාය. තාත්තා සමඟ උදයේ, ගොයම් කපන තැනකට යාමට සූදානම් වුවහොත් අම්මා ඒ හැමවිටම මා වළක්වනු පිණිස කිසිවක් කීවාය. "හා! උඹ ඔහේ ගිහින් අව්වේ පිච්චෙන්නෙ නැතුව ගෙදර ඉඳින්". ඒ හැමවිටම මම තොල් මතුරමින් ගෙදර නැවතුනෙමි. ඒ දිනවල අම්මා ගෙදර කිසිවැඩක් පලක් කිරීම පිණිස මට නොකියයි.

"හෙට පස්කල්දූවෙ කැල්ලෙ ගොයම් කපන්න ඇයො ටිකක් සොයා ගන්න ඕන" යි දිනක් හවස තාත්තා කියනු මට ඇසිණ. හෙට දින එහි ගොයම්

කපනු බැලීමට යා යුතු යයි මම තීරණය කරගතිමි. පසුද එලි වූ විගස තාත්තා කුඹුරට යන බැවින් මමද එහි යෑම පිණිස සූදනම් වීමි. එහෙත් අම්මා වෙනද මෙන්ම මා වැළැක්වූවාය.

"එපා පුතේ, උඹ ඔහේ බොරුවට ගිහින් පිච්චෙන්න."

"නැහැ, මම දවිත් අයියලාගේ ගෙදරට වෙලා බලාගෙන ඉන්නම්" යි මෙදින කෙසේ හෝ යාමට තීරණය කරගත් මම කීවෙමි.

"හා එහෙනම් උඹට ඔයතරම් යන්න ආසනම් තේ වතුර අරගෙන යනකොට කිරත් එක්ක පලයන්. දුම්ම ගිහින් නිකම් පිච්චෙන්න එපා" යි අම්මා කීවාය. කිරා යනු එකල අපේ ගෙදර නොයෙක් වැඩපල කල කොලුවාගේ නමය.

කිරා වැඩ කරන අයට තේ වතුර ගෙන යන්නේ දහයට පමණය. මම එදින ඔහුද පොලඹවා ගෙන ඊට කලින් පිටත්වීමි. එදින ගොයම් කපනු ලබන කුඹුර වූයේ අපේ ගෙදර සිට හැතැප්මක් පමණ ඈතිනි. තාර පාර දිගේ හැතැප්ම කාලක් පමණ ගොස් ඉක්බිතිව රතු පැහැති පසින් යුත් කරත්ත පාරක් දිගේ මඳක් තැන් ගිය විට කුඩා කඳු ගැටයකින් ඔබ්බෙහි වූ එය පෙනේ. දවිත් අයියාගේ ගෙදර වූයේ ඒ කඳු ගැටය මුදුනෙහිය. කරත්ත පාරෙන් හැරී නියරවල් කීපයක් පසු කොට ඒදණ්ඩකින් එතර වූ පසු ඊට ළංවිය හැක.

අප කුඹුරට ළංවන විට බොහෝ දෙනෙක් ගොයම් කපමින් සිටියෝය. තාත්තා එහා කෙළවරෙහි වූ නියරක් මත ඇන තබා ගෙන කිසිවක් හඬ නගා කියමින් සිටියේය. තමාගත් කඳින් යුතුව ගොයම් කපන ගැහැනුන් දෙසත් ඉත්ඔබ්බෙහි වූ කරල් ඇහිඳින්නවුන් දෙසත් මම මහත් ප්‍රීතියෙන් බලා සිටියෙමි. කුඹුරෙහි එක් පැත්තක මිනිසුන් කීප දෙනෙක් කපනු ලබන ගොයම් එක්කාසුකොට ගොඩ ගසමින් සිටියහ.

"හා, අද පොඩිමහත්තයත් හාපුරා කියා එනවා" යි මා කුඹුර දෙසට එනු දුටු නාගොඩ අයියා සිනහවෙමින් කියනු මට ඇසිණ.

"ඇයි පොඩිමහත්තයලත් දැන්ම ඉඳල මේවත් ටික ටික ඉගෙන ගන්න එපාය" යි තව කිසිවකු හඬ නගා කීවේය.

තවත් කිසිවකු සිහින් හඬින් යම්කිසිවක් කී මුත් මට එය නැසිණ. නාගොඩ අයියා උස් හඬින් සිනහ වී යළිත් වී කරල් එක්කාසු කරන්නට විය.

කිරා තේ වතුර හැළිය ගෙන ගොස් කෝප්පවලට වත්කරන්නට වූයෙන් කුඹුරෙහි සිටි සියලුදෙනම පාහේ එතනට ළං වූහ. මම කුඹුරෙහි මෙතෙක් කපන ලද කොටසෙහි ඇවිදින්නට සිතුවෙමි. කුඹුරෙන් වැඩි කොටසකට අව්ව වැටී ඇති නමුත් නියර අයිනෙහි වූ ගස්හි කුඹුර දෙසට විහිදූ අතුපතර නිසා ඒ කොටසට වැඩි අව්වක් නැත. කරල් කැපීමෙන්

ඉහිරිවන ලද කඳින් යුත් ඉපනැල්ලෙහි මම අලස බවෙන් ඇවිදින්නට වීමි. වැසි වැටීමෙන් පසු පොළොවෙන් නගින සුවඳක් වැනි කිසියම් සුවඳක් ඉන් නිකුත් වෙමින් තිබුණේය. කුඹුරෙහි ඈත අව්ව කෙමෙන් කෙමෙන් දැඩි වී ගෙන එයි. ඉපනැල්ලෙහි වූ රැහියන් කීප දෙනෙක් නොනවත්වා කෑගසන්නට වූහ.

තේ වතුර බීමෙන් පසු ඔව්හු යළිත් වැඩෙහි නියුක්ත වූහ. හිස් හැළිය රැගත් කිරා නියර දිගේ ආපසු යනු මට පෙනිණ. මම නියරක් මත වාඩි වී හිස් බැල්මෙකින් ඔවුන් දෙස බලා සිටින්නට වීමි.

ඈත කුඹුරෙහි ඔවුන් වැඩ කරන තැනෙහි අව්ව ඉතා සැරය. අව්වෙහි තද කම නිසා වාතයෙහි මහත් දිලිසෙන ස්වභාවයක් පවතී. ගොයම් කපන ගැහැනුන් දැඩි අලස බවෙන් මෙන් සිය හිස් කෙළින් නොකොටම වැඩ කරති. ඉන් එකකුගේ විනිවිද යන සුළු සිනහවක් ඉඳ හිට වියළි වාතයෙහි පැතිරී යනු මට ඇසිණ. සෙමෙන් පැතිරී යන එය වාතයෙහි සැඩ බව වැඩි කරන සුළුය. හිරෙහි චණ්ඩ භාවය ගැන නොතකා නොනැවතී වැඩෙහි යෙදුන ඔවුන් දකින මා තුළ කෝපයක් ඇතිවේ.

සෙමෙන් වැඩිවන අව්ව නිසා මෙනෙක් මා වසා නියර අයිනෙහි සිට මදක් තැන් පැතුරුණු සෙවනැලි සෙමෙන් නැතිවෙයි. රටාවක් මෙන් පැතිරී ගිය ඒවා මොහොතින් මොහොත කොට වී යන සැටි මම බලා සිටියෙමි. මෙනෙක් නියර අයිනෙහි සිටුවන ලද

ඉත්තක් මත වූ පිළිහුඩුවෙක් කෑ ගා පියාඹාගෙන ගියේය. ඉක්බිතිව පළමු වූ පාළු නිශ්චලත්වය යළිත් පැතිරිණ. පවනෙහි නොසෙල්වෙන ගස් කොළත් හා ගොයමින් යුත් වියළි දර්ශන පථය සිත් පිත් නැත්තකු සේ අහසට ඇරී වැතිරී ඇත.

ගොයම් ගෙන ගොස් ගොඩක් වන සේ එක්කළ ගොවීන් සෙවණට වී බලා සිටිනු මට පෙනිණ. මම එදෙස දෙනෙත් පුළුල්කොට බලා සිටින්නට වීමි. කුඹුර මැද වූ ගොඩැල්ලෙහි විශාල අතුපතර විහිදූ දෙල් ගසක් වෙයි. පාළු ගතියකින් යුත් ඒ අවට වෙන කිසිවක් නැත. දෙල් ගස අයිනෙහි බොහෝ උස් වන සේ එක්කරන ලද පිදුරු ගොඩක් වෙයි. කතිරයක හැඩහුරුකම තබා සාදන ලද කරුවක් හා දෙල් ගසෙහි කඳත් එක්කොට බඳින ලද පොල්ලක් මත ගෝනි පඩංගුවක් වැනි කිසිවක් දමා තිබුණේය. මිනිසුන් දෙදෙනෙක් එදෙසට හැර වූ දෙනෙතින් යුතුව බොහෝ වේලා දෙල් ගස මුල සිටියෝය. සැඩ හිරු රැස් වැටීම නිසා දෙල් ගසෙහි කොළ පඩුවන් පැහැයක් ගෙන දිලිසෙයි.

සෙමෙන් කුඩා වී ගිය සෙවණැලි පහව ගොස් දන් තියරද මා අවටද හිරු රැස් වැතිර තිබේ. වැට අයිනෙහි වෙල දෙසට දිගු කළ අත්තක බඳින ලද මකුළු දලක උදයෙහි රැඳුණු පිනිබිඳු නිසා හිරු රැස්හි දිලිසෙන්නට විය. මම තියර දිගේ ඔවුන් වැඩ කරන ස්ථානය බලා ගමන් කරන්නට වීමි. බොහෝ වේලාවකින් පසු සිහින් සුළඟක් හමන්නට විය. තොලවට ළංව හැමූ සුළඟෙහි වී කරල් සර සර ගා

හඬ නගන අයුරු මට ඇසිණ. මෙතෙක් නිශ්චලව සිටි ගැහැනුන්ගේ සිනහ හඬ යළි පැතිරෙන්නට විය.

දැන් හිරු මුදුන්වන්නට ඉතා ආසන්නව ඇත. යන එන්නන්ගේ පා පහර නිසා වියළී පැහැගත් තණකොළින් යුත් නියරද රත්වී තිබේ. දින දෙක තුනකට පෙර කපන ලද ගොයමින් යුත් කුඹුරෙහි තැනින් තැන ගවයන් කීපදෙනෙක් ලැග සිටියහ. වාතයෙහි උණුසුම් බව නිසා ඔවුන් පහත් කොට ගත් හිසින් යුතුව නොසැලී සිටිතියි මට සිතුණේය.

ඔවුන් වැඩ කරන අසලට පැමිණි මම කපන ලද කොටසෙහි ඒ මේ අත ඇවිදින්නට වීමි. බැලූ අතින් නොබිඳී පැතිර ගිය සමබිමින් යුතු අවට රන්වන් පැහැයෙන් දිලිසෙයි. ගොයමින් මඳක් උඩින් වාතයෙහි පෙරටද වඩා දිලිසෙන බවක් පවතී. ඒ දෙස බලා සිටි මම මොහොතකට දෑස් වසා ගතිමි. අවට පැතිරී ගිය හිරු රැස්හි සැඩ බව නිසා දෙනෙත් ඇරගෙන සිටීමද අපහසුය. ගොයම් කපන ගැහැනුන් පෙර මෙන් නොනැවතී නමාගත් කඳින් යුතුව ගොයම් කපත්. දෑකැත්තෙහි පැටලෙන වියළී ගොයම් ගස් නගන කන පිරවන තියුණු හඬ අවටැති සැඩ බව සිත තුළ දියුණු කරයි. ඔවුන්ගේ ඇඟ පත ඩහදියෙන් නැවී තිබේ. නළලින් බේරී මුහුණ දිගේ ගලායන ඩහ බිඳු කිසිවකු මොහොතක් කෙළින්ව අත උස්සා හැට්ට අතින් පිසදමයි. ඉඳ හිට නගන සිනහවත් එයත් නොවී නම් ඔවුන් හිරු රැසෙහි සැඩ බවෙන් මිරිකී මිය ගියවුන් වැන්නයි මට සිතිණ.

නියර දෙක තුනකට ඈතින් වාඩිවී සිටි තාත්තා දවිත් අයියා සමඟ කිසිවක් කථා කරමින් සිටියේය. තාත්තාගේ හිසෙහි සුදු පැහැති තුවායක් තිබුණේය. ගොයම් එකතු කරමින් දෙල් ගස යට සිටි මිනිස්සු පෙර මෙන් අලස ගතියෙන් ඒ මේ අත යමින් සිටියහ. දෙල් ගස අවට පැතිරී ගිය සෙවණැලි දුන් නැතිව ගොස් තිබේ.

"කාලෙකින් නැතිවිදියට හොඳැහෙන්න පායනවා" යි නාගොඩ අයියා උස් හඬින් කියනු මට ඇසිණ. තරහවූ කලක මෙන් නිශ්චලව සිටියවුන් යළිත් දෙඩමලු වූහ. සැඩ බවෙන් මිරිකී සිටි ඔවුන් යළි ජීවයක් ලැබුවන් සේ කථා කරනු ඇසීම මා තුළ වූ වියළි මළානික ස්වභාවය නැති කරන සුළු විය. "හා දුන් ඉතින් ගොඩ වෙන්න බලමු" යි තාත්තා උස් හඬින් කීවේය.

ගොයම් කැපූ ගැහැනු සෙමෙන් කථා කරමින් වෙලෙන් ගොඩ වී දවිත් අයියාගේ ගෙදර දෙසට යන්ට වූහ.

මම තාත්තා සමඟ ගමන් කරන්නට වීමි. නාගොඩ අයියා අනිත් අය සමඟ හඬ නගා කථා කරමින් වෙලෙන් ගොඩවෙනු මට පෙනිණ.

කොහොමද පොඩිමහත්තයට එහෙම මහන්සි නැද්ද?" යි නාගොඩ අයියා සිනහවෙමින් අසනු මට ඇසිණ.

"මොන මහන්සියක්ද?" දැයි මම පිළිතුරු දුනිමි.

"ඒකට අද ගෙදර ගියාම හාමිනේ අපිටත් එක්කයි බනින්නේ" යි තව කිසිවකු කියනු මට ඇසුණේය.

තාගොඩ අයියා ඇතුළු පිරිමි අය ඉස්තෝප්පුවේ එලන ලද පැදුරුවල වාඩි වී කෑම කන්නට වූහ. එහෙත් තාත්තාත් මාත් කෑම කෑවේ සාලයෙහිය. දවිත් අයියා සාලයෙහි වූ කුඩා මේසයකට පත්තර කීපයක් දමා එහි අපට කෑම කෑමට සූදානම් කොට තිබුණේය.

කෑම කෑමෙන් පසු මම ඉස්තෝප්පුවෙහි වූ වැල්වලින් වියන ලද ඇඳක වාඩි වූවෙමි. කෑමෙන් ස්වල්ප වේලාවකට පසු අනික් අය යළිත් වෙල දෙසට ගියහ. තාත්තාත් ඔවුන් සමඟ යතියි මට සිතුණේය. එහෙත් ඔහු ඉස්තෝප්පුවට පැමිණ එහා පැත්තෙහි වූ ඇඳෙහි හාන්සි විය. වඩා පළල් නොවූ ඉස්තෝප්පුව දිගින් විශාලය. ඉස්තෝප්පුවේ එක්පැත්තක ලෑලි කීපයක් තබා තිබුණේය. බොහෝ කලක් වාඩි වී සිටීම නිසා දෝ උඩින් වූ ලෑල්ල බෙහෙවින් මැදි තිබුණේය. ලෑලි ගොඩින් අර්ධයකට අව්ව වැටී තිබුණේය. ඒ අසල බැඳ තබන ලද බල්ලෙක් උෂ්ණය ඉවසා ගත නොහැක්කා සේ හති දමමින් සිටියේය.

ඇඳෙහි දිගා වූ තාත්තා ස්වල්ප වේලාවකින්ම නිදාගන්නට විය. ඔහු වෙනදට වඩා සිහින් හඬින් ගොරවන්නට වූයේය. මම ඇඳෙහි පස්සට වී කකුල් දිගුකොට බිත්තියට හේත්තු වීමි. තද උෂ්ණය නිසා වාතයෙහි වූ වියළි ස්වභාවය දැඩ මෙන්ම සිතද හකුලවන සුළුය. මම බිත්තියට හේත්තු වී හිස්

බැල්මකින් බලා සිටින්නට වීමි. හිරු රැස්හි දිලිසෙන කුඹුරෙහි පෙරටද වඩා මහත් පාළු මළානික භාවයක් පවතී. ගොයම් කපන ගැහැනුන් ජීවයෙන් තොරවුන් මෙන් තමාගත් හිඝින් යුතුව නිශ්චලව සිටින සැටි මට පෙනිණ. ඉඳහිට නාගොඩ අයියා හෝ අන් කිසිවකු වාතයෙහි වියළි බව වැඩි කරමින් උස් හඬින් කිසිවක් කීවේය.

ගේ තුළද කිසිවකු නැත්තා සේ මහත් නිශ්චල භාවයක් පවතී. ගේ පිටුපසෙහි ගැහැනුන් කීපදෙනෙක් කථාවෙන් තොරව වී කොටන හඬ පමණක් ඇසේ. කිසිවකු හඬ නගමින් කුල්ලකින් පෙළුවේය. වී මත මෝල වැටෙන හඬත්, කුල්ලෙන් නගින ශබ්දයත් එකම තාලයෙන් නොනැවතී ඇසේ.

දවිත් අයියා මිදුලෙහි වූ දෙලුම් ගස යටට වුත් එහි වූ ගලක පිහියක් මදින්නට වූයේය. මිදුලෙහි දෙලුම් ගස අසල වතන ලද වී පැදුරු දෙකක් විය. සමව පැතුරුණ මිදුලෙහි අතික් පැත්තෙහි විශාල කොටසක් වැසෙන සේ පිදුරු දමා තිබුණේය. ඒ අසල වූ ඉහුරු පදුරු කීපයක් වියළීම නිසා රතුපැහැ ගැන්වී තිබුණේය. දෙලුම් ගසෙහි අත්තක පැටලුනු පිදුරු ගස් කීපයක් සුළඟෙහි නොනැවතී වැනෙමින් ඇත. පණ ඇති කිසිවක් වැනි එය මගේ දෙනෙත් ඇද ගත්තේය.

ගෙය තුළින් සිහින් හඬක් නැග එන්නාසේ මට ඇසිණ. මම කන්යොමා අසා සිටියෙමි. එය නැලවිලි ගීයක් වැනි සිහින් හඬින් ඇද කියන කිසිවකි. කිසිවකු

ගේ තුළ කුඩා දරුවකු නිදිකරවනු ඇතැයි මට සිතිණ. උස් හඬින් පටන් ගන්නා එය නොබිඳී ඇදීගොස් සිහින් වී නැති වී යයි. මම බිත්තියට හේත්තු වී ඊට මහත් ආශාවෙන් කන්යොමා සිටියෙමි. එය පාළු මලානික ගතියෙන් මඩින ලද මා සිත අඩ නින්දක හෙලන සුළුය. වී කෙටීමෙන් නගින හඬ පසුබිම්කොට ඇසෙන ඒ හඬ ඈත කුඹුරෙහිත් අවටත් ඇති මලානික භාවය ශබ්දයට නහා පල කරන බඳුය.

තාත්තා තවමත් ගොරවමින් නිදියයි. ගෙතුළින් කිසිවෙක් සෙමෙන් අඩි තබා ඉස්තෝප්පුව පසුකොට ගියේය. මම එදෙස හිස හරවා බැලීමි. ගෙතුළින් ආ දරියක් මිදුලෙහි වූ වී පැදුර අතගාන්නට වූවාය. පිටුපස හරවා සිටි ඇගේ මුහුණින් මට පෙනුණේ අර්ධයක් පමණකි. එහෙත් ඇගේ මුහුණ බෙහෙවින් පියකරු විය යුතු යයි මට සිතුණේය. ඇගේ හිස කෙස් තැමෙන් පසුව වේලීම සඳහා මුද හරින ලදුව පිට දිගේ වැටී තිබුණේය. රැළි නැගුණු ඇගේ කෙස් රොදක් ඇගේ නලල මත රැඳී තිබිණ. තැම් වී පැදුර අතගාතා ඈ දෙස මම ඕනෑකමින් බැලුවෙමි. ටික වේලාවකින් ඈ හිස කෙළින් කොට නැගිට සිටියාය. එවිට ඇගේ මුහුණෙහි වූ සුන්දරත්වය මට පෙනිණ. ඇගේ විශාල කම්මුලුත් සිහින් නැහැයත් බොහෝ වේලා අව්වේ සිටීම නිසා රත් පැහැ ගැන්වී තිබුණේය. ඇගේ නළලෙහි වූ ඩා බිඳු නිසා ඒ මත වූ කෙස් රොද මහත් මනහර බවකින් ඇලවී තිබිණ. මොහොතක් සිය අලුපැහැති දෙනෙත් කිසිවක් වෙත රැඳ වූ ඈ නොපෙනී ගියාය. ඈ කොහි ගියා දැයි

මම හිස උස්කොට වට පිට බැලුවෙමි. පැහැපත් ඇ දෙස හරිහැටි බැලිය නොහැකි වී යයි මට සිතිණ.

සිහිනයක් මෙන් මොහොතකින් ඈත් වී ගිය ඇ මා තුළ වූ මලානික භාවය වැඩි කරන සුළු විය. ඇ යළිත් වී පැදුර අසලට එතියි මම සිතුවෙමි.

ඈත කුඹුරෙහි දිලිසෙන පැහැය නැතිව ගොස් දත් පෙරටද වඩා පාළු ගතියක් රැඳී ඇත. ඈත වැඩ කරන මිනිසුන් මෙන්ම ගස්කොළන්ද ශෝකයෙන් ලතවන්නා සේ මට දැණිත. අහසෙහි සුදු පැහැති වලාකුළු කීපයක් ඒ මේ අත මහත් අලස ස්වභාවයකින් යුතුව පාවෙමින් තිබුණේය. දෙලුම් ගසෙහි පටලැවුණු පිදුරු ගස් කීපය තවමත් පෙර ලෙසම වැනෙයි. ඈත කොහේදෝ ගසනු ලබන දවුලක නාදය නොනැවතී සිහින් හඬින් ඇසෙයි. එය මා සිත තුළ වූ අඩ නිදි ස්වභාවය තියුණු කරන සුළු විය.

මම බිත්තියට හේත්තු වී හිසද හේත්තු කොට ගතිමි.

ඇ යළිත් වී පැදුර වෙතට ආවාය. මොහොතක් රැඳුන ඇ ආපසු යනු මට පෙනිණ. ඇ අවට වලාකුලක සියුම් බවක් ගැබ්වී ඇතැයි මට හැඟිණ. මෙවරද ඇ හරිහැටි දකගත නොහැකි වී යයි මට සිතුණේය.

මෙවර ඇ දකීමෙන් මා තුළ වූ ශෝකය බඳු හැඟුම වඩා දියුණු විය. ඇගේ සුන්දරත්වය ගැන මා තුළ අනුකම්පාවක් ඇති විය.

දවුලෙහි ඒකාකාර ශෝකී හඬ නොනැවතී ඇසේ. දෙලුම් ගසද ඇත කුඹුරුද එකිනෙක හා වෙළී පාවෙන්නා සේ මට පෙනේ. මොහොතකින් සියල්ල හිස්වෙයි. රතු පැහැති පසින් යුත් පාරක අපි ගමන් කරමින් සිටිමු. පාරෙහි බොහෝ තැන දික් සෙවනැලි වැටී ඇත. ඇත නොපෙනෙන තෙක් පැතිරී ගිය සමබිම හිරු රැසින් මත් වූවා සේ නොසැලී පිටී. දවුලෙහි හඬ හා එක්වූ තලා නාදය වාතයෙහි පැතිරී යයි. පාරෙහි ගිය අය ඒ නාදයෙන් මත් වී ඇද වැටෙන්නා සේ පෙනේ. කෙළින් වැටුණු මාවත නැමී වක්වී යයි. වංගුවෙහි එක් පැත්තක පාළු ගෙයක් තිබේ. එහි බිත්තියේ විශාල අකුරෙන් කිසිවක් ලියා තිබේ. එය ලියන්නට ඇත්තේ අඟුරු කැබෙල්ලකින් විය යුතුය. පාර අයිනෙහි වූ කුඩා පැළෑටිවල කොළ මත දූවිලි රැඳී දුඹුරු පැහැයක් ගැබ්වී ඇත. සියල්ල අතුරුදහන් වේ. වී කොටන හඬ යළිත් නැඟී එයි. ළදරුවා තලවන ගැහැනියගේ හඬ කෙමෙන් සිහින්ව ගොස් නැතිවී යයි. ඇගේ හිසද නිදිමතේ පාවෙනු ඇත.

අපි පාර හරහා වැටුණු රේල් පාර පසුකොට ගියෙමු. මිනී පෙට්ටිය රැගත් අය සෙමෙන් ගමන් කළහ. හිරු රැස් වැටීම නිසා රේල් පීලි දිලිසෙමින් පවතී. ඒවා කොතනින් ඉවර වේදැයි කාට කිව හැකිද? ඒවා බොහෝ දුර-බොහෝ දුර යනු ඇත.

දවුලේ ශෝකී හඬින් අහස පිරී යයි. බොහෝ දෙනෙක් කරබා ගත් හිසින් යුතුව නොසැලී සිටිත්.

හිරු රැසින් රතු වූ ඔවුන්ගේ මුහුණු ශෝකයෙන් බර වී ඇත. ඔවුන්ගේ හිස් පාවී යන්නා සේ මට පෙනේ.

ඇත කොහේදෝ ගසන ඒ දවුලෙහි පාළු නාදය නොනැවතී ඇසෙයි. එපිට පාරෙහි ගල්මත්තෙහි කරත්ත රෝදයක් පෙරළෙන හඬ ඒ අතර සෙමෙන් ඇසේ. මලානික අවට ක්ලාන්ත වූවාක්මෙන් නොසැලී ඇත. අහසෙහි වලාකුළුද ඒ මේ අත පාවී විඩා වූවත් සේ නිශ්චලව එක්තැන්ව සිටිත්.''

''කාලෙකින් නැති විදියට පායනවා'' යි මෙතෙක් නිද සිටි තාත්තා රැල් බුරුල් හරිමින් කීවේය.

''කෙල්ලේ ඔය වතුර ටික හැදිල නම් ගෙනෙන්.''

# 13

# නිවාඩුව

"මෙන්න කුසුමා අපේ මල්ලී" යි අක්කා ඇ සමඟ පැමිණි මිතුරියට මා අඳුන්වා දුන්නාය. ඉස්තෝප්පුවේ බිම වාඩිවී පත්‍රයක් බලමින් සිටි මම හිස ඔසවා ඇ දෙස බලා යළිත් පත්‍රය දෙස බලා ගත්තෙමි.

"ඇත්තද? මල්ලිත් ඔයා වගේම කෙට්ටුයිනේ" යි කුසුමා කියනු මට ඇසිණ. හිස ඔසවා බැලූ මට පළමු වරට පෙනුණේ ඇගේ වටකුරු මුහුණත් මුව පුරා පැතිරී තිබුණු සිනහවත් පමණි. නැවතත් එදෙස බැලීමට මට සිතුණ නමුත් එසේ නොකොට පත්‍රය දෙස බලා සිටියෙමි.

මගේ වයස එවිට අවුරුදු දහතුනකට වැඩි නොවන්නට ඇත. අක්කා මට වඩා වයසින් අවුරුදු හතරක් පමණ වැඩිමල්ය. කුසුමාත් ඇත් වූයේ එතම පන්තියකය.

අක්කා ඇගේ මිතුරියක හා නිවාඩුව ගතකිරීමට එන බව අම්මා කියනු ඊට කීප දිනකට පෙර මට ඇසිණ. අපේ ගෙදර බාලයන් වශයෙන් වූයේ අක්කාත් මාත් පමණකි. අක්කා ගෙදර පැමිණියේද, ඇ එතරි

ගිය පාඨශාලාවට නිවාඩු දුන්විට පමණය. එබැවින් ඇ සමඟ මිතුරියක එන බව ඇසීම අම්මාගේ සතුටට හේතු වූ බව, ඇ ඒ ගැන කීපදිනක සිට සඳහන් කිරීම නිසා මට සිතුණේය. අම්මා ඔවුන් ගැන සඳහන් කරන විට මමද කන්යොමා අසා සිටියෙමි. එහෙත් ඔවුන්ගේ පැමිණීම ගැන මා අම්මා මෙන් බලාපොරොත්තු වූහයි මට කිව නොහැක.

එදින දවල් කෑම කා ඉවරවන තුරු මට ඔවුන් නැවත මුණ නොගැසිණ. ඔවුන් මුණගැසීම වැළැක්වීමට මෙන් මම තාත්තාගේ කාමරයට වී සිටියෙමි. ඔවුන් මුණගැසීම වැළැක්වීමට මා තුළ අදහසක් නැති වුවද කිසියම් හැඟීමක් නිසා එවේලෙහි කාමරයට වී පොතක් බැලීම මට වඩා රුචි විය. තාත්තාගේ ඇඳෙහි වැතිර විට්ටමට හේත්තු කොට ගත් හිසින් යුතුව සිටි මට පොත කෙරෙහි සිත රඳවා ගැනීම අපහසු විය. ගෙයි සාලයෙහි, අක්කාත් ඇගේ මිතුරියත් උස් හඬින් කරන කථාව මට මැනවින් ඇසෙයි. ඔවුන් කථා කිරීමට වඩා කළේ එක්වී සිනහවීමය. අපේ අක්කා සිනහවීමට බොහෝ සමර්ථය. එහෙත් ඇගේ මිතුරිය ඈටත් වඩා සමර්ථ යයි මට සිතිණ. මම පොත පහත් කොට ඔවුන්ගේ කථාවට මඳක් කන්යොමා සිටියෙමි. එසේ වවුද ඔවුන් කථා කළේ කුමක් ගැන දැයි මට වටහා ගත නොහැකි විය. එකෙක් කිසිවක් කියා අනිකාගේ පිටට ගසා සිනාසෙයි. අනිකා ඈ පැරදවීමට මෙන් හඬ නගා සිනාසෙයි. ඉක්බිතිව ඔවුන් දෙදෙනාම එක්වී සිනාසෙති.

ටික වේලාවකින් කිසිවකු මා සිටි කාමරයේ දොර අරිනු මට ඇසිණ.

"මල්ලී ඔකට වෙලා ඉන්නේ නැතුව ඇවිත් කුසුමක්කත් එක්ක කථා කරන්න" යි කාමරයේ දොර ළඟ නැගිට සිටි අක්කා මා දෙස නොබලාම කීවාය.

කිසියම් වැඩක් කියා කාමරයට වී සිටීමට සිතුණ නමුත් මම එසේ නොකෙළෙමි.

කුසුමාත් අක්කාත් සාලයේ වූ විශාල මේසය මත තබන ලද කිසියම් පෙට්ටියක් අවුස්සමින් සිටියෝය. එය ඔවුන් විසින් පාසැලේ සිට එන විට ගෙනෙන ලද පෙට්ටියක් බව මට පෙනිණ. මේසයේ එක් කොනක් මත වාඩිවී දෙකකුල් පහළට වැටෙන සේ සිටි කුසුමා පෙට්ටියේ වූ යම් යම් දේ ගෙන අක්කා අතට දෙයි. මේසය අසල නැගිට සිටින අක්කා, ඒවායින් සමහරක් විසිකොට අනිත්වා මේසය මත වූ පොත් ගොඩ අසලින් තබයි. ඔවුන් දෙදෙනා සිතාහවන්නේ ඒවායේ වූ නොයෙක් දේ ගැන බව මට පෙනිණ. මම මේසයට හේත්තුවී, ඒ මත වූ පොතක් පෙරලන්නට වීමි.

මා කුසුමා පළමුවරට හොඳ හැටි දුටුවේ එවිටය. ඈ අක්කා මෙන්ම සිය හිසකේ මැදින් බෙදා, කරල් දෙකක් වනසේ ගොතා තිබුණාය. මඳක් අවුල් වූ ඉන් එක් කරලක් ඇගේ උරහිස දිගේ ඈ ඇඳ සිටි රතු පැහැති ගවුම මත වැටී තිබුණේය. මා ඈ දෙස බැලූ විට ඈ පළමු වරටත් වඩා පුළුල් සිනහවක් පෑවාය. එවිට බොහෝ සේ වටකුරු ඇගේ මුහුණ මගේ සිත ඇද ගත්තේය. ඇගේ පෙනුම මා සිත ගත් මුත් ඇගේ මනහර අවයව හෝ අන් කිසිවක් ගැන මට එවේලෙහි

නොපෙනිණ. එසේ වන්නට ඇත්තේ ඇගේ අභාපසහෙහි සුන්දරත්වය මැන ගැනීමට තරම් මා එකල වයසින් නොමේරූ බැවිනැයි දැන් මට සිතේ.

"මෙන්න මල්ලිකා ඇඳපු එකේ හැටි" යි කුසුමා අක්කාගේ අතින් ඇඳ කිසිවක් පෙන්නුවාය.

"කෝ බලන්න? අපොයි මේ මිනිහගෙ මූණෙ හැටි" යි අක්කා ඇගේ අතෙහි වූ දෙය ගනිමින් හඬ නගා සිනහවන්නට වූවාය. කුසුමාද ඈ හා එක්ව සිනහවූවාය.

"මෙන්න මල්ලි මේ මිනිහගෙ මූණෙ හැටි" යි අක්කා ඇගේ අතෙහි වූ ඩ්‍රොයිං කොලය මා වෙතට දිගුකරමින් කීවාය. අක්කාගේ අතෙහි තිබියදීම මම එදෙස බැලුවෙමි. ඒ දුටු මටද සිනහ නවත්වා ගත නොහැකි විය. ඉක්බිතිව අපි තිදෙනම එක්වී සිනහවීමු.

"ඔය අපේ ස්කෝලෙ ළමයෙකුගෙ ඩ්‍රොයිං එකක් තමයි" කුසුමා මා දෙසට හැරී සිනහ මුහුණින් යුතුව කීවාය. අප හමුවූවාට පසු ඈ මා සමඟ කථා කළ පළමුවන වර ඒ යයි සිතමි.

"කුසුමා, මේ ඔයා දන්නවද? අපේ මල්ලිට පුළුවන් හොඳට අඳින්න" යි අක්කා මා දෙස බලා කීවාය.

"ඇත්තද?" යි කුසුමා මා දෙස දෙනෙත් පුළුල් කොට බලමින් විස්මයෙන් මෙන් ඇසුවාය. මම කිසිත් නොකීවෙමි. එය එසේ නොවේ යයි කීමට මට උවමනා

වූ නමුත් මම නිශ්ශබ්ද වීමි. එසේ වුවද මට හොඳට අඳින්නට පුළුවනැයි අක්කා කියනු ඇසීම මගේ ප්‍රීතියට හේතු විය. ඒ හා සමඟම මා සිතෙහි ලැජ්ජාවක්ද ඇතිවිණ. ප්‍රීතිය හා මුසු වූ ලැජ්ජාවක් බඳු ඒ හැඟුම මා යටපත් කොට ගත්තේ මඳක් වෑයමිනි.

ඔවුන් පැමිණ දින හතරක් පමණ ගතවිය. ඒ කාලය තුළ අප අතර ඇති වූ මිත්‍රත්වය බොහෝ සේ දියුණු විය. අක්කාත් කුසුමාත් සමඟ එක්වී කෙළි කවට කම් දොඩමින් කල්ගෙවන්නට පුරුදු වීමි. ඔවුනොවුන් හා එක්වී වත්තේ හැසිරෙමින්ද, නෑ ගෙදරවල යමින්ද අපි දවසෙහි වැඩි හරියක් ගත කෙළෙමු.

දිනක් උදයෙහි මම තාත්තාගේ කාමරයේ ජනේලය අසල වූ මේසය මත තබාගෙන සිතුවමක් අඳිමින් සිටියෙමි. කාමරයේ අනික් කොටස්වලට වඩා ආලෝකමත් එතැන බෙහෙවින් සිත් අලවන සුළුය. අතු පතර විදහා ගත් විශාල අඹ ගසෙහි මලින් බර වූ අතු කීපයක් ලා කොළ පැහැති ජනෙල් රෙද්දට උඩින් පෙනේ. කවුළුවෙන් ඇතුළු වූ හිරු රැස් මේසය මත රටාවක ආකාරයෙන් පැතිරී තිබුණේය.

කිසිවකුගේ සිහින් අඩි ශබ්දයක් ඇසුණෙන් මම පිටුපස හැරී බැලීමි. මැහුමක් අතකින් ගත් කුසුමා මා සිටි පුටුව අසල නැගිටී සිටියාය.

මම සිතුවම පාට කරන්ට වීමි. ඈ දෙවැලමිට මේසය මත තබා නැඹුරු වී බලාගෙන සිටියාය.

"මේක හොඳද?" යි මදක් වේලා නිශ්ශබ්දව සිටි මම ඇසුවෙමි. ඒ වනවිට මා තුළ මුලින් ඇති වූ ලැජ්ජාවක් බඳු හැඟීම පහව ගොස් තිබිණ.

"හරි ලස්සනයි. මන් හිතුවෙ නැහැ මල්ලිට මෙච්චර හොඳට අඳින්න පුළුවන්ය කියා" යි ඇ පිළිතුරු දුන්නාය. ඇගේ ඇස් සිතුවම දෙසට යොමු වී තිබෙන බව මට පෙනිණ. ඇගේ පහත් කොට ගත් හිස මදක් ඇල වී තිබුණේය. මනාව පීරා ගොතන ලද ඇගේ කෙස් කරලත් මේසය මත වැටී තිබිණ. ඇගේ මුහුණෙහි උදයේ නැවරු පියරුවල සුවඳ මට දැනිණ. දෙඅත්ල මත රැඳවූ නිකටින් යුතු ඇගේ මුහුණ මෙන්ම සිහින් ඇඟිලි වලින් යුත් දෑතද පියකරු යයි මට සිතුණේය.

නිවාඩු කාලයෙන් මාසයක් පමණ ඉකුත් වන්නට ඇත. දැන් කුඹුරුවල ගොයම් කපන කාලයය. අපේ ගෙදර ඉදිරියෙහි ඇති කුඹුරුවල ගොයම් කපන මිනිසුන්ගේ හඬ මේ දිනවල නොනැවතී ඇසේ. අපේ මිත්‍රත්වය දැන් පෙරට වඩා බොහෝ සේ දියුණුය. දැන් අප තිදෙන එකට නොමැති වේලාවක් සොයා ගැනීම පවා දුෂ්කර යයි මම සිතමි. තිදෙනා එක්ව හඬ නගා සිනහවන හඬද කථා සල්ලාපයෙහි යෙදී සිටින හඬද ගෙදර වූ අන් අයට කරදරයක් තරමය. ඇතැම් විට එය අම්මාගේ කෝපය අවුස්සන තරම් විය. එහෙත් කුසුමා අප අතර ඇති බැවින් අම්මා අපට කිසිවක් නොකියයි.

දිනක් උදයෙහි මම තේ බීමට සාලයට ආවෙමි. අප උදේ තේ බීවේ සාලයෙහිය. කුසුමාටත්, මටත්, අක්කාටත් ගෙදර අන් අයට පෙර තේ දීම අම්මාගේ සිරිතය.

තේ බීමට පැමිණි මට කුසුමා වෙනද මෙන් එහි නොවූ බව පෙනිණ.

"කෝ අක්කේ කුසුමක්කා?" යි මම පුටුවෙහි වාඩිවෙමින් අක්කාගෙන් ඇසුවෙමි.

"කුසුමක්කා ඊයේ හැන්දෑවේ ගෙදර ගියානේ. එයාලගෙ මාමට හුඟක් අමාරුය කියල එයාලගෙ තාත්ත ඇවිල්ල එක්ක ගියා."

මම කිසිත් නොදෙඩා නිශ්ශබ්ද වීමි.

අක්කා යළිත් කථා කරන්නට විය.

"ආ, අන්න කුසුමක්ක කිව්ව එයා ගිය බව මල්ලිටත් කියන්නෙයි කියල."

මම කිසිත් නොදෙඩා තේ බී අවසන් කෙළෙමි. අක්කා සමඟ කථා කිරීම මට එවිට රුචි නොවීය. මා තුළ වූයේ ශෝකයක් හා මුසු වූ කිසියම් හැඟීමකැයි මම සිතමි.

ඊට පසු මට නිතර කුසුමා ගැන සිහිවන්නට විය. අක්කා සමඟ ඇ ගැන කථා කිරීම මට බෙහෙවින් රුචි විය. ඇ දකීමට මා තුළ දැඩි ආශාවක් ඇති විය. එදින මා මේසය අසල සිතුවම අඳින විට ඇ

දෙවැලමිට මේසය මත රඳවා නැඹුරු වී සිටි සැටි මට බොහෝවිට සිහිවන්නට විය. ඇ අසලින් සිටීම මහත් ප්‍රීතියකැයි මට සිතිණ.

කෙමෙන් ඇ දකීමට මා තුළ වූ ආශාව දියුණු විය. අක්කා නිවාඩුව ඉවර වී පාසැලට ගියාය. ඇගෙන් කුසුමක්කා ගැන දත ගත හැකි වෙතියි මට සිතිණ. එහෙත් මා තුළ වූ කිසියම් බියක් හා ලැජ්ජාවක් නිසා මට එය කළ නොහැකි විය.

ඇට මා ගැන අමතක වී ඇතැයිද මට වරෙක සිතේ. "ඇට මා ගැන කෙසේ මතක හිටින්වද?" එවිට මා සිත ශෝකයෙන් මැලවෙයි.

# 14

# වෙසක් කූඩුව

"මේ සැරේ කොච්චර හැදුවත් එමානිස් අයියට නම් දිනුම ගහන්න බැහැ. මේ පාර පුංචි මහත්තයලත් මේ පැත්තෙ දකින්න නැති විදියෙ කූඩුවක් හදනව."

"ගිය සැරෙත් ඔහොම හුහක් දෙනෙක් කිව්ව. ඒකට මට ගහන්න කවුරුවත් හිටියෙ නැහැ."

"එහෙනම් හොඳයි මේ සැරේ බලන්න" යි පාරෙහි වූ පියසේන කියනු අපට ඇසිණ. සොල්දරයෙහි බිම වාඩි වී බටපතුරු වගයක් සැසීමෙහි යෙදී සිටි මම පිටුපස හැරී පාර දෙස බැලුවෙමි. තට්ටු දෙකකින් යුත් ඒ ගෙයි පහළ තට්ටුවෙහි ඇත්තේ අපේ කඩයය. ඉහළ තට්ටුව අපේ ගෙදර මිදුල හා හිතිමහක් සේ බඳින ලද තරප්පු පේළියකින් සම්බන්ධ කොට ඇත. උඩ තට්ටුවෙහි ඉස්සරහ ආවරණය කොට ඇත්තේ මිටි ගරාදි වැටකිනි. එබැවින් උඩ තට්ටුවෙහි සිටින්නෙකුට කඩය අසලින් දිවෙන පාරත්, අපේ වත්තට යා බදව ඇති එමානිස් අයියාගේ ගෙමිදුලත් මැනවින් පෙනෙයි. පියසේන, එමානිස් අයියා සමඟ කථා කරමින් සිටියේ මෙවර අප බැඳීමට අදහස් කර ඇති වෙසක් පහන ගැන බව මට ඔවුන්ගේ කථාවෙන්

වැටහිණ. පියසේන යනු එකල අපේ ගෙදර වැඩ පල කිරීම පිණිස සිටි කොලුවාගේ නමය.

"හොඳයි බලමු. ඔය වගේ හුහක් දෙනා මීට ඉස්සෙල්ලත් මට ගහන්න හදන්න හැදුවා. ඒකට මෙච්චර කල් මට ගහන්න කවුරුත් හැදුවේ නැහැ" යි එමානිස් අයියා යළිත් කියනු අපට ඇසිණ.

සොල්දරයෙහි වාඩි වී සිටි ධනපාලටත් මටත් ඔවුන්ගේ කථාව නිසා සිනා නොවී සිටිය නොහැකි විය.

"එමානිස් අයියා නම් දන් කූඩු වලින් දෙකෙන් පංගුවක් විතර හදල ඉවරකරල ඇති" යි මෙතෙක් නිශ්චලව සිටි ධනපාල කීවේය.

"ඔව් එද අපිට මිනිහ බට ගේන්න යනව හම්බවුණේ දන් සුමානෙකටත් ඉස්සෙල්ල විතර නේද?"

"එමානිස් අයිය මේ සැරේ වෙනදටත් වැඩිය හොඳට කරන්න වෙන්න ඇති කලින්ම පටන් ගන්න ඇත්තේ" යි ඔහු කීවේය.

මෙවර එමානිස් අයියා වෙනදටත් වඩා කලින් වෙසක් කූඩු සෑදීම ආරම්භ කළ බව අපි දන සිටියෙමු. "දන් කැලේ බට ඇත්තෙත් නැහැ. මට මේ සැරේ බට සොයන්න සම්පූර්ණයෙන් දවසක් ඇවිදින්න වුණා." යි දිනක් සවස ඔහු කඩයේදී කියනු මට ඇසිණ. ඉන්පසු ගෙදර වූ හැම නිවාඩු මොහොතකම ඔහු කළේ ඒවා සැස රාමු සෑදීමට සරිලන සේ

සකස් කිරීමය. ගාලු ගොස් රෑ බෝවීමට පළමු ආපසු පැමිණි ඇතැම් දිනක එමාතිස් අයියා ගෙයි ඉස්තෝප්පුවෙහි වූ ඇඳ මත වාඩි වී විට්ටම මත තැබූ කුප්පි ලාම්පුවක එළියෙන් බට පතුරු එක්කොට බඳින සැටි හෝ ඒවා නියම දිග ප්‍රමාණයක් අනුව කපන සැටි හෝ අපට දක්ක හැකි විය. විට්ටම මත වූ කුප්පියෙහි දැල්ල වරක් උස්වෙමින්ද වරක් පහත්වෙමින්ද සුළඟක් හා පොරකයි. වම් අත්දණ්ඩ මත තබන ලද බට පතුරක් සෙමෙන් සැසීමෙහි යෙදී සිටින ඔහුගේ මුහුණෙහි දැඩි ඒකාග්‍රතාවක් දක්වන පෙනුමක් ඇත. පහත් දැල්ල නිසා පැතලි නැහැයෙන් හා හතරැස් හරි පෙනුමෙන් යුත් ඔහුගේ මුහුණෙහි ඇත්තේ පඬුවන් පැහැයකි. මුළු දවසක් කරත්තයෙන් ඒ මේ අත ගොස් නොයෙක් වැඩෙහි නියුක්තව වෙහෙස වී පැමිණෙන ඔහු මෙසේ රෑ බෝවන තුරු වැඩ කරනු දැකීම අපගේ විස්මයට හේතු විය.

එමාතිස් අයියා රක්ෂාවක් වශයෙන් කළේද කරත්ත දැක්කීමය. ගොනුන් දෙදෙනකු බැඳි කරත්තයෙන් ගාලු ගොස් බඩු පටවා ගෙන එන ඔහු ජීවත්වූයේ ඉන් ලැබෙන කුලියෙනි. මුළු දවසම එහි ගෙනියනු පිණිස බඩු සොයා ගන්නා ඔහු අඳුරු වැටෙත්ම පිටත් වෙයි. මෙසේ මුළු රැයක්ම මහ ගෙවන ඔහු ගාල්ලට ළංවන්නේ පසුදින උදයෙහිය. එහෙත් මුළු ජීවිත කාලයක් තුළ ලැබූ පරිචය නිසාදෝ ඔහුට රාත්‍රිය වුවද දැනුණේ දහවල ලෙසිනි. රාත්‍රියෙහි තමාගේ 'හිත් සෝදිසිය' වැඩි යයිද ඔහු සිතුවේය. ඔහු සෑම වංගුවක්ම සෑම බෝක්කුවක්ම පැටලීමක් නොමැතිව අඳුනා ගත්තේය. කරත්තය ඇතුළෙහි දිගා වී සිටින

ඔහු ඇතැම් මොහොතක සිය පුතාට මෙසේ කීවේය. "බලාගන දක්කපන්. තව ටිකක් එහායින් බෝක්කුව පැත්තේ ලොකු වලක් තිබුණා." ඔහු මෙසේ කීවේ ඉවෙනියි සිතමි. ඔහුට මහ දෙපස වූ සෑම කඩයකම මෙන්ම ගෙදරකද අතීතය ගැන එකලෙස නිවැරදිව කිව හැක. "ඕමෙන් වඩුමහත්තයලගෙ පුතාට ගෙනාපු දවස මට අද වගේ මතකයි. එද මඟුල් කාරයන්ට යන්න කරත්තෙ පැය තුනකටත් වැඩිය නවත්තගෙන ඉන්න වුණා. එදම තමයි රත්තගෙ තුනටිය කැඩුණේ . . . අපොයි, එහෙම ගොනෙක්යි ඔහු ඇතැම් විටක කිසිවකු හා කියන්නේ මේ දැනුම වහල් කොට ගෙන විය යුතුය.

එමානිස් අයියාට එපමණක් නොව තමාගේ ගොනුන් මැරුණ සැටිද දවසද මතක ඇත්තේ එවැනිම නිවැරදි ලෙසය. "නාකියා මැරුණේ ගිය අවුරුද්දේ දුරුතු පෝයට දවසක් තියා. මට ඌ විකුන්නා නම් හොඳ සල්ලියක් ගන්න තිබුණා" යි ඔහු ඉඳ හිට කියන්නේ මෙ කරුණ නිසා විය හැක. ඔහු තමාගේ ගොනුන්ට සැලකුවේද සිය දරුවනට මෙනි. 'මතු ආත්ම වලදී සතුන්ට මිනිසුන් වී ඉපදිය හැකි බැවින්, ගොනුන් ලබන ආත්මයේදී මිනිසුන් වන බව නොඅනුමාන යයි' ද ඔහු විශ්වාස කළේය. ගොනුන්ගේ ඇස් මිනිසුන්ගේ ඇස් වැනි යයිද ඔහු සිතුවේය. ඇඟ පත වෙහෙස වූ ඇතැම් දිනයක එමානිස් අයියා සවස ගෙදර ආවේ බීමත්ව ය. එවැනි දිනයක ගෙපිලෙහි වාඩි වී ගොනකු පුරතල් කරන ඔහු, ද්‍රවුවෙක් සිනාපුණේය. "උඹ දැන් නාකි වී ගෙන එනවා. උඹට පුත්තු නැද්ද. නාකි වුණාම සැලකුම්

ගන්න උඹට පුතෙක් ඉන්න ඕනෑ'' යි ඔහු එවැනි මොහොතක කියනු සොල්දෙරෙයෙහි කිසිවක් කරමින් සිටින අපට ඇසෙයි.

මෙසේ ජීවත්වන එමාතිස් අයියා, වෙසක් පොහෝ දින පිළිබඳ සැරසීමද සැලකුවේ අවුරුද්දේ තමාට ඇති කාර්‍යයන්ගෙන් ප්‍රධාන එකක් ලෙස යයි සිතමි. ''අපට මීට වැඩිය උතුම් දවසක් තවත් කොහේද? මිනිසුන්ට මේ දවසේ උතුම් කම ගැන නොතේරෙන්නේ පව් වැඩි කම හින්දයි'' යි. ඔහු ඒ ගැන කථා කරන විට සිතහවෙමින් කීවේය. එවැනි විටක ඔහුගේ කට හඬෙහි අහංකාර භාවයක් විය.

සාමාන්‍යයෙන් වෙසක් පොහෝ දින සඳහා කූඩු සෑදීමට එමාතිස් අයියා පටන් ගන්නේ අවුරුද්ද ගොස් සුමානයක් ගතවීමටත් පෙරය. ගාලු යෑමට නොමැති එක්තරා දිනයක ඔහු සොලොස්වියෙහි වූ සිය පුතාත් සමඟ බරකරත්තයෙන් උඩලමත්තට යයි. එසේ යන අතර ඔහුට තමා අඳුනන ගිහියකු අතර මඟදී සමුවුවහොත් කථා කිරීමට පටන්ගන්නේ සිය උවමනාවෙන්මය.

''අවුරුද්දත් ගියා දන් ඉතින් වෙසක් වලට තව දවස් කීයද? මං මේ බට ටිකක් ගේන්න උඩලමත්තට යනවා.''

''මේ සැරෙත් එමාතිස් අයියා වෙසක් ජයට කරන්න වගෙ'' යි ඔහුගේ කථාවට අසුවන තැනැත්තා අසන්නේ ඔහුගේ සිතෙහි ඇති උනන්දුව ඉවෙන් මෙන් දැන ගනිමිනි.

"ඔව් හැමදම කරන එක තෙවෙ. මෙච්චර කල් මට ගහන්න මේ පැත්තෙ කවුරුවත් කෙරේ නැහැ."

"ඒක නම් ඇත්ත තමයි. ඒ වුණත් ගිය සැරේ දෙවර ගෙදරත් බොහොම ජයට තිබුණා" යි මෙසේ කී විට ඇතැමෙකු කියන්නේ ඔහුගේ සිත මඳක් කුප්පවන අදහසිනි.

"මොන බොරුද ඔය පිංතූර කොළ අලවපු පෙට්ටි තිබුණට මගේ වගේ ලස්සන කූඩු කොහේද? අපේ දෙල්ගහේ එල්ලල තිබුණු කැරකෙන කූඩුව ලොකු මහත්තය දැක්කද?"

"ඔව්"

"ඒක හදන්න මට පිට පිට දවස් පහක් විතර ගියා. ඒ වගේ කූඩුවක් මම ගාල්ලෙවත් දැක්කෙ නැහැ" යි ඔහු ඉක්බිතිව කියන්නේ තමා කාරණය සම්පූර්ණයෙන් අවබෝධ කර දුන්නේ යයි යන ප්‍රීතිමත් හැඟීමෙන් යුතුවය.

උඩලමත්තට දවල්වන විට යන ඔහු එහි එදින මුළු දවසම ගෙවන්නේ ඇල අද්දර වූ බට ගස් කපමිනි.

මෙසේ ගොස් ගෙනෙන ලද බට ගොඩ පසුද උදයෙහි ඔහුගේ ගෙමිදුලෙහි තිබෙන බව දකින අපි කුඩා කල නම් බොහෝ වර විස්මයට පත්වීමු. ඉන්පසු අප ඒ වටා කැරකෙන්නේ ගෙමිදුලෙහි හෝ අහල පහල කිසිවකු නැති මොහොතක් බලා එයින් දෙක තුනක් මිටියෙන් ඇද ගෙන ගේ දෙසට දුවන අටියෙනි.

මල්ලීත් මාත් මෙසේ එමානිස් අයියාගේ ගෙමිදුල අසලට වුත් සිටින බව දකින අම්මා අපට ගෙදර එනු පිණිස අඬ ගසා බැරි වූ ඇතැම් විටක මෙසේ කියයි.

"පියවතී, තාත්ත ආවහම කියපන් මේ දෙන්නටත් ඔයින් කුඩුවක් හදල දෙන්නය කියා."

එහෙත් බොහෝ වේලාවල අප එතනින් ඉවත් වන්නේ අපට තනිවම සාදගත හැකි කුඩුවකට සෑහෙන පමණ බට රැගෙන යාමෙන් පසුවය.

කුඩා කල වෙසක් කුඩුවක් සාදගත නොහැකි අප එසේ එකක් සාදවා ගන්නේ තාත්තාට දවස් කීපයක් කරදර කිරීමෙන් පසුවය. අපේ කරදරය තවත් ඉවසිය නොහැකි තාත්තා එමානිස් අයියාට හඬ ගසා මෙසේ කියයි. "එමානිස් මගේ කන්දෙක ඇහිල ඉන්න නැහැ. මෙන්න මේ තුන් දෙනාටත් ඔන්න ඔයින් එකක් හදල දීපන්." එහෙත් අපට එය ලැබෙන්නේ වෙසක් පොහෝ දට පළමු දින හෝ එදිනම උදයෙහි බව අපි දනිමු. එතෙක් ඉවසා ගෙන සිටීම අපට කළ නොහැක්කකි. තවත් ඉවසිය නොහැකි වූ නංගිත් මල්ලිත් මාත් ගෙදර කවුරුත් නිදි මොහොතක් බලා කුස්සිය අසල වූ මඩුවට එන්නේ අම්මාගේ මැෂින් ලාච්චුවෙන් සොරා ගන්නා ලද නූල් බෝලයත් රැගෙනය. ඉන්පසු නංගිත් මමත් කුස්සියෙහි වූ මන්නය ගෙන බට පතුරු අමාරුවෙන් සැස ඒවායේ කොන් එකට එක් කොට බැඳීමට පටන් ගතිමු. එහෙත් අපට ඒවා නිසියේ බැන්ද

හැක්කේ කලාතුරකිනි. එක් කොනක් බැඳ, අනික් කොන බැඳීමට සූදානම් වන විට පළමුව බඳින ලද කොන ලිහී ගිය බව දකින මා යළිත් එය බැඳීමට පටන් ගත්තේ කෝපයෙන් පිපිරීමෙනි. මෙසේ අමාරුවෙන් කොන් තුනක් බැඳ හතරවන කොන බැඳීමට පටන් ගත්තා අපට එය හරි හතරැස් නැති බව පෙනී යයි. නංගී එපා යයි කියද්දී මම බඳින ලද කොන් ලිහීමට පටන් ගනිමි. එහෙත් කිසිවකුගේ අඩි ශබ්දය අපට ඇසේ. මම බට පතුරු සියල්ලම බුරු ඇඳ යටට දමා මඩුවෙන් එළියට ඒමට තැත් කරමි. අප රැවටුන නමුදු එය කිසිවකුගේ අඩි ශබ්දය නොවේ. මෙවර මල්ලීට දෙර අසල බලා සිටින ලෙස කියා නංගිත් මමත් යළිත් බට පතුරු බැඳීමට පටන් ගනිමු. එහෙත් ස්වල්ප වේලාවක් ගතවන්නට පෙර මුවහත් වූ බට පතුරක පැටලීම නිසා නංගිගේ ඇඟිල්ල කැපෙයි. ඇඟිල්ලෙන් ලේ ගලන බව දකින නංගී බියෙන් ඇලලී ගිය මුහුණින් යුතුව කෑ ගැසීමට පටන් ගන්නා බව දන්නා මා ඇගේ ඇඟිල්ල, ඇඳ සිටි කමිසයේ වාටියෙහි යටි පැත්තට තද කොට සිටින්නේ 'අනේ නංගියේ අඬන්න එපා අම්මට ඇහේවි' යි අයදමිනි. එහෙත් ඇගේ ඇඟිල්ලෙන් ලේ ගලනු දකින මල්ලී "මෙන්න අම්මේ අක්කගෙ . . . යි" කෑ ගසන්නට පටන් ගනියි. නිදා සිටි අම්මා වහා දිව අවුත් නංගී කැඳවා ගෙන අල්මාරිය වෙත යන්නේ මෙතෙක් අප විසින් බඳින ලද හා සැස ඔප මට්ටම් කරන ලද බට පතුරු සියල්ල විසිකරමිනි.

කෙසේ වුවද වෙසක් පොහෝ දින අපට පත්තු කිරීම පිණිස එදින උදයෙහි එමානිස් අයියා ගෙන්

කුඩුවක් ලැබේ. ඔහු එය සාද දෙන්නේ අපේ ඉල්ලීම් වලට වඩා තාත්තාගේ කීම අහක දැමිය නොහැකි නිසා යයි සිතමි. ඉන්පසු අපගේ ප්‍රධාන කාර්යය වන්නේ එහි කඩදසි ඇලවීමය. ඇලවීමට සුදුසු අයුරු කඩදසි කපා දෙන්නේද, රැලි කපන්නේද තාත්තාය. මෙසේ සාද ඉවර කොට රාත්‍රි ඇඳිරි වැටෙත්ම පාර අසල ඇඹුල් දෙඩම් ගසෙහි එල්වනු ලබන පහනෙහි ඉටිපන්දම් දල්වීමට කුඩා කල මා තුළ වූයේ දැඩි ආශාවකි. ඉටිපන්දම් දල්වන විට "මම ගිහින් මේවා වෙසක් කුඩුවේ ගහන්නම්" යි මා තාත්තා සමඟ කියන්නේ ඔහු එයට ඉඩ නොදෙන බව දැන දැන වුවද ආශාව මැඩ පවත්වා ගැනීමට නොහැකි බැවිනි.

"එපා උඹ පුච්ච ගනීවි. මා පත්තු කරන්නම්" යි කී ඔහු අපත් සමඟ ගොස් එය පත්තු කරයි. ඉක්බිතිව අප එදෙස බලා සිටින්නේ මහත් සන්තෝෂයෙනි. එහෙත් එය අපගේ සිත ඇද ගන්නේ ස්වල්ප වේලාවක් පමණකි. එමානිස් අයියාගේ ගෙමිදුලෙහි එල්ලන ලද වෛවර්ණ වෙසක් පහන්හි එළිය දල්වත්ම අපි එදෙස හයාගත් නෙතින් යුතුව දුවමු. ඒ සියල්ල කාන්තියෙන් ගෙමිදුලද, පාරද නහවයි. ඒ වෙසක් පහන් හමුවෙහි අපගේ පහන කුමක්ද? අපගේ පහන ගැන සිතත් ම මා තුළ ලැජ්ජාවක්ද කෝපයක්ද හටගනී. "එමානිස් අයියා අපිට දීල තියෙන්නෙ කැතම කුඩුව" යි නංගී මට ලංව කොඳුරන්නේ නොසතුටිනි. බොහෝ වේලා යන තුරු අපි දෙ ඇස් ඉන් ඇදගත නොහැක්කාක් මෙන් බලා සිටිමු.

මෙවර අප විසිනුත් විශාල වෙසක් කූඩුවක් සැදිය යුතු යයි මගේ සිතට ආවේ නිවාඩු පිණිස කොළඹ සිට ඒමට පෙරය. එබැවින් මම කොළඹින්ම විශාල ඉටිපන්දම් කීපයක් රැගෙන ගියෙමි.

දැන් අප විසින් වෙසක් කූඩුව තැනීම අරඹා දවස් දෙකකට වඩා නොවේ. වෙසක් පොහොයට තව ඇත්තේ දවස් හතරක් පමණකි. අප විසින් මෙතෙක් බැඳ නිමකොට ඇත්තේ මැද කූඩුව පමණක් බැවින් පෝය දිනට පළමු එය සම්පූර්ණයෙන් නිමවිය නොහැකි වෙතියි මම ඇතැම් විටක බියවීමි. වඩා කල් අල්ලන්නේ මැද කූඩුව සෑදීමට නොව ඒ වටා එල්ලනු ලබන පැටව් කූඩු සෑදීමටය, කිසිවකුට නුවුවමනා ලෙස නො එන සේ සොල්දරයෙහි දෙර වසා ඉතිරි කූඩු සෑදීම ඉක්මනින් කළ යුතු යයි මා ධනපාලට යෝජනා කළේ අඩු ගණනේ පොහෝ දිනට පළමු කඩදසි ඇලවීම පිණිස එය බැඳ නිම කළ යුතු බැවිනි. මල්ලී බට පතුරු එක ගණනට කපා සැස දෙන අතර අපි දෙදෙන ඒවා යුහුසුළුව බැඳීමට පටන් ගතිමු. නෙත සිත දෙකම යොමවා නොනැවතී වැඩ කරන අප දවල් කෑමෙන් පසු එළියට ආවේ තේ වතුර බොන පිණිස හෝ වෙන එවැනි අන් කාර්‍යයක් සඳහා පමණකි. අන් සෑම තැනම දැන් කූඩු බැඳීම නිම කොට ඇති බව අපට රහසක් නොවීය. දැන් ඔවුන් කරන්නේ කඩදසි ඇලවීම හෝ මල් කැපීමය. දිනක් සවස කඩයකට පැමිණි අපට එමාතිස් අයියාද කූඩු සියල්ලම සාද ඉවරකොට ඇති බව වැටහිණ.

"පොඩි මහත්තයලත් ලොකු කූඩුවක් බඳිනවාය කියා ආරංචි වුණා" යි අප දුටු මහු කීවේ සිනහවෙමිනි.

"නැහැ . . . අපිටත් නිකම් ඉන්නවට සෙල්ලමට හිතුනා" යි මම කීයෙමි.

"දැන් කූඩුව බැඳල ඉවරද?"

"තව කොහේද, තව පැටව් කූඩු ගණනක්ම බඳින්න තියෙනව."

"එහෙනම් කවද අලවන්නද? මගේ කූඩුවල නම් මල් අලවන්න විතරයි තියෙන්නෙ. කොයි එක කරන්නත් හෙට විතරක්නේ තියෙන්නෙ?" යි මහු කීවේ සාවඥ මුඛයෙන් සිනහවෙමිනි. ඔහුගේ සිනහවට හේතුවන්නට ඇත්තේ අපට අපේ කූඩුව වෙසක් පෝයට දවසක් තිබියදීවත් ඉවරකරගත නොහැකිවී යයි යන අදහස විය යුතුයි.

එදින අපි බොහෝ රෑ බෝ වනතුරු බිම පැදුරක් දමාගෙන වාඩිවී ලන්තෑරුමක එළියෙන් කූඩු බැන්දෙමු. නොයෙක් දේ ගැන කථා කරමින් වැඩෙහි යෙදුන අපට නිදිමතක් නොදැනිණ. අප තිදෙන හා එක්ව රෑ බෝ වනතුරු වැඩ කිරීමෙන් පසු පසුදින බැඳීමට ඉතිරිවූයේ එක කූඩුවක් පමණකි. පසුදින එයද නිමකොට සම්පූර්ණ කූඩුවෙහි කඩදාසි ඇලවීම කළ යුතු යයි අපි තීරණය කර ගතිමු.

වෙසක් කූඩුවක් තැනීමෙන් ලැබිය හැකි ප්‍රීතියෙහි, ඉතා උසස් අවස්ථාව ලැබිය හැක්කේ එහි කඩදාසි

ඇලවීමට පටන්ගත් විට පමණකි. වෙසක් පහනෙහි නියම හැඩය හා ස්වභාවය අපේ මනැසෙහි පළමුවරට ඇඳෙන්නේ එහි කඩදසි ඇලවූ විට පමණකැයි මම සිතමි. අවුරුදු ගණනක් වෙහෙස වී කටු සටහනක් සැදූ චිත්‍ර ශිල්පියකු තමාගේ සිතුවමෙහි සම්පූර්ණ හැඩය ගෙන දෙන අන්තිම තෙලිකා කූරු පහර කීපය යම් ප්‍රීතියකින් අඳීද එවැනි ප්‍රීතියකින් යුතුව අපිද වෙසක් පහනෙහි කඩදසි ඇලවීම කෙළෙමු. එහෙත් කඩදසි ඇලවීම ප්‍රවේශමෙන් කළ යුතුය. කඩදසි ඇලවූ පසු එහි රැල්ලක් හෝ වකගැසීමක් නොවිය යුතුය. මුළු කූඩුවෙහිම කඩදසි අලවා නිමකිරීමට අපට උදය කාලයම ගතවිය. එබැවින් රැළි කැපීමට හා මල් සැදීමටද එදින මුළු සවස් කාලයම යෙදීමට සිදුවිය. නොයෙක් පාටින් යුතු රැළි ලබාගැනීමට නම් නොයෙක් පැහැයෙන් යුතු කඩදසි තීරුකපා පළමු කොට ඇලවිය යුතුය. එවැනි කඩදසියක් කැපීමෙන් පමණකි විවිධ පාටින් යුත් රැළි ලබාගත හැක්කේ. රැළි කැපීම හා මල් කැපීමද කරන ලද්දේ මව්සිනි. ධනපාලත් ඒවා ඇලවූහ.

කඩදසි ඇලවීම හා රැළි දැමීමද එදින අවසන් වූ නමුත් මහ කූඩුව පැටව් කූඩු හා සම්බන්ධකොට ඉතිරි වැඩ නිමාකිරීම අපි පසුදිනට කල්දැම්මෙමු. වෙසක් පොහොය හෙට බැවින් දැන් සෑම ගෙදරකම පාහේ සාලය හෝ කාමරය මෙතෙක් සාදන ලද වෙසක් කූඩුවලින් පිරී ඇත. එමානිස් අයියාගේ ගේ තුළද මෙතෙක් සාදන ලද වෙසක් කූඩු හෙට වනතෙක් නොඉවසිල්ලෙන් සිටින ආකාරය ගැන අපට සිහිවිය.

පසුදින එළිවත්ම මුළු අවට පෙදෙසම වෙසක් සිරියෙන් බැබලෙන්නට විය. මනහර සේ අමදින ලද ගෙමිදුල් මත උදය හිරු රැස් ප්‍රීතියෙන් නැටුවේය. පන්සලෙහි එළිවීමට පෙර පටන්ගත් දවුලෙහි හඬ ඇසුණු අප සිත් තුළද ඇතිවූයේ වෙනද නොමැති සතුටකි. මම අවදිවූ විගස සොල්දෙරයට ගොස් කඩදසි ඇලවීමෙන් නිමවන ලද වෙසක් පහන දෙස බැලුවෙමි. අප සිතුවාට වඩා එය විශාල ලෙස පෙනීම මගේ සතුටට හේතු විය.

එදින සවස්වත්ම අපි වෙසක් කූඩුව මිදුලට ගෙන, අඹ ගස අසල තබා මැද කූඩුව හා පැටව් කූඩු සම්බන්ධ කිරීම ආරම්භ කෙළෙමු. ඉක්බිතිව මැද කූඩුව හා පැටව් කූඩු වසා කඩදසි මල් වැල් කීපයක්ද එල්ලන ලදී. වෙසක් පහනෙහි සියලු වැඩ නිමවුවද එය එල්ලිය යුත්තේ කොතනකද යන්න ගැන අපට තීරණයකට බැසීමට අපහසු විය. අන්තිමේදී එය පාර හරහා සිටින සේ සොල්දරයෙහි ගරාදි වැටත්, පාරෙන් එහා පැත්තෙහිවූ සියඹලා ගසත් අල්ලා බඳින ලද කඹයක එල්ලිය යුතු යයි අපි තීරණය කර ගතිමු. එසේ එල්ලූවිට එය සෑම පැත්තටම එකසේ පෙණෙනු ඇත.

ඇඳිරි වැටෙත්ම පන්සලෙහි දවුල් හඬ දියුණු වෙයි. අවට ඇති උත්සව සිරියද නැග එයි. ගෙමිදුල්හි එල්ලන ලද කොඩිවැල් හා වෙසක් පහන්හි රැළි එකිනෙක හා පටලැවෙන විට නගින 'සර' 'සර' නාදය සවස්වත්ම වැඩි වේ. තෙල් මල් පහන් ගෙන පන්සල් යන්නවුන් නිසා මහපාරද ක්‍රමයෙන්

ආකීර්ණ වෙයි. එමානිස් අයියාගේ ගෙමිදුලත්, ඒ අසල පාරත් නොයෙක් වෙසක් පහනින් හා කොඩි වැලින් වැසෙන්නට විය. පේළියටද එකිනෙකට යාවද එල්ලන ලද වෙසක් පහන් වැල් නිසා පාරෙහි යන්නකුට ගෙයි ඉස්තෝප්පුව පෙනුණේද යන්තම්නි.

සැඳෑ එළිය ක්‍රමයෙන් නැතිවත්ම එමානිස් අයියාගේ ගෙමිදුලෙහි වූ දෙල් ගසෙහිද වෙසක් පහන් කීපයක් එල්ලන ලදී. එහි පාර දෙසට නැමුණු විශාල අත්තක එල්ලන ලද සුදු පැහැති පැටවුන් ගණනකින් යුත් කූඩුව සිනහවෙන් ඉතිරෙන්නාක් මෙන් සුළඟෙහි සෙමෙන් පැද්දුනේය. එය දුටු අප තුළ විස්මය මෙන්ම බියක්ද ඇති විය. එහෙත් අපේ කූඩුව ඊට වඩා විශාල බව හැඟී ගියෙන් අප තුළ වූ බිය පහව ගියේය.

දැන් පාරෙහි යනෙන අයගේ ගණනද ක්‍රමයෙන් වැඩි වෙයි. මෙතෙක් නැගුණු දවුලෙහි හඬද නිශ්චල ගැඹුරු නිශ්ශබ්දතාවයකට ඉඩදෙමින් නැවතුණේය. අන්තිම සැඳෑ එළියද සෙමින් පහව ගොස් නැති විය. අපි මෙතෙක් ගේ තුළ වූ පහන පාර වෙතට ගෙනවුත් එහි ඉටිපන්දම් දැල්වීමට පටන් ගතිමු. මැද කූඩුවෙහි මව්සින් ගෙනෙන ලද විශාල ඉටිපන්දම් දෙක දල්වන ලදී.

ඉටිපන්දම් සියල්ල දැල්වීමෙන් පසු අපි කූඩුව සෙමෙන් උස්කොට එල්ලීමු. ඉටිපන්දම් එළියෙන් ආලෝකමත්වූ එහි සුන්දරත්වය අප තුළ වුවද විස්මයක් ඇතිකරවන සුළුවිය. අපි වරක් සොල්දරයටද වරක්

එමානිස් අයියාගේ ගේ අසලටද වරක් පාලම උඩටද ගොස් එහි සුන්දරත්වය දෙස බලා සිටියෙමු. එය අපගේ වුවද නෙත් සිත් බැඳ තබන සුළුවිය.

දන් අවට සැම තැනම පහන් දල්වා අවසානය. එමානිස් අයියාගේ ගෙදරින් පටන් ගත්තා පහන් වැට පාර දෙපැත්තෙහිම නොනැවතී එකලෙස දිලියෙයි. පාරෙහි යන එන්නන් පාලම අසල නැවතී බලා සිටින්නේ එමානිස් අයියාගේ ගෙමිදුලෙහි වූ පහන් හා අපේ වෙසක් පහන දෙස විය යුතුය. අපගේ පහන දෙස දුර සිට බලා සිටි කිසිවකු ළඟට පැමිණ, ඉන්පසු ඒ යටටද ගොස් එදෙස බැලුවේ සුන්දරත්වයෙන් වශීකෘත දෙනෙතින් යුතුවය. ඇතැමෙක් එය කෙසේ සාදන ලද්දයි වටහා ගැනීමට තැත්කරන්නාක් මෙන් බොහෝ වේලා පරීක්ෂාකාරීව එදෙස බලා සිටියෝය. ගෙමිදුලෙහි වූ එමානිස් අයියාගේ දෙ ඇසද අපේ පහන දෙස යොමුවී තිබෙන බව අපි දුටුවෙමු. වෙසක් පහන දෙස නැවතී බලා සිටියෙකු කථාවට වැටුණේ එහි සුන්දරත්වයෙන් චමත්කාරයට පත්ව විය හැක.

"හැබෑම ලස්සන කූඩුව, මේක හදන්න හුඟක් කල් යන්න ඇති" යි වෙසක් පහන දෙස බලා සිටියකු අප හා කියන්නට විය.

"මොකද එමානිස් කියන්නෙ, හැබෑටම ලස්සන කූඩුව නේද?" යි මෙවර ඔහු ඇසුවේ ගෙමිදුලෙහි වූ එමානිස් අයියාගෙනි.

එමානිස් අයියා කිසිත් නොදෙඩා මඳ සිනහවක් පෑවේය.

"මේ සැරේ එමාතිස් අයියට දිනුම ගහන්න බැහැ . . . මෙහේ තියා අම්බලම්ගොඩවත් මම නම් මෙහෙම ලස්සන කූඩුවක් දැකල නැහැ."

"ඔව් එක කූඩුව වුණහම කොහොමත් හුඟක් කල් අරගෙන හදන්න ඇහැකි. මට නම් කූඩු විස්සක් තිහක් නැතුව වැඩක් නැහැ" යි ඉක්බිතිව එමාතිස් අයියා පිළිතුරු දුන්නේය.

පාර පසුකොට යන බොහෝදෙන මෙන්ම අවට ගෙවල වූ බොහෝ අයද පාලම අසලට වුත් අපේ වෙසක් පහන දෙස බලා සිටින්නට වූහ. ඔවුන් එසේ චමත්කාරයෙන් වෙලීගිය මුහුණින් යුතුව එදෙස බලා සිටිනු දකින අප තුළ නිතැතින් වූවද ඇතිවූයේ ආඩම්බරයකි. එසේ පැමිණි බොහෝ දෙන අප සමඟ මෙන්ම එමාතිස් අයියා සමඟද කථාවට වැටුණේ ඉබේය.

"පොඩිමහත්තයල මේ සැරේ එමාතිස් අයියා පරාද කරා නේද?" යි එසේ පැමිණි කිසිවකු කීවේ හඬ නහා සිනහවෙමිනි.

"හැබෑටම හරිම ලස්සන කූඩුව"

"මේකෙ ප්ලෑනෙ බලාගෙන එමාතිස් අයියටත් ලබන සැරේ එකක් හදන්න ඇහැකි" යි කිසිවකු එමාතිස් අයියා සමඟ කීවේ මෙවැනි කූඩුවක් සාදන සැටිද විස්තර කරමිනි.

"දැන් අපි කොහොමත් නාකි නෙවෙ" යි එමාතිස් අයියා එවැනි විටක කීවේය.

පැයක් පමණ මෙසේ කඩය අසල වාඩිවී බලාසිටි අපි පාරදිගේ වෙසක් සිරි බලනු පිණිස පිටත්වීමු. වෙසක් දිනයෙහි මුළු පෙදෙසම එකම සුරංගනා ලෝකයක් සේ බබලයි. අහසෙහි පාවෙන පුන්සඳ සිය රැස් දහරින් අවට කඳු මුදුන්ද, පාළු කුඹුරුද, නිශ්චල දිය කඩිතිද නහවයි. සෑම දෙයෙහිම අලුත් බවක්ද ප්‍රීතියක්ද පිළිබිඹුවී ඇත. තැනින් තැන දිස්වෙන වෙසක් පහන් මිනිසුන්ගේ හදවතින් නගින ප්‍රීතිය දෙ ඇසට පෙන්වන්නවුන් වැනිය. පාරෙහි ඒ මේ අත ඇවිදින්නවුන්ද, මහත් ප්‍රීතිමත් ආරංචියක් ඇසීමෙන් තුල්මත් වූවන් මෙන් සිනහබර මුහුණින් යුතුව ඒ මේ අත ඇවිදිති.

පැය බාගයක් පමණ ඒ මේ අත හැසුරුණ අපි ආපසු පැමිණියෙමු. පාලම දෙසට ළංවත්ම අපේ නෙත් පුදුමයෙන් වෙලීගියේය. අපේ විශාල පහන හැර ඒ අවට එකද පහනක් පෙනෙන්නට නොවීය. මෙතෙක් එළියවී තිබුණ එමාතිස් අයියාගේ ගෙම්දුල අඳුරෙහි ගැලී තිබිණ. සිදුවී ඇත්තේ කුමක්දැයි විසඳාගත නොහැකි අපි ඒ අසලට පැමිණ වෙසක් පහන්වලට කුමක්වීදැයි බැලුවෙමු.

ගෙම්දුලෙහි ඉතිරිවී තිබුණේ පහන් කීපයකි. ඉන් කීපයක්ද දැවී ගොස් තිබිණ. මා වටපිට බැලුවේ කිසිවක් සිතාගත නොහැකි වූ බැවිනි. ගෙයි ඉස්සරහ පැත්තද වසා තිබිණ. එහි වූ ඇඳ මත කුඩා දරුවකු අඬමින් සිටියේය. මම ඔහු වෙත ගියෙමි.

"ඇයි අඬන්නේ?"

එහෙත් ඔහු කථා නොකළේය.

"කෝ අම්මලා?" යි මම යළිත් ඔහුගේ උරහිසින් අල්ලා සොලවමින් ඇසුවෙමි.

"පන්සල් ගියා"

"අඩන්නෙ පන්සල් එක්ක නොගිය හින්දද?"

"නැහැ . . . වෙසක් කූඩු . . . පිච්චුවා . . ."

"කව්ද පිච්චුවේ?"

"තාත්තා" යි ඔහු ගොතගසමින් කීවේ යළිත් අඬමිනි.

මෙතෙක් කෑම නොකා සිටිය බැවින් අපි ගෙදර දෙසට ගියෙමු. එහෙත් ඊට පළමු මම සොල්දරයට ගියෙමි. මම එහි ගරාදි වැටෙහි බඳින ලද කඹය ලිහුවෙමි. ඉක්බිතිව මම මෙතෙක් දැල්වෙමින් තිබුණු පහන බිමට බා එය නිවා දැම්මෙමි.

# 15

# ලිපිකරුවෝ දෙදෙන

පිනස් වියෙහි සිටි මහලු ලිපිකරුවා ඉස්තෝප්පු-වෙහි මිටි බිත්තිය උඩ වාඩිවී මහත් ප්‍රීතියෙන් මෙන් සිහින් හඬින් යුතුව සෙමෙන් කථා කෙළේය. ඔහු කථා කළේ ඉතා නොවැදගත් දෙයක් කියන්නාක් මෙන් නුවුවමනාවෙන් යුතුවය. සතරැස් හරි, පැතලි නැහැයකින් යුත් ඔහුගේ මුහුණෙහි වූ කුඩා දෙ ඇස ඔහු කියන දෙයෙහි සත්‍යතාවය නිසා ප්‍රීතිවන්නාක් මෙනැයි එදෙස බැලූ මට සිතිණ. ඔහු ඉදහිට තමා අසල වූ තරුණ ලිපිකරුවා කී දේ නැසෙන්නාක් මෙන් දෙතොල උල්කොට බීමත් ගතියෙන් මෙන් හිස වැනුවේය. ඉස්තෝප්පුවෙහි එහාපැත්තෙහි වූ මා ඔවුන්ගේ කථාවට කන්දුන්නේ යම්තම්නි. තරුණ ලිපිකරුවා - වීරසිංහ -වෙනද මෙන්ම තමාගේ දුඃඛිත තත්වය ගැන නොනවත්වා කියමින් සිටියේය.

"ඔහොම තමයි - ජීවිතේ ඕවා ගැන සිතීමෙන් වැඩක් නැහැ. ඕවා ගැන සිතා දුක්වන්නේ මෝඩයෝ."

මහලු ලිපිකරුවා සෑම වාක්‍යයක් අන්තිමේදී දෙතොල උල්කොට තමා කී දෙයෙහි සත්‍යය නිසා පැහැදුනාක් මෙන් සෙමෙන් හිස සෙලෙව්වේය.

"මට ජීවිතේ එපාවෙලා . . . මට මෙහේ ඉන්නකොට ගෙදර යන්නට හිතෙනවා. එහෙත් ගෙදර ගියහම එයින් පිටවෙන්නේ කොයි වෙලාවෙද කියා මට ඉවසුම් නැහැ. ඇත්ත වශයෙන් කියනව නම් මම මේ සියල්ලට බයයි" යි නොනවත්වාම කියාගෙන ගිය ලිපිකරුවා කල්පනාවෙන් බරවූ දෙනෙතින් යුතුව තමාගේ දෙඅත්ද ඇඟිලිද දෙස බලා සිටියේය.

අසල වූ පාරෙහිත්, පාරෙන් ඔබ්බෙහි වූ කඳුවලත් කිසිවෙක් පෙනෙන්නට නොවීය. පැය දෙකක් පමණ නොනැවතී වැහි වැටීම නිසා අහසෙහි තරමක පැහැදිලි පෙනීමක් තිබුණේය. ඈත කන්දක ගස්වලට උඩින් සිහින් මීදුමක් වැනි කිසිවක් නැගගෙන එයි. මහලු ලිපිකරුවා එදෙස බලමින්ද හිස වැනුවේය.

"මේ වගේ වහින්නට ගියෝතින් අපිට කන්තෝරු යන්නත් බැරිවෙනවා. මේ කාලයේ වෙනද නම් වැහි නැහැ. වැස්ස වහිනවාය, අව්ව පායනවාය, හිරිහැර තිබෙනවාය, ජීවිතේ එපාවෙලාය. මේ ඔක්කොම කියන්නේ මෝඩයෝ. ඔක්කොම මෝඩකම් මට නම් මං පාවෙන්න වැස්සත් ගණනක් නැහැ" යි කී ඔහු මා දෙස සිනහ වී හිස සලමින් බැලුවේ කිසිවකුට සරදමක් කරන්නාක් මෙනි. මම එය අනුමත නොකරන බව ඇඟවීමට මෙන් කියවමින් සිටි පොත දෙස සිත යොමු කෙළෙමි. ඔවුන් මෙන් විවේක කාලවලදී එක්ව කථා කිරීම හෝ නිකරුනේ ගෙවීම මගේ සිරිත නොවේ.

"දැන්නම් මට ගැලවෙන්න විදියක් පෙනෙන්නේම නැහැ. මීට වැඩිය මැරෙන එක හොඳයි" යැයි යළිත් වීරසිංහ හිස ඔසවමින් තොල් මැතුරුවේය. "මම මුලදී හිතුවේ ඉතාමත් ප්‍රීතිමත් ජීවිතයක් ගෙනියන්න. මගේ ඒ බලාපොරොත්තු මෙසේ සුන්වී යාය කියා මම සිතුවේ නැහැ. මම ඇත්තෙන්ම මුලදී විමලාට තදින් ප්‍රේම කළා."

ඔහුගේ කටහඬෙහි මේ සියල්ල කියනවිට වෙනද ඇතිවන සුළු ශෝකී භාවය මෙදිනද විය. ඔහුගේ කථාව මෙන්ම ඔහුගේ කට හඬෙහි දුක්මුසු බවද මට ප්‍රිය නොවීය. ඔහු ක්‍රියා විරහිත, සිතීමට පමණක් පුරුදුවී ලාමකයෙකැයි යන්න ඔහු පිළිබඳව මා තුළ වූ අදහස විය. ඔහු ඉතා සුළු දෙයින් වුවද කැළඹීමට පත්වන පුද්ගලයකු විය යුතුය. ඔහුගේ දෙ ඇස දැඩි අභිලාෂයන් මෙන්ම බියක්ද නිරතුරුවම හෙළි කරයි. ඔහු කියන දේ මට එතරම් රුචි නොවූයේ මෙ බැවින් විය හැක.

මහලු ලිපිකරුවා මුහුණට නගාගත් මඳ සිනහවකින් යුතුව, බිත්තිය මත ඇඟිලි තුඩු වලින් තාලයක් තගමින් ඈත කඳු දෙස බලා සිටියේය. "තව කීප දවසකින් වැහි නවතීවි. හවසට මීදුම ගලන්නේ තදින් පැවීමටයි. පායනවා, වහිනවා කන්තෝරුවට යනවා! බොනවා - නිදගන්නවා - ආ මෙහෙම සැපවත් ජීවිතයක්." ඔහු මා දෙස බලා යළිත් දෙතොල් උල් කෙළේය.

තරුණ ලිපිකරුවා ඒ සියල්ල නැසුනාක් මෙන් නොනවත්වා තොල් මතුරන්නට විය. ඔහුගේ දෙතොල එකිනෙක හා සෙමෙන් ගැටෙයි.

"මම විමලා බඳිනකොට ඇට ඉතාමත් තදින් ප්‍රේම කළා. ඒ දවස්වල ප්‍රීතිමත් ජීවිතයක් ගැන මම කොතරම් බලාපොරොත්තු වුණාද? ඒ සියල්ල විනාශ වුණා. ඒ සියල්ල නැති වුණා. "ඔහු වටපිට බලා සුසුමක් හෙළීය. "ඇට ක්ෂය රෝගය හැදුනේ මාස හයක් යන්නටත් කලින්. ඇට ඊට ඉස්සෙල්ලත් ඒක තියෙන්න ඇති. ඉතින් මට ඇව එපා වුණේ ඒක හින්දද? වෙන මොකක්වත් නිසාද? මට නම් කිසිදෙයක් තේරෙන්නෙ නැහැ. ඇ සමඟ ආදරයෙන් කථා කිරීම පවා මට මාස කීපයකින්ම එපා වුණා. මුලදී ඇගේ සිත රිදවීමට පවා වචනයක් නොකී මම ඇ සමඟ කථා කළේ කෝපයෙන්. ඒක මම උවමනාවෙන් කළා නොවෙයි . . . ඔබට තේරෙනවද? . . . ඔබට තේරෙනවාද? . . . ඇගේ කඳුළු මගේ සිත උණුකළේ නැහැ. මට ම තේරෙන්නේ නැහැ මට මොකක් වීද කියා" නොනවත්වාම කියාගෙන ගිය වීරසිංහ බිත්තියට හේත්තුවී නිශ්ශබ්දව බලා සිටින්නට විය. ඔහුගේ දිගටි මුහුණ බියපත් සුදුමැලි පෙනුමක් ඉසුළුවේය. දියවී යන හැඟුමක් ගෙන දෙන එහි කම්මුල් ඇට පිටතට නෙරා තිබේ.

මහලු ලිපිකරුවා යළිත් බීමත් ගතියෙක් පෑ දෙනෙතින් යුතුව ඈත අහස දෙස බලා සිටියේය. ගස් අතරින් නැඟුණු දූමාරය කඳු මුදුන් වසා වලාකඩක් සේ පැතිර සිටියි. එය වැසි වැටීමෙන් පසු

පොළොවෙන් නගින වාෂ්ප හෝ මීදුමක් විය යුතුය. හිරු බැස යාමට ආසන්න බව දක්වන ලකුණු අහසෙහි තිබුණේය. ඔහු සිගරැට්ටුවක් ගෙන එය නොසැලකිල්ලෙන් මෙන් දෙතොල් මත තබා දල්වා ගත්තේය.

මදක් නිශ්චලව සිටි තරුණයා යළිත් ඔබාගත් හිසින් යුතුව කථාකරන්නට විය. "ඉතින් මට ආයිමත් ප්‍රේමකරන්න පුළුවන්ද? මං මෙහාට එන්න ඉස්සෙල්ලා වැල්ලවත්තෙදියි මට මොනිකා හමුවුණේ. මට ඇට ප්‍රේම නොකර ඉන්න බැරි වුණා. තේරුනාද?. මට මගේ හැඟීම්වලට වහල් නොවී ඉන්න නොහැකි වුණා. මට බලාපොරොත්තු නැතුව ඉන්න බැහැ. මම ඇට ප්‍රේම කළා. මගේ බිරිඳ දිනෙන් දිනම දියවී යනවා. එහෙත් මට ඈ ගැන අනුකම්පාවක් ඇතිවන්නේ නැහැ." නවත්වා සෙමෙන් කියාගෙන ගිය ඔහුගේ කටහඬ දුබල විය. ඔහු නොනවත්වා විනාඩි දෙකක් පමණ කැස්සේය. ඔහුගේ දෑස තෙත්වී ගියේය.

මහලු ලිපිකරුවා අලස බවෙන් යුතුව දුම් වළලු කීපයක් අරිමින් ඉදිරිපස දත් නොමැති මුව දක්වා සිනහවන්නට විය. ඔහුගේ ඒ සිනහවෙහි මෙන්ම පෙනුමෙහිද කිසිවකු කෝප කරවන සුළු ස්වභාවයක් විය. මදක් බීමත්කම නිසාදෝ ඔහු නිතර දෙතොල උල්කර අහස දෙස බැලීමද, සිනහවීමද කෙළේය.

"මිනිස්සු තමන්ගේ හැඟීම්වලට වහල්වුනහම ඔහොම තමයි. මෝඩයෝ . . . ලෝකය ගැන කිසිදෙයක් දන්නේ නැහැ . . . මම නම් ඕවා ගැන

බිඳක්වත් සලකන්නේ නැහැ. ජීවිතය මටත් ඔය දේම කරන්න හැදුවා. ඒකට මම නොවෙයි එහෙම දේවලට යටත්වන්නෙ. මම ජීවිතය සමඟ සටන් කළා'' යි මහළු ලිපිකරුවා දුම්වළලු කීපයක් පාකර හැර එදෙස බලාගත් වනම පැවසුවේය. ''මෝඩයෝ කිසිදෙයක් තේරෙන්නේ නැහැ.''

මහලු ලිපිකරුවා කී දේ නොඇසුනාක් මෙන් ඔබාගත් හිසින් යුතුව කල්පනාකාරීව සිටි වීරසිංහ දිග සුසුමක් හෙලා වටපිට බැලීය.

අහසෙහි පැවති සිහින් දුමාරය දන් නැති වී ගොස් තිබේ. වැස්සට සේදී ගියාක් වැනි සුදුමැලි පැහැති අහසෙහි මෙන්ම කඳු අතරද පාළු ගතියක් ඇත. ඒ දෙස බොහෝ වේලා බලා සිටියද ඔහුට එහි සුන්දරත්වය නොපෙනේ.

''මට මොකක් වෙලාද කියා මටම තේරෙන්නේ නැහැ. මගේ භාර්යාව ක්ෂය රෝගයෙන් මරණාසන්න වන අතර මට ඈ රුස්සන්නේ නැහැ. ඈ ගැන මගේ සිතේ අනුකම්පාවක් ඇති වන්නේ නැහැ. මම වෙන ගැහැනියෙකුට ප්‍රේම කරනවා. මේ කිසිවක් කොහොම ඇතිවීද කියා මට තේරෙන්නේ නැහැ. මම මුලදී, විමලා බඳින්නටත් පෙර බලාපොරොත්තු වූයේ ප්‍රීතිමත් ජීවිතයක් ගෙවන්නට. ඈ සමඟ ගෙවූ මුල් කාලයේ මා තුළ වූ ප්‍රීතියක හැටි. මම උදේ සිට හවස්වන තුරු කිසිත් දැනුමක් නැතුව කන්තෝරුවේ වැඩ කළා. එහි ඇති සතුටත් විවේකයත් මට එවිට දැණුනා. මා එවිට අනාගතය දෙස බැලුවේ ප්‍රීතියෙන් මෙන්ම

බලාපොරොත්තුවෙන් යුතුව. එහෙත් ඒ සියල්ල බිඳී ගියා. මට ඇව තුරුස්සන්න පටන්ගත්තා. මගේ බලාපොරොත්තු සුන්වුණා. මට සියල්ල එපා වුණා. ඔබට තේරුණාද? ඉතා සුළු දේ මම කෝප කරවීමටත් වෙහෙස කරවීමටත් සමත්වුණා. මොනිකා සමුවුණේ නැත්නම් මම ජීවිතය නැතිකර ගන්නා තත්වයකයි සිටියේ. මට ඉතිරි වුණ එකම බලාපොරොත්තුව එයයි."

තරුණ ලිපිකරුවා කථා කරන අතරද ඉත්පසුද කීප විටක් කැස්සේය. ඔහු නොනවත්වා තමාගේ හදවතෙහි ඇති සියල්ල පිට කරන්නාක් මෙන් කරන කථාව ඇසූ මම එදෙස ඉඳ හිට බැලුවෙමි. තරුණයා සිය කථාව නතර කරන තුරුද මහලු ලිපිකරුවා දුම් වළලු පිටකිරීම නොනැවැත්තුවේය. ඔහු සෙමෙන් කිසියම් තාලයක් මතුරමින් දෙතොල් උල්කොට සිය හිස ඉදහිට පෙරටද වඩා සෙලවූයේය.

සෙමෙන් පැතිරෙන මඳ අඳුරක් නිසා මා කියවමින් සිටි පොතෙහි අකුරු නොපැහැදිලි වන්නට විය. මම එය වසා පුටුවෙහි වාඩි වී මොවුන් දෙදෙනාගේ කථාවට අලස බවෙන් යුතුව කන් යොමා සිටින්නට වීමි. ඔවුන් සෑම දිනම කරන මේ කථාව මගේ සිත නොගත්තේය.

"තමුසේ මෝඩයෙක්" යි මෙතෙක් නිශ්චලව සිටි මහලු ලිපිකරුවා වටිනා කිසිවක් කියන්නාක් මෙන් දෙබැම ළං කරමින් කියන්නට විය. "මටත් ඔය වගේ වැඩක් සිද්ද වුණා. මම අවුරුදු පහක් ප්‍රේම කරලා,

තිවුණු සියලු දේ වියදම් කරලා ගැහැනියෙක් බැන්දා." ඔහු තමා කියන දේ ඉතා වටිනා නමුත් තමාට ඒවා ඉතා සාමාන්‍ය දේ බව ඇඟවීමට මෙන් ඉඳ හිට හඬනගා සිනහවූයේ. "ඉතින් ඈ බැඳලා තුන් අවුරුද්දකටත් ඉස්සෙල්ලා ඈ පැනලා ගියා. ඒ දවස්වල මම ඒ ගැන මුළු ජීවිතයම යෙදෙව්වා. මට ජීවත්වීම එපා වුණා. ඈ නැතිව ජීවත්විය නොහැකි යයි මට සිතුණා. මම පිස්සෙක් වගේ ජීවිතය ගෙව්වා. එහෙත් මට එකම බලාපොරොත්තුවක් තිබුණා. මගේ දැවිරිදි දුවට සැලකීමට, ඇගේ දුක සැප සෙවීමට මම මගේ මුළු කාලයම යෙදෙව්වා. ඈ නිදි කෙරෙව්වෙත්, නැලෙව්වෙත් මමයි. ඈ නැතිව මට මොහොතක් ඉන්න බැරි වුණා. ඉතින් මොකක් හිතනවද? ඈට අවුරුදු හය වෙන්නටත් ඉස්සෙල්ලා ඇගේ මව ඈව එක්ක ගියා. මට ඉන්පසු ජීවත්වීම එපා වුණා. මම මාසයක් ගෙදර හිටියේ නැහැ. මම ඈ ලබාගන්නට තඩු කීවා. එහෙත් ඈ මව සමඟ ජීවත්වීමට කැමති වුණා. මට ඒ දවස්වල ජීවිතය නැති කර ගැනීමට සිතුණා." ඔහු යළිත් හඬ නගා සිනහවෙන්නට විය. "ඒවා ඔක්කොම මෝඩකම්, මිනිසුන් ජීවිතයට වහල් වන්නට තරකයි."

ඔහු යළිත් හඬ නගා සිනා සී සිගරැට්ටුවක් පත්තු කරගත්තේය. ඔහු එය පත්තුවීමට ඇරිය නමුත් එහි දල්ල නොකැඩුවේය.

"දැන් ඉක්මණට ඇඳිරි වැටෙනවා. මේ දවස්වල රෑ දවාලට වැඩිය දිගයි."

සිගරැට්ටුවෙන් නගින එළිය මඳ අඳුරෙහි මැනවින් පෙනිණ. ගෙදර වූ කොලුවා විසින් එල්ලන පහන පත්තු කරන ලදී.

තරුණ ලිපිකරුවා තවමත් සිහින් හඬින් තමාගේ සිතෙහි ඇති නොයෙක් දේ පවසයි. ඔහු එය අවසන් කරන්නේ රාත්‍රි කෑමට අඬ ගැසූ විට පමණක් බව මම දනිමි. එතෙක් මහලු ලිපිකරුවා හිස වනමින් ඒ සියල්ල ඉතා නොවැදගත් දේ සේ අසා සිටිනු ඇත. මම පුටුවෙන් නැගිට සාලය දෙසට ගමන් කෙළෙමි.

පිටිසර බඳ පිරිමින් පමණක් මෙසේ නැවතී සිටින මෙහි අපි ලිපිකරුවන් සිව්දෙනෙක් වෙමු. වීරසිංහ මෙහි නැවතීමට පැමිණියේ මීට මාස පහකට පමණ පෙරය. ඔහු අප සමඟ නැවතීමට පැමිණි නොබෝ දිනකින්ම ජීවිතය පිළිබඳ කලකිරුණු එකකු මෙන් හැසිරෙන්නට විය. සෑම සැන්දෑවකම කන්තෝරුවෙන් පැමිණි පසු ඔහු මහලු ලිපිකරුවා සමඟ කීවේ තමාගේ තත්වය ගැනය. තමා මුල දී ප්‍රීතිමත් අනාගතයක් ගැන සිතූ සැටිද, ඔහුගේ බිරිඳ ක්ෂය රෝගයෙන් පෙළෙන බවද, තමා දූත් අන් ගැහැනියකට පෙම් කරන බවද, සියලු බලාපොරොත්තු සුන්වීම නිසා දූත් තමා අවාසනාවන්ත ජීවිතයක් ගෙවන බවද ඔහු කීවේය. ඔහු කී සියල්ල මහලු ලිපිකරුවා ඉතා නොවැදගත් දේ ලෙස අසා සිටියි.

මෙදින මෙන් සෑම සැන්දෑවකම ඔවුන්ගේ කට හඬ ඉස්තෝප්පුවෙහි හෝ මහලු ලිපිකරුවාගේ කාමරයෙහි ඇසිය හැක.

මෙසේ මාස දෙකක් පමණ ගතවන්නට ඇත. අපි පෙර මෙන් මුළු දවස කන්තෝරුවේ ගත කරමින් පිටිසර ගෙවන ඒකාකාර ජීවිතයට තව තවත් පුරුදු වුණෙමු. කාලගුණයද යම්තම් හෝ වෙනස් නොවීය. හවස්වත්ම අහස අඳුරු වී වැහි වැටීමට පටන් ගනියි. ඉන්පසු අහස සුදුමැලි පෙනුමක් උසුලයි. ඉස්තෝප්පුවෙහි වීරසිංහත් මහලු ලිපිකරුවාත් කථා කරමින් සිටිනු ඇත. ඇතැම් දවසක මටද ඔවුන්ගේ කථාවට සහභාගි වීමට සිදුවේ.

දිනක් සවස වීරසිංහ වෙනදට වඩා කලින් කන්තෝරුවෙන් පැමිණියේය. ඔහුගේ මුහුණ ලේ පැහැ ගැන්වී දෙතොල් වෙවුලමින් තිබිණ. ඔහුගේ දෙඇසෙහි මහත් බියගත් පෙනුමක් විය. ඔහු පැමිණි විගස සිය ඇඳුම් පැළඳුම් සූදනම් කොට ගෙදර යාම පිණිස සූදනම් විය.

"මගේ නෝනට හුඟක් අමාරුය කියා ටැලිග්‍රෑම් එකක් එවා තිබුණා. මම දැන් යන්න ඕනැ" යි ඔහු අප සමඟ කීවේද බියෙන් තැතිගත් දෙනෙතින් යුතුවය. "මට අද දවල් කන්තෝරුවට ටැලිග්‍රෑම් එක ලැබුණා. මම මෙච්චර ප්‍රමාද වුණා වැරදියි. මගේ නෝනට මම මෙහේ ගෙදර නොගිහින් අන්තිම වෙනකතුත් මම මෙහේ ගෙදර නොගිහින් හිටියා."

ඔහුගේ කට හඬෙහි වෙනද නොමැති ශෝකී භාවයක් විය. මම ඔහුට අස්පරස් කිරීමට උදව් කෙළෙමි. එහෙත් මහලු ලිපිකරුවා වෙනද මෙන්ම සිගරැට්ටුවක් උරමින් ඉස්තෝප්පුවෙහි අලස බවෙන් ඒ මේ අත ඇවිදිමින් සිටියේය.

"තමුසෙ අදත් හෙටත් ඉඳලා සෙනසුරාදම යනවා නම් හොඳයි. ඊටත් වැඩිය මේ වැස්සේ කොහේ යන්නද?" යි ඔහු ඉඳ හිට වීරසිංහ වෙත ගොස් කීවේය. "මොන බොරුද, මිනිස්සු මුළු ජීවිතේම දවසක් නැර එහේ මෙහේ දුවනවා කිසිම ප්‍රයෝජනයක් නැතුව. අන්තිමේදී ඔක්කොම නිෂ්ඵලයි. කොයි එකටත් තමුසෙ සෙනසුරාදම යනවා නම් හොඳයි."

තරුණ ලිපිකරුවා ඒ කිසිවක් නෑසුනාක් මෙන් බියෙන් සැලෙන හදවතින් යුතුව සියල්ල සූදනම් කෙළේය. "මම කොහොමවත් පුමාතයක් දෙකක් ඉන්නවා. මට ලියුම් තිබුණොත් එවන්න. මං කළා වැරදියි. මගේ නෝනාට හොඳටම අමාරු වෙනතුරුත් මම මෙහේ හිටියා" යි ගෙදරින් පිටත් වූ ඔහු අප සමහ කීවේය. ඔහුගේ කට හඬෙහි දැඩි ශෝකී භාවයක් ගැබ්වී තිබිණ.

වීරසිංහ ගොස් දවස් තුන හතරක් යනතුරුද අපට ඔහු හෝ බිරිඳ ගැන ආරංචියක් දත ගත නොහැකි විය. අපට ඔවුන් බැලීමට යාමටද අවකාශයක් නොවීය. හැතැප්ම සියයක් පමණ ඈත වූ එහි ගොස් ආපසු ඒමට සම්පූර්ණ දවසක් ගත වේ.

ඔහු ගොස් මාසයකට පමණ පසු දිනක අපට ඔහුගේ බිරිඳගේ මරණය ගැන ආරංචි විය. කල්යත්ම ඇගේ රෝගය අසාධ්‍ය වූයෙන් ඈ වෙත පළාතකට ගෙන යන ලදී. ඈ මිය ගියේ එහි දීය. මාත් මහලු ලිපිකරුවාත් හැර අන් අය අවමඟුල සඳහා ගියහ.

මට එහි යා නොහැකි වූයේ එදින හදිසියේ ගමට යෑමට තිබුණු බැවිනි.

ඉන්පසු මාස කීපයක් යනතුරුද අපට වීරසිංහ ගැන ආරංචියක් නොලැබිණ. ඔහු අප සමඟ වැඩ කළ කන්තෝරුවෙන් අස්වූ බවද දැනගත හැකි වූයේ එහි එවන ලද ලියුමක් මගින් පමණි. අපි කල්යත්ම ඒකාකාර ජීවිතයට වඩ වඩා හරි ගැසුනෙමු. මම කන්තෝරුවෙන් පැමිණි පසු රෑ වනතුරු කිසිවක් ලිවීම හෝ කියවීම කෙළෙමි. මහලු ලිපිකරුවා ඉස්තෝප්පුවෙහි ඇවිදිමින් හෝ බිත්තිය මත වාඩි වී හෝ සිගරැට්ටුවක් උරමින් දුම් වළලු පිට කෙළේය. වැසි කාලය අවසන් වුවද එක්ව ඇවිදීමට යාමට හෝ ගෙදරින් බැහැර යාමට හෝ අපට සිත් නොවීය. මහලු ලිපිකරුවාද දැන් කථා කරන්නේ ඉඳ හිටය. ඔහු වැඩි වශයෙන් කථා කළේද කාලගුණය ගැනය අපි සියලු දෙනම අලස බවෙහි ගිලුණවුන් මෙන් ජීවිතය ගෙවුයෙමු.

මෙසේ මාස අටක් පමණ ගතවන්නට ඇත. දැන් අප නිවස අවටද වෙනස්වීම් සිදුවී තිබේ. එහි සිට පාර දක්වා වැටී තිබුණු අඩි පාර දැන් තාර දමූ පාරකි. ඇත කළුවලද දැන් ගැමියන් විසින් ගෙවල් සාද තිබේ.

දිනක් මම උවමනාවක් සඳහා කොළඹ ගොස් සිටියෙමි. එහිදී මට වීරසිංහගේ මිත්‍රයකු සමුවිය. ඔහු මා සමඟ වීරසිංහ පිළිබඳව කීවේ ඉතා දුක්මුසු ආරංචියකි. වීරසිංහට ක්ෂය රෝගය වැළඳී තිබෙන

බවද ඔහු දැන් ගෙදරින් අස්ව ගොස් ප්‍රතිකාර ගනිමින් සිටින බවද ඔහු මා සමහ කීවේය. වීරසිංහට එය සිය බිරිඳගෙන් බෝවන්නට ඇතැයි මට සිතිණ. එය ඇසූ අපේ කන්තෝරුවෙහි වූ අයද බෙහෙවින් දුක්වූහ. වීරසිංහ බැලීමට යාමට සිතූ නමුදු මට එය කළ නොහැකි විය. ඔහු ගෙදර නොමැති නම් කිසියම් නැයකු සමහ වසනු ඇත. කෙසේ වුවද මම ඔහුගේ ගෙදර ලිපිනයට ලියුමක් ලීවෙමි. එහෙත් ඊට පිළිතුරක් නොලැබිණ.

යළිත් ඒකාකාර ජීවිතයට පුරුදු වූ අපට සියල්ල අමතක විය. වීරසිංහ ගැන වුවද අපට ඉන්පසු මතක් වූයේ ඉඳහිටය. ඔහු ගැන කථා කරන ඇතැම් විටක මහලු ලිපිකරුවා සරදමට මෙන් සිනහ වී මෙසේ කීවේය. "මිනිහා තවම බලාපොරොත්තු හරියන තෙක් ඉන්නවා ඇති . . . මෝඩයෝ." කන්තෝරුවෙන් පැමිණි පසු අපි පෙරටද වඩා අලස කාලයක් ගත කිරීමට පුරුදුවීමු. මම වඩ වඩා පොත් පත් කියවීමට කාලය යෙදවූයෙමි. මහලු ලිපිකරුවාද පෙරටද වඩා බීමට පටන් ගත්තේය. ඔහු කථා කළේ ඉඳ හිටය. බීමත්ව පැමිණි ඔහු දෙතොල උල්කර දුම් වළලු පිට කරමින් කාලය ගත කෙළේය. දැන් ඔහුගේ මුහුණ පෙරටද වඩා පාළු ගතියක් උසුලයි.

දැන් වීරසිංහ අප වෙතින් ඉවත්ව ගොස් අවුරුද්දක් පමණ ඇත. එක් ඉරිද දිනයක මම කාමරයට වී කිසිවක් කරමින් සිටියෙමි. කිසිවෙක් සෙමෙන් තට්ටු කෙළේය. මම එහි ගොස් දොර ඇරියෙමි. එහි වූයේ වීරසිංහය. මට ඔහු අඳුනා ගත හැකිවූයේ යම්තම්නි.

ඔහු එතරම් දුර්වල වී කෘෂ වී සිටියේය. ඔහුගේ දෙනෙත කාන්තියෙන් තොරව මළානිකව ගොස් තිබුණේය. ඔහුගේ මුහුණෙහි කම්මුල් ඇදී මස් පේදී ගියාක් මෙන් ඇත. ඔහු කථා කළේ පෙර මෙන් නොව ආයාසයෙනි. ඔහු කථා කරන අතර නිතරම තම දෙතොල පෙහ වූයේය. කෙසේ වුවද ඔහු දැකීමෙන් මා තුළ මහත් ප්‍රීතියක් ඇතිවිය. මම ඔහු පැමිණි බව අන් අයටද දන්වා ඔහු හා කැටිව සාලයට ගොස් වාඩිවී කථා කරන්නට වීමි.

තමා දැන් සිංහල වෙදකම් ගන්නා බවත්, අසල වූ වෙදෙකු සමුවීමට පැමිණි බවත්, ඒ ගමනෙහි අප බැලීමට පැමිණිය යුතු යයි සිතුණු බවත් ඔහු මා සමඟ කීය. මහලු ලිපිකරුවාටද ඔහු දැකීමෙන් ප්‍රීතියක් ඇති විය. ඔහු සුපුරුදු පිනහව සිනහවෙමින් ඔහුගේ අත තදින් අල්ලා මිරිකුවේය. අපි ඔහු වටා වාඩි වී කථා කරන්නට වීමු. ඔහු කථා කරන අතර නිතර තම දෙතොල පෙහවූයේය.

"ඉතින් දැන් මොකද කරන්නේ?" යි මම ඔහුගෙන් ඇසුවෙමි.

"මම දැන් නිකම් ඉන්නවා. මගේ තෝන්න නැතිවෙලා මාස හතරකට විතර පස්සෙයි මට ලෙඩේ හැදුනේ. ඒකට මගේ හිතේ ඊට ඉස්සෙල්ල ඉඳල ලෙඩේ ඇඟ ඇතුළේ තිබෙන්න ඇති. මුලදී දෙස්තර බෙහෙත් ගත්තා. දැන් ගන්නේ සිංහල බෙහෙත්. සිංහල බෙහෙත් වලින් කොහොමත් ඉක්මණට හොඳ වෙනවාය කියා කවුරුත් කියනවා."

"මොකෝ ඉක්මණට හොඳ වෙන්න උවමනාව? ඉක්මණට . . . හදිස්සියෙ . . . මිනිස්සු මුළු ජීවිත කාලෙම ගෙවන්නෙ ඔහොමයි" යි මහලු ලිපිකරුවා හිසවනමින් කීවේය. "මෝඩයෝ . . . හා . . .හඃ . . . හඃ"

වීරසිංහ ඒ කිසිවක් නෑසූනාක් මෙන් කථා කරන්නට විය.

"මට කොහොම හරි තව මාස හතරකට ඉස්සෙල්ලා ලෙඩේ හොඳ කරගන්න ඕන. මගේ ලෙඩේ දෙස්තරවරු කියන තරම් අමාරු නැති බව මට තේරෙනවා. මම ලබන මැයි මාසයේ මොනිකා බඳිනවා. ඊට ඉස්සෙල්ල මේක සුවකර ගන්න ඕන. ලබන මාසයේ අග හරියෙදියි නම් ප්‍රසිද්ධ කරන්නේ."

ඔහු කී දෙයින් මා මඳක් විස්මයට පත්වූ නමුත් එය ඇසූ මහලු ලිපිකරුවා හඬ නහා සිනහ වූයේය. එහි කිසිවකු කුපිත කරවන අහංකාර භාවයක් විය. තමා සිතූ ලෙස සියල්ල සිදුවූයේ යයි කියන්නාක් මෙන් ඔහු කීප වරක් සිය හිස සෙලවූයේය.

"තමුසෙ ලෙඩින් බව ඒ ගෑනි දන්නේ නැද්ද?" යි ඔහු සිනහ වෙමින්ම ඇසීය.

"ඇයි නැත්තේ, ඒක නිසා තමයි මේක කොහොම හරි ඊට ඉස්සෙල්ලා හොඳ කරගන්න හදන්නේ."

මහලු ලිපිකරුවා තමාගේ දත් නැති මුව දක්වා පෙරටද වඩා හඬින් සිනහ විය.

"තමුසෙ ඔහොම හිතුවාට ඒ ගැනිට තමුසෙ එපා වෙනවා. ඒක අනුමානයක් නැහැ. තමුසේ වගේ ලෙඩෙකුට ගෑනු කැමති වෙන්නේ නැහැ. තමුසෙ උන් අඳුනන්නේ නැතුව." ඔහු සිනාහවීම නොනැවැත්තුවේය.

මහලු ලිපිකරුවාගේ හැඩි දැඩි කථාව මගේ පුදුමයට හේතු විය. ඔහුගේ දෑසෙහි වූ බැල්මද මගේ සිත් නොගත්තේය.

"නෑ මොතිකා එහෙම ගෑනියෙක් නෙවෙයි. මම ඈ ආශ්‍රය කරන්නට පටන්ගෙන දැන් අවුරුද්දකටත් වැඩියි" කී වීරසිංහ ඇගේ යහපත් ගතිගුණ ගැන කියන්නට විය.

"ඒක ගැන කොහොමත් අපිට වැඩිය වීරසිංහ දන්නවා ඇති. ඒක ගැන අපිට කියන්න දෙයක් නැහැ" යි මාද කීවේ මහලු ලිපිකරුවාගේ වචන මගේද සිත් නොගත් බැවිනි. එය වීරසිංහගේ කැළැඹීමට හේතුවී දැයි යන්න මට කිව නොහැක. ඔහු මඳ වේලාවක් කල්පනාකාරීව නිශ්චලව සිටියේ එනිසා විය යුතුය. මාද කිසිවක් නොකියා සිටි නමුත් මහලු ලිපිකරුවා තමාගේ අහංකාර සිනහව නොනැවැත්තුවේය.

"තමුසෙගෙ බලාපොරොත්තු නැවතත් විනාශ වෙලා යනවා. මගේ හිතේ තමුසෙට තව අවුරුද්දකට වැඩිය ජීවත්වෙන්න පුලුවන් හැඩක් නැහැ."

මහලු ලිපිකරුවාගේ කට හඬෙහි මෙන්ම දෑසෙහිද කුරිරු ගතියක් රැඳී තිබුණේය. එය මා තුළ කෝපයක් ඇති කරවන සුළු විය.

"තමුසෙගෙ ඔය බොරු නවත්වනවා. ඕවා . . ."

එහෙත් මහලු ලිපිකරුවා මා කී දේ නැසුනාක් මෙන් කථා කරන්නට විය.

කිවයුතු කිසිවක් මගේ සිතට නාවෙන් මම කෝපයෙන් කරබා ගතිමි.

"ඇස්වල ඔය සුදු පැහැය මතුවන්නේ අසාධ්‍ය අතට හැරුණහම තමයි. අපේ කන්තෝරුවේ ඉස්සෙල්ල හිටිය මගේ යාලුවෙකුටත් කැස්ස තිබුණා. ඔය සුදු මතුවෙලා මාස පහක්වත් ඇල්ලුවේ නැහැ."

ඔහුගේ වචන ඇසූ මගේ කෝපය කොතරම් වීද යත් මට හිටි තැතින් නැගිට ඔහුට පහරක් ගැසීමට සිතිණ. ඔහු ඒ සියල්ල කියන්නේ දැඩි ප්‍රීතියකින් යුතුව බව පෙනෙත්ම මගේ කෝපය දියුණු වෙයි.

"තමුසෙගෙ ඔය බොරුවලට රැවටෙන මිනිස්සු නැහැ" යි මා අන්තිමේදී සිනහවෙමින් කීවේ සිතෙහි වූ කෝපය තවත් ඉවසා ගත නොහැකි වූ බැවිනි.

මහලු ලිපිකරුවාගේ කථාව නැවැත්වීමට තීරණය කරගත් මම අන්තිමේදී කථාව අන් මගකට හැරවීමට සිතුවෙමි. මම වීරසිංහ සමඟ කන්තෝරුවේ වූ පැරණි මිත්‍රයන් ගැන කථා කරන්නට වීමු. එහෙත් මගේ කථාව වීරසිංහගේ සිත් නොගත් බව පෙනිණ.

ටික වේලාවක් අප සමඟ කථාකරමින් සිටි වීරසිංහ ආපසු යෑමට පිටත්වූ ඔහුගේ මුහුණෙහි

වූයේ පුදුම පෙනුමකි. එය ඔහු එනවිට එහි වූ පෙනුමට බෙහෙවින් වෙනස්වූවකි.

ඔහුගේ දෙඇස මරණය මුණ ගැසුණාක් මෙන් බියෙන් හා ශෝකයෙන් වෙළී තිබුණේය. ඔහුගේ දෙතොල් කිටි කිටියේ වෙවුලුවේය. ඔහු කල්පනා විරහිතව මෙන් සෙමෙන් ගමන් කෙළේය.

ඔහු ගෙදරින් පිටත්ව යන තුරුද මම බලා සිටියෙමි. ඔහුගේ දුර්වල නැවුණු දේහය සෙමෙන් අතුරුදහන් වනතුරුද මම දෑස ඉවතට නොගත්තෙමි. මරණයේ මූර්තියක් වැනි එය මගේ සිත ශෝකයෙන් හා කෝපයෙන් මඩින සුලුවිය. මම මිදුලට බැස ඔහු ගිය දෙස දෙනෙත් අයා බලා සිටියෙමි. මගේ කෝපය වහ වහා නගින්නට විය.

මම ගේතුළට ගොස් මහලු ලිපිකරුවාගේ කාමරය තුළට ගියෙමි. ඔහු දකින්ම මගේ කෝපය බෙහෙවින් තියුණු විය.

"තමුසෙ හිතක් පපුවක් නැති දරුණු මිනිහෙක්. තමුසෙට දුක සැප දෙකම තේරෙන්නේ නැහැ. තමුසෙගෙ පපුව ගලක් තමුසෙ මුළු ලෝකයටම ඊර්ෂ්‍යා කරනවා . . ." කෝපය නිසා මට සිතෙහි වූ සියල්ල කියා ගත නොහැකි විය. මම මා අසල වූ පුටුව වේගයෙන් පසකට තල්ලු කෙළෙමි.

ඔහු මා කී දෙය නැසුනාක් මෙන් අදිමින් සිටි සිගරැට්ටුව වේගයෙන් ඇද දුම් වළලු කීපයක් පිට කෙළේය. ඉක්බිතිව ඔහු හිස වනමින් හඬ නතා

සිනාහවන්නට විය. මට දැන් කළ හැක්කේ එකම දෙයකි. එය ඔහුට වේගයෙන් පහරක් ගැසීමකි. එහෙත් මම ඊට පළමු කාමරයේ දෙර පලුව වේගයෙන් වසමින් ඉන් නිකුත් වූයෙමි.

මම මගේ කාමරයට ගොස් මේසය අසලවූ පුටුවෙහි වාඩිවීමි. කල්පනා කිරීමට හෝ සිදුවූයේ කුමක් දැයි සිතීම මට එවේලෙහි රුචි නොවීය. මම පොත් වලින් වැසුනු මේසය මත හිස රඳවා සිහිනයකින් අවදිවූවකු මෙන් හිස් බැල්මකින් බිත්තිය දෙස බලා හිටින්නට වීමි.

**- නිමි -**





# රතු රෝස මල

ගුණදාස අමරසේකර

සිංහල කෙටිකතාව කලා මාධ්‍යයක් ලෙස වැඩි වර්ධනය කිරීමට මහත් මෙහෙයක් ඉටු කළ ලේඛකයකු ලෙස ගුණදාස අමරසේකර හැඳින්වීමට පුළුවන. ඔහු දැනට කෙටිකතා සංග්‍රහ හතක් රචනා කොට ඇත. වික්‍රමසිංහ, සේනානායක යන ලේඛකයන්ගේ නිර්මාණ හේතු කොට ගෙන පර්යේෂණාත්මක පසුබිමක පැවති සිංහල කෙටිකතාව විකාශනයේ දී උපයෝගී කර ගත යුතු කලාත්මක ප්‍රයෝග හා ස්වාධීන රීතියක සලකුණු ඔහු සිය පළමු කතා සංග්‍රහය වන රතු රෝස මල මගින් ප්‍රකට කළේ ය. එක් අතකින් බලන කල, 'රතු රෝස මල' වූ කලී බටහිර විචාරකයන් විසින් අනුගත සම්මත කෙටිකතා රීතියෙහි ගැමි සමාජ ජීවිතයෙන් උකහා ගන්නා ලද ජීවිත අත්දැකීම් කපා කොටා ඔප මට්ටම් කිරීමට දරන ලද උත්සාහයක ප්‍රතිඵලයක් බඳු ය.

මහාචාර්ය කුලතිලක කුමාරසිංහ
- සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා කලාත්මක විකාශනය -

ISBN 955-21-0047-X
00074101-13 Rs. 360/-